# පටිසෝතගාමීව
# තිස් වසක්

පාඨලී චම්පික රණවක

ස්වයං ලිඛිත චරිතාපදානය



# පටිසෝතගාමීව
# තිස් වසක්

# පටිසෝතගාමීව
# තිස් වසක්

පාඨලී චම්පික රණවක

ස්වයං ලිඛිත චරිතාපදානය

පළමු මුද්‍රණය
2009 නොවැම්බර්

ISBN අංකය
978-955-98843-2-3

පරිගණක අක්ෂර සංයෝජනය
නිරෝෂා පනාවැන්න

පිටකවර නිරමාණය මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස්,
143, උඩහමුල්ල දුම්රිය පාර,ගංගොඩවිල,
නුගේගොඩ.

# වියත්බව, අධිෂ්ඨානය හා අරමුණු සඳහා කැපවීම ඔහුගේ නායකත්වයේ රහසයි

**පා**ඨලී චම්පික රණවක මහතා ගැන අසා තිබුණත් ඔහු හැඳින ඇසුරු කරන්නට ලැබුණේ භාවිත වර්ෂ 2002 දී පමණ අප ජාතික සංඝ සම්මේලනය ආරම්භ කිරීමත් සමගය. සම්බුද්ධ ශාසනය රැකගැනීම සඳහා බෞද්ධයින් එකමුතු කර සංවිධානය කරගැනීම සඳහා වූ එකී ජාතික මෙහෙවරේ දී ගිහියන් අතර, සිටි කැපී පෙනෙනා චරිතය වූයේ ඔහුය. සිය දේශපාලන චරිත කතාව එළිදක්වන්නට තීරණය කර ඇති බව මා වෙත ඔහු විසින්, දැනුම් දීමෙන් පසු මුලදී මට තරමක කුකුසක් ඇතිවිය. මන් ද චම්පික මහත්තයා යැයි අපි ආදරයෙන් හඳුන්වන මේ පුද්ගලයා බොහෝ විට සිය ජාතික කාර්යයන් හැකිතාක් අප්‍රකටවම සිදුකළ නිසාය. ඔහු ගැන ලෝකයා දත් ප්‍රමාණය මෙන් කිහිප ගුණයක අති මහත් ජාතික කාර්යභාරයක් ඔහුගෙන් ඉටු වී ඇති අතර, ඇතැම් දෑ තමන්ගේ හපන්කම් ලෙස වෙනත් අයට පෙන්වන්නට ඉඩ දී නිහතමානීව බලා සිට ද ඇත.

ඒ නිසා සියල්ලන්ගේ දැන ගැනීම පිණිස සිය දේශපාලන චරිතාපදානය ලිවීමට ඔහු ගත් තීරණය නිසා ඔහු පිළිබඳව දැන සිටි අපට පමණක් නොව ලොවටම ඒ පිළිබඳ තතු දැනගන්නට හැකියාව මේ කෘතියෙන් ලැබී ඇත. තවත් බොහෝ තොරතුරු කාලය හරස්වීම නිසා හෝ වෙනත් හේතු මත ඉදිරිපත් කර නැති බව ද කිව යුතුය.

චම්පික මහතාගේ සුවිශේෂී බව නම් ඔහු "ලොවෙන් එකෙක් එක දෙයකට වෙයි සමත" නම් ප්‍රකාශය බොරු කළ අයෙක් වීමයි. ඔහුට බොහෝ ක්ෂේත්‍රවල බොහෝ දක්ෂකම් විය. ඔහු දන්නා බොහෝ දෙනෙක් ඔහුගේ

ගුණාංග ලෙස සලකන්නේ අති විශිෂ්ඨ මතකයත් නිවැරදි සංඛ්‍යා ලේඛන, දත්ත සහ කරුණු සහිතව සංගතව, බුද්ධිමත්ව කරුණු දක්වන්නෙකු ලෙසය. නමුත් එයට වඩා ඉතා ගැඹුරු දූරදර්ශී, දාර්ශනික, වියත්, බුද්ධිමත් භාවයක් ඔහු සතුව ඇත.

චම්පික, පෙර අපර දෙදිග දර්ශන ගුරුකුල ගැන හොඳ අවබෝධයක් ඇත්තෙකි. ථෙරවාදී බෞද්ධ අනාත්මවාදයේත්, නාගර්ජුනයන්ගේ ශුන්‍යතාවාදයේත්, ඩේවිඩ් හියුම් ආදීන්ගේ බටහිර අනුභාවිකවාදවලත්, නූතන විද්‍යා ප්‍රවාදවල එන සසම්භාවී ප්‍රවාද ගැනත් මැනවින් දැන ඒවායේ වෙනස පැහැදිලි කරගත හැකි පැහැදිලි කරදිය හැකි බුද්ධිමතෙකි. එවැනි දාර්ශනික පදනමක් සහිත තවත් අයෙක් ලංකාවේ ප්‍රසිද්ධ දේශපාලනයේ නියැලෙනවා ද යන්න අපට නම් සැකයකි. ලෝකයේ දේශපාලන දර්ශන වූ මාක්ස්වාදය - ලිබරල්වාදය මෙන්ම ආර්ථික දර්ශන වූ ඇඩැම්ස් ස්මිත්, ඩේවිඩ් රිකාර්ඩෝ සිට කේන්ස් දක්වා ද මෑත කාලීන ආර්ථික විද්‍යා විද්වතුන් වූ ජෝශප් ස්ටිග්ලිට්ස් වැන්නවුන් ගැන ද ඔහුට ඇත්තේ පුදුමාකාර දැනුමකි. ඒ නව දැනුම ඔහු අප සමග බෙදා හදාගත් බව ද නොකිවමනාය. ගණිතයට කුඩාකල සිට ශූරයෙකු වූ ඔහු මේ මහා දැනුම ද සිය හිස මත සුපිරි පරිගණයක ආකාරයට ගබඩා කරගෙන සිටිනා බව ද නොකිවමනාය. ඕනෑම සභාවක දී සංගත ලෙස, බුද්ධිමත් ලෙස ඉතා පිළිවෙළට ඔහුගෙන් කරුණු ගලා එන්නේ ඒ දාර්ශනික හිසත්, දැනුමේ පිළිවෙළත් නිසාය.

බොහෝ දෙනෙක් ඉතිහාසය සමග ජීවත් වුවත් ඉතිහාසය නිර්මාණය කිරීමට හැකියාව නොලබති. චම්පික රණවකට දාර්ශනික මනසක් මෙන්ම දූරදර්ශී නව සිතුවිලි ද විය. බොහෝ දුර සිතා ඔහු ගත් ඇතැම් උපාය මාර්ගයන් බොහෝ දෙනෙකුට වැටහෙන්නේ බොහෝ කල් ගියාට පසුවය. පාර්ලිමේන්තු කථානායක තේරීමේ තරගයේ දී (2004) ඔහුගේ අදහසකට අනුව කළ ඡන්ද නිෂේධය එවැනි අපූර්ව අවිහිංසාවාදී උපායකි. එමගින් විධායක ජනාධිපති ධුරය අහෝසි කර රට අවුලක් කර ත්‍රස්තවාදයට පාර්ලිමේන්තුව අවුල් කිරීමේ හැකියාව ද නිශ්ක්‍රීය කෙරුණු බව බොහෝ දෙනා දැනගත්තේ බොහෝ පමාවීය. අපේ භික්ෂූන් වහන්සේලාට අවමාන අපවාද කරමින් ආණ්ඩුවත්, ඇතැම් පක්ෂත් මුදාහළ "ත්‍රස්තවාදය" හමුවේ ඔහුගේ අධිෂ්ඨානය, අරමුණු සහගත බව, තිරසාර බව කැපී පෙනුණේය. බෞද්ධ භික්ෂුවට අපහාස අවමාන එල්ල කිරීමට තැත්කළ සෑම විටම හෙතෙම ඉන්ද්‍රඛීලයක් සේ නැගී සිටියේය. ජාතික හෙළ උරුමයේ අපේ දේශපාලනයට මහ නුග රැකක් සේ සෙවණ ලැබුණේ ඔහුගේ අධිෂ්ඨානශීලී

කැපවීම නිසාය. බොහෝ දෙනා එරෙහිවෙත් දී ජනාධිපතිවරණය 2005ට දිනාගැනීමේ උපාය මාර්ගික නියමුවා වූයේත් ජනාධිපතිවරණය "රාජ්‍යයේ ඒකීයභාවය" නැමැති ප්‍රතිපත්තිය මත කෙරුණු ද්වන්ධ සංග්‍රාමයක් කර ෆෙඩරල්වාදය විවෘත බිමක දී පරාජය කෙරුණෙත් ඔහුගේ දූරදර්ශී උපායන් නිසා බව නොකිවමනාය. රටට අවශ්‍ය මොහොතේ නිවැරදි නායකත්වය - අතිගරු මහින්ද රාජපක්ෂ මහතා - දිනවීමට අප ගත් තීරණය පසුපස සිට ක්‍රියාත්මක කරවූයේත් ඔහුය.

බොහෝ බුද්ධිමතුන් සිය සිතුවිලි ශාස්ත්‍රීය ලේඛනවලට සීමා කරති. චම්පික රණවක බුද්ධිමතා සිය සිතුවිලි සිය ජීවිත අරමුණු කරගෙන එහිම ජීවත් වෙයි. ඒ අරමුණු සාක්ශාත් කරගැනීම සඳහා පසු නොබැස ක්‍රියාශලී වෙයි. පුද්ගලික ජීවිතය පවා අතහැර අරමුණු ජයග්‍රහණය සඳහා අසීමිතව කැපවෙයි. අන් අයටද කැපවීමේ ආදර්ශය දෙයි.

ඔහු අණ දෙන්නෙක් නොවේ. තෙමේම ඒ අණ ක්‍රියාත්මක කර පෙන්වන්නෙකි. බොහෝ වෙනස් දේ කළ නායකයින් දේශපාලන බිමට පැමිණ ඇත්තේ අනුන්ගේ පක්ෂ, අනුන්ගේ දර්ශන මත ක්‍රියාකරමින් පසුව ඒවායින් බිඳී යැමෙනි. නමුත් චම්පික රණවක මුල සිටම තමන්ගේ දර්ශනයක් මත පිහිටියේය. තමන්ගේම වූ දේශපාලනයක් කළේය. ඒ අනුව රට වෙනස් කළේය. ඔහු 1990 ගණන්වල කොටි පැරැදවිය යුතුය එය කළ හැකිය කියනා විට ඔහු සමග එකඟවූයේ සුළු පිරිසකි. ප්‍රධාන දේශපාලන පක්ෂ තුනම එනම් යූ.එන්.පීය, ශ්‍රී.ල.නි.පය, ජවිපෙය 1999 ජනාධිපතිවරණයට ගියේ ප්‍රභාකරන් යුද්ධයෙන් පැරැදවිය නොහැක, යුද්ධය එපා කියාය. සියලුදෙනාම පාහේ රටේ ඒකීය ව්‍යවස්ථාව වෙනස් කළ යුතු යැයි ද සිතුවෝය. නමුත් චම්පික රණවක එසේ සිතුවේ නැති අතර, ඉතා දක්ෂ ලෙස ජාතික බලවේග අවුලවමින් සිංහල සමාජය වෙනස් කළේය. දේශපාලන පක්ෂවලට වෙනස් වීමට බල කළේය. ඔහු සෙසු නායකයින්ගෙන් වෙනස් වන්නේ එතැනිණි. රටත්, ජාතියත්, විජාතික බලවේගවල මහා ප්‍රචාරක යුද්ධයකින් ගලවාගෙන ජාතික දේශපාලනයකට ප්‍රායෝගිකව ගෙන යන්නට ඔහු දුන් නායකත්වය සුවිශේෂී වන අතර, ජනතාව ඔහුට කෘතවේදී ද විය යුතුය.

චම්පික රණවකයන්ගේ නොසැලෙන තාදි ගුණය ද අභියෝග භාර ගැනීමට දැක් වූ නිර්භයකම ද පුදුමාකාරය. 2000 වසරේ දී හැඩිගල්ලේ විමලසාර හිමියන් ෆෙඩරල් යෝජනාවලියට එරෙහිව දිවි කැපකළ විටත්, 2005 දී ඕමල්පේ සෝභිත හිමියන් සුනාමි සහන මණ්ඩලය මගින් ප්‍රභාකරන්ට වෙරළ

තීරය පාවාදීමට රැහැනිව ගිය කළත්, සෝම හිමියන් අපවත් කළ අවස්ථාවේදීත් භික්ෂූන්වහන්සේ දේශපාලනයට පිවිසීම සඳහා 2004 දී ඓතිහාසික තීන්දුවක් ගත්විටත්, ඔහු ඒ අභියෝග ගිහියෙකු ලෙස භාර ගත්තේය. සිංහල භික්ෂුවගේ අභිමානය රැකදීම සඳහා ජාතික අරමුණු ජයගැනීම සඳහා උපරිම ලෙස කැප වූයේය.

පොතපත ලියන ලේඛකයෙකු වීම කෙතරම් අපහසු කරුණක්දැයි දන්නේ ඒවා ලියන්නන් පමණි. සමහර මැති ඇමැතීන් පතපොත ලියවාගන්නේ අනුන් ලවාය. චම්පික රණවක ඒ අරුතින් ගත්කළ පරිපූර්ණ ලේඛකයෙකි. ඔහු ලියා ඇති පතපොත හා ලේඛනවල නාම ලේඛනය බැලූවිටම පුදුම සිතේ. දර්ශනය, ජාතික උරුමය, පරිසරවාදය, කෘෂිකර්මය, බලශක්තිය, නූතන විද්‍යාව හා තාක්ෂණය, ත්‍රස්තවාදය හා ජාතික ආරක්ෂාව, අනාගත ලෝකය ආදී විවිධ මාතෘකා ඔස්සේ ඔහු ලියා ඇත. ලියූ දේ ක්‍රියාත්මක කිරීමට කැපවීම ඔහුගේ සුවිශේෂත්වයන්ය. 1999 දී ත්‍රස්තවාදය මැඩපවත්වන්නට ජාතික සැලසුමක් තැනූ ඔහු 2009 දී එය සාර්ථක කරගන්නට ජනාධිපති මහින්ද රාජපක්ෂ සේනාධිනායක හා ගෝඨාභය රාජපක්ෂ වැනි සෙනෙවිවරුනට සිය උපරිම දායකත්වය දුන්නේය. වසර 1990 දී තිරසර සංවර්ධනය හරිත ආර්ථිකය ගැන දූරදර්ශීව ලියූ පෙරවදන් දශක දෙකකට පසු පරිසර ඇමැති ලෙස ජාතික ජාත්‍යන්තර ලෝකයේ ස්ථාපිත කළේය.

මහා සංඝරත්නයේ අනුශාසනාවෙන් ඇමැති පදවිය ලැබූ දා සිට සිය රාජකාරී අකුරට ඉටුකර අපේ ගරුත්වයත්, රටේ ගරුත්වයත් රැකදුන්නේය. බොහෝ දෙනා ජාතික ධනය කාබාසිනියා කරත් දී සිය අමාත්‍යාංශය දූෂකයන්ගෙන් දූෂණයේ පිරිවැය අයකර ලාභදායී අමාත්‍යාංශයක් කළේය. තමන්ට අයත් නැති කසළ කළමනාකරණය ආදී වැඩට ද කරගසා ආදර්ශයක් දුන්නේය. සුදුසුකමට මුල්තැන දුන්, දූෂණය නැති කාර්යක්ෂම, ආදර්ශමත් අමාත්‍යාංශයක් තැනුවේය. අපව ද මවිත කරමින් ජාත්‍යන්තර පරිසර සමුළුවලදී ද නායකත්වයට පත්වී ගෝලීය නායකයෙක් වූයේය. ගම තුළත්, රට තුළත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළත්, තම සිතිවිලි දර්ශනය නොවලහා එක ලෙස කීවේය. එවා ක්‍රියාත්මක කිරීමට කැපවිය.

චම්පික රණවක සමග හොඳ කලාකරුවෙක් ද ජීවත් වෙයි. හෙතමෙ හොඳ චිත්‍ර ශිල්පියෙකි. හොඳ ගායකයෙකි. හොඳ ගෘහ නිර්මාණ ශිල්පී අදහස් ඇත්තෙකි. පැරැණි පුරාවිද්‍යා වාස්තු නිර්මාණයන්ට අතිශයින් ආදරය

කරන්නෙකි. සීගිරිය හා රිටිගල වාස්තු නිර්මාණ සංරක්ෂණයට ඔහුට අයත් නැති වගකීමක් වුවත් එයට උරදුන්නේය. අභයගිරිය ප්‍රතිසංස්කරණයට හා උතුරු හා නැගෙනහිර ඓතිහාසික භූමි ආක්‍රමණිකයන්ගෙන් බේරාගැනීමට නොපැකිලිව ඉදිරිපත් වූයේය. සිය දේශපාලන දිවිය පවා පරදුවට තබා ක්‍රියා කළේය.

පාඨලී චම්පික රණවක නාමය ගත්කළ පලොල් ශාකයත් (පාඨලී) සපු (චම්පික) ශාකයත් අපට සිහියට නැගේ. ඒ ශාක දෙකම මහා වෘක්ෂයන් ලෙස, අතීත බුදුවරයාණන්ට සෙවණ ලබාදුන් බෝධීන් වේ. පාඨලී චම්පික නම් තරුණ වෘක්ෂය සිංහල භික්ෂු පරපුරට සෙවණ ලබාදුන්, ලබාදෙන වෘක්ෂයකි. එය මහා වෘක්ෂයක් වී රටටම සෙවණ ලබාදෙන වෘක්ෂ රාජයෙක් වේවා යන්නය අපේ අවංක පැතුමයි!

**"උදාර චරිතා නාන් තු වසුධෛව කුටුම්බකං"**
**(ශ්‍රේෂ්ඨ මිනිසුන්ට මුළු විශ්වයම සිය පවුල හා සමානය)**

පුරාවිද්‍යා චක්‍රවර්තී
**එල්ලාවල මේධානන්ද නාහිමි**
නායක, ජාතික හෙළ උරුමය

# ස්තුතිය

අපේ ආරක්ෂක හමුදා 2009 මැයි 18 දා එක් අඟලක් නැර සියලු බිම් ත්‍රස්තවාදයෙන් මුදාගැනීමත් සමග මුළු රටම මහත් ජාතික ප්‍රහර්ශයකට පත්විය. එයින් වැඩියෙන්ම සතුටු වූවන් අතරට මම ද එක්වීමි. ත්‍රස්තවාදය පරාජය කළ යුතුය, පරාජය කළ හැකිය යන්න විශ්වාස කළ ඒ අනුව ක්‍රියා කළ ජීවිත කැපවීම් කළ අතලොස්ස අතරට එක්වීමේ අභිමානය ද ඒ සමග විය. ත්‍රස්තවාදය දෙස නිරීක්ෂකයෙකු ලෙස බලා සිටි බොහෝ පිරිස් අතර, සිටි මාගේ හදවත දැවුණේ 1985 මැයි 14දා ත්‍රස්තවාදීන් විසින්, ජය ශ්‍රී මහාබෝධිය අසල සිදුකළ සමූහ ඝාතනය නිසාය. අපි කාගේත් වෙන වෙනස් දේශපාලන මතිමතාන්තර තිබුණ ද ඒ සියල්ලට ඉහළින් ත්‍රස්තවාදය පැරැදවීම තබාගත යුතුය යන්න මගේ ජීවිත අධිෂ්ඨානයක් වූයේ එලෙසය. එතැන් සිට නොකඩවා ගොඩනැඟුණු බොහෝ ජාතික ව්‍යාපාරවලට මගේ ක්‍රියාශීලී සහාය පළවිය. ජාතික ව්‍යාපාරයන් හා එහි නායකයින් අරමුණට කැප නොවී පටු පුද්ගලික හා දේශපාලනික අරමුණු හඹායන විට අපිම එය නිර්මාණය කරන්නට ඉදිරිපත් වූයෙමු. 1995 දී බිහි වූ ජාතික සංඝ සභාවත්, 1998 දී බිහි වූ ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයත් නවීන ජාතික ව්‍යාපාරයේ මුල්ගල් හා තිඹිරිගෙය විය. සිංහල වීර විදහන හා ජාතික ඒකාබද්ධ සභාව එහි නිම් වළලු ව්‍යාපාරික හා වෘත්තීය සමාජයන් දෙසට ගෙන ගියේය. අපි සයිබර් අවකාශයට ද පිවිස ලොව පුරා ජීවත් වූ දේශප්‍රේමී පිරිස් සංවිධානය කරන්නට වූයේ දශකයකටත් එපිටදීය.

අපි ගොඩනගනා ජාතික ව්‍යාපාරය පිළිබඳ පළමුව සිදුවූයේ කාගේත් නොසැලකිල්ල ඇතිවීමය. අපි වැඩීයනු දකිනා විට උපහාස එල්ල විය. පසුව ඒවා අපහාස විය. ඉන්පසු විරෝධතා හා බාධා කිරීම් ද, චරිත ඝාතන මෙන්ම ශාරීරික ඝාතන ප්‍රයත්නයන් ද ඇතිවිය. ඒ සියල්ල මැඩ අපේ මුඛ්‍ය අරමුණ

ශාක්සාත් කරගන්නට අපි සමත් වූයෙමු. ත්‍රස්තවාදයෙන් අපේ මව්බිම මුදා ගැනීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා හා අපේ රණවිරුවන් වෙත ජාතියේ සියලු ගෞරව පිරිනැමිය යුතුය. ඒ ක්‍රියාදාමයට අපේ ද කැපවීම එකතු කිරීමට හැකිවීම ජීවිතයේ ලද මහත් භාග්‍යයක්කොට සලකමි.

ත්‍රස්තවාදයෙන් අප ලද නිදහස නිසා අතීත මතකයන් අවදිවීම සිදුවිය. මගේ ජීවිතයේ දේශපාලන කාර්යයන් සංක්ෂිප්ත ලෙස ලියා තැබීමේ අවශ්‍යතාවය පිළිබඳව මිත්‍රයින්ගෙන් ලැබුණු උපදේශයන් ද වැදගත් විය. ඒ මේ කුඩා කෘතියේ මූලාරම්භය විය.

මේ රටේ පළමු හරිත දේශපාලන ව්‍යාපාරය වූ “ජනතා මිතුරෝ” බිහිකරත් දී එකී දේශපාලනය අපි හැඳින්වූයේ මවක් සේ සංයත වූ පියෙක් සේ පරිණත වූ, තණපත ද කතා කරනා, දිය දහර ද සිතිවිලි මවනා, ප්‍රඥාව රොද බැඳගන්නා නවාතැන ලෙසය. පසුකාලීනව විවිධ දේශපාලන ව්‍යාපාරවල නියැලුන ද එදා ඒ ඇති වූ කුළුදුල් දේශපාලනයේ හදගැස්ම දිගටම පැවතුණේය. බුදුරජාණන් වහන්සේ දෙසා වදාළ ධර්මය හරයෙන් හඳුනාගත් පසු - අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණය මගේ ලෝක දැක්ම බවට පත්විය. පංචශීලය රැකීම, ජීවිත සදාචාරයක් කිරීමට උත්සාහ ගතිමි. ශ්‍රේෂ්ඨ භාරත පුත්‍රයෙකු- වූ මහත්මා ගාන්ධි ප්‍රකාශ කළ පරිදි ප්‍රතිපත්තියක් නැති දේශපාලනය, සදාචාරයක් නැති වෙළඳාම, වැඩ නොකර උපයන ධනය, සුචරිතවත් නොවන අධ්‍යාපනය, මිනිසත් බවක් නැති විද්‍යාව, හෘද සාක්ෂියක් නැති සැපත, කැපවීමක් නැති ඇදහිල්ල යනාදී වූ සමාජ පාපයන්ගෙන් ද ගැලවීමට ක්‍රිය කළෙමි. අනුන් ද ඉන් ගලවා ගැනීමට උත්සාහ කෙරුවෙමි.

දැන් අපේ රට ආරක්ෂිත අතින් සුරක්ෂිත වී ඇති නිසා අපට අහිමි වූ දේ නැවත ලබාගෙන, අලුත් දේ හිමිකරගෙන ආසියාවේ එකට, ලෝකයේ මුත්තැනට පත්වීමට ක්‍රියා කළ යුතුය. ඒ සඳහා වියත් කැපවුණු ප්‍රඥාවන්තයින්, චින්තකයින්, නිර්මාණශීලී මිනිසුන් මව්බිම ඉල්ලා සිටිනා හෝරාවයි අපි පසු කරමින් සිටින්නේ. ඒ සඳහා මේ රටේ තරුණ පරපුර තුළ සැඟව සිටිනා කුසළතා පූර්ණ ප්‍රඥා අංකුර පුබුදුවාලීම, විකසිත කිරීම රටේ මහා ඉදිරි පිම්මේ මූලික අඩිතාලමයි.

මගේ ජීවිතයේ කුඩාකල සිට අද දක්වා ඉමහත් වේදනා දරමින් මා රැකගන්නට කටයුතු කළ මගේ මැණියන් හා පියාණන් මෙහි දී සිහිපත් කරමි.

එමෙන්ම මගේ අධ්‍යාපනය හා ජීවිතය ගොඩනැගීම සඳහා කැපවීම් කළ මගේ සොයුරු සොයුරියන් ද සිහි කරමි. දුෂ්කර අවස්ථාවල දී මට රැකවරණය දුන් මගේ බිරිඳ හා මගේ ජීවිතයේ සතුට සොම්නස වඩවාලමින් වැඩෙනා මගේ දියණියන් දෙදෙනා ද සිහිකරන්නේ වගකීම් හරිහැටි ඉටු කිරීමට නොහැකි වූ පියෙකුගේ වේදනාවෙනි.

දේශපාලන ජීවිතයේ දී කවදත් මට ගුරුහරුකම් දෙන ජාතික හෙළ උරුමයේ නායක එල්ලාවල මේධානන්ද නාහිමි, ආචාර්ය ඕමල්පේ සෝභිත නාහිමි, කොටපොළ අමරකිත්ති නාහිමි හා දශක දෙකකට අධික කාලයක දේශපාලන මිතුදමක් සහිත අතුරලියේ රතන නාහිමි ගෞරවපූර්වකව සිහි කරමි. එමෙන්ම මේ කෘතිය සකස් කිරීම සඳහා උපදෙස් ලබාදුන් අඩුපාඩු සැකසූ, උදය ගම්මන්පිල, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හා අනුරුද්ධ ප්‍රදීප් සොයුරන් වෙත ප්‍රණාමය පිරිනමමි.

මගේ ජීවිතය පුරා එය දාර්ශනිකව, ක්‍රියාශීලීව ගොඩනගන්නට දායක වූ මේ බිමේ පහළ වූ නම් සඳහන් කළ නොහැකි තවත් සොයුරන් දහස් ගණනක් කෘතඥපූර්වකව සිහිකරමි..

ඉතිහාසය නැමැති මහා ප්‍රවාහයට මුසු වී අනන්ත වූ බාධා මැද එය තරණය කරනා අතරේ විටෙක ඒ මහා ප්‍රවාහයටම ගෙන යන ලෙසට මම ඉඩ දුනිමි. තවත් විටෙක තවත් අය ලවා ඒ මහා ප්‍රවාහය වෙනස් කරලීමට කටයුතු කළෙමි. ඇතැම් විට මමම ඉදිරිපත් වී එය වෙනස් කරලූයෙමි. සියක් ගව්දුර ගෙවී ගියේ එසේය. ඉදිරි මග කෙසේ වේ දැයි අනාවැකි කිව නොහැකි වුවත් නව සිතිවිලි සහ අත්දැකීම් ඉතිහාසයේ ප්‍රවාහය නිර්මාණය සඳහා අවශ්‍ය බව හොඳින්ම දැන ක්‍රියා කරන්නෙමි.

# පටුන


| | |
|---|---|
| **තුරු වදුලු මැදින් පළමු පියසටහන්** | **17** |
| **සරසවිය අරගලයෙහි උරගලයි** | **33** |
| **මම සිතමි, ඒ නිසා මම පවතිමි** | **55** |
| **ජාතික දැහැනට සමවැදුණෙමු** | **73** |
| **සාම අඳුර මැද අරුණළු** | **95** |
| **මහින්දාගමනය** | **129** |
| **අපි දිනුම්** | **153** |

# පළමු දිගහැරුම

## තුරු වදුලු මැදින් පළමු පිය සටහන්

"අපේ අම්මා ළඟ එනවා හාල් සේරු දෙක දෙනවා" කියමින් නිල් පැහැ හැඳගත් ගැහැනුන් හා මිනිස්සු පෙළපාළි ගියහ. "බත් දුන් පියා බුදු වේවා" කියමින් කොළපැහැ හැඳගත් මිනිස්සු පෙළපාළි ගියහ. ඒ මගේ ජීවිතයේ මට මතක මුල්ම දේශපාලන සංසිද්ධියයි. 1970 මහා මැතිවරණයයි. අප එකල ජීවත් වූයේ කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රදේශයේය. සෞඛ්‍ය සේවකයින් වූ මගේ මවත්, පියාත් ඉංගිරිය රෝහලේ සේවය කළහ. පසුව පියා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපිකරුවෙකු ලෙස එක්විය.

අපේ පවුලේ දරුවන් හයදෙනෙකු විය. ගැහැනුන් තිදෙනයි. පිරිමින් තිදෙනයි. මම බාලයා වීමි. මේ නිසාම මට වැඩිමහල් සොයුරු සොයුරියන්ගෙන් එදිනෙදා කටයුතු සඳහා මනා සහායක් ලැබිණි. අප පාසල් ගියේ අප නැවතී සිටි රෝහල් සේවක නිවාස අසල පිහිටි ඉංගිරිය සුමනජෝති විදුහලටයි. උදෑසන පාසල් යෑම සඳහා බස් වියදම් ලෙස සත පහක් මවගෙන් ලද නමුත් එය ඉතුරුකරගෙන පයින්ම රබර් වතු බඩවැටි හරහා පාසල් යෑම වඩාත්ම ප්‍රිය කළෙමි. පාසලට කිලෝමීටරයක් පමණ දුරින් කළුගඟ ගලාගිය අතර, ඝනව වැඩුණු තුරුයායන් සහිත තෙත්බිම් අවට පරිසරය පුරා පැතිරී තිබිණි. මේ නිසා හැකිතාක් දුරට ගස්වැටි, පෙත්මං ආදිය

හරහා පයින්ම ගමන් යෑම මගේ ජීවිතයේ ඉන්පසු ජීවන ශෛලියක් බවට පත්විය.

මා පළමු ශ්‍රේණියේ සිටියදී එක් දිනක් මගේ දෙවැනි අක්කාත්, අයියාත් සමග පාසල් යනවිට කාකි හැඳගත් පොලිස් නිලධාරීහු අවි රැගෙන පාරෙන් මතු වී අපට ආපසු හැරීයන ලෙස කීවෝය. කෙසේ හෝ පාසල් යෑමට සිටි අපව බිය වද්දා ආපසු හැරවීමට ඔවුහු ක්‍රියා කළහ. කළබල වූ මිනිසුන් ද එහෙ මෙහෙ යමින් සිටි අතර, "චේගුවේරා"කාරයන් පොලීසියට පහර දීමට පැමිණ මියගොස් ඇති වගක් වැඩි හිටියන්ගේ කතාවලින් වාර්තා විය. එයට දශකයකට පමණ පසු ජ.වි.පෙ සාමාජිකයන් රතු හැඳගෙන කැට ව්‍යාපාරවල නියැලෙනු දකිනා තුරු "චේගුවේරා"කාරයින් කෙරෙහි මා සිත තුළ තිබුණේ ගුප්ත අඳුරු හැඟීමකි.

රජයේ සේවකයින්ගේ දරුවන්ට සාමාන්‍යයෙන් සිදුවන පරිද්දෙන් අපේ දෙමාපියන්ට ද මාරුවීම් ලැබෙනා විට ඒ සමගම අපට ද ගමන් කරන්නට සිදුවිය. අපගේ ඊළඟ නවාතැන වූයේ බුලත්සිංහලය. මගේ මව බුලත්සිංහල රෝහලේ සේවයට ගියාය. මගේ පියාගේ උපන්ගම වූයේ බුලත්සිංහල බෝතලේගමයි. අපි එහි ස්ථිර නිවසක් තනාගෙන පදිංචි වීමු.

මගේ ජීවිතයේ සියලු පදනම වැටුණේ බෝතලේගම ගමේ ජීවිතයෙනි. අප පාසල් ගියේ කුඹුරු යායන් මැදිනි. ගමේ නැගෙනහිර දෙසින් වූයේ අහස සිඹගත් කඳුවැටි පන්තියකි. ඇතැම් කඳුවැටි සදාහරිත තෙත් වනාන්තරවලින් සිංහරාජයට සම්බන්ධ වී තිබූ අතර, සිරිපා හිම නිල් පැහැයෙන් ඇතැම් උදෑසනක දිස්විය. තවත් කඳුවැටි ඝන රබර් වගාවන්ගෙන් හා සීත දියකඳුරු සහිත තේ වගාවන්ගෙන් පිරී ගොස් තිබිණි. ගමට උතුරින් හා බටහිරින් කළු ගඟ ද එයට ජලය සැපයූ කුඩා අතුඉති ගංගා රැසක් ද ගලාගියේ කුඹුරුයායන් මැදිකරගනිමිනි. ඒ අතර, විල්ලු වැනි නිතර ගංවතුරින් යටවෙන පන් මානා හා තණකොළවලින් වැසී ගිය සාරවත් තෙත්බිම් ගණනාවක් ද විය. ගමේ ගව රංචු බොහෝවිට ලැගුම්ගත්තේ එහිය. අපේ පවුල්වල අයට විශාල මීහරක් රංචු සිටියහ. ගොවිතැනට උදව් වූයේ ඒ සතුන්ය. විශාල කෙත්වතු යායන් මෙන්ම පළතුරු ආදිය පිරුණු කුඩා කැලෑද එමට විය. කුඹුරු කෙටීම, වී වැපිරීම, ගොයම් කැපීම, ගොයම් මැඩීම, වී වේලීම, හාල් කෙටීම ආදී සියලු ක්‍රියාදාමයන් ඉතා ඉක්මණින් අපට හුරුවිය. ඒ දිනවල පැවැති ආහාර අර්බුදය නිසා (1973 - 1975) එළවළු, පලතුරු වැවීම සඳහා නිරතුරුවම අපි යොමු වූයෙමු. නිතරම ගොවිතැන විධිමත් කරගැනීමේ නවක්‍රම අත්හදා බැලීමට ද

අපි පෙළඹුනෙමු. වී වැපිරීම වෙනුවට ගොයම් පැළ සිටුවීම, කන්න තුනක් වැවෙනා වී ප්‍රභේද යොදා ගැනීම, කුඹුරුවල වල් නෙළීම, ජලය යෙදීම ක්‍රමවත් කිරීම, ගොයම් මැඩීමට යන්ත්‍ර යොදාගැනීම ආදියට අප යොමු වූයේ ඉමහත් ආශ්වාදයෙනි. අපේ නිවසේ සිට කිලෝමීටරයක් පමණ ඈතින් වූ කඳුකර රබර් වගාව මිශ්‍රිත ලඳු කැලයක එළවළු වගාවක් අප විසින්, පවත්වා ගන්නා ලදි. ගල්ගුහා, කඩා හැළෙන දොළ පාර හා කුඩා වන සිව්පාවුන් හා කුරුල්ලන්ගෙන් පිරීගිය ඒ කුඩා කැලය, වනය හා වන ජීවිතය පිළිබඳ පුදුමාකාර ආදරයක් ජීවිතයට ඇතුළු කරනා ලදි. මට මතක ඇති කාලය පුරාම කෘෂිකර්මය හා පරිසරය විෂයන්ට සීයෙන් සීය ලැබෙන්නට මේ ප්‍රායෝගික අත්දැකීම ඉවහල් විය.

මට වැඩිමහල් සොයුරු සොයුරින් පස් දෙනෙක් වූ අතර, අප අතර, වයස් පරතරය වසර දහයක් පමණ විය. මෙය මගේ දැනුම වයසට වඩා මුහුකුරා යෑමට බලපෑවේය. මාහට කුඩාකල හෝඩිය පුහුණු කිරීමට පන්සලේ අපේ ඥාති ස්වාමින් වහන්සේ උත්සාහ කළ අවස්ථාවේ "අ" යන්න යැයි කීමට මට අණ කළ විට සිංහල හෝඩියම එක හුස්මට මවිසින් ප්‍රකාශ කර ඇත. මා මහා ප්‍රඥයෙකු විය හැකියැයි විහාරාධිපතින් වහන්සේ අපේ තාත්තාට කියා ඇත්තේ එයින් මවිතයට පත්වීමෙනි. නමුත් එය එතරම් මවිතයට කරුණක් නොවන්නේ මගේ වැඩිමහල් සහෝදරයින් හෝඩිය කටපාඩම් කිරීම අසා සිටීමෙන් එය මගේ මතකයේ පැවැතීම නිසා විය යුතුය.

වැඩිමහල් සොයුරු සොයුරියන් නිසාම මම ඉක්මනටම වැඩිහිටියන්ගේ පතපොත කියවන්නට වීමි. පහේ ශිෂ්‍යත්ව විභාගය වනවිට මැකී ගිය දඩමං, සුදුගෝනා, අඹ යහළුවෝ, වරදත්ත, ගම්පෙරළිය වැනි කතා බොහොමයක් ද සෝවියට් කෙටිකතා සංග්‍රහයන් ද මා කියවා තිබිණි. මා ශිෂ්‍යත්වයේ දෙවැනි විභාගයට රචනාවක් නොව ලිවූයේ කෙටි කතාවකි. මට මතක හැටියට පරිසර වාර්තාවක් ද සහිතව මහ වනය මැද දුර්ලභ ඖෂධ සොයා ගිය තරුණයෙකුගේ ගමනක් එයට පාදක විය. එකල ශිෂ්‍යත්ව විභාග දෙකක් විය. පළමු විභාගය පුහුණු කටයුත්තක් වූ අතර, එහිදී එකම පිළිතුරක් පමණක් වැරැදි සහගත වූ අන්සියල්ලට නිවැරදි පිළිතුරු දුන් සිසුවෙකු සොයා පරීක්ෂකතුමා (ඔහු අපගේ ඥාතියෙකි) අපේ පාසලට පැමිණි අතර, ඒ සිසුවා මම වීමි. පසුව මගේ දියණිය ශිෂ්‍යත්වය සඳහා උනන්දු කරලීමට මා කළේ මේ අතීත කතාව කියා කෙසේ හෝ තාත්තාගේ වාර්තාව බිඳ දමන ලෙස ඇයව උනන්දු කරලීමය.

ගණිතයට මගේ හපන්කමක් ඇතිබව මට වැටහුණේ මා තුන්වැනි ශ්‍රේණියේ සිටියදීය. මා මුහුණ දුන් පළමු ගණිත ප්‍රශ්න පත්‍රයටම මට සීයෙන් සීයක් හිමිවිය. සාමාන්‍ය පෙළ, උසස් පෙළ හා විශ්ව විද්‍යාලය දක්වාම ගණිතය සම්බන්ධ විශිෂ්ඨත්වය මට හිමිවිය. පසුව විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිසුනට උගෙන්වීමට අවස්ථාවක් ලදවිට මා තෝරාගත්තේ ඉංජිනේරු ගණිතයයි. ගණිතය හා ජ්‍යාමිතිය ඉතිහාසය පුරා පරිණාමය වූ ආකාරය පසුව හැදෑරිමි. එමගින් මට ශූන්‍යය, ඍන සංඛ්‍යා සහිත ගණිතය පමණක් නොව විචල්‍යයන්, වීජමයශ්‍රිත, කලණය, ආදී බොහෝ දේ ආසියාවේ නිර්මාණ බව පැහැදිලි විය. ශූන්‍යය අති විශිෂ්ඨ බෞද්ධ දාර්ශනිකයෙකු වූ නාගර්ජුනගේ නිර්මාණයකි. කලණයේ මූලය ගැන එංගලන්තයේ නිව්ටන් හා ප්‍රංශයේ ලයිබ්නිස් අතර, විවාදයක් පවතින නමුදු ඒ දෙදෙනාම එකී දැනුම ජේසුයිට්වරු ආසියාවෙන් පැහැරගත් ගණිත දැනුම කොපි කිරීමෙන් ලබාගත් බව පසුව මගේ සොයාබැලීම් වලින් පෙනී ගියේය. මගේ ප්‍රියතම විෂයක් වූ ජ්‍යාමිතිය බිහිකළේ යුක්ලීඩ් වුවත් භාහික ජ්‍යාමිතිය (Fractal Geometry) නමින් ස්වභාවික ජ්‍යාමිතියක් ද ඇති බව දැනගතිමි. විවෘත විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා භාහික ජ්‍යාමිතිය හඳුන්වාදුන්නේ මා විසිනි. ඒ අතරේ ඉන්දියාවේ නරේන්ද්‍ර පූරි විසින්, නිර්මාණය කළ වේද ගණිතය (Vedic Mathematics) හදාරා ඒ පිළිබඳව ද පාඩම් මාලාවක් සකස් කළෙමි. සිංහලයින්ගේ ජ්‍යාමිතිය හා ගණිතය පිළිබඳ ගැඹුරු පර්යේෂණයක් කිරීමට ඉටාගෙන සිටි නමුත්, දේශපාලනය මගේ කාලය අවුරා සිටියේය.

ශිෂ්‍යත්ව විභාගය සමත්වීමෙන් පසු හොරණ තක්ෂිලා විද්‍යාලයට ඇතුළු වූයෙමි. මගේ පියා කොළඹ කොටුවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කළ නිසාත්, දිනපතා එහි සේවයට පැමිණෙන නිසාත්, කොළඹ පාසලකට මා ඇතුළු කිරීමට ඇතැමුන්ට අවශ්‍ය විය. තාත්තා සමග දිනක් කොළඹ පැමිණ මරදාන ආදී ප්‍රදේශවල තත්ත්වය දැකීමෙන් පසු මට කොළඹ එපා විය. අධික උණුසුම, වාහන තදබදය, දූවිලි කඩසාප්පු හා මරදානේ එකගොඩට ඇති කුඩා නිවාස පන්ති මට මහත් පිළිකුලක් ගෙන ආවේය. නිල් පැහැති කඳු පන්තියක් පාමුල පිහිටා තිබූ තක්ෂිලා විද්‍යාලය ගමේ සුන්දරත්වයෙන් මිදී තිබුණේ නැත. අදටත් තක්ෂිලාව ලංකාවේ මිශ්‍ර පාසල් වලින් පළමුතැන පවතින අතර, එය මට තක්සලාවක්ම විය.

තක්ෂිලාවේ දී මට ලැබුණු පළමු අත්දැකීම තරමක් අමිහිරි විය. එකල සෞන්දර්ය විෂය සඳහා චිත්‍ර, සංගීතය හා නැටුම් විෂයන් අතුරින් එකක් තෝරා ගැනීමට විය. නැටුම් ගුරුවරයා වූයේ රෝහණ බැද්දගේ මහතාය.

එතුමා ඒ කලාවේ විශිෂ්ඨයෙකු වුවත් මට ඒ කලාව පිහිටා තිබුණේ නැත. ඊළඟට මම සංගීත පන්තියට ගියෙමි. සංගීතය සඳහා මට ආසාවක් පැවතුණු නමුත් ඒ ගීත ගායනය සඳහා පමණි. ඒ කාලයේ ගීතයක් කියන්නැයි කී විට මා කියන්නේ බැද්දගේ ගේ "මගේ රත්තරන් හෙලේනා" ගීතයයි. වරක් විද්‍යාල උත්සවයක දී කිසිම පිරිමි ළමයෙකු ගීත ගායනයට ඉදිරිපත් නොවූ විට මා වේදිකාවට නැග අමරදේවගේ "අඩවන් වූ දෙනෙතින්" ගීතය ගැයූවෙමි. අපේ විදුහල්පති වූ වෝල්ටර් සිල්වා මැතිතුමාගේ පැසසුමට මගේ ගායනය ලක්විය. නමුත් මට සංගීත භාණ්ඩ වැයීම මෙන්ම ඉන්දීය රාගධාරී සංගීතය ද ඇල්ලුවේ නැත. සිංහල සංගීතයේ වෙනස හා රසය මා උගත්තේ දශක ගණනකට පසු ලයනල් රංවලගේ සංගීත සැඳැවක් රසවිඳීමෙන් පසුවය. සංගීතය රසවිඳීමට පමණක් සීමාවීම ගැන කනගාටුවක් මට ඇතිවූයේ එදාය.

මා තෝරාගත්තේ චිත්‍ර විෂයයි. ගුරුතුමා අපට, 'මා දුටු සිහිනයක්' නමින් චිත්‍රයක් අඳින්න යැයි කීවේය. ඒ දිනවල චිත්‍ර ලෙස අප හඳුනාගෙන තිබුණේ චිත්‍ර කතාවන්ය. සතුට, සිත්තර පුවත්පත්වල ජනප්‍රිය චිත්‍රකතාවන්හි ආභාෂය අපට නොඅඩුව ලැබී තිබිණි. මා විසින්, එදා අඳින ලද්දේ හෙලිකොප්ටරයක එල්ලීයන තරුණයකුගේ දර්ශනයකි. පසුදා එම චිත්‍රය බැලීමෙන් පසු එය මගේ ස්වයං නිර්මාණයක් බව පිළිගැනීම අපේ චිත්‍ර ගුරුතුමා ප්‍රතික්ෂේප කළේය. ඔහු කීවේ එය වැඩිහිටියෙකුගේ චිත්‍රයක් බවයි. අවශ්‍ය නම් දැන් ඔහු ඉදිරිපිටදීම වුව එය යළි ඇඳ පෙන්විය හැකි යැයි දුකට පත් මම කීවෙමි. ගුරුතුමා මගේ අභියෝගයට ඉඩ දුන්නේය. මා එය ඒ ලෙසම ඇඳ පෙන්වූයෙමි. එදා සිට ඔහු මගේ කුසලතා අගය කළේය. දේශීය විදේශීය චිත්‍ර තරග සඳහා අපව උනන්දු කළේය. චිත්‍ර කතාවල ආභාෂය නිසා මගේ නිර්මාණශීලීත්වය මොට වී ඇති බව ඔහුගේ ද මගේ ද මතය විය. චිත්‍ර සහ ජ්‍යාමිතියට සැමදා මට ඉහළම ලකුණු ලැබිණි. වාස්තු විද්‍යාඥයෙකු වීම කලක් මගේ අරමුණක් විය. මේ නිසාම මගේ ප්‍රියතම කලා මධ්‍යස්ථානය වූයේ සීගිරියයි. මා මුලින්ම ජාත්‍යන්තර ප්‍රදර්ශනයකට ඇන්දේ සීගිරියේ චිත්‍රයකි. සීගිරියේ ගොඩනැගිලි ඒ කාලයේ තිබුණු ආකාරයට ඇඳීමට කීපවතාවක් උත්සාහ කළෙමි. පසුව ජපන් කණ්ඩායමක් සීගිරි කෞතුකාගාරය නිර්මාණය කරනාවිට එහි ගොස් මගේ අදහස ඔවුනට ද කීවෙමි. ඔවුන් කළ පරිගණක නිර්මාණයක් දැන් එහි ප්‍රදර්ශනය වේ. සීගිරියේ යකඩ නිර්මාණය ගැන ද මට ලොකු උනන්දුවක් විය. ඒ පිළිබඳව ලංකාවේ හා ඉන්දියාවේ සිදුකළ පර්යේෂණ කිහිපවිටක්ම නිරීක්ෂණය කළෙමි. ලෝකයේ මුල්ම යකඩ නිස්සාරකයින් ලෙස සිංහලයින්ට නිසි ගරුත්වයක් තවමත් ලැබී නැති නමුත් එය ලබාගැනීම අපේ විද්වතුනගේ වගකීමක් වෙයි. සීගිරි

අභිරහස තවමත් නිසි ආකාරයෙන් නොවිසඳුන ද එහි කලා නිර්මාණ, වාස්තු නිර්මාණ හා භූ නිර්මාණ මගේ ජීවිතයේ වෙන්කළ නොහැකි ආත්මීය බන්ධනයකි.

විශ්ව විද්‍යාලයේ දී නැවත වරක් මගේ චිත්‍ර කුසලතාවය පැන නැගුණේ සරත් මුත්තෙටුවගම මහතා මියගිය දිනයය. එතුමාගේ රුවක් මම විශ්ව විද්‍යාලයේ බිත්ති පුවත්පට ඇන්දෙමි. සාමාන්‍යයෙන් හොඳ චිත්‍ර ශිල්පීන් සිටියේ වාස්තු විද්‍යා පීඨයේ මිස අපගේ ඉංජිනේරු පීඨයේ නොවේ. නමුත්, බොහෝ දෙනෙක් චිත්‍රය අගය කළහ. ප්‍රතිඵලය වූයේ එතැන් සිට විශ්ව විද්‍යාලයේ බිත්ති පුවත්පතේ නිර්මාණකරුවා බවට මා පත්වීමය. මගේ නිසඳැස්, කවි, ලිපි, චිත්‍ර, කාටූන් ආදියෙන් එය නිරතුරුව වර්ණවත් විය. ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය අළලා නිර්මාණය කරනා ලද "සදා සමරමු සොහොයුරෝ" නම් දැවැන්ත ප්‍රදර්ශනයේ (1986) වැඩ වලින් බහුතරයක් සැකසුණේ ද මා අතිනි. ශිෂ්‍ය ව්‍යාපාරයේ අරගලය ගැන ද එක්සත් ජාතික පක්ෂයේ මර්දනකාරී පාලනය ගැන ද දැවැන්ත ප්‍රදර්ශනයක් මම විශ්ව විද්‍යාලයෙන් පිට වූ වහාම නිර්මාණය කළෙමි. (1992) රණසිංහ ප්‍රේමදාස මහතාගේ මැරවරයින් එය මාතර දී පැහැරගෙන විනාශ කළේ වසර ගණනක් අමාරුවෙන් එක්කරගත් වටිනා ඡායාරූප, චිත්‍ර, කලා ආකෘති නිර්මාණ අපට අහිමි කරමිනි. පසුව ඊළාම් අගාධය (1999) නම් ප්‍රදර්ශනයක් ද දෙමළ ජාතිවාදයේ ඉතිහාසය හා ත්‍රස්තවාදයේ ව්‍යාප්තිය පිළිබඳව නිර්මාණය කළෙමි.

ඒ දිනවල ජාතික සංඝ සභාව (1995), ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය (1998) ආදී බොහෝ ජාතික ව්‍යාපාරවල පුවත්පත්, පත්‍රිකා, ප්‍රදර්ශනය ආදිය මගේ මූලිකත්වයෙන් නිර්මාණය කෙරිණි. ආපසු හැරී බලනාකල චිත්‍ර කලාවට මගෙන් සිදුව ඇත්තේ ප්‍රචාරක මෙහෙවරක් පමණක් බව මටම පසුව අවබෝධ විය. වටිනා නිර්මාණයක් මගෙන් සිදු නොවූ අතර, එයට කාලයක් ද මනසක් ද නොවිණි.

වාස්තු විද්‍යාව ද මගේ ප්‍රියතම විෂයක් විය. විශ්ව විද්‍යාලයේ දී බොහෝ වාස්තු විද්‍යා සොයුරෝ ඔවුනගේ කඩිමුඩි ව්‍යාපෘති අවසන් කිරීම සඳහා උපකාර පතා අප වෙත ආවහුය. බාවාගේ මෝසම් වාස්තු ගුරුකුලය (School of Monsoon Architecture) පිළිබඳ උනන්දුව ආවේ එතැනිණි. ඔහුගේ ලුනුගඟ නිවස මාගේ ප්‍රියතම ස්ථානයක් විය. මා පළමුව පාර්ලිමේන්තුවට (2001) ගියවිට දින දෙකක් පාර්ලිමේන්තුවේ ඇවිද එකී අපූරු නිර්මාණය රස වින්දෙමි. ඔහු එය අපට හැඳින්වූයේ "අපි ඔබ සමගයි. නමුත්, මදක් ඉහළින් "

යන තේමාව යටතේය. ඔහුගේ කණ්ඩලම හෝටලයට එරෙහිව පැවැත්වූ උද්ඝෝෂණවල (1992) මම ද පෙරමුණේ සිටියෙමි. එය ප්‍රේමදාස පාලනයට දැක් වූ දේශපාලන අගතියෙන් කළ විරෝධයකි. කණ්ඩලම බාවාගේ කදිම වාස්තු නිර්මාණයකි.

මා විදේශ රටකට ගිය ඕනෑම විටෙක කියන්නේ මාව කලාගාරවලට රැගෙන යන ලෙසය. ප්‍රංශයේ ලූවර් ඇතුළු ලෝකයේ ප්‍රසිද්ධ බොහෝ කලාගාරවලටත්, වාස්තු විද්‍යාත්මක ලෙස වැදගත් මන්දිරවලටත් යෑම මගේ පුරුද්දකි. ඒවායින් මිල දී ගත් වටිනා චිත්‍ර හා ගොඩනැඟිලි සැලසුම් අතිවිශාල ප්‍රමාණයක් දැන් මා සතුව ඇත. තනිව සිට ඒවා නරඹමින් සතුටු වීම තරම් සතුටක් තවත් මට නැත. වරක් එංගලන්තයේ කලාගාරයකින් ඩාවින්සිගේ සියලු නිර්මාණ සහිත කෘතියක් පවුම් තිහකට මිල දී ගතිමි. වසර තුනකට පසු එංගලන්තයේම වෙනත් කලාගාරයක දී මා දුටුවේ එම කෘතියම පවුම් එකසිය පනහකට මිලකර ඇති බවය. හේතුව සොයාබැලීමේ දී මා දැනගත්තේ ඒ දිනවල ඩෑන් බ්‍රවුන් විසින් රචිත "ඩාවින්සි කෝඩ්" නම් කෘතිය අතිශයින් ජනප්‍රිය වීම හේතුව බවය. එය (ඩාවින්සි කෝඩ්) මිල දී ගත් මම එක හුස්මට එය කියැවීමි. එයට පදනම් වූ BBC වාර්තා චිත්‍රපටය ද එය ප්‍රතිනිර්මාණය කළ චිත්‍රපටය ද යන දෙකම පසුව මිල දී ගතිමි. ඩෑන් බ්‍රවුන් කතෝලික පල්ලියේ "ඕපස්දෙයි" නම් රහසිගත සංවිධානය වෙත හෙළා ඇති කලාත්මක බැල්ම බොහෝ කරුණු අප වෙත කියාදෙයි. ඕප්ස්දෙයි සංවිධානය ගැන මුල්ම සිංහල ලිපිය ලිවූයේ මාය. එය මගේ "අල්කයිදා අල් ජිහාද්" කෘතියේ පළවිය. ලන්ඩනයේ තේම්ස් නදිය දකිනාවිට මට මතක් වන්නේ දියේ ගිල්වා මරන ලද ඕපස් දෙයි විසින්ම ගොඩනැගූ රොබර්ටෝ කැල්විගේ පාපොච්චාරණයයි. කැල්වී පල්ලියේ මුදල් ආයෝජනය කළ අතර, එය පසුව හෙළි දරව් කිරීම නිසා ඝාතනය කෙරිණි. යුරෝපයේ රහසිගත සංවිධාන ගැන සෙවීමට මට බොහෝ කුහලක් එමඟින් ඇතිවිය. එතැනින් ඇවිලී ගිය ප්‍රී මේසන්වරු හා ගොතික් ගොඩනැගිලි කලාව ගැන වූ මගේ උනන්දුව තවමත් සන්සිඳුනේ නැත.

වරක් ප්‍රංශයේ වර්සලේස් මාලිගයේ ඇවිදින අතරේ එහි වැසිකිළි - කැසිකිළි බැලීමට මට අවශ්‍ය විය. අපේ  ප්‍රංශ රාජ්‍ය නියෝජිතයාගෙන් ඒ ගැන විමසා සිටි විට ඔහු කීවේ ඒවා ගොවි කැරලි වලින් විනාශ වූ බවකි. මට එය පිළිගත නොහැකි විය. පසුව මට ඇත්ත හෙළිවිය. එනම් ඒ දිනවල පවා (18 වැනි සියවස) ප්‍රංශයේ රජ මාලිගයේ භාවිතා වී ඇත්තේ බාල්දි වැසිකිළි බවය! ජල මුද්‍රිත වැසිකිළිය උතුරු යුරෝපයට අරුමයක්ම විය. එහෙත් වසර දෙදහසකට

පෙර මනාව සකසන ලද ජල මුද්‍රිත වැසිකිළි සුන්දර රිටිගල වන ආරණ්‍යයෙන් හමුවෙයි. අපේ ශිෂ්ටාචාරයේ ඉපැරණි දියුණුවට තවත් සාක්ෂි කුමකට ද? රිටිගල වාස්තු නිර්මාණ මගේ ජීවිතයේ තවත් ආත්මික හමුවීමක් ලෙස සලකමි. එහි පහළ ඇති වනයට යට වූ බන්ඳා පොකුණ නැමති ගලින් කළ වැව මතුකර ගැනීම සඳහා අපගේ හරිත ගම්මාන වැඩපිළිවෙළ යටතේ මූලික වීමට හැකිවීම ඒ ආත්මීය ගමනේ සන්ධිස්ථානයක් ලෙස සලකමි.

මා පස්වැන්නේ ශිෂ්‍යත්වය සමත්වූවිට මට ලැබුණු තෑගී අතර, ලෙනින්ගේ ජීවිත කතාව සහිත "ආලෝකය" නම් කෘතිය ද විය. මම ඉක්මණින්ම සමාජවාදියෙකු වීමි. මුලදී මගේ සිත්ගත්තේ පාවෙල් කොර්චගින්ගේ තරුණ වීරත්වය සහිත "වානේ පන්නරය ලැබූ හැටි" නම් කෘතියයි. ඉන්පසු මැක්සිම් ගෝර්කිගේ "අම්මා" චින්ගිස් අයිත්මතව්ගේ "පළමු ගුරුවරයා" ආදිය කියවන්නට වීමි. මීහායිල් ෂොලහොව් හමුවීමෙන් පසු මට පැරණි සියල්ලන් අමතක වීය. "සැබෑ මිනිසෙකුගේ කතාව" ලෙස වූ කකුල් අහිමි ගුවන් නියමුවාගේ කතාව මා ප්‍රබෝධමත් කළේය. කෘෂි ගමක සමාජවාදය ගොඩනඟන අපූරු කතාවක් වූ "පෙරලූ නැවුම් පස" නම් වූ කෘතිය මා වැඩිම වාර ගණනක් කිය වූ කෘතිය විය හැකිය. ඉංග්‍රීසි දැනුම ලැබීමෙන් පසු "දොන් නදිය  නිසලව ගලා බසී" නම් කොසැක් ජනකතා පෙළ කියවීමි. ෂෝලහොව් කොමියුනිස්ට් ආකෘතියට සිර නොවූවානම් ලොව විශිෂ්ඨතම රචකයෙකු වීමට ඉඩ තිබුණු බව මගේ හැඟීමය.

වයසට ඔරොත්තු නොදෙන මේ කතා කියවීමෙන් පසු මම ඉබේම සමාජයේ විවේචකයෙකු බවට පත්වීමි. නිතරම ගුරුවරුන් හා ගැටුම් ඇතිකර ගත්තෙමි. විශේෂයෙන් සමාජ අධ්‍යයන ගුරුතුමිය (නන්දා අමරතුංග) සමග එකී ගැටුම් ඇතිවිය. 1977 පෙරළියෙන් පසු විවෘත ආර්ථිකය, නිදහස් වෙළෙඳ කලාප ආදිය සමාජ අධ්‍යයන පොතට එකතු විය. මගේ වැඩිමහල් සොයුරන්ගේ පෙළ පොත්වල තිබුණු රුසියානු - චීන විප්ලව පිළිබඳ පාඩම් නව ආණ්ඩුව ඉවත් කළේය. මගේ මුල්ම වාදය ඇවිලුනේ එකී පාඩම් හැලුනේ මන්ද කියාය. ඒ දිනවල සමාජ අධ්‍යයන පාඩම්වල අසනා ප්‍රශ්නවලට මවිසින් පිළිතුරු දුන්නේ මාගේ දේශපාලන මතවල සිටගෙනය. උදාහරණයක් ලෙස නිදහස් වෙළෙඳ කලාපවල වාසි සඳහන් කරන්නැයි අසනා ප්‍රශ්නයට මා ලියන්නේ ඒවා ධනපති රටවල සූරාකෑමේ උපක්‍රමයක් ආදී ලෙසය. මම සැමදාම පන්තියේ පළමුවැන්නා වීමි. ගුරුතුමිය මට අනුකම්පා කර මා නිවැරදි කරන්නට උත්සාහ කළාය. මගේ පාඩම් වැඩ සොයා බැලූ මාගේ ලොකු අක්කා ද නිතර කීවේ තමන්ගේ අදහස් නොව පාඩම්වල උගන්වන දෙය ලියනා ලෙසය.

නැතිනම් විභාගය අසමත් විය හැකි බව ඇයගේ ද අනතුරු ඇඟවීම විය. නමුත්, මාගේ මුරණ්ඩු සිත ඒවා පිළිනොගත්තේය. වෙන වෙනස් ප්‍රශ්න පවා අසන්නට මාගේ සිත පොළොඹවාලූයේය. පොළොවේ උණුසුම ඇතිවන්නේ සූර්යා නිසා නම් කඳුවල උස් මුදුන් සූර්යාට වඩා කිට්ටු නිසා ඒවා වඩා රත්විය යුතු නොවේද? නමුත් ඒවා සීතල ඇයි? පොළොව භ්‍රමණය වේ නම් බැලූමක නැගුනවිට අපට බටහිර රටකට යා නොහැක්කේ ඇයි? මිනිස්සු වඳුරන්ගෙන් පරිනාමය වූවානම් වඳුරන් ඉතුරුවූයේ ඇයි? ආදී ප්‍රශ්න පවා මට පැන නැගිණි. රුසියානු විද්වතෙකු වූ වෛ.පෙරල්මන් විසින්, රචිත ගණිත විද්‍යා විනෝදය, භෞතික විද්‍යා විනෝදය නම් කෘති කියවීමෙන් පසු මගේ බොහෝ කුහුල දනවන ප්‍රශ්න විසඳී ගිය බව ද මතකය. නමුත් පරිණාමවාදය පිළිබඳ ප්‍රශ්නය විසඳුණේ බොහෝ කලකට පසුවය. ඩාවින්ගේ "බීගල් චාරිකාව" පිළිබඳව මූලික සටහන් මා කියවූ අතර, ඔහුට සුදු වර්ගවාදයේ තිබූ බලපෑම හඳුනාගතිමි. ඩාවින් විශ්වාස කළේ සියලු දේ, සරල දේවල සිට සංකීර්ණ දේ බවට පරිණාමය වන බවට වූ බයිබලයේ එන උප්පත්ති කතාවෙන් ජනනය වූ බටහිර සංවර්ධන න්‍යායයි. මූලික ජීවීන්ගෙන්, වඳුරන් ද ඔවුනගෙන් මිනිසුන් ද අභ්‍යන්තර (ජානමය) පරිනාමයක් නිසා බිහිවූ බව කියැවිණි. සම්ප්‍රදායික පල්ලිය එදා ඩාවින්ට විරුද්ධ වූවත් ඔහුගේ දර්ශනයේ හරය තිබුණේ උත්පත්ති කතාවේය. විශ්වය මහා පිපුරුමකින් ඇතිවූවාය කියනා (BIG BANG THEORY) හෝර් කින්ස් ගේ මතය පටන් ගන්නේ ද එමඟිනි. ඩාවින්ගේ කාලයේම විසූ ලමාර්ක් කීවේ සරල දේ සිට සංකීර්ණ දේ දෙසට නියත වූ පරිණාමයක් නැති බවත්, තමන්ගේ අභ්‍යන්තර දෙයකට වඩා ජීවීන් වෙනස් වන්නේ අවට අන් ජීවින් හා පරිසරය අතර, සම්බන්ධය නිසා බවත්ය. එය බෞද්ධ දර්ශනයේ එන පටිච්ච සමුප්පාදය චින්තනයට සමාන රූපී දැක්මකි. මා විශ්වාස කරන්නේ ලමාර්ක් නිවැරදි බවය. මිනිසා වඳුරු කුලයේ වියහැකි නමුත් ඔහුට ද වඳුරන්ට මෙන්ම ඉතිහාසයක් ඇති බවය. වඳුරන් හා මිනිසුන් පරිසරය නිසා වෙනස්වන බවය.

පාසලේ දී මම ක්‍රීඩාවට ද ඇදී ගියෙමි. මම සයවැන්නේ දී පැවැත් වූ මීටර් 75 තරගයේ දී පළමුවැන්නා වීමත්, සමග දිවීම, පැනීම ආදියට යොමුවීමි. නමුත් මට වඩා ක්‍රීඩාවට සමත් අය අපේ පාසලේ සිටියහ. ඔවුන් සමහරෙකු සමස්ත ලංකා මට්ටමේ ශූරයින් වීම නිසා ඔවුනට දෙවැනි වීම මට ලජ්ජාවක් නොවීය. උස පැනීම මගේ ප්‍රියතම ක්‍රීඩාව විය. මගේ උසත් එයට දායක විය. විශ්ව විද්‍යාලයේ පවා එයින් මම පළමුවැන්නා වීමි. සුපුරුදු පරිදි ක්‍රීඩාව ද එහි තාක්ෂණය ද මම හදාරන්නට වීමි. ඕනෑම දෙයක් රස වැටුණු විට එය

අවසානය දක්වා හැදෑරීම මගේ පිස්සුවකි. අන්තිමේදී ලෝක ශූරයින් දිවීමට ආරම්භය ගන්නා අයුරු, අවසානය සඳහා ක්‍රියාකරනා අයුරු, දිගු දුර දිවීම (මගේ ප්‍රියතම ක්‍රීඩාවකි) සඳහා ඉවසීම, සැලසුම් සැකසීම, කණ්ඩායම් ක්‍රීඩාවල න්‍යායන් ආදිය බොහෝ ප්‍රගුණ කළෙමි. වොලිබෝල්, පාපන්දු, එල්ලේ, ක්‍රිකට්, කරාටේ හා කුංෆු ක්‍රීඩාවන් හැදෑරූ නමුත් ඒවායේ ප්‍රවීණයෙක් වීමට අසමත් වීමි. එහෙයින් ක්‍රීඩා ලෝලියෙක් වීමෙන් සැනසුනෙමි.

මගේ ජීවිතයේ ඊළඟ මංසන්ධිය වූයේ 1980 ජූලි වැඩ වර්ජනයයි. අපේ තාත්තා සමසමාජ ව්‍යාපාරයට හිතවත් වාමාංශිකයෙක් විය. ඔහු දෙහිතක් නොහිතා වැඩ වර්ජනයට එක්විය. අම්මා එයට විරුද්ධත්වය පෑවේ රැකියාව අහිමි වුවහොත් අටදෙනෙකුගෙන් යුතු පවුලට අත්වන ඉරණම ගැන සිතා පමණක් නොවේ.
ඇය ඉවෙන් මෙන් සටන පරදින බව දැන සිටියාය. ජේ.ආර්ගේ දේශපාලන ශක්තිය තාත්තලා තේරුම් නොගෙන ඇතිබව ඇයට වැටහිණි. මා සිතන්නේ වර්ජකයින් සොහොනට යවනවා යැයි කියූ ජේ.ආර්ගේ පුරසාරමට වඩා වර්ජනයේ අසාර්ථකත්වයට හේතු වූයේ ගෙවල්වල ගැහැනුන් සිය සැමියන්ට කළ බලපෑමයි. මනරංජන වැඩ වර්ජනය ඛේදවාචකයකින් අවසන් විය. "කෙරුවෝ උන් වැඩ වර්ජන මනරංජන වැඩ වර්ජන" නමින් චිත්‍රයක් ද මවිසින් මියගිය සෝමපාල වෙනුවෙන් නිර්මාණය කෙරිණි. අම්මා නිවැරදි විය. අපි ආර්ථික අතින් අගාධයකට වැටුනෙමු. ජීවිතයේ පළමුවරට බඩගින්න අපට දැනෙන්නට විය. මුල් මාස කීපයේ අපි කෑවේ දවසකට දෙවේලකි. අපට අත්වූ ඉරණම ගැන අම්මා අතිශයින් ශෝකයට පත්වූවාය. තාත්තා ද විස්සෝපයට පත්වූ නමුත් රැකියාව සොයා ආපසු නොගියේය. අපේ ලොකු අයියාගේ උසස් අධ්‍යාපනය කඩා වැටිණි. ලොකු අක්කා වඩා අධිෂ්ඨානශීලී වූවාය, ඇයත් විශ්ව විද්‍යාලයට ගොස් අපවත් එහි ඇදගන්නට උපරිම ලෙස කැපවූවාය. වර්ජනයෙන් හොඳක් ද විය. අපි අපේ අවට කුඹුරු, රබර් වතු, එළවළු කොරටු කරන්නට වීමු. කලක් යනවිට අපේ තත්ත්වය පෙරට ද වඩා සුභවාදී විය. තාත්තාගේ කොළඹ යහළුවන්ට ද උදව් කරන්නට අපි සමත්වීමු.

අපේ රටේ වාමාංශිකයන් ගෙනගියේ නිෂේධවාදී දේශපාලනයකි. සෑම දෙයකටම විරුද්ධ වීම, විරෝධතා පැවැත්වීම, සටන් පාඨ කීම, කඩාකප්පල් වැඩ කිරීම ඒ සම්ප්‍රදායයි. ඩී.එස්. සේනානායක ගොවි ගම්මාන උතුරු හා නැගෙනහිර පිහිටුවන විට ඔවුන් ගැමියන්ට මැලේරියා උවදුර ගැන කියා

බියකරමින් බාධා කළෝය. ඩී.එස්.ගේ පදවිය, මින්නේරිය, කන්තලේ, ගල්ඔය ගම්මාන නොවන්නට වේලුපිල්ලේ පහසුවෙන්ම දෙමළ ඊළම පිහිටුවන්නට ඉඩ තිබිණි. අනෙක් අතින් වාමාංශිකයන් ද මැදිහත් වී එකී ක්‍රියාදාමය ශක්තිමත් කර වන්නිය හා මඩකළපුව ද ගොවි ගම්මාන වැටකින් ශක්තිමත් කළානම් දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදයකට ඉඩක් ඇති නොවන්නට ඉඩ තිබිණි. වාමංශිකයන්ගේ නිෂේධාත්මක මනස ඒ ජාතික වැයම අවුල් කළේය. බණ්ඩාරනායක මහතා නවීකරණය ලබාගැනීම සඳහා ජනසතු ව්‍යාපාර බිහිකළ විට වාමංශිකයන් කළේ වැඩ වර්ජන රැල්ලක් ඇතිකිරීමය. කොළඹ වරායට, ගුවන් තොටුපලට, බැංකු පද්ධතියට, අන්තර්ජාතික නාවික, ගුවන්, මූල්‍ය කේන්ද්‍රයක් වීමට තිබූ අවස්ථාව එයින් විනාශ කෙරිණි. වාමංශික අදහස් මත දියත් වූ 1971, 1987-1989 කැරැලිවලින් ද සිදුවූයේ අතිශය වටිනා ගැමි තරුණ ජීවිත විනාශ වීමයි. ඒ කැරැලිවලින් ඉතුරු වූවන් පසුව සිය සමාජ ජීවිතයේ දී සිදුකර ඇති කාර්යභාරයන් සලකාබැලීමේ දී මළවුන් ජීවත්වූවානම් රටට කුමන ප්‍රයෝජනයක් අත්වේදැයි සිතාගත හැකිය.

වාමාංශිකයන්ගේ මේ නිෂේධාත්මක ආකල්ප මෙන්ම ඔවුන්ගෙන් සාධනීය ක්‍රියාවන් ද සිදුවිය. ගමේ, රටේ පවුල් කීපයකට සීමා වී තිබූ "බලය" ප්‍රජාතන්ත්‍රවාදීව බෙදාහරින්නට වාමංශිකයන්ගේ ක්‍රියාවන් ඉවහල් විය. එමෙන්ම දුගී, නූගත් ජනයා මරව, මරවා වැඩ ගැනීමේ සම්ප්‍රදායන් වෙනස්කරන්නටත් තරුණ සිත්වලට පරාර්ථකාමීත්වය ගෙන එන්නටත් ඔවුනට හැකිවිය. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය, නිදහස් ඡන්ද ක්‍රමය මෙරට භික්ෂූන් වහන්සේලා හා වාමාංශිකයින් දිනාදුන් වටිනා සම්ප්‍රදායන් විය. සමාජයේ පහළම කොටස්වලට සමාජ නායකත්වය කරා යන්නට එමඟින් පිටුබලයක් ලැබිණි.

1980 වැඩවර්ජනය වනවිට මා සිටියේ අපො.ස.(සා.පෙළ) විභාගය සඳහා සූදානම් වෙමිනි. වැඩවර්ජනය මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් විය. දේශපාලනය මගේ අනාගත ගමන්මග ලෙස තෝරාගන්නට මට බලකෙරුණේ ඒ සිදුවීම නිසාය. එකල මාගේ දේශපාලනය ඉතා පටු එකක් විය. එනම් කවර හෝ මගකින් ජේ.ආර්. ජයවර්ධන අවසන් කිරීමයි. මගේ ජීවිතයේ පසුකලකදී ජේ.ආර්ගේ පුත්‍රයා වූ රවී ජයවර්ධන සහ මුනුබුරන් වූ රුක්ෂාන්, ප්‍රදීප් හා අම්රික් (ඔවුන් සියලුදෙනා හොඳ පරිසර වේදීන්) හමුවන විට සිත යට මහත් ලජ්ජාවක් අතීත ජයවර්ධන කෙරේ වූ වෛරය විසින්, උපදවනු ලැබූ බව මතකය. පසුව ජේ.ආර් ගැන වූ හාවඩ් හිගින්ස් හා කිංස්ලි ද

සිල්වා ලියූ දැවැන්ත නිබන්ධනය (ලංකාවේ දේශපාලඥයෙකු ගැන මා කියවූ හොඳම චරිතාපදානය) කියවූ විට ජේ.ආර්. විසිවෙනි සියවසේ ලාංකීය දේශපාලකයා ලෙස හඳුනා ගතිමි. ඔහුට තරුණ වියේදී බලය ලැබුණා නම් මහළුවියේදී ඔහු කළ බරපතල වැරදි දෙක එනම් සැලසුමකින් තොරව විවෘත ආර්ථිකය හඳුන්වාදීම හා ඉන්දියාව දෙමළ ත්‍රස්තවාදය දෙසට තල්ලු කිරීම සිදු නොවන්නට ඉඩ තිබිණි.

සාමාන්‍ය පෙළ සමත්වීමෙන් පසු විද්‍යාව කළයුතු ද කලාව කළයුතු ද යන්න ගැන යම් දෙගිඩියාවකට මැදිව සිට පසුව විද්‍යා අංශය තෝරා ගතිමි. කුඩාකල සිටම සතුනට කිසිදු හිංසාවක් කිරීමට මට නොහැකි විය. මා කුඩාකල කුරුල්ලෙකු අපේ ජල ටැංකියේ මැරී ඇති බව දැක අතිශය වේදනාවට පත්වුනෙමි. කැරපොත්තන්, මීයන් කපන සත්ව විද්‍යාව මට එපා විය. කුතර්කයට බර ගණිතය, ජ්‍යාමිතිය මගේ ජීවිතය බවට පත්විය. එහෙයින් සාමාන්‍ය පෙළින් මා ගියේ උසස් පෙළ ගණිත අංශයටය. එහිදී මා ආශාවෙන් ශුද්ධ ගණිතය, ව්‍යවහරික ගණිතය හා භෞතික විද්‍යාව උගත්තෙමි. රසායනික විද්‍යාව උගෙන ගැනීමට මට උනන්දුවක් නොවීය. මේ එකම විෂයක් හෝ විධිමත්ව හැදෑරීමට නොහැකි වූයේ හදිසියේ හෙනයක් මෙන් දේශපාලන ක්‍රියාදාමයක් පතිත වීම නිසාය. එය නම් අධ්‍යාපන ධවල පත්‍රිකාවයි. (1981) විශ්ව විද්‍යාල සිසුන්ගේ කතාවලට සවන්දීමෙන් පසු ධවල පත්‍රිකා විරෝධයට එක්වීමට අපිත් තීරණය කළෙමු. අපේ පාසලේ උද්ඝෝෂණය අසාර්ථක විය. විදුහල්පතිතුමා හා ගුරුවරු ඉතා හොඳින් අපේ කටයුතු පරාජය කළෝය. නමුත් මේ හා සමග මට අලුත් දේශපාලනයක් හමුවිය. ඒ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයයි.

කලක් ජ.වි.පෙ ඉහළම නායකයෙකු වූ කෙලී සේනානායක මහතා ජීවත්වූයේ හොරණය. ඔහුගේ මල්ලී සමන් අපේ පාසලේ, අපේ පන්තියේ ගජමිතුරෙකු විය. නමුත් ඔහු කිසි විටෙක අපව ජවිපෙට දිනාගැනීමට උත්සාහ කළේ නැත. නිතිපතා "ඇත්ත" පුවත්පත කියවීමෙන් උග්‍ර ජවිපෙ විරෝධියෙකු වූ මා ජ.වි.පෙට නිතර දොස් නැගූයේ 1980 වැඩවර්ජනය පාවාදීම ගැනය. ජවිපෙ පූර්ණකාලීනයෙකු වූ "ප්‍රියන්ත" නම් තැනැත්තෙකු සමග මේ සම්බන්ධයෙන් වූ සංවාදයකට 1982 මුලදී මම අපේ හිතවතකුගේ නිවසට ගියෙමි. ඔහු ප්‍රසන්න අයෙක් විය. මගේ "ඇත්ත පත්‍රයේ" ජ.වි.පෙ විරෝධී තර්කවලට ඔහු සාවධානව ඇහුම්කන් දුන්නේය. ඔහුගේ ප්‍රතිතර්ක ද මා සිත්ගත්තේය. හවස් වූ විට වෙනත් දිනයක සාකච්ඡාව සඳහා දින නියම කරගත් අතර, ඔහු දහවල් කෑම ගැනීමට පටන්ගත්තේය. ඒ වනවිට වේලාව සවස හතර පසුවී තිබිණි. ඒ

ඇයිදැයි විමසූවිට ඔහු කීවේ ඔහු දවසකට කන්නේ වේල් දෙකක් පමණක් බවය. ඔහු එදා කෑවේ කිරිහොඳි හා සම්බෝල සමග කැකුළු බත්ය. මට වහාම වසර දෙකකට පෙර අපි විඳි දුක් මතක් විය. කොල්වින් ආර් ද සිල්වා (අපේ අල්ලපු ආසනයේ අගවත්තේ හිටපු මන්ත්‍රී) ඇතුළු වාමංශිකයින්ගේ ජීවිත මතක් විය. මගේ හද උණුවිය. මම මුලින් ප්‍රියන්ත සහෝදරයාගේ පාක්ෂිකයෙකු වී පසුව ජවිපෙ පාක්ෂිකයෙකු වීමි.

1982 දී රෝහණ විජේවීර මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ විට අපි ඔහුට සහාය පිණිස ගෙන්ගෙට යන්නට වූයෙමු. එහෙත් මාගේ යටිහිත කිව්වේ ජේ.ආර්. පරද්දන්නට නම් ශ්‍රී.ල.නි.ප - ජ.වි.පෙ එකතුවිය යුතු බවය. නමුත් අපි වෙනත් පක්ෂවල අය සමග වාද කරමින් ජ.වි.පෙ ප්‍රතිපත්ති නිවරදි බව පෙන්වන්නට උත්සාහ කළෙමු. වරක් නව සමසමාජයේ ජයතිලක කම්මැල්ලවීර මහතා සමග ද පාසල් සිසුවෙකු ලෙස විවාදයට එළැඹුණු බව මතකය. අප මෙන්ම අපේ මත ද බොහෝ තරුණ විය. මැතිවරණයෙන් ජවිපෙ තුන්වැනි තැනට පත්විය. ලැබුණු ඡන්ද ප්‍රමාණය ගැන ජවිපෙ ක්‍රියාකාරීකයන් කළකිරුණු නමුත් ජ.වි.පෙ ගැන නොදැන සිටියවුන් නම් පුදුමයට පත්විය. ඒ මැතිවරණයේ දී ප්‍රථමවරට මට දෙමළ ඊළාම් අරගලය ගැන දැනගන්නට ලැබිණි. අප කුඩාකල දෙමළ ත්‍රස්තවාදීන්ගේ ජායාරූප ආදිය බිත්තිවල ප්‍රදර්ශනය කර තිබුණු අතර, පුවත්පත්වල ඝාතන හා ගිනි තැබීම් පිළිබඳ වාර්තා පළවිය. ඒවා මට දැනුණේ කව්බෝයි චිත්‍රපටවල එන ෂෙරීෆ් හා දඩයම්කරු අතර, ගැටුමක් ලෙසය. දෙමළ ජනයාට ස්වයං පාලනය ලබාදීම ජවිපෙ ප්‍රතිපත්තිය බව මට දැනගන්නට ලැබිණි. එහි යම් අමුත්තක් දැනුණු නමුදු ඒ ගැන පුළුල් සොයාබැලීමකට මා පෙළඹුණේ නැත. ඒහා සමගම උසස් පෙළ විභාගයට සූදානම් වන්නට සිදුවිය. පාඩම් වැඩ ගැන මගේ අවධානයක් තිබුණේම නැත. සාමාන්‍ය පෙළ විභාගය වැඩ වර්ජනය නිසාත්, උසස් පෙළ විභාගය ජනාධිපතිවරණය (1982) ජනමත විචාරණය හා ජූලි කලබල (1983) නිසාත් අවුල් විය.

අපේ ගමට අල්ලපු ගම වූයේ හල්වතුරය. එහි විශාල තේ වත්තක් විය. එහි 70 දශකයේ දී දෙමළ පවුල් විශාල ගණනක් සිටියහ. ඔවුහු බොහොමයක් අප සමග පාසල් ගියහ. අපේ ගොවිතැන් වැඩට හවුල් වූහ. නමුත්, සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම (1964) හා පූරි සැලැස්ම නිසා ඔවුන් බොහෝ දෙනෙක් ඉන්දියාවට ගියහ. වරක් එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දිවා ආහාර සංග්‍රහයක දී (2007) අන්ක්ටැඩ් (UNCTAD) සංවිධානයේ විධායිකා ලක්ෂ්මී පූරි මාහට හමුවිය. ඇය පූරි සැලැස්ම දියත් කළ ඉන්දියානු මහකොමසාරිස්ගේ දියණිය වූවාය.

අපේ ගමේ හිත මිතුරන් ඉන්දියාවට යැව්වේ ඇයගේ පියා විසින් බව මම ඇයට කීවෙමි. ඇය ලංකාවේ සුන්දරත්වය සිංහල ශිෂ්ටාචාරයේ දියුණුව ගැන වටිනා අදහස් කීපයක් පළ කළාය.

පූරි සැලැස්ම නොවන්නට ලංකාවේ දෙමළ ප්‍රශ්නය තවත් උග්‍ර වන්නට ඉඩ තිබිණි. 1977න් පසු අපේ ගම්වල වතු යායවලින් ඉන්දියාවට යවනු ලැබූවන් බොහොමයක් නතර වුණේ වන්නියේ යුද ගම්මානවලය. ගාන්ධියන්, ටී.ආර්.ආර්.ඕ., රෙඩ්බානා හා සර්වෝදය එක්වී වේලුපිල්ලේට මේ දෙමළ දරුවන් පූජා කළෝය. අනෙක් අතින් ඩික්සිත් (1983) ජූලි කලබල වලින් පසු දෙමළ ජනයා භාර ගැනීම ප්‍රතික්ෂේප කළේය. ප්‍රතිඵලය වූයේ ක්‍රමයෙන් සියල්ලන්ට ලංකාවේ පුරවැසිකම ලැබීමය. මෙය බ්‍රිතාන්‍යයන් හා ඉන්දියාව එකී දෙමළ ජනයාටත්, ලංකාවටත් කළ ඓතිහාසික අසාධාරණයකි.

1983 ජූලි කෝලාහලවලට අපේ ගම්වල සිටි යූ.එන්.පී පාක්ෂිකයෝ ද එක්වූහ. නමුත්, ගම්මු සාමූහිකව නැඟී සිට වත්තේ දෙමළ ජනයා රැකගත්හ. එහෙත්, ජේ.ආර්. කළේ ජ.වි.පෙ හා වමේ පක්ෂ තහනම් කිරීමය. මේ අනුව මම උසස් පෙළ විභාගය ලීවේ පාඨමාලාවෙන් යන්තම් අඩක් හමාරකර කලබල ගොඩක් මැද්දේන්ය. හැමදාම ආරංචි වූයේ ජ.වි.පෙ සගයින් අත්අඩංගුවට ගැනීමේ ප්‍රවෘත්තීන්ය. මෙයින් සිදුවූයේ ජේ.ආර් ගැන මා තුළ තිබූ පටු විරෝධය උත්සන්න වීමය. "මූ අපිට දේශපාලනය කරන්න දෙන්නෑ, මූටත් අපි දේශපාලනය කරන්න දියයුතු නෑ" ලෙස එකී විරෝධය උත්සන්න විය.

උසස් පෙළ විභාගයෙන් පසු චිත්‍ර අඳින්නටත්, පතපොත කියවීමටත්, ගොවිතැන් කටයුතුවලටත් මගේ කාලය වැයවිය. මගේ මනසේ හැරවුම් ලක්ෂයක් එහි දී උදාවිය. ඒ ඇතිවූයේ මාටින් වික්‍රමසිංහගේ පොත පත කියවීමත් සමගය. විශේෂයෙන් ඔහුගේ "සෝවියට් දේශයේ නැගීම" නම් කෘතිය කියවීමත් සමග මාක්ස්වාදය ගැන මගේ තිබූ විශ්වාසය පළුඳු විය. සමාජවාදයට එකම මග මාක්ස්වාදය නොවන බවත්, බුදු දහමේ එන සාංඝික දැක්ම එයට යොදාගත හැකි බවත්, මට අවබෝධ විය. මේ ගැන මම ජ.වි.පෙ ඉතුරු වී සිටි නායකයින් සමග කීවෙමි. නමුත්, ඔවුන් සිටියේ එවැනි මතවාදවලට ඇහුම්කන් දිය හැකි තත්ත්වයක නොවේ. විනාශකාරී මර්දනයත් හා විසිරී යන පක්ෂයත් සමග පොරබදිමිනි. ජ.වි.පෙ පීඩාවට පත්ව ඇති මොහොතේ එහි මතවාදය වැරැදි වූවත් එය හැර නොයා යුතු බව ඉටාගත්තෙමි. එහෙත් වැඩි වැඩියෙන් මාක්ස්වාදී නොවන පතපොත කෙරේ අවධානය යොමුකරවූයෙමි. ඩොස්ටොව්ස්කිගේ 'අපරාධය හා දඬුවම'

ටෝල්ස්ටෝයිගේ "ඇනා කැරනිනා" හා "යුද්ධය හා සාමය", සිලෝන්ගේ "ලූකා" ආදී නවකතාවන් මා ගෙනගියේ වඩාත් විවෘත වූ මිනිසත්කමක් කරාය. කේ. ජයතිලක හා සයිමන් නවගත්තේගමගේ කතාවන් ද මගේ මනස වඩාත් පුළුල් කළේය. මම මාක්ස්වාදයෙන් සම්පූර්ණයෙන් කැඩී වෙන්වූයෙමි. (1984) ජ.වි.පෙ දියැවී යැමත් සමග අභ්‍යන්තරයේ වූ මූල්‍ය වංචා, දුෂ්චරිත ක්‍රියා, බියගුළු පාවාදීම් ආදිය ද කරලියට ආවේය. මගේ මුල් ගුරුවරයා වූ ප්‍රියන්ත ද පක්ෂ නායකයින් පිළිකුල් ලෙස විවේචනය කර පක්ෂය හැර ගියේය. ඉන්පසු වරක් මා හමුවන්නට අපූරු පුද්ගලයෙකු ආවේය. ඔහු පසුකලෙක රටක් බිය වැද්දූ සන්නද්ධ ව්‍යාපාරයක අණදෙන්නා වූ සමන් පියසිරි ප්‍රනාන්දු විය. ඔහු අපේ ගමට අල්ලපු ගම වූ පෝරුවෙදණ්ඩ ප්‍රදේශයේ අයෙක් විය. "කොට සමන්" ලෙස ප්‍රචලිත ඔහු පක්ෂය වැටී ඇති තැනින් ගොඩ ගැනීම ගැන මට ආවේගශීලී දේශනා කීපයක්ම කළේය. ඉන්පසු ඔහු මට කැලණියේ උපාලිවත්, ඔහුගෙන් පේරාදෙණියේ ඉඩමේගමත් හඳුන්වා දුන්නේය. ආනන්ද ඉඩමේගම වඩාත් සුහදශීලී මිත්‍රශීලී අයෙක් වූ අතර, ඉංජිනේරු සිසුවෙකු ද විය. පසුව විශ්ව විද්‍යාලයේදී දේශපාලනය කිරීමට මේ මිතුදමද ඉවහල් විය.




ශක්තියම
සමගියේ
වඩා
ව්ලදිමර්


වස්න වැස්ස
අවුලන් ගිනි


මනරංජන • වැඩවර්ජන





## දෙවැනි දිගහැරුම

# සරසවිය අරගලයෙහි උරගලයි

**කො**තරම් අපිළිවෙළට විභාගය කළත්, උසස් පෙළ මා සමත් වූයේ කළුතර දිස්ත්‍රික්කයේම පළමුවැන්නා ලෙසයි. මට ශිෂ්‍යත්ව කීපයක්ම ලැබීමට නියමිත වූවත් මගේ ආඩම්බරකම විසින්, ඒවා ප්‍රතික්ෂේප කෙරිණි. එයින් සිදුවුණේ අම්මාටත්, අක්කාටත් මා බරක් වීමය. මම මොරටුවේ ඉංජිනේරු පීඨයට ඇතුළත් වූයෙමි. ඉංජිනේරු පීඨයට මා ගිය පළමු දවස අද මෙන් මට මතකය. මගේ පුරුද්ද වූයේ කොපි පොත හෝ ෆයිල් කවරය දෙකට නවා කලිසම් සාක්කුවේ දමාගෙන යෑමය. මා පළමු දවසේම විශ්ව විද්‍යාලයට ගියේ ඒ ලෙසය. ඇතැම් ජ්‍යෙෂ්ඨ සිසුන් නවකයින්ට බාධා කිරීම සඳහා පෙළ ගැසී සිටි අතර, මට කිසිදු බාධාවක් වූයේ නැත. නවකයින්ගේ ඉංග්‍රීසි දැනුම සඳහා විභාගයක් පැවැත්වුණු අතර, විභාග ශාලාව සොයා ගන්නාවිට හොඳටම පමා වී තිබිණි. එහි දී මට දැනගන්නට ලැබුණේ මුළු පාඨමාලාවම පවත්වන්නේ ඉංග්‍රීසියෙන් බවය. එවකට මගේ ඉංග්‍රීසි දැනුම තිබුණේ බොහෝ දුර්වල තැනකය. අප, සිංහලෙන් වසර 12ක් අධ්‍යාපනය ලබා තිබිණි. මෙය මහත් අසාධාරණයක් බව මට වැටහිණි. කැරැලිකාරී ලෙස නැගී සිටින්නට අවශ්‍ය පළමු පසුබිම පළමු දිනයේදීම ගොඩනැගිනි. විභාගය ලියා එළියට එන මාව ජ්‍යෙෂ්ඨයින්ට හසුවිය. ඔවුන් මට කලින් බාධා කිරීම් කර නැත්තේ මා ජ්‍යෙෂ්ඨයෙකු ලෙස සිතාය. මගේ උසත්, කිසි පැකිලීමක් නැති ගමනත්,

සාක්කුවේ ෆයිල්කවරය දමාගෙන යෑමත්, ඒ වැරැදීමට හේතු විය. මටත්, නවකවදය ලැබිණි. එය බරපතල දෙයක් නොවූවත් නවක වදය තුරන් කිරීමට එය මට අධිෂ්ඨානයක් විය. පසුව මට පෙනී ගියේ නවක වදයට යොමුවන්නේ වෙනත් කිසිම හැකියාවක් නැති, ලිංගික හෝ පන්ති පීඩනයන් සහිත පුද්ගලයින් බවය. අපි දෙවන වසරට පා තබනා විට පෞද්ගලිකවම ගොස් නවකයින් රැක්කෙමු. මා හා සමාන අදහස් දරනා බොහෝ ජ්‍යෙෂ්ඨයින් ද සිටිනා බව මට අවබෝධ විය. අපේ උත්සාහය තරමකට සාර්ථක විය. මා සිතන්නේ අද දක්වා මොරටු ඉංජිනේරු පීඨයේ නවක වදය අතිශය සීමාකාරී එකක් බවය. නමුත්, ජයවර්ධනපුර, කැලණිය, රුහුණ වැනි විශ්ව විද්‍යාලවල මා අත්දැක ඇති සත්‍යය නම් පරපීඩක කාමුකත්වය, පන්ති වෛරය, තමන්ගේ බෝල්ෂෙවික් දේශපාලනයට පුද්ගලයින් දිනාගැනීම, නේවාසිකාගාරවල පීඩක ආඥාදායකත්වයක් පවත්වා ගැනීම ආදිය අරමුණු කරගෙන නවක වදය පවත්වා ගෙන යන බවය. නවක වදය වැළැක්වීම පිටතින් නීති ගෙනඒමෙන් පමණක් නොව විශ්ව විද්‍යාල ඇතුළතින්ම ඇතිවන ව්‍යාපාරයකින් කළ යුත්තකි. බ්‍රිතාන්‍යයේ ප්‍රභූවරුන් සාමාන්‍ය දරුවන් තම විශ්ව විද්‍යාල සම්ප්‍රදායට ඇතුළත් කරගැනීම සඳහා ඇතිකළ සම්ප්‍රදායක් පරපීඩක කාමුකයන්ගේ හා ප්‍රජා පීඩක රතු සහෝදරවරුන්ගේ අතකොළුවක් වීමට ඉඩදිය යුතු නැත.

විශ්ව විද්‍යාලයේ පළමු වසරේ දී මට පෙනී ගියේ මා පමණක් නොව මට පහළින් තවත් අති විශාල පිරිසක් ඉංග්‍රීසිය නිසා දුක් විඳිනා බවය. ඉංග්‍රීසි නොතේරීම නිසා පළමු වසර අසමත්ව ගෙදර ගොස් සාර්ථක ව්‍යාපාරිකයන් බවට පත්වූවන් ගැන ද, ඉංග්‍රීසි නොතේරීම නිසා ගෙදර ගොස් හොඳින් ඉංග්‍රීසි උගෙනගෙනවුත් අතිසාර්ථක දේශීය ඉංජිනේරුවන් වී මහා ජලාශ හා වාරි කර්මාන්ත සුද්දන්ගේ ඇස්තමේන්තුවලින් 1/4කට කළ විශ්වකර්මයන් ගැනද, අපේම විශ්ව විද්‍යාලයේ ආචාර්ය මහාචාර්ය පදවි මෙන්ම විදේශ විද්‍යාලවල ආචාර්ය මහාචාර්ය පදවි ලබාගත්තවුන් ගැන ද මම දනිමි. විශ්ව විද්‍යාලයට ඒමට පෙරත්, පාඨමාලා ඇරඹීමට පෙරත්, පාඨමාලා ඇතුළතත්, ඉංග්‍රීසි බස උගෙන්වීමේ විධිමත් ක්‍රමයක් සකස් කරගැනීමට සහ පළමු වසරේ දී සිංහල-දෙමළ බසින් පැහැදිලි කරගැනීමට ප්‍රමාණවත් උපදේශකයන් ලබාගැනීමට උපරිම සටනක් දියත් කළෙමි. අපේ උපකුලපති වීලි මැන්දිස්, මහාචාර්ය පී.ඒ.ඩී.සිල්වා, මහාචාර්ය ජී.ටී.එෆ් සිල්වා (පසුව උපකුලපති විය) ආදීන් අපේ සටනට සහාය ලබාදුන් අතර, අපට පහළින් පැමිණි සිසුහු ද එයට සහාය දැක්වූහ.

සමහරුන් සිතන්නේ 1956 සිංහල රාජ්‍ය භාෂාව කිරීම නිසා ගම්වලින් පැමිණි අපවැනි අයට ඉංග්‍රීසිය නිවරදිව හැදෑරීමට උසුරුවීමට නොහැකි වූ බවය. 2000 මැතිවරණයේ දී සිහළ උරුමයේ වැඩිම මනාප හා මනාප ප්‍රතිශතය ගත් මා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයා ලෙස පත්නොකළ යුත්තේ විදේශ ජනමාධ්‍ය ඉදිරියේ ඉංග්‍රීසියෙන් කරුණු දක්වන්නට මා අසමත් නිසා බව අපේ හිතවත් මධ්‍යම කාරක සභිකයෙක් ප්‍රකාශ කළේය. නීති විද්‍යාලයේ කටයුතු ද ඉංග්‍රීසියෙන් කළයුතු බවට එවකට අගවිනිසුරු සරත් සිල්වා මහතා කළ යෝජනාව තුළ ගැබ්වූයේ ද විදේශ නඩු තීන්දු කියැවීම හා දේශීය ලෙස ඉංග්‍රීසියෙන් නඩු තීන්දු ලිවීමට හැකියාව ලබාදීම ගැනය. මා වඩාත්ම මවිතයට පත්වූයේ 1988 ජනාධිපතිවරණයේ දී පොදු ප්‍රතිපත්ති සැකැසීම් කටයුතුවලදී ඉංග්‍රීසි ද රාජ්‍ය බසක් වියයුතු බවට ජ.වි.පෙ ඉදිරිපත් කළ යෝජනාවය. ඔවුන්ගේ සාමාජිකයන් හා නායකයින් කිසිවෙකුට ජන්ම ඉංග්‍රීසිය කතා කිරීමට හෝ ලිවීමට නොහැකි බව මම දැන සිටියෙමි. මා පරිසර ඇමැති වූ විට මගේ ජපන්, කොරියන්, සිංගප්පූරු රාජ්‍ය තාන්ත්‍රිකයන් නිතරම මට කීවේ ලංකාවේ දියුණු ඉංග්‍රීසි භාවිතයෙන් විපුල ඵල නෙළාගැනීමට තවමත් අසමත් වී ඇත්තේ අපගේ පටු බටහිර විරෝධය නිසා බවය. පිළිතුරු ලෙස මා ඔවුනට නිතරම කීවේ ඊශ්‍රායලය සිය සියලු විද්‍යාත්මක හා වාණිජ කටයුතු සාර්ථක කරගත්තේ අන් කිසිවෙක් කතා නොකරන හීබෲ බසින් බවය.

සාතිශය බහුතරයක් වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නීතිවේදීන්, කළමනාකරුවන් කටයුතු කරන්නේ සිංහල (හෝ දෙමළ) භාවිතා කරන්නන් සමගය. අපේ "වෙළෙඳ පොළ" සිංහල එකකි. ඉතා සුළු වශයෙන් අපට ඉංග්‍රීසි සමාජයන් හා වෙළෙඳ පොළ හමුවේ. ඉතින් මේ සුළුතරය වෙනුවෙන් බහුතරය බලයෙන් ඉංග්‍රීසියට දැමීම කිසිසේත් සාධාරණ නොවේ. එය ඔවුනගේ ජන්ම අයිතිය උදුරා ගැනීමකි. කෙසේ වෙතත්, අන්තර්ජාතික භාෂාවක් ලෙස අද ලෝකයේම උසුරුවන ඉංග්‍රීසිය ඉගෙන ගැනීමෙන් වාසියක් මිස අවාසියක් නම් නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භාෂා හයක් ඇතත්, බොහෝදුරට භාවිතා වන්නේ ඉංග්‍රීසියම බව ජාත්‍යන්තර සමුළුවල දී මා හට තේරුම් ගිය කරුණකි. ඉංග්‍රීසි යනු හැඳි - ගැරුප්පු වැනිම ඇතැම්විට ප්‍රයෝජනවත් උපකරණයකි. උපකරණය අපේ සිරුර බවට පත්වීමට ඉඩදිය යුතු නැත.

අපේ විශ්ව විද්‍යාල පාඨමාලා ගැන ද යමක් කිව යුතුය. අපි විශ්ව විද්‍යාලයේ දී චන්ද්‍රිකා ගැන, තරංග සිද්ධාන්ත ගැන, රොකට් තාක්ෂණය ගැන ඉගෙන ගන්නා නමුදු රැකියා කිරීමේදී වඩා වැදගත් වන්නේ එකී ඉහළ ඉංජිනේරු දැනුම නොව සේවකයින් කළමනාකරණය කරගැනීමේ හැකියාවයි. මගේ වෛද්‍ය හිතමිතුරන් කියන්නේත් ඔවුන් උගත් දෑ, ප්‍රායෝජනයට ගැනෙන්නේම නැති තරම් බවය. අපි ඉංජිනේරු - වෛද්‍ය ආදී වෘත්තිකයන් බිහිකරන්නේ රටේ අවශ්‍යතා මත නොව බටහිර රටවල සම්මත අනුවය. බටහිර රටවලට උසස් අධ්‍යාපනයට යන්නේ ඉතා සුළු පිරිසකි. නමුත් ඒ සුළු පිරිස වෙනුවෙන් විශ්ව විද්‍යාල පාඨමාලාවන් ද, උසස් පෙළත්, සාමාන්‍ය පෙළත්, බාල අංශයත් සිය පාඨමාලා සකසයි නම් එතැන ඇත්තේ මහා අවුලකි. එපමණක් නොවේ. විෂයෙහි අති දක්ෂයින් සිය උසස් අධ්‍යාපනය සඳහා තෝරාගත යුත්තේ සෛද්ධාන්තික විද්‍යාවන්ය. නමුත් අපේ රටේ වන්නේ වැඩි ලකුණු ගත් සිසුන් ඉංජිනේරු - වෛද්‍ය වැනි ප්‍රායෝගික වෘත්තීන්ට නැඹුරු වීමත්, අඩු ලකුණු ගත්තවුන් භෞතික - ගණිත - ජීව - රසායන සෛද්ධාන්තික අධ්‍යාපනයට යොමු වීමත්ය. මෙය ඒ ක්ෂේත්‍ර දෙකම බිඳ වැටීමට හේතු සාධක වී තිබේ. මගේ හැඟීම නම් උසස් පෙළ හා විශ්ව විද්‍යාල දෙවන වසරේදී පමණ අති දක්ෂයින් තෝරාගෙන ඔවුන් අන්තර්ජාතික මට්ටමට පුහුණු කරනා අතරේ සෙසු බහුතරය රටට ගැලපෙන පාඨමාලාවලට යොමුකළ යුතු බවය.

අප විශ්ව විද්‍යාලයට ඇතුළු වූ මාසයේ දීම ප්‍රබල ශිෂ්‍ය සටනක් ඇවිලී ගියේය. ජේ.ආර්. පාලනය 1983 ජූලි කෝලාහලවලින් පසු ජ.වි.පෙ හා වාමාංශික පක්ෂ සමග ශිෂ්‍ය සභා ද තහනම් කර තිබිණි. ශිෂ්‍යයින් දේශපාලන වශයෙන් එකමුතු වී ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු තනාගෙන තිබූ අතර, ඒවා සඳහා නිල ඡන්ද විමසීමක් නොවීය. 1984 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඇතුළත පොලීසියක් පිහිටුවීමත් සමග ශිෂ්‍යයින් සාමාන්‍ය නීතියට සමානද නැත්නම් උඩින් සිටීද යන්න ගැන විවාදයක් විය. ඉතාලියේ බොලෙඤ්ඤෝ නගරයේ නූතන විශ්ව විද්‍යාල බිහිවන විට එහි තිබූ ස්වාධිකාරය (Autonomy) යන්නෙන් අදහස් වූයේ විශ්ව විද්‍යාල සිසුන් සාමාන්‍ය නීතියට යටත් නොවනා බවය. වැඩිකලක් ඒ සංවාදය පේරාදෙණියේ නොපැවති අතර, බීමතින් සිටි සිසුන් පිරිසක් අත්අඩංගුවට ගැනීමත්, සිසුන් පොලීසිය වටලෑමත්, පොලිස් වෙඩි පහරින් සිසුවෙකු මිය යෑමත්, (පද්මසිරි අබේසේකර) සිදුවිය. (1984) එයට ප්‍රචණ්ඩ ලෙස විරෝධය පෑ කොළඹ විශ්ව විද්‍යාලයේ ද සිසුවෙකු (රෝහණ රත්නායක) මිය ගියේය. එය 1976 දී වීරසූරිය සිසුවා ඝාතනයට එරෙහිව

සිරිමාවෝගේ පාලනයට එරෙහිව නැගුණු සිසු රැල්ල තරම්ම ප්‍රබල ලෙස නැග ආවත්, එයට ජනතා සහායක් නොවීය. 1985 දී පුද්ගලික විශ්ව විද්‍යාල නීතිගත කිරීමටත්, තහනම් කළ ශිෂ්‍ය සහා අහෝසිකර ශිෂ්‍ය සුහසාධන සමිති පිහිටුවීමටත්, එරෙහිව සටන ආරම්භ විය. අපි පෙළපාළි ගියෙමු. මාර්ග අවහිර කළෙමු. වර්ජන කළෙමු. පාසල් සිසුන් එයට ඇද ගැනීමට ක්‍රියා කළෙමු. කම්කරු පන්තිය අවදිකිරීම සඳහා වැඩ පොළවලට ගියෙමු. පුදුමයකට රජය අපට පහරදීම සඳහා යොදාගත්තේ ද ජාතික සේවක සංගමයේ කම්කරුවන්ය. ඒ දිනවල (1989) රත්මලානේ හිරාණි කම්හලේ සේවක අරගලයක් වූ අතර, මාස ගණනක් අපි එයට ද සහාය දැක්වීමට ගියෙමු. අන්තිමේදී කම්කරු පන්තිය අපටත් නොකියා වැඩපළට ගියේය. කම්කරුවන් ගැන මාගේ විශ්වාසය තවදුරටත් බිඳ වැටිණි. කම්කරුවන් සටන් කරන්නේ ආර්ථික වුවමනා සඳහා පමණක් බවත්, දේශපාලන වුවමනා ජයගැනීමට කම්කරු පක්ෂයක් අවශ්‍ය බව ලෙනින් කළ යුත්තේ කුමක්ද? (1905) කෘතියේ කියා ඇති බවත් අපේ සරසවියේ න්‍යායාචාර්යවරයා වූ කැමිලස් සිල්වා (ඔහු ජ.වි.පෙ හිටපු පූර්ණ කාලීනයෙකි) අපට පැහැදිලි කර දුන්නේය. කම්කරුවන්ට ඇත්තේ තමන්ගේ පඩිය වැඩිකර ගැනීම පිළිබඳ ආර්ථික විඥානය පමණක් නම් විප්ලවයක් කිරීමට කම්කරු පන්තිය එක විඥානයකින්  බැඳී පවතින්නේ කෙසේද යන්න මගේ තර්කය විය. පන්තිය වෙනුවට පක්ෂය කැමිලස්ගේ සූත්‍රය විය. මේ තර්ක විතර්කවලින් මාක්ස්වාදය පිළිබඳ මගේ සැකය තවත් වැඩිවිය. ඒ දිනවල බොහෝ විප්ලවකාරී සිසුහු සිය ලියන මේස මත ලෙනින්ගේ එකතු කළ කෘති දොළහ තබාගෙන සිටියහ. මේවා එකින් එක මම කියවන්නට වීමි. මට හැඟී ගියේ ඒවා බොහෝමයක් සනාතනික කරුණුවලට වඩා ඒ අවස්ථාව සඳහා ලෙනින් තනාදුන් සූත්‍රයන් බවය. කම්කරු පන්තිය වෙනුවට කම්කරු පක්ෂය, ධනවාදී විප්ලවය, සමාජවාදී විප්ලවය සමග එකට කිරීම (ට්‍රොස්ට්කිගේ නොනවතින විප්ලවය) වැනි සූත්‍ර කෙසේ හෝ බලය අල්ලා ගැනීම සඳහා ගොඩනගන ලද කතා බව මට හැඟී ගියේය. මා මාක්ස්වාදය හදාරන්නට, හදාරන්නට එයින් වඩ වඩා ඈත්වීම ද සිදුවිය.

1985 මැයි 14 දා ත්‍රස්තවාදීන් අනුරපුර ශුද්ධ නගරයට පහරදුන් අතර, අසරණ උවැසි උවැසියන් 150ක් පමණ ජය ශ්‍රී මහාබෝධිය අසල ඝාතනය කරනා ලදි. මා පසුව පරිසර ඇමැති ලෙස විල්පත්තු උද්‍යානයට ගියවිට (2007) මා දුටුවේ විල්පත්තුවේ සේවකයින් 18 දෙනෙකු ද එදිනම මරාදමා ඇති බවය. අපේ විශ්ව විද්‍යාලයේ ඒ දිනවල දෙමළ බෙදුම්වාදයට හිතවත් දෙමළ සිසුහු ද, දෙමළ ජනයාට වෙන්වී යෑමේ අයිතියක් ඇතැයි කී මාක්ස්වාදී විප්ලවවාදීහු ද සිටියහ.

අනුරපුර ප්‍රහාරය ගැන ඔවුන් සියල්ලන්ගේ අදහස වූයේ ශ්‍රී ලංකා හමුදා අහිංසක දෙමළ වැසියන් ඝාතනය කරනා නිසා මේ ඝාතනය ද එකට එක කිරීමක් ලෙස සැලකිය හැකි බවය. මම එය පිළිනොගනිමි. අනුරපුර ඝාතනය මගේ දේශපාලන ජීවිතයේ තවත් කඩඉම් ලක්ෂයක් විය.

වියට්නාම් හා කොරියා යුද්ධවලදී ප්‍රංශ, එක්සත් ජනපද හමුදා ලක්ෂ ගණන් මිනිසුන් මරත්දී වියට්නාම් හෝ කොරියා විමුක්ති හමුදා ඔවුනට ඒ සඳහා අසාමාන්‍ය හැකියාවක් තිබියදීත්, ප්‍රංශයේ, බ්‍රිතාන්‍යයේ හෝ එක්සත් ජනපදයේ නිරායුධ ජනයා එකට එක කිරීමක් ලෙස මරා දැම්මේ නැත. වේලුපිල්ලේ ප්‍රභාකරන් හා ඔසාමා බින්ලාදන් දෙදෙනාම විමුක්තිකාමීන් නොවී හුදු ත්‍රස්තවාදීන් වන්නේ ඔවුන් නිරායුද ජනයා මරා දැමීම රාජ්‍ය හමුදා සමග යුද්ධයේ උපායක් කර ගැනීම නිසාය.

මෙතෙක් කලක් නිරීක්ෂකයෙකු ලෙස ජේ.ආර්ට පහරදෙන දෙමළ ත්‍රස්තවාදය දෙස යටි සිතින් සතුටුවෙමින් බලා සිටි මගේ දෑස් ඇරුණේය. දෙමළ ත්‍රස්තවාදීන් සටන් කරමින් සිටින්නේ ජේ.ආර් හෝ යූඑන්පීය සමග පමණක් නොව සිංහල වීම නිසා අප සියලු දෙනාම සමග බව පළමුවරට මට ගැඹුරින් තේරුම් ගියේය. එදින සිට ජේ.ආර්.ටත් වඩා වැඩියෙන් මම දෙමළ ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාකරන්නට පටන් ගතිමි. එය දෙමළ ත්‍රස්තවාදය සහමුලින් අතුගෑවී යනතෙක් (2009) මගේ හද තුළ වූ අධිෂ්ඨානයේ ප්‍රමුඛතම අංගය විය.

1985 වසරේදී සිදු වූ තවත් සිදුවීමක් නිසා මා ශිෂ්‍ය දේශපාලනයේ ඉහළටම තල්ලු විය. අපගේ විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ගොඩනැගිල්ල විවෘත කිරීමට එවකට මුදල් ඇමැති රොනී ද මැල් මහතා පැමිණීමට නියමිත වූ අතර, ජ්‍යෙෂ්ඨයින්ගේ කීම මත අපි එයට එරෙහිව සත්‍යග්‍රහයක් දියත් කළෙමු.

රොනීද මැල් මහතා උත්සවයට නොපැමිණි අතර, ආතර් සී ක්ලාර්ක් මහතා අතින් ගොඩනැගිල්ල විවෘත විණි. ප්‍රතිඵලය වූයේ ශිෂ්‍ය නායකයන්ගේ පන්ති තහනම් වීමයි. මෙය කෙතරම් උග්‍රවීද කියතොත් සියලු ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයින්ගේම පන්ති තහනම් වී රැස්වීමක කතාවක් පැවැත්වීමටවත් අයෙක් නැති තරමට තත්ත්වය උග්‍රවිය. පස්දෙනාට වඩා එක්රැස්වීම, කතා පැවැත්වීම, පත්‍රිකා බෙදීම, ආධාර එකතුකිරීම ආදී සියලු ක්‍රියා තහනම් විය. ඇත්තටම අද මෙන් නොව එදා විශ්ව විද්‍යාල සිරගෙවල්වලට සමාන විය. නායකයින්

එළියට දැමීම නිසා පළමුවරට මා කතාවක් පැවැත්වීමි. මා පාසලේදී හෝ වෙනත් ස්ථානයක ප්‍රසිද්ධ කතා පවත්වා නැති අතර, ශිෂ්‍ය නායක ධුර, විවාද කණ්ඩායම් යනාදිය කිසිදා නියෝජනය කර ද නැත. සෑමවිටම මා සිටියේ තිරයෙන් පිටුපසය. එළියේ සිටිනා අය හරියට වැඩේ නොකරන බව අවබෝධ වූ විට කරළියට ඒම මගේ ප්‍රතිපත්තිය විය. විශ්ව විද්‍යාලයේ සිසුන් සහමුලින් මර්දනය කළවිට අන්තිමේ දී නැඟී සිටින්නට මා තීරණය කළේ ඒ නිසාය. මගේ ද පන්ති තහනම් විය. නමුත් කථිකයෙකු, සංවිධායෙකු හා නායකයෙකු ලෙස එතැන් පටන් අපේ විශ්ව විද්‍යාලයේ පමණක් නොව සියලුම විශ්ව විද්‍යාලවල පාහේ පිළිගැනීමක් මා හට ලැබිණි. මෙවැනිම සිදුවීමක් 1996 දී ද විය. තිරයෙන් පිටුපස සිටි මා හට එළියට එන්නට සිදුවූයේ දෙමළ ජාතිවාදී මත දරනා අය සමග වාද කිරීමට සිංහල ජාතිකවාදී මත දැරූවන් පැකිලී ගිය අවස්ථාවේදීය. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ එකී ප්‍රසිද්ධ විවාදය පැවැත්වුණු අතර, මහාචාර්ය තිස්ස විතාරණ (මහාචාර්ය ජී.ඇල්. පීරිස්ටත් ආරාධනා කළමුත් ඔහු සහභාගී වූයේ නැත) එස්.එල්.ගුණසේකර හා මම එයට සහභාගී වූයෙමු. ලංකාවේ සිංහල ජාතික වේදිකාවේ කථිකයෙකු, සංවිධායකයෙකු හා නායකයෙකු ලෙස මා කරළියට ආවේ ද එලෙසය. එය ද අහම්බයක් ලෙසය.

1986 වසරේ දී ඒකාබද්ධ ශිෂ්‍ය සටන් පැවතුණේ නැත. ඒ වෙනුවට දෙමළ බෙදුම්වාදය සම්බන්ධයෙන් තීරක විවාදයක් විශ්ව විද්‍යාලවල හටගත්තේය. ප්‍රධාන වශයෙන් එය මාක්ස්වාදය හා ජාතිකවාදය අතර, ඇතිවූ සංවාදයක් විය. මේ වනවිට මහාචාර්ය නලින්ද සිල්වා, ආචාර්ය සූරිය ගුණසේකර, වෛද්‍ය ගුණදාස අමරසේකර ආදීන් ජාතික චින්තන ප්‍රවාදය ඉදිරිපත් කර පෙරට ගෙනයමින් තිබූ යුගයයි. විශේෂයෙන්ම නලින් ද සිල්වා මහතා විශ්ව විද්‍යාල ගුරුවරයෙකු වූ බැවින්, ඍජුවම ශිෂ්‍ය දේශපාලනය සමග සම්බන්ධ විය. දෙහිතක් නැතිව මාත්, ඔවුන් සමග ජාතිකවාදයට එක්වුනෙමි. එහෙත් මගේ වැඩි අවධානය යොමුවුණේ තාර්කික සංවාදවලට වඩා සංවිධානාත්මක ජාතිමාමක ශිෂ්‍ය බලවේගයක් ගොඩනගා ගැනීම ගැනය. මේ වනවිට ජවිපෙ සිටියේ ඉතා දුර්වල මට්ටමකය. ඔවුනට මතවාදී ලෙසින්, මාක්ස්වාදීනට පිළිතුරු දිය නොහැකි වූයේ මාක්ස් මෙන්ම ලෙනින් ද ජාතීන්ගේ ස්වයං නිර්ණය හෙවත් බෙදී වෙන්වී යෑමේ අයිතිය පිළිගත් නිසාය. මේ නිසා ඊකවරණය පතා ඔවුන් අප පිටුපසට විය.

ඒ දිනවල මම මාක්ස්වාදය හා ධනවාදය යන දෙකම බටහිර දේශපාලන දර්ශන දෙකක් බවත් අපට ගැලපෙන්නේ බුදු දහමට අනුකූල සාංඝික

සමූහවාදය බවත්, පෙන්නා දෙන දීර්ඝ ලිපියක් ජවිපෙ නායකයින්ට ලීවෙමි. එය මගේ ජවිපෙන් නිල වශයෙන්ම ඉල්ලා අස්වීමේ ලිපිය ද විය. (1985) නමුත් විශේෂයෙන් මොරටු විශ්ව විද්‍යාලයේ බලයක් එවකට ජ.වි.පෙට නොවූ නිසාත්, පොදුවේ ඔවුන් ජාතිකවාදය ජේ.ආර්ට එරෙහිව යොදාගැනීමට ඉටාගෙන සිටි නිසාත් ඔවුහු තවදුරටත් අප සමගම එකට සිටියෝය. ජ.වි.පෙ අප ඇසුරු කළ නායකයින් වූ ඩී.එම්.ආනන්ද, රංජිදම් ගුණරත්නම්, ආනන්ද ඉඩමේගම ආදීන් විවිධ කුසලතා සහිත සියලු නායකත්ව ගුණ සහිත පුද්ගලයින් වූ බව ද කිව යුතුය. ඔවුන් නිවැරදි ප්‍රායෝගික ජාතිකවාදීන් වූවානම් මේ රටට බොහෝ සේවයක් වන්නට ඉඩ තිබිණි. විශේෂයෙන් ආනන්ද ඉඩමේගම හෙවත් ධම්මික, දිවි ඇතිතෙක් අමතක කළ නොහැකි සුහද මිතුරෙකු විය.

ජවිපෙ මුහුණ දී තිබූ න්‍යායික ආරවුල විසඳීමට විජේවීර මහතා 1986 මුල දී මධ්‍යම කාරක සභාව අමතන ලිපියක් ලෙස කෘතියක් එළි දැක්වූයේය. (ඊළාම් අරගලයට විසඳුම කුමක්ද? - 1986 මාර්තු - පළමු පිටපත් පොලීසිය විසින් අත් අඩංගුවට ගත් බව වාර්තා විය). එමගින් දෙමළ ජනයා ජාතිකත්වයක් බවත් සිංහලයින් ද ජාතියක් නොව ජාතිකත්වයක් බවත්, ජාතිය නම් ශ්‍රී ලාංකික ජාතිය බවත්, ප්‍රකාශ කරනා ලදි. එහෙයින් මාක්ස් - ලෙනින්ගේ ජාතීන්ගේ ස්වයං නිර්ණය පිළිබඳ අයිතිය දෙමළ ජනයාට යෙදිය නොහැකි බව ප්‍රකාශ කරනා ලදි. දෙමළ බෙදුම්වාදය යොදාගෙන ඉන්දියාව බෙදීමට එක්සත් ජනපදය ක්‍රියාකරනා නිසා ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ සමාජවාදීන් එක්විය යුතු බව යෝජනා විය. සමාජවාදය යටතේ ජාතික පීඩනය ඉවත් වී සුළු ජාතීන්ට ස්වයං පාලනය (Self Rule) ලැබුණු විට ප්‍රශ්නය විසඳෙන බව ද ප්‍රකාශ විය. මුල් කෘතිය දැඩි ඉන්දියානු ගැති එකක් විය. පසුව වාර්තා වූයේ ජ.වි.පෙ ඉන්දියාව සමග සබඳතා ඇතිකර ගන්නට උත්සාහ කළ ද ඔවුන් ඒ වනවිටත්, ජවිපෙ විරෝධී කොටස් සමග සබඳතා ඇතිකරගෙන තිබූ බවය. ඉන්දියාව විසින්, ප්‍රතික්ෂේප කරන ලද ජවිපෙ ඊළඟට දැඩි ඉන්දියානු විරෝධී විය. ඒ සඳහා ඉහත කී කෘතියේ සංස්කරණයක්ද නිර්මාණය විය. ඒ අතරේ ජවිපෙ තෝරාගත් පිරිස්වලට සන්නද්ධ පුහුණුව දෙන්නට ද විය. ජවිපෙට බාධාවක් ලෙස සැලකුවන් ඉවත් කිරීම ද ආරම්භ කරනා ලදි. දැඩි ඊළාම්වාදියෙකු වූ දයාපතිරණ කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතිකවාදීන්ට දේශපාලනය කිරීමට ඉඩ නොදුන්නේය. ඔහු ජ.වි.පෙට නම් කොහාමවත් ඉඩ දුන්නේ නැත. 1986 දෙසැම්බරයේ ඔහු ඝාතනය විය. මා අපේ සියලු හිතවතුනට කීවේ මෙතෙක් කල් සහෝදරත්වයෙන් යුතුව කුමන මතවාද යටතේ වුව එකට සටන්කළ සියලු දෙනා දැන් වෙන්ව ඔවුනොවුන් ගහ

මරාගැනීමට නියමිත බවය. එය ඒ ලෙසම විය. කෙසේ වෙතත්, ප්‍රතිවිරුද්ධ මත සහිතව වූවත් මොරටු විශ්ව විද්‍යාලයේ අපි ගැටුමට මැදි නොවී අනන්‍යතාවය රැක ගත්තෙමු.

තමනට බහුතර බලය නොලැබේ යැයි සිතූ ජේ.ආර්. 1977 මැතිවරණ ප්‍රකාශනයට සර්ව පාක්ෂික වට මේස සාකච්ඡාවක් පිළිබඳ යෝජනාවක් දැම්මේ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ සමග අවබෝධයකිනි. නමුත්, හයෙන් පහක බලයක් ලැබූ ජේ.ආර්. සුපුරුදු ලෙස එය අමතක කළේය. නමුත් 1977 සිට ක්‍රමයෙන් දෙමළ ජාතිවාදී බෙදුම්වාදී ත්‍රස්තවාදය නැගී එද්දී ජේ.ආර්. හැරුණේ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ වෙතටය. 1981 පිහිටු වූ සංවර්ධන සභා එකී දේශපාලන විසඳුම විය. එය පිටුපස එක්සත් ජනපදයත් ඔවුනගේ සුවච ගෝලයන් වූ ලලිත් ඇතුළත්මුදලි හා නීලන් තිරුචෙල්ලමුත් සිටියහ. එදා දිස්ත්‍රික් සංවර්ධන සභා විසඳුම ලෙස පිළිගත් දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ චෙල්වනායගම්ගේ "දැන් ටිකක් පසුව තවත් ටිකක් " යන න්‍යාය යටතේ 1986 වසරේදී පළාත් සභා ක්‍රමය ඉල්ලූහ. ඉන්දීය බලපෑම මේ වනවිට සෘජුව තිබූ අතර, දෙමළ බෙදුම්වාදීන් විවෘතව ඉන්දීය බිමේ පුහුණු කරනා ලදී. එක්සත් ජනපද ඔත්තු සේවා විසින් සපයන ලද පුහුණු කඳවුරුවල ඡායාරූප ඇතුළත්මුදලි විසින් ඉන්දීය නියෝජිතයිනට ලබාදුන් බවට ද වාර්තා පළවිය. දෙමළ ප්‍රශ්නය දඩමීමා කරගෙන ඉන්දියාව, ශ්‍රී ලංකාව සිරකරමින් සිටියේය. එය 1971 දී, නැගෙනහිර පකිස්තානයේ 'මුක්තාභානී' ව්‍යාපාරයට උපකාර කර "බංගලිදේශය" බිහිකළ මෙහෙයුමට බොහෝ සමාන දෙයක් විය. දින දහයක් ඇතුළත ජෙනරාල් මනෙක්ෂෝ යටතේ වූ ඉන්දීය හමුදා ඉන්දිරා ගාන්ධි හා ඉන්දීය බුද්ධි අංශයේ කේ.එන්. කාවෝ ගේ මෙහෙයවීම යටතේ නැගෙනහිර පකිස්තානය යටත් කිරීම පිළිබඳ කතාව (1971 දෙසැම්බර් 06) මා සිත නිතර බියපත්කළ කතාවකි. චීනයේ ප්‍රහාරයන් විසින් ආත්ම විශ්වාසය බිඳගෙන සිටි ඉන්දියාව (ජවහර්ලාල් නේරු මියගියේ චීනය හමුවේ ඇති වූ පරාජයේ වේදනාවෙන් බව ඉන්දිරා ගාන්ධිගේ චරිත කතාව ලියූ පාපුල් ජයකාර් ප්‍රකාශ කර තිබිණි) පාකිස්තානය පරදවා එකී විශ්වාසය දිනා ගත්තේය. ඉන්දිරා පක්ෂ විපක්ෂ සියල්ලන්ගේ "දූර්ගා" දෙවඟන බවට පත්විය. 1984 දී සීක්වරු විසින්, ඒ ඉන්දිරාව ඝාතනය කළ අතර, නැවත ඉන්දියාවට ආත්ම විශ්වාසය අවශ්‍යව තිබිණි. ජේ.ආර්.ගේ මුග්ද රාජ්‍යතාන්ත්‍රික බටහිර ගැතිබව සේවය කළේ ඉන්දියාවේ බිඳුණු ආත්මගරුත්වයටය. රජීව් ගාන්ධි හා ඩික්සිත් වේගයෙන් ශ්‍රී ලංකාවට එරෙහිව ක්‍රියාකරමින් සිටියහ.

පර්තසාරතී හා (සී) ඇමුණුම (Annexure C) මගින් පළාත් සභා ක්‍රමයක් හඳුන්වාදෙන ලදි. ප්‍රතිඵලය ක්ෂණික විය. මව්බිම සුරැකීමේ ව්‍යාපාරය බිහිවිය. එයට ශ්‍රීලනිපයේ හා තහනම් කරනා ලද ජ.වි.පයේ පමණක් නොව සිරිල් මැතිව් වැනි යූඑන්පී නායකයින්ගේ ද, එවකට අස්ගිරි මහානායක ධුරයන් ද පලිපාන චන්දානන්ද මහ නාහිමි වැනි මධ්‍යස්ථ භික්ෂූන් වහන්සේලාගේ ද සහාය පළවිය. දෙහිතක් නොසිතා මම එයට එක්වුනෙමි. සාර්ථක රැලි කීපයක් මහනුවර, නුගේගොඩ ආදී ප්‍රදේශවල පැවැත්විණි. මහත් උදෙ‍්‍යාගයෙන් පෝස්ටර් ඇළවීම, කොඩිවැල් දැමීම ආදියේ සිට එකී රැලිවලට මගේ සහාය පළවිය. ක්‍රමයෙන් නැඟී එන ජාතික රැල්ල කල්තියා දුටු ජේ.ආර්. නුගේගොඩ ප්‍රසිද්ධ රැලියක් තබා පළාත් සභා අකුලා ගත්තේය. ඊළඟට ඔහු ඉතා සූක්ෂම ලෙස ශ්‍රී.ල.නි.පය හා ජ.වි.පෙ අතරත්, භික්ෂු සංඝයා අතරත්, බුද්ධිමතුන් අතරත් භේද ඇති කළේය. මව්බිම සුරැකීමේ ව්‍යාපාරය දෙකඩ විය. සිරිමාවෝ මැතිණිය, බෙංගමුවේ නාලක හිමි, ගාමිණී ඊරියගොල්ල වැනි අය මව්බිම සුරැකීමේ සංවිධානය ලෙසත්, ප්‍රින්ස් ගුණසේකර, දිනේෂ් ගුණවර්ධන, මාදුළුවාවේ සෝභිත හිමි වැනි අය මව්බිම සුරැකීමේ ව්‍යාපාරය ලෙසත්, සංවිධානය වූහ. මම දෙවැනි සංවිධානයට එක්වීමි. ජවිපෙ සහාය ලැබුණේ ද එයටය. කෙසේ වෙතත්, සිංහල ජාතික ව්‍යාපාරයේ භික්ෂු නායකත්වය, දේශපාලන නායකත්වය, බුද්ධිමතුන් ආදීන්ගේ පටු හැඟීම් විශේෂයෙන් පුද්ගල කැපී පෙනීමේ ආශාව ජාතික ව්‍යාපාරයේ ඉදිරිගමනේ ලොකුම බාධාව ලෙස අවබෝධ කරගතිමි. ජේ.ආර්. උත්සාහ කළේ ශ්‍රීලනිප ඉවත්කර ජ.වි.පෙ හුදකලා කිරීම වුවත් සිදුවූයේ ජ.වි.පෙට ජාතික ව්‍යාපාරයේ නායකත්වය ඉබේම ලැබීමය. කම්මැලි ප්‍රභූවාදී ශ්‍රී.ල.නි.ප නායකයින් ඉවත්ව යාමේදී කොන්කර සිටි කෙසේ හෝ කරලියට ඒමට වලිකමින් සිටි ජ.වි.පෙ බඩගිනි වෘකයෙක් මෙන් ජාතික ව්‍යාපාරය ඩැහැගත්තේය. ත්‍රස්ත ක්‍රියා උත්සන්න වෙමින් ඉන්දියාව සිය දකුණු කලාපයේ "දෙමළ බංගලි දේශය" බිහිකරමින් සිටිනා විට ජ.වි.පෙ සිය සන්නද්ධ ක්‍රියාදාමය පියවරයකින් පෙරට ගත්තේය. ඒ පල්ලේකැලේ හමුදා කඳවුරින් අවි පැහැර ගැනීමෙනි. (1987)

1987 අප්‍රියෙල් අවුරුදු නිවාඩුවට මම ගෙදර නොගියෙමි. එයට හේතුව අපව අත්අඩංගුවට ගැනීමට රජය වෑයම් කරනා බවට වූ රාවයයි. අප්‍රියෙල් 18 කිතුල්උතුවේද අප්‍රියෙල් 21 පිටකොටුවේදී ද සමූල ඝාතන සිදුවිය. එය ජේ.ආර්.ට ඉන්දියාව ලබාදුන් ලේ පිරුණු සංඥාවක් විය. මැයි දිනය තහනම් විය. නමුත් අපේ ධෛර්යය එයින් බිඳීමට නොහැකි විය. නාරාහේන්පිට අභයාරාමයේදී අපි මැයි දිනය සැමරුවෙමු. මැයි දිනයට පෙරදා රාත්‍රියේ

අපුරු දෙයක් විය. එදින පේරාදෙණියේ සිට පැමිණි අතුරලියේ රතන හිමියන් හා අපේ විශ්ව විද්‍යාලයේ නිමල් බාලසූරිය අතර බුදුදහම හා මාක්ස්වාදය පිළිබඳ සංවාදයක් ඇති විය. රතන හිමි බොහෝ පහසුවෙන් බාලසූරියව පරාජය කළේය. බාලේ හැඟිම්බර ක්‍රියාකාරීකයෙකු මිස බුද්ධිමය විතර්කයෙකු නොවීය. ඔහු කලක් ජ.වි.පෙට එරෙහි නව ජනතා ව්‍යාපාරය සමග එක්වී පසුව එය අතහැර ජ.වි.පෙ සමග එක්වූ අයෙකි. රතන හිමියන්ගේ තර්ක ශෛලිය මා සිත්ගත්තේය. දශක ගණනක් දිවයන දේශපාලන මිතුදමක් ඇතිවූයේ ඒ නිදි නැති රාත්‍රියේ ඇතිවූ තර්ක විතර්ක නිසාය. රතන හිමියන්ද මා මෙන්ම කම්කරු පන්තියට වඩා භික්ෂූන් වහන්සේට ජාතික සාමාජීය විප්ලවයක් කළ හැකි බව විශ්වාය කළ ඒ අනුව ක්‍රියාකළ ශිෂ්‍ය ක්‍රියාකාරීකයෙකු විය.

මැයි දිනය ලේ විලක් විය. අභයාරාමයේදී ජීවිත දෙකක් බිලිගන්නා ලදී. ජේ.ආර්. ගේ අදහස වන්නට ඇත්තේ තමන් සිංහල ජාතික බලවේග මර්දනයට සූදානම් බව ඉන්දියාවට පෙන්වීම විය හැක.නමුත් ප්‍රායෝගිකව සිදුවූයේ ජේ.ආර්.පැරදවීමට අවි ආයුධ අවශ්‍ය බවට වූ ජ.වි.පෙ මතය දෙසට ප්‍රකෝප වූ සිසුන් ඇදී යෑමය. බොහෝ කලක සිට රංජිදම් වැනි ජ.වි.පෙ ශිෂ්‍ය නායකයින් ප්‍රසිද්ධියේ කීවේ අත් වන වනා පොලිස් වෙඩි පහරට ලක්වීම සඳහා පෙළපාලි ගිය යුගය නුදුරේදීම නතරවන බවය. අවිහිංසාවාදය ඇදහූ අපේ මග ජේ.ආර්.ගේ තුවක්කු මර්දනයෙන් යටපත් විය. තුවක්කුවෙන්ම ප්‍රතිචාර දැක්වීමේ ජ.වි.පෙ මගට නව ජවයක් එයින් සැපයිනි. ජේ.ආර්. නතර කළ හැක්කේ තුවක්කුවෙන් පමණකි යන්න ජේ.ආර්. විසින්ම පෙන්නා දෙන ලදී.

ජේ.ආර්. පළමුව ශ්‍රීලනිපය බිඳ දමා ජවිපෙට ජාතික ව්‍යාපාරයේ නායකත්වය දුන්නේය. ඊළඟට අවිහිංසාවාදී ශිෂ්‍ය ව්‍යාපාරය සන්නද්ධව මර්දනය කර ජවිපෙ සන්නද්ධ අංශයට විපක්ෂය වීමට ඉඩ ලබාදුන්නේය.

1987 ජුනිමස රටපුරා ශිෂ්‍ය නායකයින් අත්අඩංගුවට ගැනිණි.විශ්ව විද්‍යාලය වසා තිබුණු අතර මා සිටියේ නිවසට නොගොසින් මොරටුවේ බෝඩිමකය. බොහෝ දෙනෙක් අත්අඩංගුවට පත්විය. ජේ.ආර්. මේ වන විට ඉන්දියාව සමග එකඟතාවයක් සඳහා ක්‍රියාකරමින් සිටි අතර එයට ප්‍රතිපක්ෂව නැඟී සිටිය හැකිවූවන් කුඩු කිරීමේ උත්සහායක නියැලී සිටියේය. අත්අඩංගුවට පත්වූවන් බේරාගැනීමේ සටන ගැන සිතමින් සිටිනා අතරේ ඉන්දු-ලංකා ගිවිසුමක් එන බව පුවත්පත් වාර්තා කළේය. අපි වහාම සංවිධානය වූයෙමු.

පළමු රැස්වීම විද්‍යාලංකාර පිරිවෙනේ (කැලණියේ) පැවැත්වූ නමුත් එය උපවාසයක් කරා ගෙනයෑමේ උත්සාහය සාර්ථක නොවීය. පසුදින විද්‍යෝදයට (මාලිගාකන්ද) එක්රැස් වී පිටකොටුවේ උපවාසයක් ඇරැඹීම ඊළඟ ඉලක්කය විය. ශ්‍රී.ල.නි.ප නායකයින්ද විහාරමහාදේවී උද්‍යානය අසල උපවාසයක් කිරීමට යන බව වාර්තා විය. එක්වූ මහ සඟරුවන සමග සිංහ ධජය ගෙන කොටුව බලා ඉදිරියෙන්ම ගියේ මාය. කොළඹ නීති පීඨයේ කරුණාරත්නද මා සමග විය. පැය කීපයක් ඇතුළත ශ්‍රී.ල.නි.ප නායකයින්ද එයට එක්වූ අතර මාර්ග අවහිර වී එය දැවැන්ත උපවාසයක් බවට පත්විය. (1989 ජූලි 28) වසර දහතුනකට පසු 2000 අගෝස්තු 14 දා ද ෆෙඩරල් යෝජනාවලියට එරෙහිව පිටකොටුවේ දී ඒ ලෙසටම උපවාසයක් හා විරෝධතාවයක් පැවැත්වීමට අපට සිදුවිය. පළමු සටනේ අත්දැකීම දෙවැනි සටනේ ජයග්‍රහණය සඳහා බොහෝ උපකාරී විය.

ජේ.ආර්.උපවාසය මර්දනය කළේය. වෙඩි ප්‍රහාර මැද අපි විද්‍යෝදය දෙසට පළාගියෙමු. ආරක්ෂක අංශය අප එහි කොටු කරන ලදී. රාත්‍රියේදී අඳුරට මුවාවී අපි කීපදෙනක් එයින් පැනගොස් කොළඹ වෛද්‍ය පීඨයට ආවෙමු. අපට පෙනී ගියේ පොලීසිය කුමන අයුරින් හැසුරුනද හමුදාව විරෝධතාකරුවනට අනතුරක් නොකරන බවය. මගේ තක්සේරුව නම් ජ.වි.පෙට නිසි යුද සංවිධානයක් තිබිණි නම් හමුදාවල සහායයෙන් ජේ.ආර්.බලයෙන් පහකිරීමට වුව හැකියාවක් තිබුණු බවය. නමුත් එය එසේ වූවානම් අනිවාර්යෙන්ම ඉන්දීය හමුදා සමග ලක්ෂ ගණනක් මියයන යුද්ධයක් ඇවිලී යෑමද වැලැක්විය නොහැකි වනු ඇත.

විරෝධතාකරුවන් 147 දෙනෙක් මියගොස් සිටියහ.වෛද්‍ය පීඨ මෘත ශරිරාගාරයේ ඔවුන් සමග ගතකළ දින දෙකක කාලය මගේ ජීවිතය සහමුලින් වෙනස් කළේය. අපේ විශ්ව විද්‍යාලයේ හිතාදර සිසුන් දෙදෙනෙකු වූ ක්ලිෆඩ් පෙරේරා හා නිමල් ලියනගේද මියගියවුන් අතර විය. වතුර පමණක් බොමින් ඇඳිරි නීතිය යටතේ දිනතුනක් මළ සිරුරු සමග ගතකළෙමි. වසර 20කට පසු ක්ලිෆඩ් හා නිමල් නමින් භාරකාර අරමුලක් ගොඩනගන්නට එදා දිවි ඉතුරු කරගත් සොයුරන් සමග එක්වීමේ භාග්‍යයද මට හිමිවිය. මරණය පිළිබඳ බියක් පිළිකුලක් විනිනම් ඒ සියල්ල ඒ ලේ වැකුණු දින කීපය නිසා මැකී ගියේය.

ජ.වි.පෙ සිය ප්‍රචණ්ඩ උද්ඝෝෂණ රැල්ල ඉන්දු - ලංකා ගිවිසුමත් සමග ආරම්භ කළේය. විශ්ව විද්‍යාල දිගටම වසා තැබිණි. පළාත් සභා ක්‍රමය ඇතිකිරීම සඳහා වූ අනපනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වනවිට විශ්ව විද්‍යාල විවෘතව

තිබීම අපට මහඟු අවස්ථාවක් උදාකළේය. අපි එයට එරෙහිව උපවාසයක් ආරම්භ කළෙමු. මොරටුවේ අපේ අවිහිංසාවාදී සම්ප්‍රදාය ජ.වි.පෙට ඉවසුම් දුන්නේ නැත. සන්නද්ධ ක්‍රියාදාමයට එයින් බාධාවක් ඇතිවන බව ඔවුනගේ හැඟීම විය. ඔවුන් සහාය දුන්නේ නැත. ආරක්ෂක හමුදා විසින් වටකරනු ලදුව උපවාසය විසිරී ගියේය. පළාත් සභා මැතිවරණ ආරම්භ විය. ජ.වි.පෙ එකී ඡන්දය වර්ජනය කිරීම සඳහා සන්නද්ධ බලය යොදා ගන්නා ලදී. පළමු පියවරේදීම මම එය විවේචනය කළෙමි. ජනතාවගේ ඡන්ද බලය බියපත් කර නතර කිරීම දරුණු ප්‍රතිවිපාක දෙන සිදුවීමත් බව මගේ හැඟිම විය. නමුත් ජේ.ආර්. කළේ අතට හසුවන සියල්ලන් මර්දනය කරමින් ජ.වි.පෙ සන්නද්ධ ගමන්මග සාධාරනීකරණය කිරීමය.

1988 පෙබරවාරි මස සිදු වූ වැදගත් සිදුවීමක් වූයේ වාමාංශික පක්ෂ එක්සත් සමාජවාදී පෙරමුණ නමින් සන්ධානයක් පිහිටුවීමට අර අදිනා අතරේ ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක විජය කුමාරතුංග මහතා ඝාතනය කිරීමය. ඝාතනයේ ප්‍රවෘත්තිය අසනා විට මා සිටියේ විශ්ව විද්‍යාල කැන්ටිමේ ආහාර ගැනීමට සූදානම් වෙමිනි. විජයට වෙඩි තැබුවා යැයි ප්‍රවෘත්තිය ඇසූ විට කැන්ටිමේ මත දෙකක් ඇතිවිය. විජයට සිනමා ශිල්පියෙකු ලෙස හෝ දේශපාලකයෙකු ලෙස ආදරය කළ අය කෑම ගැනීම නවත්වා ඝාතකයින්ට දොස් කියන්නට වූහ. ජ.වි.පෙ ආධාරකරුවන්ට වූ කුතුහලය නම් විජය ඇත්තටම මියගියාද යන්නය. දයා පතිරණ සිද්ධිය මෙන්ම මෙයත් විශ්ව විද්‍යාලයේ ගැටුමක් ඇතිවිය හැකි සිදුවීමක් ලෙස තේරුම් ගත් මම මේ පිළිබඳ සත්‍යය විමසීම සඳහා ආනන්ද ඉඩමේගම හමුවීමට කොළඹ වෛද්‍ය ශිෂ්‍ය නේවාසිකාගාරයට ගියෙමි. ඒ වනවිටත් විජයගේ දේහය එහි වූ මෘතශරීරාගාරයට ගෙනවිත් තිබූ නිසා සැලකියයුතු පිරිසක් එහි පැමිණ සිටියහ. ආනන්ද හෙවත් ධම්මික සිනාමුසු මුහුණින් මට කීවේ "විජය ද්‍රෝහියෙක්" කියාය. ප්‍රතිවිප්ලවය නතර කිරීම සඳහා මෙවැනි ද්‍රෝහීන් දැන්මම ඉවත් කළ යුතු බව එතැන සිටි මහනාම කීවේය. ඔහු එකල ජ.වි.පෙට සිටි ලොකුම න්‍යායාචාර්යවරයා වූ අතර, මාක්ස්වාදය හා ජාතිකවාදය ගැන අප සමග දිගටම ගැටුම් ඇතිකරගත් අයෙක් ද විය. උපවැදි, ශූර කථිකත්වයක් සහිත අයෙක් වූ ඔහු අපට පහරදුන්නේ බුද්ධිවාදීන් ලෙස හංවඩු ගැසීමෙනි. විප්ලවයට පෙර ප්‍රතිවිප්ලවය මර්දනය කිරීමට කටයුතු කරන්නේ නම් තමන් ප්‍රතිවිප්ලවවාදීන් ලෙස හඳුනාගන්නා බොහෝ දෙනා ද දැන්මම ප්‍රතිවිප්ලවය සමඟ එක්වීමට ඉඩ ඇති බව මහානාමට පිළිතුරු දී ආපසු පැමිණියෙමි.

විජය කුමාරතුංග මිය යනවිට, ඔහු ජේ.ආර්.ට සිටි ලොකුම තුරුම්පුව විය. ඊළඟ ජනාධිපතිවරණයක දී සිරිමාවෝ බණ්ඩාරනායක පරාජය කිරීම සඳහා අවශ්‍ය ඡන්ද කැඩීමට විජය ඔහුට අත්‍යවශ්‍ය විය. මගේ මතය නම් තුන්වැනි වරටත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට ජේ.ආර්. ඉදිරියට නොපැමිණියේ විජය ඝාතනය නිසා බවය. විජය ප්‍රේමදාස සමග ද දෙමළ සන්නද්ධ කල්ලි සමග ද කිට්ටු සම්බන්ධයක් ගෙන ගියේය. ඔහු මහජන පක්ෂයට එක්ව සිටි හිටපු ජවිපෙ පිරිස් සඳහා සන්නද්ධ පුහුණුවක් ද ලබාදුන් බව එකී පුහුණුවට සම්බන්ධ වූ කුරුණෑගල දොරවේරුවේ තරුණයෙක් මා හට පැවසුවේය. විජය මියයෑමෙන් පසු ජේ.ආර් තවදුරටත් තබාගැනීම සඳහා ලලිත් තුරුම්පුවක් ගැසුවේය. ඒ විජේවීර කරළියට ගැනීම සඳහා ජ.වි.පෙ තහනම 1988 මාර්තු මස ඉවත් කිරීමෙනි. ඉන්දීය විරෝධී පෙරමුණක් පිළිබඳ වූ සාකච්ඡාවලදී ජ.වි.පෙ ලලිත් ඇතුළත්මුදලි මෙන්ම රවී ජයවර්ධන සමග ද සාකච්ඡා කරගෙන ගියේය. ආණ්ඩුව හා ජ.වි.පෙ අතර, ඇති වූ ගිවිසුම පිටුපස සිටි රොහාන් පෙරේරා නොහොත් පස්ලිනිසාර් ඇතුළත්මුදලිගේ ගෝලයෙකු වූ අතර, තිස්ස බාලසූරිය පියතුමා හා කේ.සී. සේනානායක ඒ සඳහා දෙපිරිසම විසින්, අන්දවනු ලැබූවන් විය. ජ.වි.පෙ සාම සාකච්ඡා ප්‍රතික්ෂේප කළේය. ප්‍රචණ්ඩ ක්‍රියා උත්සන්න විය.

මේ වනවිට විශ්ව විද්‍යාලවල මූලික සටන් පාඨ දෙකක් විය. එකක් නම් අත්අඩංගුවට පත්වූ ශිෂ්‍ය නායකයින් මුදාහරිනු යන්නයි. රංජිදම් වැනි ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම සභිකයින්ගේ සිට ජ.වි.පෙට හිතකර මතවාදවල නොසිටි අතුරලියේ රතන හිමි, අශෝක අබේගුණවර්ධන, ගෙවිඳු කුමාරතුංග වැනි අයද අත්අඩංගුවේ සිටියහ. මගේ ඉලක්කය වූයේ කෙසේ හෝ ශිෂ්‍ය ප්‍රශ්න විසඳාගෙන අධ්‍යාපනය යථා තත්ත්වයට පත්කර ජනාධිපතිවරණයේදී ජේ.ආර්. පරාජය කර ඉන්දීය හමුදා පිටත්කර පළාත්සභා අහෝසි කිරීමේ මගක් තැනීමය.

අත්අඩංගුවට පත් සිසුන් නිදහස් කිරීමත්, පුද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ ප්‍රශ්නයත් සාකච්ඡා ක්‍රියාදාමයකින් විසඳාගත හැකි බව අපේ උපකුලපති විලි මැන්ඩිස් මහතා මා හට ප්‍රකාශ කර සිටියේය. මම මේ ගැන අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය මණ්ඩලයට දැනුම් දුනිමි. 1987 සිට විශ්වවිද්‍යාල වසා දැමීම නිසා සිසුන්ද, දෙමාපියන්ද සිටියේ මහත් අසහනයකිනි. නමුත් ජ.වි.පෙ උපාය මාර්ගය වූයේ හැකිතරම් කාලයක් විශ්ව විද්‍යාල වසාගෙන සිය කැරැල්ල සඳහා විශ්ව විද්‍යාල සිසුන් යොදා ගැනීමය. ජවිපෙ මෙම උපාය අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය මණ්ඩලය තුළ බෙදීමක් ඇති කළේය. කොළඹ විශ්ව විද්‍යාලයේ

ගෙවිඳු කුමාරතුංග, පේරාදෙණියේ රතන හිමි, ජයවර්ධනපුර බර්ටි විදානපතිරණ ආදී සෙසු ජාතිකවාදී මධ්‍යස්ථ නායකයින්ද සිටියේ ඒ මතයේය. ඇත්තෙන්ම බහුතර ශිෂ්‍යන්ගේ ගරුත්වය තිබුණේ මේ ජනප්‍රිය නායකයින් සමගය. අන්තිමේදී ආණ්ඩුව සමග සාකච්ඡා කළ යුතුය යන මතය ජයගනු ලැබීය. ආණ්ඩුව පැත්තෙන් ඒ.සී.එස්. හමීඩ් මහතා සමග ප්‍රතිපාදන කොමිෂම් සභාවේ සභාපති ස්ටැන්ලි කල්පගේ පැමිණි අතර ශිෂ්‍යයින්ගේ පැත්තෙන් සාකච්ඡාව මෙහෙය වූයේ මා ය. සාකච්ඡා වට කීපයකින් පසු අපේ ඉල්ලීම් ලබාදීමට ආණ්ඩුව එකඟවිය. මහාචාර්ය විලි මැන්දිස් හා මහාචාර්ය අර්ජුන අලුවිහාරේ එකී සාකච්ඡා සාර්ථක කර ගැනීම සඳහා බොහෝ කැපවීම් කළහ. නියෝජ්‍ය පොලිස්පති එඩ්වඩ් ගුණවර්ධනද එයට සහාය විය. අත්අඩංගුව පත් වී සිටි සිසුන් නිදහස් විය. පුද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු විය. (ඇත්තම තත්ත්වය නම් 1980 මුල් භාගයේ ඇතිකළ රාගම පුද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ සටන යටගොස් තිබියදී 1987 මුල් භාගයේ එය මතුකර ගත්තේ අපය. පසුව ජ.වි.පෙ එය තමන්ගේ සටන් පාඨයක් කරගත්තේ වෛද්‍ය පීඨයේ පළමු හා දෙවන වසරවල ක්‍රියාකාරී සිසුන් දිනා ගැනීමෙනි) බොල්ෂෙවික් කැරැල්ල සඳහා වේගයෙන් ඉදිරියට යමින් සිටි ජ.වි.පෙ විශ්ව විද්‍යාල සමථයකට පත්වීම ඉවසුවේ නැත. ඔවුන් අපට බාදා කිරීමට පටන් ගත්හ.

විශ්ව විද්‍යාල සාමකාමී කරගැනීමේ ඉලක්කය දිනා ගැනීමෙන් පසු දෙවැන්න කරළියට ගතිමු. එනම්, මේ අතර ජේ.ආර්. පාලනය පෙරළා දැමීම සඳහා පොදු සන්ධානයක් ඇතිකර ගත යුතුය යන මතයයි. ඒ සඳහා පළමුවෙන්ම ජ.වි.පෙ හා ශ්‍රී.ල.නි.ප එක්විය යුතු බවට මතයක් ඇතිවිය. ගුණදාස අමරසේකර විසින් රචිත "ගණඳුර මැදියම, දකිනෙමි අරුණළු" කෘතියත් නලින්ද සිල්වා මහතාගේ "56 දරුවෝ" සංකල්පයත් මෙයට බොහෝ ඉවහල් විය. ජ.වි.පෙ වෙනත් අරමුණකින් මෙයට එකඟ විය. එනම් සිය සන්නද්ධ විප්ලවය පෙරට ගෙනයෑම සඳහා වූ ආවරණ ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ බිහිකිරීම සඳහාය. කොටි මැතක දී දෙමළ සන්ධානය යොදා ගත්තා සේ ශ්‍රී.ල.නි.පය තම අරමුණු සඳහා යොදා ගැනීම ජ.වි.පෙ උපාය විය. ශ්‍රීලනිපයේ උපාය වුයේද ජ.වි.පෙ සරණින් හෝ බලයට පැමිණීමයි. වසර 11 ක් බලය අහිමිවීමෙන් ශ්‍රී.ල.නි.පය බඩගිනි හිවලෙකුගේ තත්ත්වයට වැටී තිබිණි. අපේ අරමුණ වූයේ ජේ.ආර්. හා ඉන්දීය හමුදා යුද්ධයකින් තොරව ඉවත්කර ගැනීමය.

ශ්‍රී.ල.නි.ප හා ජ.වි.පෙ අතර මුල්ම සාකච්ඡාවට අතරමැදියා වූයේ මාය. එය පැවැත්වුණේ 1988 ජුනි 06 දා රොස්මිඩ් පෙදෙසේ බණ්ඩාරනායක නිවසේදීය. එහිදී අනුර බණ්ඩාරනායක හා ආනන්ද ඉඩමේගම දෙපාර්ශ්වයෙන් හමුවිය. පසුව වෙන නායකයින්ද එයට සම්බන්ධ විය. ඒ දිනවල රුහුණු විශ්ව විද්‍යාලයේ ආචාර්ය සත්‍යපාල වන්නිගම අතුරුදහන් වී තිබූ අතර ඒ පිළිබඳ සර්වපාක්ෂික හමුවක් පැවැත්විනි. අපි එය පුළුල් දේශපාලන සන්ධානයක් බවට පරිවර්තනය කළෙමු. දේශප්‍රේමී ජාතික පෙරමුණක් පිළිබඳ කුඩා වැඩපිළිවෙළක් මා විසින් කෙටුම්පත්කර අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ගෙන පසුව සෙසු පක්ෂවලට ඉදිරිපත් කරන ලදී. පේරාදෙණියේ සුදත් බණ්ඩාර, ජයවර්ධනපුර ගාමිණී මාලසිංහ යන සිසු නායකයින්ද එකී සාකච්ඡාවලට සහභාගී විය. මෙතරම් තරුණ වියේ දී රටේ ජාතික පක්ෂ සන්ධානයක් සඳහා වූ මූලික ප්‍රතිපත්ති කෙටුම්පතක් සැකසීමට මා හට අවස්ථාවක් ලබාදීම පුදුමයට කරුණක් විය. මෙයම මාගේ භාග්‍යයකි. පසුව සිහළ උරුමයේත්, ඉන්පසුව ජාතික හෙළ උරුමයේත් ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමටත් ඉන්පසුව මහින්ද චින්තන ප්‍රතිපත්තිය සැකසීමටත් එදා ලද පුහුණුව හා පන්නරය මා හට ශක්තියක් විය.

මේ සාකච්ඡාව අපූරු දේශපාලන අත්දැකීමක් ගෙන දුන්නේය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, අනුර බණ්ඩාරනායක මහතා, රුක්මන් සේනානායක, ඒ.එච්.එම්.අෂ්රෆ්, කුමාර් පොන්නම්බලම්, චානක අමරතුංග, ඒ.එම්.අසීස්, දිනේෂ් ගුණවර්ධන වැනි නායකයින් රැසක් ඇසුරු කිරීමටත් ඔවුන්ගේ පුද්ගලික රුචි අරුචිකම් දේශපාලන අදහස් ආදිය හඳුනා ගැනීමටත් හැකිවිය. වරක් කුමාර් පොන්නම්බලම්ගේ නිවසේදී එහි වූ ඡායාරූපයක් එතුමා සෙසු අයට පෙන්වීය. එහි තිබුණේ ජී.ජී. පොන්නම්බලම්, බණ්ඩාරනායක, පිලිප් ගුණවර්ධන හා ඩඩ්ලි සේනානායක මහත්වරුන්ගේ සමූහ ඡායාරූපයකි. කුමාර් පොන්නම්බලම් එය පෙන්නා කීවේ ඒ සියල්ලන්ගේ පුතුන් හෝ ඥාති පුතුන් (කුමාර්, අනුර, දිනේෂ්, රුක්මන්) දැන් මෙතැන සිටිනා බවය. නැත්තේ ජේ.ආර්.ගේ පුතුන් බවද ඔහු විහිළුවට කීවේය. තව වසර කීපයකින් අපගේ දරුවන්ද එක්වී අප ගැන මේ ලෙසටම කතා කිරීමට ඉඩ සලසනු වස් අපේ සමූහ ඡායාරූපයක් ගනිමුයැයි ඔහු යෝජනා කළේය. එවිට මා කීවේ විජේවීරගේ හා ප්‍රභාකරන්ගේ දරුවන් එයට ඉඩදේවි දැයි සිතා බැලීම වඩා සුදුසු බවයි. අපි සියලු දෙනා හඬ නගා සිනාසුනෙමු. යථාර්ථය නම් විජේවීර හා ප්‍රභාකරන් නියෝජනය කළ ගැමි

ගොවි පරපුර කොළඹ 03 - කොළඹ 07 ප්‍රභූ පරපුරට ඉඩක් දීමට සූදානම් නැති බව ඔවුන් එදා තේරුම් නොගැනීමය.

මෙහිලා කිවයුත්තේ කුමාර් පොන්නම්බලම් මහතා බොහෝදුරට සිත තුළ ප්‍රභුවාදයක් තබාගෙන නොසිටි අයෙක් බවය. මෙය සිංහල නායකයින්ගේ දකින්නට නොතිබුණු ලකුණක් විය. ඔහු වරක් කීවේ තම නිවසෙහි උඩුමහලේ එල්.ටී.ටී.ඊ හා ප්ලොට් කීපදෙනෙකුට නාවාතැන් දුන් බවත්, රාත්‍රියේ එකට ආහාරගෙන පසුව එළියට ගොස් ඔවුන් වෙඩි තබාගත් බවත්ය. කොළඹ බොහෝ දෙමළ ප්‍රභූ නිවෙස් "කොල්ලන්ට" ඒ දිනවල විවෘතව තිබිණි. ජ.වි.පෙ කැරැල්ල පරාජය වූ පසු (1991 දී) කොළඹ විශ්ව විද්‍යාලය අසල පයින් යමින් සිටි මා දැක සිය බෙන්ස් රථය නතර කර දිවඅවුත් හෙතෙම මා වැළඳගත් ආකාරය තවමත් මතකයට එයි. චන්ද්‍රිකාගේ පාතාලය ඔහු මරාදැමූ විට එහි ඇඟිල්ල අප වෙත යොමුකළ අවස්ථාව, වේදනාත්මක අත්දැකීමක් විය.

අෂ්රෆ් මහතා සිය උපායන් විවෘතවම අප සමග කතා කළේය. සිංහල - දෙමළ ගැටුම උත්සන්න වනවිට මුස්ලිම්වරු ඉබේම ජයග්‍රාහකයා තීරණය කරන්නා බවට පත්වන බව ඔහුගේ මතය විය. එය තමාගේ උපාය බව ද හෙතෙම ප්‍රකාශ කළේය. දෙමළ ජාතිවාදී ප්‍රහාර නිසා මුස්ලිම් කොංග්‍රසය බිහිවුවත් එය නිතරම සිංහල විරෝධී ලෙස පවත්වා ගැනීම ගැන හෙතෙම සැලැකිලිමත් විය.ඔහු හා රුක්මන් පොදු සන්ධානයෙන් ඉවත්වී ජනාධිපතිවරණයේදී ප්‍රේමදාස මහතාට සහාය දීමට ඉදිරිපත් වූහ.

දේශප්‍රේමී පොදු සන්ධානයක් සඳහා වූ සාකච්ඡා අසාර්ථක විය. එයට ආසන්නම හේතුව වූයේ කවර පක්ෂයක් හෝ (ආණ්ඩුවක් පිහිට වූ පසු) ඉල්ලා අස් වී ආණ්ඩුව විසුරුවිය යුතු බවට ජ.වි.පෙ ගෙන ආ මතයට ශ්‍රී.ල.නි.පය එරෙහි වීමයි. අනෙක් අතින් ජනපති ශ්‍රි.ල.නි.පයෙන් නම් අගමැති ජවිපෙන් ලෙස වූ බලය බෙදාහදා ගැනීමේ ජ.වි.පෙ සූත්‍රයද ශ්‍රී.ල.නි.ප පිළිගත්තේ නැත. සාකච්ඡා අසාර්ථක වී ජ.වි.පෙ ඡන්ද වර්ජනයට ගියේය. මම ප්‍රසිද්ධියේම මේ ගැන ජ.වි.පෙ විවේචනය කළෙමි. ප්‍රේමදාස ජනාධිපතිවරණය හා මහා මැතිවරණය යන දෙකම ජයගත්තේය. ජවිපෙ ඡන්ද වර්ජනය ප්‍රේමදාස සිය වාසියට යොදාගත් අතර ජවිපෙට ප්‍රේමදාස සමග සබඳතාවයක්ද විය. සමහර ජ.වි.පෙ නායකයින් අත්අඩංගුවට පත්වූ පසු (1989) තමන්ට ජනාධිපති හමුවිය යුතුයැයි ඉල්ලා සිටි බවද වාර්තා විය. ජවිපෙ උපාය ශිෂ්‍යයින්ට පමණක් නොව රටටම විනාශය කැඳවන්නක් බවත් ජාතිකවාදය, අවිහිංසාවාදය, අපේ

මග විය යුතු බවත් පෙන්වන කෘතියක් නිකුත් කළෙමි. එයින් මා උත්සාහ කළේ ජවිපෙ ජාතිකවාදය උපායක් කරගෙන තරුණ ව්‍යාපාරය සියතට ගැනීම වැළැක්වීමත්, වේලුපිල්ලේට හා කොළඹ ප්‍රභූවාදීන්ට එරෙහිව සිංහල ජාතික බලයක් විශ්ව විද්‍යාල තුළ රෝපණය කිරීමත්ය.

ප්‍රේමදාස මහතාගේ ජයග්‍රහණයෙන් පසු විපක්ෂයේ වෛරය ජ.වි.පෙ වෙතට යොමුවිය. ජ.වි.පෙ කීවේ ප්‍රේමදාස යනු "ලෝකල් කෙරන්ස්කි" බවය. බෝල්ෂෙවික්වරු 1917 දී රුසියාවේ දී හයමසක් ඇතුළත කෙරන්ස්කි බලයෙන් පහකළ ලෙස ප්‍රේමදාස ද බලයෙන් පහකරනු ලබන බව "ප්‍රේමදාසට මාස හයයි" යන්නෙන් ප්‍රකාශ කෙරිණි. විශ්ව විද්‍යාලවල තත්ත්වය වූයේ ජ.වි.පෙට රැහැණිව ශිෂ්‍ය පෙළගැස්මක් ඇතිවීමය. මා විසින් ලියන ලද, චින්තන පර්ෂදය විසින් එළිදක්වන ලද "අපේ මග" කෘතිය ජ.වි.පෙට රැහැණි ජාතිකවාදී ශිෂ්‍ය නායකයින්ගේ අත්පොත විය. 1989 මැයි මස විශ්වවිද්‍යාල විවෘත වූ විට ජ.වි.පෙට එරෙහි කැරැල්ල පුපුරා ගියේය. මොරටු විශ්ව විද්‍යාල සිසුන් අමතා ඉන්දීය හමුදා පිටමං කිරීම හා ජයවර්ධන ඉවත් කිරීම පිළිබඳ වූ අපේ උත්සාහය අසාර්ථක වූ බව ප්‍රසිද්ධියේ පිළිගතිමි. ජවිපෙ සන්නද්ධ උපාය ඉදිරියේ රට විනාශය කරා ගෙනයන නිසා එයින් වලකින ලෙස ද ඉල්ලා සිටියෙමි. පළමු වසරේ ජ.වි.පෙ ක්‍රියාධරයින් කීපදෙනෙකු හැරුණු විට මුළු විශ්ව විද්‍යාලයම ජ.වි.පෙ විනාශකාරී මගින් ගැලවී ගත්තේය. ජ.වි.පෙ තුවක්කු කරුවෝ එවිට සිදුකළේ මහාචාර්ය පටුවටවිතාන මරාදමා විශ්ව විද්‍යාලය වසා ගැනීමය. එය පසුපස සිටි තුවක්කුකරුවා පසුව රූපවාහිනිය ඉදිරියේ ජ.වි.පෙ විවේචනය කළ බව ද දැනගතිමි. එය ඉතිහාසයේ ඛේදවාචකයක් විය. කොළඹ විශ්ව විද්‍යාලයේ ද මෙය සිදුවිය. විද්‍යා පීඨයේ ගෙවිඳු, අනූප, මාලික, රොෂාන් වැනි නායකයින් ඍජුව ජ.වි.පෙට එරෙහිව නැගී සිටිනා ලදි. ප්‍රසිද්ධ වාද විවාද කළ නොහැකි වූ ජ.වි.පෙ මහාචාර්ය විජේසුන්දර මරාදමා එම විශ්ව විද්‍යාලය ද වසාගත්තේය. එකී තුවක්කුකරු ද පසුව "අප ගත්මග වැරදිය" යනුවෙන් ජ.වි.පෙ සිර කඳවුරුවල දේශන පැවැත්වීය. කනගාටුවෙන් වුව කිවයුත්තේ බෝල්ෂෙවික් විප්ලවයට සහාය නොදෙන්නන් "අලයින්" ලෙස හඳුන්වමින් මව්බිම නැත්නම් මරණය කියා එදා (1989) උස් හඬින් කෑගැසූවන් පසුව එක්කෝ රජයේ ඔත්තුකරුවන් වූ බව හෝ මව්බිම නැත්නම් පැරීසිය කියා යුරෝපයට පළාගිය බවය.

1989 ජුනිමස වනවිට ජ.වි.පෙ සිය කැරැල්ල උත්සන්න කළේය. මේ වනවිට ජ.වි.පෙ විසින්, තමන් මරාදමතැයි බිය වූවන් බොහොමයක්, එක්කෝ

විදේශගතවීම හෝ රජයේ ආරක්ෂක අංශ වෙතට නැඹුරුවීම සිදුකළහ. විශේෂයෙන් කොළඹ ස්වාධීන ශිෂ්‍ය සංගමය හා ශ්‍රී ලංකා මහජන පක්ෂයේ පිරිස් වෙනම සන්නද්ධ කල්ලියක් ලෙස ජ.වි.පෙ හෝ ජාතිකවාදී මත දැරූවන් පසුපස පන්නන්ට වූහ. මේ අතර, ජ.වි.පෙ "ජාතික චින්තන නඩය" ලෙස නලින් ද සිල්වා මහතා හා අප සියලුදෙනා නම්කර පත්‍රිකාවක් නිකුත් කළේය. එය එක් ආකාරයකින් අපේ මරණ වරෙන්තුව විය. මෙලෙස අවිහිංසාවාදී වීම නිසා අපි දෙපැත්තේම ගොදුරු බවට පත්වූයෙමු. සෙවන සොය ගිය සෑම තැනකම මරණයේ සෙවනැල්ල අප සොයා ආවේය. වරක් ගල්කිස්සේ එක්තරා විහාරස්ථානයක දී අප ඝාතනය සඳහා බෝම්බයක් අටවන ලෙස තමන්ට උපදෙස් ලැබුණු බව දැනට උපැවිදිව සිටින එවකට භික්ෂූන් වහන්සේ කෙනෙකු වූ කොළඹ විශ්ව විද්‍යාල සිසුවෙකු මා හට කීවේය. මේ අතර, ස්වාධීන ශිෂ්‍ය සංගමය ද අපේ හිස් සොයා "පෙජෙරෝ" වලින් නගරය පීරන්නට වූයේය. කොළඹ විශ්ව විද්‍යාලයේ "හේමන්ත චන්ද්‍රසිරි" පැහැර ගැනීමට ඔවුන් සමත් වූ අතර, ඔහු සොයාගිය මා හා තවත් අපේ හිතවත් වෛද්‍යපීඨ සිසුවෙකු ස්වාධීන ශිෂ්‍ය සංගමයේ මරුවන් අතට පත්විය. අප නිතර සැරිසැරූ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨ දේශන ශාලාවක් ඇස්වසා විලංගු දමා සිටි අපගේ වධකාගාර නිවාසය බවට පත්විය. එහි ගතකළ මාස තුනක තරම් කාලය අළලා මවිසින් ලියන ලද "අමු සොහොනක විලංගුලා" නම් ලේඛනය දිවයින බදාදා සංග්‍රහයේ පළවීමෙන් බොහෝ දෙනෙක් කැරැල්ල පිළිබඳ නිරුවත් ලේ වැකුණු ඇත්ත දැන ගත්හ. එකී ලිපි පෙළට උදව් කළේ අද අප අතර නැතිමුත් සදා හිතාදර කිත්සිරි නිමල් ශාන්ත මහතාය. අපි අත්අඩංගුවට ගැණුනේ ඔක්තෝම්බර් මසය. නොවැම්බර් වනවිට ජ.වි.පෙ සියලුම නායකයින් එකවැලට අත්අඩංගුවට පත්විය. බොහෝ පිරිසකට මියයන්නට, මරන්නට ජීවය කැවූ ඔවුන් සියල්ලෝම පාහේ අන් සියලුදෙනාම පවා දුන්හ. කොටින්ම ජ.වි.පෙ සැකකරුවන් හඳුනාගැනීම, පහරදීම, වධ දීම, ඝාතනය ආදිය සිදුකළේත් ජවිපෙ නායකයින්ම විසිනි. තව මිනිත්තුවක් හෝ ජීවත් වීම ඔවුනගේ එකම පැතුම වී තිබිණි. ජ.වි.පෙ නායකයින් පෙන්වූ මේ බියගුළු හැසිරීම හා නින්දා සහගත මරණය කවදා හෝ කොටි සංවිධානයේ නායකයින්ට ද අත්වන බව මම විශ්වාස කළෙමි. 2009 මැයි මස ඒ විශ්වාසය ද තහවුරු විය. කොටි නායකයෝද සිය සාමාජිකයින් පාවාදුන්හ.

ජ.වි.පෙ තහනම් කර (1983) එය කැරැල්ලට ඇද දැමූයේත්, ඔවුන් ජාතිකවාදී විපක්ෂයේ නායකත්වයට ගෙනාවේත්, ඔවුනගේ සන්නද්ධ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය සමාජ පිළිගැනීම ලබාදුන්නේත් ජේ.ආර්ගේ වැරදි දේශපාලන උපාය

විසිනි. ජේ.ආර්ගේ විවෘත ආර්ථිකය තුළ ප්‍රධාන සංචරකය වූ සේවා ආර්ථිකය විසින්, ඇතිකළ ලුම්පන් ධනපතීන් මෙන්ම පීඩිතයින් ද ජ.වි.පෙ මෙන්ම ප්‍රේමදාසගේ ද පදනමක් විය. මර්දනයේදී 1971 මෙන් ගැමි ගොවි වීරත්වයක් 1989 - 90 දී ජවිපෙට ආරෝපණය නොවුණේ මේ ලුම්පන් ක්‍රියාකාරීත්වයේ ගොදුරු බවට ඔවුනගේ නායකයින් හසු වී සිටි නිසාය. ඔවුන් විනාශ කෙරුණේ ද ප්‍රේමදාස - කුරේ හවුල විසින් තනනා ලද "ලෝරන්ස් මාෆියාව" නම් තවත් ලුම්පන් සංවිධානයකින් වීම ද අභාවවාචක ක්‍රියාවක් විය.

වරක් 1988 දී ත්‍රීමාවිතාන ඝාතන සිද්ධිය සමයේ දී මා හමු වූ විජය විමලරත්න මහතා ප්‍රකාශ කළේ උතුරේ මෙන්ම දකුණේ කැරැල්ල ද ජයගත නොහැකි (No Win) තත්ත්වයකට පත්ව ඇති බවයි. ත්‍රීමාවිතාන පිළිබඳ පෙළපාළියකට අවසර ගැනීම සඳහා ඔහු හමු වූ විටය ඒ සඳහන කෙරුණේ. ආරම්භයේ දී හමුදා නිලධාරීන් පවා ජ.වි.පෙ ශක්තිය පිළිබඳ අධිතක්සේරුවකට ආවේ ජේ.ආර් ගැන කලකිරී සිටි දැවැන්ත විපක්ෂයක සරණ ඔවුනට ලැබුණු නිසාය. නමුත් ජ.වි.පෙ ගත් අන්තවාදී ඉන්දීය විරෝධයත්, ඉන්දියාවට එරෙහිව එක්සත් ජනපදය සමග හෝ එක්වීමට ඔවුන් දැරූ උත්සාහයත්, කොටි සංවිධානය සමග පවා සන්නද්ධමය සබඳතා පවත්වා ගැනීමත්, 1988 ජනාධිපතිවරණය හා මහා මැතිවරණය කඩාකප්පල් කිරීමත් නිසා විපක්ෂය ජ.වි.පෙන් ඉවත් විය. ජ.වි.පෙ කේඩරයට සීමා වූ පක්ෂයක් විය. මේ වරද ජ.වි.පෙ 2007දී ද කළේය. ඒ රටේ ජාතිමාමක දේශප්‍රේමී ජනයා ජනපති මහින්ද සමග කොටි විරෝධී සටනේ ඉදිරියට යද්දී වර්ජන, තර්ජන, බාධා කිරීම්වලට යෑමෙනි. ඔවුනගේ දැවැන්ත ඡන්ද පදනම ඊළඟ මැතිවරණවලදී කඩාවැටී එය කේඩරයට සීමා වූ පක්ෂයක් විය. (2009 පළාත් සභා මැතිවරණය)

මේ අතර, හමුදාවේ විශේෂ ප්‍රහාරක අංශවලින් ජ.වි.පෙ සදාචාරයක් නැති ගරිල්ලා යුද්ධයට (DIRTY WAR TACTICS) පිළිතුරක් ලෙස එකී උපක්‍රමයන්ම යොදාගන්නට විය. (MIRROR IMAGE TACTICS) ජ.වි.පෙ මර්දනය සඳහා සියලු දෙනා අත්අඩංගුවට ගන්නා, විවෘතව වෙඩි තබනා න්‍යාය වෙනුවට තෝරාගෙන විනාශ කිරීම ඇරැඹිණි. රත්මලානේ මුණසිංහගෙන් ඇරැඹුණු එකී ප්‍රතිබිම්බ ප්‍රහාර මාස කීපයකින් විජේවීර - ගමනායක - ඩී.එම්. ආනන්ද දක්වාම ගමන් කළේය. මේ අතර, වෙනත් ප්‍රතිවිරුද්ධවාදීන් ඝාතනයට ද ආණ්ඩුව මෙන්ම වාමාංශික කල්ලි ද උපරිම ලෙස එකී භීෂණ සමය යොදාගත්තෝය. ජවිපෙ ආරම්භය හා බිඳ වැටීම පිළිබඳව "ලේ කඳුළු මැදින්" නමින් ලිපි මාලාවක් "ලක්මිණ" පුවත්පතේ

(1991) පළ කළෙමි. එකල සුනිල් මාධවගේ සංස්කරණයෙන් යුතු "ලක්මිණ" පුවත්පත විසිරී ගිය ජ.වි.පෙ ක්‍රියාධරයින් එක්කරන නවාතැනක් ලෙස ද ක්‍රියා කළ අතර, එකී ලිපි පෙළ ඔවුනගේ දැඩි විවේචනයට ද හසුවිය. එයට ලිපි සැපයූවන් අතර, ඩලස් අලහප්පෙරුම මහතා මෙන්ම විමල් වීරවංශ මහතා ද සිටි අතර, එය මුද්‍රණය කළේ තිලක් කරුණාරත්න මහතාගේ ආධාරයෙනි. පසුව නලින් ද සිල්වා හා තිලක් කරුණාරත්න අතර, ඇති වූ ගැටුමකින් පසු අපි එකී පුවත්පතෙන් සමුගතිමු. වධකාගාරයෙන් නිදහස් කෙරුන ද මරණයේ සෙවනැලි අප පසුපස වැටී තිබිණි. එවකට "අතුරුදහන් වී" සිටි මා යළිත් සොයාගන්නට අපේ ලොකු අක්කා ප්‍රමුඛ පවුලේ සැමට එවකට "රාවය" කර්තෘ වූ වික්ටර් අයිවන් මහතාත්, අනුරුද්ධ රත්වත්තේ මහතාත් උපකාර කර තිබිණි. මා පළමු ලිපිය ශිෂ්‍ය ව්‍යාපාරය පිළිබඳව රාවයට ලිවූ අතර, ලක්මිණට සම්බන්ධ වනතෙක් බොහෝ මාතෘකා යටතේ එයට ලිපි ලියූවෙමි. වරක් අයිවන් මහතා විසින්, චන්ද්‍රිකාට පාර කැපීම (1994) සඳහා විවෘත ආර්ථිකය පිළිබඳව කරනා ලද සාවාද්‍ය කරුණු දැක්වීමක් නිවැරදි කරනා ලෙස ඔහුගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ එය ඉටුනොකළ නිසා රාවයට ලිපි සැපයීම නතර කළෙමි. රාවය පුවත්පතක් වූයේ ලලිත් ඇතුළත්මුදලිගේ කැරැල්ල පෙරට ගෙනයෑම සඳහා වූ අතර, එය ඉතා සාර්ථක ලෙස රාවය විසින්, ඉටුකරන ලදී. 2001 දී යූඑන්පීය බලයට ගෙනඒම සඳහා ලසන්ත වික්‍රමතුංග විසින් සිදුකළ මෙහෙයට සමාන මෙහෙයක් 1994 දී චන්ද්‍රිකා බලයට ගෙනඒම සඳහා රාවය විසින් ඉටුකරන ලදී. මෙවැනි විකල්ප මාධ්‍ය ඒවායේ සමාජ කාර්යය ඉටුකරන අවස්ථාවේදී ලාභදායී ව්‍යාපාර ලෙස පවත්වාගෙන ගිය ද බොහෝදුරට නඩත්තු වන්නේ විදේශීය හෝ බෞද්ධ විරෝධී ආගමික කල්ලිවල හෝ සිංහල විරෝධී කල්ලිවල අරමුදල් වලිනි. විටින් විට ප්‍රගතිශීලී වෙස් ගත්ත ද සමස්තයක් ලෙස ඒවා සිය ස්වාමීන්ට සේවය කරති. ඉරුදින, ලීඩර්, යුක්තිය හා රාවය විකල්ප ජනමාධ්‍ය ජනප්‍රිය තේමා ගන්නා අතර, මාධ්‍යවේදී ෆැසිස්ට්වාදයක් ද මුදාහරිති. ජාතිකත්වය පදනම් කරගත් ශක්තිමත් චරිත හා ව්‍යාපාර විනාශ කිරීම ඒ ෆැසිස්ට්වාදයේ මුඛ්‍ය අරමුණයි.

## තෙවැනි දිගහැරුම

# මම සිතමි,
# ඒ නිසා මම පවතිමි

**1**990 වසර මගේ ජීවිතයේ දාර්ශනික වසර විය. ජීවිතය ගැන වඩා පුළුල් අවබෝධයක් වධකාගාරවල ලේ වැකුණු මතකයන් විසින්, ලබා දී තිබිණි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිළිබඳ කිසිදු ආශාවක් ඇති නොවිණි. නිත්‍ය අධ්‍යාපනයේ දී දේශපාලනය මට නිතරම බාධා කළේය. සාමාන්‍ය පෙළ 1980 ජූලි වැඩවර්ජනය නිසා ද උසස් පෙළ ජනාධිපතිවරණය, ජනමත විචාරණය හා 83 ජූලි කලබල නිසාද, විශ්ව විද්‍යාල අවසන් වසර දෙක ජ.වි.පෙ කැරැල්ල නිසා ද කඩාකප්පල් වී ගියේය. ජීවිතය සොයා විවිධ ස්ථානවලට පළායමින් සිටිය දී එකම දෙය වූයේ හැකිතාක් කියවීමේ නියැලීමය. අපට හිතවත් විහාරස්ථාන ගණනාවක් ඒ සඳහා සෙවන දුණි. විහාරස්ථාන අනාරක්ෂිත වනවිට අපේ හිතමිතුරු රොෂාන්ගේ මගපෙන්වීම යටතේ කලක සිට දැන හැඳින සිටි ජූඩ්ලාල් පියතුමා හමුවුනෙමි. ඔහු ඒ දිනවල (1990) කිතුණු දහම සඳහා විමුක්ති දේවධර්මය හඳුන්වාදීමේ උත්සාහයක නියැලී සිටි බුද්ධිමත් දක්ෂ තරුණ පූජකතුමෙක් විය. මධ්‍යම ඇමැරිකාවේ (1950-70) අතර, ප්‍රචලිත වූ "ඔස්කා රොමෙයිරෝ"ගේ විමුක්ති දේවධර්මයේ (LIBERATION THEOLOGY) පදනම් හඳුනාගන්නට මා හට එයින් හැකියාව ලැබිණි. එකී පිරිස් පසුව දකුණු හා මධ්‍යම ඇමැරිකානු ප්‍රදේශවල වාමාංශික විප්ලවයන්ගේ තීරක බලවේගය බවට පත්විය. ඇත්තෙන්ම රෝමානු කතෝලික ලතින්

රටවල සිදුවන මේ සමාජ වෙනස්කම ගැන සැලකිලිමත් වූ එක්සත් ජනපදය ඒ සඳහා උපායන් දෙකක් යෙදුවේය. එකක් නම් දුගියන් සඳහා උපකාර කිරීමට ස්වේච්ඡා සංවිධාන ජාලයක් බිහිකිරීමය. මේ සඳහා මූලික ආභාෂය ඉන්දියාවේ හා ලංකාවේ සර්වෝදය වැනි සමාජ සංවිධානවලින් ලබාගැනිණි. විදේශ ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධාන මාදිලිය එයින් උපත ලැබිණි. සමාජ අසහනයන් පුපුරා නොයවා පීඩනයන් පිටකර පාලනය කිරීම ඒවායේ අරමුණ විය. දෙවැනි උපාය වූයේ සංවිධානාත්මක පල්ලිය වෙනුවට පුද්ගල ඇදහිල්ල ගෙනඒමය. පෙන්තකොස්ත ප්‍රචාරකයින් දස දහස් ගණනක් මේ ප්‍රදේශවලට යැවීමේ ප්‍රතිඵලය වූයේ ජනතාව මධ්‍ය කතෝලික පල්ලිය අතහැර කුඩා එවැන්ජලික පල්ලි වටා රොක්වීමය. ලතින් ඇමැරිකාවේ ඇතිවෙමින් ගිය විමුක්ති දේව ධර්මය හා බැඳුණු දුගී විප්ලවය පාලනය කෙරුණේ ඒ ලෙසය.

ජූඩ්ලාල් පියතුමා විමුක්ති දේවධර්මය අනුක්‍රමයෙන් දෙමළ ජාතිවාදයට මුසු කළේය. එයින් ඔහු හා අප අතර, ගැටුම් හටගත්තේය. 2002 වසරේ කොළඹ දී ඇති වූ පොංගු තමිල් ගැටුමේ හරිමැද සිටියේ ඔහුය. ඔහු දැන් විදේශගතව සිටී. ඔහු මට කතෝලිකයන් අතර, සුවිශේෂී චරිතයක් හඳුන්වා දුන්නේය. ඒ ඔස්කා අබේරත්න පියතුමාය. එතුමා ද 1971 දී විප්ලවවාදී අදහස් දරා පල්ලිය විසින්, කොන්කරන ලද්දෙකි. එතුමාගේ ප්‍රශංසාරාමයේ දින ගණනාවක් මා රැඳී සිටි අතර, මහත් වටිනා පොත් ගුලක සරණ ලබන්නට ද හැකිවිය. මර්සිලින් ජයකොඩි පියතුමා මෙන්ම ඔස්කා අබේරත්න පියතුමා හා එතුමාගේ පිරිවර සිංහලකමත්, බෞද්ධකමත් කෙරේ ගෞරවයක් දැක්වූහ. පසුව සිංහල කොමිසම (1997) පිහිටු වූ විට එයට සාක්ෂි දීමටත් ඉදිරිපත් වූහ. සිංහල බස, සාහිත්‍යය, ගීත කලාව මෙන් ජාතිකවාදය සඳහාත් ඔස්කා අබේරත්න පියතුමාගේ කිතු දන"පුබුදුව" ද ඇතුළත්ව බොහෝ කිතුණුවන් සේවය කර ඇතිබව ද කිව යුතුය.

අතැම් පටු අදහස් සහිත පිරිස් මට මඩගැසීම සඳහා නිතරම පුබුදුව හා අප අතර, ඇති සම්බන්ධය යොදා ගත්හ. කතෝලික ඔත්තුකරුවන් ලෙස කලක් අපව හංවඩු ගැසූ ඇතැම් භික්ෂූන් වහන්සේලා පසුව බිෂොප් මන්දිරයේ දානය වළඳන තත්ත්වයට ද පත්වූ බව නොකිවමනාය. ඇතැම් ජ.වි.පෙ නායකයෝ, මා විවාහවූයේ පුබුදුවේ කිතුණු කතක් සමග බව කියා ප්‍රසිද්ධ පුවත්පත්වලට ලිව්වෝය. ඒ පිළිබඳව නඩුමගට ගොස් මගේ බිරිඳ බෞද්ධ බව ඔප්පුකර මිලියන 20ක වන්දියක් ජ.වි.පෙ 'ලංකා' පුවත්පතින් ලබාගන්නට පවා මට සිදුවිය. මේවා ඉදිරියේ මා නොසැලුණේ මඩිහේ මහනායක හිමියන්

සහ සෙනරත් පරණවිතාන ශූරීන්ගේ පවුලේ අය කිතුණුවන් බව කියා මඩ ගසන්නට පවා පිරිස් සිටි නිසාය. අපේ ජාතික නායකයින්ට මෙවැනි මඩ ප්‍රහාර එල්ල කරනා එක්තරා රාජ්‍ය නොවන සංවිධානයක නායකයෙකු වරක් ඉතාලියේ දී මට හමුවිය. ලංකාවේදී රෙද්ද බැනියම හැඳගෙන සිංහල, ජාතික නායකයින්ගේ පවුල් විවේචනය කරනා ඔහු පූර්ණ යුරෝපීය ඇඳුම හැඳ රෝමයට ගොස් සිටියේ පල්ලියෙන් ආධාර එකතු කරන්නටය!. රාජ්‍ය නොවන සංවිධාන ගැන විවේචනය කර විකල්පය ද, තමන් විසින්ම ගොඩනැගීමට තරම් ඇතැම්විට බටහිර බලවේග සූක්ෂම වෙති. "ඇටමැස්සා" නම් සුප්‍රකට කෘතියේ කතානායකයා පුවත්පතකට පක්ෂව හා විපක්ෂව ද ලිපි ලියූ ආකාරයටම මෙය සිදුවේ. මේ කූඨ පුද්ගල චරිත එකින් එක හඳුනාගන්නට ලැබීම මම ලැබූ ලොකුම අත්දැකීමක් ලෙස සලකමි.

බුදු දහම පිළිබඳව සාමාන්‍ය අවබෝධයකින් සිටි මගේ දැක්ම ජාතික චින්තන ප්‍රවාදයේ කරුණු විමසීමෙන් පසු පුළුල් විය. නමුත් එහි දාර්ශනික දැක්ම මගේ සිරුර හා මනස තුළට මුල් බැසගත්තේ ආර්.ජී. ද එස් වෙත්තමුණි මහතා විසින්, ලියන ලද "බුදු දහම, විද්‍යාව හා සම විසම වන අයුරු" හා බුදුදහම හා පැවැත්මේ අස්ථිරත්වය (Buddhism and Ambiguity of Existence) නම් කෘති දෙක කියවීමෙනි. ලෝකයේ බොහෝ දර්ශනයන් සාරයක්, ආත්මයක්, යථාර්ථයක්, දෙවියෙක් හෝ එවැනි යමක් ඇතැයි යන්න පූර්ව නිගමනයක් ලෙස ගත්ත ද බුදු දහම එය සහමුලින්ම ප්‍රතික්ෂේප කර සිය දර්ශනය ගොඩනංවා ඇති බව එකී කෘතිවලින් පැහැදිලි විය. එමෙන්ම විද්‍යාව නමින් අපි හඳුනාගන්නා ක්‍රියාදාමය හා බුදු දහම සත්‍යය සොයා යන මාර්ගය පිළිබඳව ද මනා විවරණයක් එමඟින් සැපයිනි. බොහෝ ගුරුන් සරණ ගිය ද මට සත්‍යය සහමුලින් පසක් වූයේ වෙත්තමුනි මහතා නිසාය. ඒ මහතාටත් ඒ මහතා ගැන මට කියාදුන් පේරාදෙණියේ ජයන්ත අයියාටත් බොහෝ පින්දෙමි.

ලංකාවේ ජවිපෙ කැරැල්ල පරාජය වීමත් සමගම පාහේ සෝවියට් දේශයේ බිඳ වැටීම ද (1989) සිදුවිය. මුළු කොමියුනිස්ට් ලෝකයම බිඳ වැටුණු අතර, චීනය, වියට්නාමය ආදිය සෙමින්, සෙමින් වෙළෙඳපොළ ක්‍රමයට අනුවර්තනය වෙමින් පැවැතිණි. මේ තත්ත්වය ලංකාවේ වාමාංශික ව්‍යාපාරයට ද ඒ දිනවල තදින් දැනිණි. ගොර්බචොව් විසින් හඳුන්වාදුන් "පෙරෙස්ත්‍රොයිකා" නම් සංකල්පය ගැන සංවාද කිරීම සඳහා සංවාද මණ්ඩලයක් විද්වතුන් කීප දෙනෙකු විසින් ගොඩනංවා තිබිණි. එය සංවිධානය කරන්නට මහාචාර්ය අර්ජුන සොයිසා මූලික විය. ඔහු හොඳ මනසක් මෙන්ම හොඳ හදවතක් ද හිමි

ගුණගරුක බුද්ධිමතෙකු විය. එකී සංවාද මණ්ඩපවලට හැරී අභයගුණවර්ධන, හෙ. ශ්‍රියානන්ද, වික්‍රමබාහු කරුණාරත්න, නලින් ද සිල්වා වැනි අය සහභාගි වූහ. මේ අයගේ සංවාද වෙතින් මම නොයෙක් කරුණු උගෙන ගතිමි. විශේෂයෙන් හැරී අභයගුණවර්ධනයන්ගේ ලේඛනවලින් සමාජවාදයේ තවත් පැතිමානයක් දැක ගතිමි. ඔහුගේ තර්කය වූයේ සියලුම ජීවීන් රංචු වශයෙන් සාමුහික වශයෙන් යැපෙනා බවත්, ජීවත්වන බවත්ය. මිනිසා ද දියුණු ජීවියෙකි. එහෙයින් ඔහුට වඩා විධිමත් ස්ථාවර සාමූහික ජීවිතයක් ලබාගත හැකිය යන්නය.

අපේ රටේ සමාජය තුළ සමාජවාදය හා මාක්ස්වාදය එකම ඇරුතින් යොදාගනී. නමුත් එය ඉතාම වැරදි නිගමනයකි. මාක්ස්ට පෙර සිටි බොහෝ යුරෝපීය සමාජවාදීන් එක්කෝ පරාර්ථකාමය, මිනිස් යහගුණය ආගමික සමූහ චින්තනය මත හෝ ජීව, මානව වාදී ලකුණු මත සමාජවාදය හොඳම සමාජක්‍රමය ලෙස නිර්දේශ කළෝය. ලංකාවේ ද බොහෝ සමාජවාදීන් අයත්වන්නේ පළමු ගණයටය. නමුත් මාක්ස් ඔවුන්ට නිග්‍රහ කළේ "මනෝරාජිකයන්" ලෙසය. මාක්ස්ට අනුව නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ සංවර්ධනය ධනවාදයට කළ නොහැකි වන වකවානුවක ඒ සඳහා සමාජවාදය අත්‍යවශ්‍ය වෙයි. ඔහු එය විද්‍යාත්මක සමාජවාදය ලෙස නම් කළේය. මාක්ස්වාදය ලංකාවට පැමිණි මුල් අවස්ථාවේ විද්‍යාලංකාරයේ වල්පොල රාහුල හිමි, උඩකැන්දවෙල සරණංකර හිමි, මාර්ටින් වික්‍රමසිංහ වැනි මහා ප්‍රාඥයින් පවා මාක්ස්වාදයට වසඟවුණේ එහි සඳහන් සාමූහික සමාජය, බුදුරජාණන් වදාළ සාංඝික සමාජයම නවීණ ආකාරයට ගැනීමක් ලෙස සිතාය. මෙයට පටහැනි මතයක් දැරුවේ යක්කඩුවේ හිමියන් පමණි. උන්වහන්සේගේ මතය වූයේ බුදු දහමින් දැමුණු සිත් ඇතිව ඔවුනොවුන් සමග පරෝපකාරයෙන් බැඳුණු ධාර්මික සමාජය මාක්ස්ගේ බඩු භාණ්ඩවලින් බැඳුණු සමාජයට වඩා උසස් සමාජවාදයක් බවය. යක්කඩුවේ හිමියන් මෙන්ම අදීන මතයක් අපේ භාෂාව ගැන පළකළේ කුමාරතුංග මුණිදාසයන් විසිනි. සිංහලය ආර්ය භාෂාවක් ලෙස මැක්ස්මුලර්ගේ වර්ගීකරණයන් ඔස්සේ අපේ විද්වතුන් දැක පුරුදු අවස්ථාවක, සිංහල බස ආර්ය - ද්‍රවිඩ ආදී කුලකවලට දැමිය නොහැකි අනන්‍ය බසක් බව හෙළි පෙහෙළි කළේ කුමාරතුංගයන්ය. එහෙයින් බුද්ධිමය ආදීනත්වය විසින් මේ දෙදෙනාම සුවිශේෂී පුද්ගලයින් වෙති. ඉහත කී අරුත්වලට වෙනස් වූ අරුතක් සමාජවාදය සඳහා මම එක්කළෙමි. ඒ 1990 දී රචිත "සංවර්ධනයේ තුන්වැනි යාමය" නම් කෘතිය මගිනි. එයින් කියවුණේ ලෝකයේ සම්පත් සීමිත වීමත්, පරිසරයට දූෂණය

උකහාගත හැකි ප්‍රමාණය සීමා සහිත වීමත් නිසා අපරිමිත සංවර්ධනයක් ඇතිකරගත නොහැකි බවය. මේ නිසා වත්මන් පරපුර අතරත්, මතු පරපුර සමගත් පරිසර සම්පත් සීමා සහිතව බෙදා හදාගත හැකි සමාජ ක්‍රමයක් ලෙස නව සමාජවාදයක් - (මා එය නම්කළේ හරිත සමාජවාදය ලෙසිනි) - අවශ්‍ය බව කීවෙමි. මෙය වැඩි වැඩියෙන් සංවර්ධනය ඉල්ලන මාක්ස්වාදී සමාජවාදයට පටහැනි ප්‍රවාදයක් ලෙස ඉදිරිත් කළෙමි. ඉන් වසර 19 කට පසු මට පෙනී යන්නේ එය දැන් දැන් කෙතරම් ප්‍රයෝජනවත් ප්‍රායෝගික මතයක් ද යන්නය. 2009 වසරේ දී නයිරෝබි නගරයේ පැවැත් වූ (UNEP) එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ඉදිරිපත් වූ හරිත ආර්ථිකය පිළිබඳ න්‍යාය පත්‍රයේ අඩංගු වූයේ එවන් බෙදා හදාගන්නා ආර්ථිකයක ඡායා මාත්‍රයකි. පසුව මම මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ විධායක අකීම් ස්ටයිනර් සමග සාකච්ඡා කළෙමි. ඔහු මට කීවේ හරිත ආර්ථිකයක් පිළිබඳ මූලික කතිකාව සැකසුණේ ඩේවිඩ් පියර්ස්, අනිල් මර්කන්දා, එඩ්වර්ඩ් බාර්බියර් විසින් රචිත හරිත ආර්ථික විද්‍යාව (BLUE PRINT FOR A GREEN ECONOMY - 1989) නම් කෘතිය මගින්, බවයි. වහාම පොත්හලට ගොස් ඔවුන්ගේ ඒ කුඩා පොත මිල දී ගතිමි. එය කියැවීමෙන් මම මවිතයට පත්වුනෙමි. ඔවුන් ගැන හාංකවිසියක් නොදැන ලෝකයේ වෙනත්ම මුල්ලක සිට මා රචිත කෘතියේත්, ඔවුනගේ දර්ශනයේ හා පවතින තත්ත්වය පිළිබඳ විවේචනයේත්, පුදුමාකාර සමාන බවක් තිබිණි. කෙසේ වෙතත්, හරිත ආර්ථිකය පිළිබඳ නූතනවාදී කෘතියක් නොමැති කමේ අඩුව මම දුටිමි. හරිත අරුණ ( TOWARDS A NEW GREEN ERA ) කෘතිය නිර්මාණය කළේ ඒ අනුවය. එය ජාතිකවත් ජාත්‍යන්තරවත් බොහෝ පරිසරවේදීන් හා දේශපාලකයින්ට යොමු කළෙමි. බොහෝ විද්වතුන් කීවේ තිරසර සංවර්ධනය හා හරිත ආර්ථිකය අතර, අර්ථදීමේ වෙනස ඔවුන් හඳුනාගත්තේ එකී කුඩා කෘතියෙන් බවය.

අර්ජුන සොයිසා මහතාගේ ආරාධනයෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය නිම වීමෙන් පසු (1992) මම විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ගණිත අංශයට බැඳුනෙමි. ඒ දේශකයෙකු හා උපදේශකයෙකු ලෙසයි. මා මූලික වශයෙන් උගැන්වූයේ ඉංජිනේරු ගණිතයයි. අශෝක අභයගුණවර්ධනගේ මග පෙන්වීම යටතේ විද්‍යාත්මක චින්තනය දෙසට නැඹුරු වූයෙමි. අර්ජුන සොයිසා මහතා පසුව එකී විෂය පිළිබඳ වගකීම් ද මා වෙත යොමු කළේය.

ඒ දිනවල විවෘත විශ්ව විද්‍යාලයේ ගණිත අංශයේ ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ද සේවය කළේය. බොහෝ දිනවල මාක්ස්වාදය ගැන ඔහු සමග

විවාදවල පැටලුනෙමි. අර්ජුන සොයිසා මහතා එවිට අප අතර, විවාදයක් සංවිධානය කළේය. එහි ප්‍රතිඵලය වූයේ මාක්ස්වාදය පිළිබඳ මගේ දැනුම තව තවත් සංවිධිත වීමත් එයට පටහැනි මතවාදය තව තවත් ශක්තිමත් වීමත්ය. ප්‍රාග්ධනය, සොබාදහමේ දයලෙක්තිකය, ඩූරින් විරෝධය ආදී මාක්ස් හා එංගල්ස් ලියූ කෘතීන් ගණනාවක් එකී විවාදය නිසා මා හට කියවන්නට සිදුවිය. මට එකී සංවාදයේ දී හැඟී ගියේ අපේ බොහෝ මාක්ස්වාදී බුද්ධිමතුන් මාක්ස්වාදය බොහෝ ගැඹුරින් හදාරා නැති බවය. එහි කොටස් හදාරා ඇති බවය.

වරක් අප විශ්ව විද්‍යාලයේ සිටිනා කාලයේ (1985) අපේ ශිෂ්‍ය නායකයා වූ තිලකසිරි ගාල්ලගේගෙන් අපේ වසරේ සිටි තියුණු ශිෂ්‍යයෙකු වූ උදය ඉඳුනිල් ප්‍රශ්නයක් ඇසුවේය. එය නම් ඔබ මාක්ස්වාදියෙකු වී ඇත්තේ ඇයි කියාය. ගාල්ලගේ ගේ පිළිතුර වූයේ එය විද්‍යාත්මක නිසා යන්නය. විද්‍යාව කියන්නේ කුමක් ද කියා ඉඳුනිල් ඇසුවේය. එයට ගාල්ලගේ දුන් පිළිතුර වූයේ සිද්ධාන්ත - නිගමනය - පරීක්ෂණය - සාධනය යන විද්‍යාත්මක ක්‍රමවේදය අනුව බිහිකරන සිද්ධාන්ත පද්ධතිය කියාය. ඉතින් මාක්ස්වාදී සිද්ධාන්තය පරීක්ෂණයකින් ඔප්පු වී තිබේදැයි ඉඳුනිල් පෙරළා ඇසුවේය. ගාල්ලගේ දුන් පිළිතුර මට දැන් මතක නැත. ඉඳුනිල් පසු කලෙක දිවි නසා ගත්තේය. මියයන විට ඔහු ඇල්බෙයා කැමු, සාත්‍රේ වැනි සාංදෘෂ්ඨික වාදියෙක් හා පරිසර වාදියෙක් බවට පත්ව සිටියේය. නමුත් ඔහු ඇසූ ප්‍රශ්න මාක්ස්වාදීන්ට නම් බරපතල ප්‍රශ්න වෙයි.

විද්‍යාව හා විද්‍යාත්මක චින්තනය ගැන චැල්මර්ස්, කාර්ල් පොපර්, පෝල් පෙයර්බන්ඩ්, තෝමස් කුන්, ආදීන්ගේ මූලික කෘතීන් කියවූයෙමි. එහි දී මට පෙනී ගියේ සිද්ධාන්තවලින් අනාවැකි කීම - (නිගමනකාරී) හෝ අත්දැකීම්වලින් සිද්ධාන්ත තැනීම - (උද්ගමනකාරී) ආදී ලෙස පැවතුණු පැරැණි විද්‍යාත්මක ක්‍රමවේදයන්ට වඩා අතිශය සංකීර්ණ ලෙස බටහිර ලෝකයේ දැනුම එක්රැස් වී ඇති බවය. කොටින්ම දැනුම එක්රැස් කිරීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ගයක් නැති බවත්, දැනුම පවා නිශ්චිත නැති බවත්, ක්‍රමයෙන් සත්‍යය කරා යනවා යන්න විකාරයක් බවත්, එයින් මට පෙනී ගියේය. මගේ සිත් ගත්තේ සුසුමදර්ශය (Paradigm) පිළිබඳ තෝමස් කුන්ගේ සිද්ධාන්තයයි. ලෝක දැක්මක් මත පදනම් වූ වටිනාකම් පද්ධතියක් ඇතිවීමත්, එකී පද්ධතිය ඇතුළත විවිධ කුඩා කුඩා සිද්ධාන්ත රාමූන්

ඇතිවීමත් එයින් පැහැදිලි කෙරිණි. විශේෂයෙන්ම මෙහිදී නිරපේක්ෂ අවකාශය හා කාලය, වස්තූන් මත පදනම් වූ නිව්ටෝනියානු සුසුමදර්ශය හා අයින්ස්ටයිනියානු සුසුම දර්ශය සාකච්ඡා විය. භෞතික විද්‍යාවේ මතු වූ මේ සුසුමදර්ශය පිළිබඳ අදහස සංවර්ධනය හා සමාජක්‍රමයන් විග්‍රහ කරන්නට පසුව මම යොදා ගත්තෙමි. මෙය මවිසින් රචිත "සාපෙක්ෂා" (1994) කෘතියේ විස්තර කරන ලදී.

ඒ දිනවල අර්ජුන සොයිසා මහතාත් මමත් කීප විටක් දාර්ශනික සංවාද සඳහා පේරාදෙණියට ගියෙමු. පේරාදෙණි දර්ශන අංශයේ ගුණපාල ධර්මසිරි, ඩයස් ගුණරත්න, පී.ඩී. ප්‍රේමසිරි වැනි මහාචාර්යවරු එහිදී අපට හමුවිය. ඒ සාකච්ඡාවලින් දර්ශනයේ මූලික ප්‍රශ්න පිළිබඳවත් බුදු දහමේ ඒ පිළිබඳව ඇති විග්‍රහ පිළිබඳවත් සංයුක්ත දැනුමක් මට ලැබිණි. හේගල්, කාන්ට් හා හියුම් ගැඹුරින් හදාරන්නට මට හැකියාව ලැබිණි. දර්ශනයේ මූලික ප්‍රශ්නය අපේ ඉන්ද්‍රියන්ට දැනෙනා, අත්දැකීමක් කරගත හැකි ලෝකයට වඩා වෙනත් ලෝකයක් තිබේද? එසේනම් එය පවතින බව අප දැනගත්තේ කෙසේද යන්න ලෙස හඳුනාගතිමි.

මේ කාලයේ දිනෙක චරිත හේරත් විසින්, මා හට ප්‍රිටිජෝෆ් කප්රා විසින්, රචිත "භෞතික විද්‍යාවේ තාවෝ වාදය" (TAO OF PHYSICS ) කෘතිය ලබාදුන්නේය. එය කියවීමෙන් ඉමහත් ආශ්වාදයක් ලබාගත්තෙමි.

පසුව ඔහු විසින්, රචිත ඉතිහාසයේ සන්ධිස්ථානය ( TURNING POINT ) හා හරිත දේශපාලනය පිළිබඳ කෘතීන් ද කියවීමි. භෞතික විද්‍යාවේ ගැඹුරු ප්‍රශ්න කලාත්මක ලෙස නවකතාවක් ලෙස රචනා කරන්නට ඔහුට තිබූ අපූරු හැකියාව පිළිබඳ තවමත් මම පුදුම වෙමි.

කප්රා විසින්. පුබුදුවන ලද සිතුවිලි අනුව යමින් භෞතික විද්‍යාවේ සිද්ධාන්ත ගැඹුරින් හදාරන්නට වූයෙමි. මා උසස් පෙළ භෞතික විද්‍යා ප්‍රශ්න පත්‍රයට පිළිතුරු දෙත් දී එක්තරා ප්‍රශ්නයකින් අසා තිබූ චුම්භක ස්‍රාවය පිළිබඳ ගැටලුවකට හිරවුනෙමි. එවකට මා උගත් ආකාරයට විද්‍යුත් හෝ චුම්භක ප්‍රශ්න ඒවා අවකාශයේ ඇති කුඩා අංශු ලෙස සැලකීමෙන් හෝ අවකාශයේ පැතිරී ගිය ස්‍රාවයන් ලෙස සැලකීමෙන් හෝ විසඳිය හැකි වෙයි. ඉහත කී ගැටලුව මේ දෙයාකාරයෙන්ම විසඳීමට මා උත්සාහ කළ ද එය අසාර්ථක විය. මේ ගැන ගුරුවරුන්ගෙන් ලත් පිළිතුරුද මා සෑහීමකට පත් නොකළේය.

පසුව මා දැනගත්තේ විද්‍යුත් චුම්භකයේ ඇතැම් ගුණාංග ඒවා අංශු ලෙස ගැනීමෙන් ද ඇතැම් ගුණාංග ඒවා තරංග ලෙස ගැනීමෙන් ද විසඳිය හැකි බවය. ඒ දෙක සැමවිටම එකක් බවට පත්කළ නොහැකි බවත්ය. මා උසස් පෙළ දී විසඳන්නට ගියේ අයින්ස්ටයින් හා බෝර් ආදීන් විසින් දශක ගණනක් විවාද කළ අද දක්වා පවතින අංශු - තරංග විවාදයයි. මට හෝ මගේ ගුරුවරුන්ට එයට පිළිතුරු නොපැවතීම ගැන දැන්නම් මට කිසිම කනගාටුවක් නැත. නමුත් ඒ ගැටලුවේ එරී සිටීම නිසා මට භෞතික විද්‍යා උත්තර පත්‍රයේ සෙසු ප්‍රශ්න විසඳීමට කාලයක් නොවීම ගැන නම් තවමත් කනගාටුවක් ඇත.

උසස් පෙළ ගණිතය මා හට ඉගැන්වූ සෙන්දනායක මහතාත් භෞතික විද්‍යාව ඉගැන්වූ ග්‍රෙගරි ප්‍රනාන්දු මහතාත් යන දෙදෙනාගෙන්ම මා ඇසූ ප්‍රශ්නයක් විය. එනම් මේසයට ගසත්දී අපේ අතට දැනෙනා "භෞතික බලය" ගුරුත්වය සම්බන්ධයෙන් අපට නොදැනෙන්නේ ඇයි? කියාය. ඒ දෙදෙනාම මට කීවේ එකී බල දෙකේ කිසිම වෙනසක් නැති බවය. සෙන්දනායක මහතා මට පසුව කීවේ ප්‍රශ්නය බරපතල එකක් බවත්, එය නොසිතා ගණන් හදනා ලෙසත්ය. වසර දහයකට පසු මේ පිළිබඳව සොයා යත්දී මට භෞතික විද්‍යාවේ සිටි ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා හමුවිය. ඔහු නිව්ටන් හෝ ඩේකාර්ට් හෝ අයින්ස්ටයින් නොව අර්නස්ට් මාක්ය.

මාක් ඉතා නිවැරදි දාර්ශනික ප්‍රශ්න කීපයක් ඇසුවේය. අපේ මිණුම් මාපකවලට - නොදැනෙන ලෙස කාලය හෝ අවකාශය පවතීද? අපේ ඉන්ද්‍රියයන්ට නොදැනෙන ලෙස වස්තු පවතීද? පවතීනම් ඒවා අප දැනගන්නේ කෙසේද?

මාක් නිර්භීත ලෙස කීවේ අපේ ඉන්ද්‍රියන්ට, උපකරණවලට නොදැනෙන කාලයක්, අවකාශයක් හෝ වස්තු නොපවතින බවය. එයින් නිවුටන්ගේ ලෝකය අභියෝග කෙරිණි. අයින්ස්ටයින් කාලය හා අවකාශය පිළිබඳ තිබූ මාක්ගේ මතවාදය ගණිතයටත් ප්‍රායෝගිකත්වයටත් ගෙනආවේය. නීල්ස් බෝර් - හයිසන්බර්ග් වැන්නන් වස්තුවල පැවැත්ම ඉන්ද්‍රීන්ට - උපකරණවලට සාපේක්ෂ බව ගණිතයට හා ප්‍රායෝගික පරීක්ෂණවලට ගෙනආවේය. සුප්‍රසිද්ධ අයින්ස්ටයින් - බෝර් විවාදය තවමත් පවතී. බොහෝ දෙනෙක් නොදන්නවාට අයින්ස්ටයින් මැවුම්කාර දෙවියන් හා දේව සැලැස්ම විශ්වාස කළ හොඳ යුදෙව්වෙකු විය. එය යම් දුරකට අභියෝග කළේ නීල්ස්බෝර් හා ඔහුගේ කෝපන්හේගන් දාර්ශනික ගුරුකුලය විසිනි.

සාපේක්ෂතා වාදය හා ක්වන්ටම් යාන්ත්‍රණයේ ඇති යථාර්ථය පිළිබඳ තත්ත්වය විග්‍රහ කරමින් මම ශාස්ත්‍රීය ලිපියක් - ක්වන්ටම් යථාර්ථය (Quantum Reality) නමින් පළකළෙමි. එයට අමතරව අපේ පාසල් දරුවන්ගේ උනන්දුව උදෙසා විදුසර සඟරාවට ලිපි මාලාවක් සපුමල් සේනානායක නමින් ලියා පළ කළෙමි. විද්‍යාත්මක ලෝකයේ වාද විවාද පිළිබඳව උගෙනීමෙන් මා ලද දැනුම හා ආශ්වාදය බෙදා ගැනීමටත් වැඩිදුරටත් ඒ දැනුම සංවිධිත කර ගැනීමටත් එයින් මට හැකිවිය. පසුව මේ ලිපි පෙළ "ක්වන්ටාවක නිවන" නම් කෘතියක් ලෙස සකස් කළද එය පළකළ නොහැකි විය.

කුඩාකල සිට යම් විෂයයක් පිළිබඳ ඉගෙනීමෙන් පසු ඒ පිළිබඳ ලිවීම, අන් අයට ඉගෙන්වීම මගේ පිළිවෙත විය. උසස් පෙළට ඉගෙන ගන්නා කාලයේ දී මගේ පන්ති කාමර සගයින්ට සවස්වරුවේ ගණිත ඉගෙන්වීම මගේ විනෝදය විය. එමගින් විෂයේ ගැඹුරු තැන් පිළිබඳ අලුත් අවබෝධයක් මා වෙත ලැබිණි. විශ්ව විද්‍යාලයේදී ද අනුනට ඉගැන්වීමෙන් ඒ ලෙසම විනෝදයක් හා අවබෝධයක් ලබාගතිමි. අප උගන්වන්නේ අපේ මතකය ද නැත්නම් අපේ අදහස් ද කියා තමනට සැකයක් ඇතැයි වරක් ලලිත් ඇතුළත්මුදලි ප්‍රකාශ කර තිබිණි. මා සිතන්නේ අපි උගන්වන්නේ අනුන්ගේ දැනුම අපේ ලෙස ගැනීමෙන් තනාගත් නව අදහසක් බවයි. කොටින්ම දැනුම පිළිබඳ අපේ කියවීම බවයි. එය අපේ සිසුන් උකහා ගන්නේ ද ඔවුන්ගේ දෙයක් ලෙස බවයි.

මගේ දැනුම දර්ශනය, විද්‍යාව, ආර්ථිකය, පරිසරය, සමාජය, දේශපාලනය යන ක්ෂේත්‍රවල එක්තරා පරිණත අවස්ථාවකට පැමිණි කළ මම නව කෘතියක් කළෙමි. එයට "සාපේක්ෂා" ලෙස නම් තැබුවෙමි. සොබාදහම කිසිදු සිද්ධාන්තයකට අනුව ක්‍රියා නොකරන බවත්, එහි ඇතිවන රටා අපේ දැනුමෙන් නිර්මාණය වන බවත්, පැහැදිලි කළෙමි. මිනිස් සමාජය හුදු මිනිස් ආත්මීය නිර්මාණයක් බවත්, එය ඒ නිසාම ස්වභාව දහමට වඩා වෙනස් ලෙස හැසිරෙන බවත් ඇතැම්විට රීතිවලට යටත්ව හැසිරෙන බවත්, (එය මිනිස් නිර්මාණයක් නිසා) එමෙන්ම එහි හැසිරීම් අනාවැකිවලින් කිව නොහැකි බවත්, ප්‍රකාශ කළෙමි. මාක්ස්වාදය හෝ බටහිර රටවල එන සිද්ධාන්තවාදය මෙන් ලෝකය තනි එක සිද්ධාන්තයකට ගත නොහැකි බව, ලෝකය අපේ ඉන්ද්‍රියයන්ට මනසට, දැනුමට, අවට සමාජයට, පරිසර පද්ධතියට, විශ්ව සබඳතාවලට සාපේක්ෂ බවත් එහි හරය විය. මාක්ස්වාදී - ලිබරල්වාදී

ආර්ථිකය සංවර්ධන චින්තනය ආදිය පිළිබඳ විවේචනයක් ද එයට ඇතුළත් විය.

මේ පාරිසරික දර්ශනය ඔස්සේ එක් වූ අපි කණ්ඩායමක් 1992 දී "ජනතා මිතුරෝ" පිහිටුවූයෙමු. අතුරලියේ රතන හිමි, මාලික විමලසූරිය, අශෝක අභයගුණවර්ධන හා මා එහි මූලිකයෝ වූයෙමු. භීෂණයෙන් හිරිවැටුණු සමාජය වෙතට නිල් අහස හා පළාවන් බිම පිළිබඳ අලුත් අදහසක් සමග අපි ගමන් කළෙමු. එය අප හැඳින්වූයේ ප්‍රඥාව රොද බඳින තණ පත ද කතා කරනා දේශපාලනයක් ලෙසය.

ජනතා මිතුරෝ ගොඩනැගීමේ දී ඇත හම්බන්තොට වීරකැටියේ ජනක බණ්ඩාරගේ (සබරගමුව ආණ්ඩුකාර) නිවසත්, අතුරලියේ රතන හිමියන්ගේ මාතර පල්ලිමුල්ල ආනන්දාරාමයත්, අශෝක අභයගුණවර්ධනයන්ගේ හබරාදූවේ පැරණි නිවසත්, විශේෂයෙන් බන්දුල චන්ද්‍රසේකරයන්ගේ රත්තනපිටිය නිවසත් මූලික විය. බන්දුලගේ මාමා දැඩි ප්‍රතිපත්තිගරුක මාක්ස්වාදියෙකු වූ අතර, ඔහුගේ අනුගාමිකයෝ හොඳ පුස්තකාලයක් හා මුද්‍රණාලයක් පවත්වාගෙන ගියහ. මේ දෙකත් ඔහුගෙන් ලැබුණු රැකවරණයත් මුල් යුගයේ අපේ ජීවිත අවශ්‍යතා ඉටුකරලීමට සමත් වූ බව අදත් සිහිකරන්නේ කෘතඥපූර්වකවය.

'ජනතා මිතුරෝ' පිහිටුවීමත් සමග අපි විශ්ව විද්‍යාලවල සිසුන් සමග නව සංවාදයකට ගියෙමු. අපේ සම්ප්‍රාප්තිය සමග ඒ වනවිට තැන තැන නැවත එකතු වෙමින් සිටි ජ.වි.පෙ කාඩරයින් කලබලයට පත්විය. නමුත් ඔවුන් බොහොමයක් සිටියේ රජයේ හා වාමාංශික සන්නද්ධ කල්ලිවලට බියෙනි. කොටින්ම 1990-91 වකවානුවේ විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය සභා සඳහා ඉදිරිපත්වීමටත් කිසිවෙක් නොසිටියහ. කොළඹ විශ්ව විද්‍යාලයේ සෘජුවම ස්වාධීන ශිෂ්‍ය සංගමයේ ප්‍රචණ්ඩ බලය ඉතිරී ගොස් තිබිණි. ගුටි කමින්, රාජ්‍ය මර්දනයට මුහුණ දෙමින් ශිෂ්‍ය සභා නැවත ක්‍රියාකාරී කළේ අපය. විශේෂයෙන් 1983 දී තහනම් කර 1985 දී අහෝසිකර, 1988 දී නැවත දිනාගත් ශිෂ්‍ය සභා ක්‍රියාකාරී කළයුතු බව අපේ අධිෂ්ඨානය විය. එයට හේතු දෙකක් විය. පළමුවැන්න රජය සමග සාකච්ඡාවලදී (1988) නව ශිෂ්‍ය සභා පනත කෙටුම්පත් කළේ අප කීපදෙනෙකු විසිනි. ඒවා ක්‍රියාත්මක කරලීම එහෙයින් අපේ වගකීමක් විය. අනික් අතට නිල ආයතන අක්‍රීය වුවහොත් නැවතත් ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු හරහා නිල නොවන, ශිෂ්‍යයින්ට වග නොකියන දේශපාලන කාඩර විසින්, නටවන ආයතන ඇතිවේ යැයි අපි බියවීමු. ජ.වි.පෙට අවශ්‍යව

තිබුණේ නිලවරණ නැති එවැනි ආයතනයි. අපේ උත්සාහය සාර්ථක විය. බොහෝ විශ්වවිද්‍යාල නිලවරණ සහිතව ශිෂ්‍ය සභා පිහිටුවා ගත්හ. තමනට ශිෂ්‍ය බලය පාලනය කළ නොහැකි බව දුටු ජ.වි.පෙ කාඩර්වරු එකී ශිෂ්‍ය සභාවලට පොදු ශිෂ්‍යයන් ලෙස රිංගා ගත්හ. ජ.වි.පෙ හෙමිහිට සිය ප්‍රතිසංවිධාන කටයුතු සඳහා මංගල සමරවීරත් මව් පෙරමුණත් යොදාගත් අතර, එහි සම සංවිධායක වූ මහින්ද රාජපක්ෂ සමග දිගින් දිගටම ගැටුම් ඇතිකරගත්හ. ජනතා මිතුරෝ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පුරාවාලනු ඇතැයි බියට පත් ජවිපෙ සිය විවෘත කටයුතු ද වේගවත් කළේය. අවසානයේ ඔවුනට ආධාර ලැබුණේ ඔවුන් මර්දනය කළ යූඑන්පී ආණ්ඩුවෙන්මය. එළැඹෙන මහා මැතිවරණයේ දී (1994) හා ජනාධිපතිවරණයේ දී ජවිපෙ ඡන්ද පොදු පෙරමුණට එක්වීම වැළැක්වීම සඳහා ජ.වි.පෙ කරලියට ගැනීමට යූ.එන්.පී ආණ්ඩුවට ද අවශ්‍යතාවයක් ඇති වී තිබිණි. ප්‍රගතිශීලී පෙරමුණ එහි ප්‍රතිඵලය විය.

ජනතා මිතුරෝ විසින් මූලික වශයෙන් ලංකා දේශපාලනයේ හරවත් වෙනසක් ඇතිකරන ලදි. එයනම් පරිසර හිතකාමී "හරිත දේශපාලනය" මුල්වරට හඳුන්වා දීමයි. සුපුරුදු පරිදි අපට විවේචනය ආවේ මාක්ස්වාදයෙනි. ජ.වි.පෙන් 1971 දී බිඳිගිය ජනතා සංගමයේ සාමාජිකයන් විසින් පවත්වාගෙන ගිය "දියැස" සඟරාව එහිලා අපව දැඩි ලෙස විවේචනය කළේය. එය අපට උපකාරයක්ම විය. මාක්ස්වාදී දයලෙක්තිකයේ සීමාව හා යාන්ත්‍රික වාදය, මාක්ස්වාදී ආර්ථික විද්‍යාවේ සීමා හා ශ්‍රම සූරාකෑමට වඩා පරිසර සූරාකෑම බලවත් බව පෙන්වීම, මාක්ස්වාදී සමාජ සංවර්ධන න්‍යායේ බොළඳකම, අසාර්ථක කම හා පන්ති සටනේ විකෘතීන් පෙන්නා දීමට අපට හැකිවිය. යුගෝස්ලාව් දාර්ශනික ජිලාස් කී අයුරු රදළයින් හා ගොවියන් ගැටෙත් දී, ධනපතීන් පෙරට ආ අයුරින් ධනපතීන් හා කම්කරුවන් ගැටෙත් දී වෘත්තීයවේදීන් බලය පැහැර ගැනීම පිළිබඳ විවාදයන් ද ඇතිවිය. විශේෂයෙන් පරිසර හිතකාමී තාක්ෂණය පිළිබඳ මූලධර්මයන්, පරිසර හිතකාමී ගොවිතැන පිළිබඳ මූලධර්මයන්, රාජ්‍ය සංවිධානය පිළිබඳ නව මූලධර්මයන් හඳුන්වා දීමට අපට හැකිවිය. ජපන් ජාතික ෆුකුයාකෝ ලියූ පිදුරු ගසක විප්ලවය (One straw revolution) කෘතිය සිංහලට යොදා ගනිමින් රසායනික පොහොර, කෘමි හෝ වල් නාශක නැති ගොවි තැන පිළිබඳ මා ලියූ ලිපි පෙළ දිවයින බදාදා සංග්‍රහයේ අතිශයින් ජනප්‍රිය විය.

විශ්ව විද්‍යාලවල, ඒ වනවිට ශීඝ්‍රයෙන් පැතිර ගිය රාජ්‍ය නොවන සංවිධානවල, ගම්වල, විහාරස්ථාන ආශ්‍රිතව ආදී තැන්වල රැඳී සිටි දේශපාලන

උනන්දුව සහිත බොහෝ තරුණ හා වැඩිහිටි පිරිස් අතර අපේ මතය සක්‍රීයව ගෙනයන්නට හැකිවිය. මුලදී කෙසේ වෙතත්, දශකයකට පමණ පසු ඔවුන් ක්‍රමයෙන් අපේ මතවාදවලට පිවිසුණු බව පසුව මට පෙනී ගියේය. ජව සම්පන්න තරුණ බුද්ධිමතුන් පිරිසක් කාඩරය ලෙස දිනාගන්නට අපට හැකිවිය.

1990-91 වකවානුව ශීඝ්‍ර ලෙස රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ත වූ කාලයක් විය. ප්‍රේමදාස පාලනය බටහිර ලෝකය සමග ප්‍රශ්න තනාගෙන තිබුණේය. ප්‍රේමදාසගේ නිර්ප්‍රභූ ලුම්පන් සමාජ කණ්ඩායම යූඑන්පීයේ සම්ප්‍රදායික ප්‍රභූ පන්තියෙන් වෙන්වී වැඩෙන්නට විය. රන්ජන් විජේරත්න මිය යෑමත්, ලලිත් - ගාමිණී කැරැල්ලත් විසින් ප්‍රේමදාස බටහිර ලෝකය ඉදිරියේ හුදකලා විය. මානව හිමිකම්, ප්‍රජාත්‍රන්තවාදය, මාධ්‍ය නිදහස, පරිසරය සුරැකීම, ආගමික සමගිය ආදිය ඔස්සේ හතු පිපෙන්නා සේ රාජ්‍ය නොවන සංවිධාන බිහිවන්නට විය. විපක්ෂයට වඩා ඉදිරියෙන් මේ සංවිධාන සිටගත්තේය. මෙය පෝලන්තය හා නැගෙනහිර යුරෝපයේ කොමියුනිස්ට් පාලනයන් බිඳ දැමීමේදී ද අත්හදාබලා සාර්ථක වූ බටහිර උපායකි. ප්‍රේමදාසට රැහැනිව සිටි බොහෝ වාමාංශිකයන් දැන හෝ නොදැන මේ ජාත්‍යන්තර එන්.ජී.ඕ ජාලයට හසුවූ අතර, අන් කිසි රැකියාවකට හැකියාවක් නොවූයෙන් ඒවායේම පූර්ණ සේවකයින් බවට ඊලඟ වටයේදී හසුවූහ. එන්.ජී.ඕ. ජාලය රටේ මතවාද හසුරුවන වෙනම බල ජාලයක් බවට පත්විය.

හරිත දේශපාලනයක් පිළිබඳ දාර්ශනික ප්‍රවාදයන් ඉදිරියට ගෙන ගිය ද සමාජයේදී අපට සිදුවූයේ ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස වෙනුවෙන් සටන් කිරීමටය. ඇතැම් මාකස්වාදීන් අපට චෝදනා කළේ පරිසරය සුරැකීම වාම් සරළ ජීවිත වැනි සටන් පාඨවලින් අපේ ලෝකයේ සංවර්ධනය ඇන හිටවා බටහිර ධනපති ලෝකයටම ඒ සම්පත් ටිකත් ලබාදීමට අප ක්‍රියාකරනා බවයි. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්නවලින් අපි දුරස්ථ බවයි. මේ නිසා ඉක්මණින්ම අපේ බාහිර මුහුණත මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීම බවට පත්විය. මරා දමනු ලැබූවන්ගේ ආත්මයන් යුක්තිය ඉල්ලා සිටි අතර, එය අපගේ ආත්මීය වගකීම බවට පත්විය. අපි ප්‍රේමදාස පළවාහැරීමේ ප්‍රජාතන්ත්‍රවාදී අරගලයට එක්වුනෙමු.

ප්‍රේමදාස පැන්නීම සඳහා දේශපාලන වැඩපිළිවෙළක් තිබෙන බව මට මුලින්ම දැනුම් දුන්නේ රාවයේ සුනිල් ජයසේකරය. (1991) එයින් මම අමන්දානන්දයට පත්වුනෙමි. රන්ජන් විජේරත්න මිය ගියදා අපේ

නේවාසිකාගාරවල ප්‍රීති උත්සව පැවැත්විණි. කැරැල්ලෙන් පසු විශ්ව විද්‍යාල විවෘත කළවිට කවුදෝ අපේ පන්ති කාමරවල "රන්ජන් ඔබට තුති" " Thank you Ranjan" කියා ලියා තිබීම ගැන ඇති වූ ප්‍රකෝපයත් එයින් පිටවී ගියේය. ජවිපෙ විසින් සිරකර තිබූ එක් ශිෂ්‍ය කණ්ඩායමක් රන්ජන්ට රහසේ ආශිර්වාද කළ අතර, තවත් පිරිසක් ඔහුට වෛර කරමින් සිටි බව එයින් පෙනී ගියේය. රන්ජන්ගේ මරණයෙන් පසු ප්‍රේමදාස ප්‍රභූ පන්තිය සමග ගෙනගිය සමතුලිත බව අවසන් විය. ලලිත් - ගාමිණී එක්වී ප්‍රේමදාස නෙරපීම සඳහා දෝෂාභියෝග වැඩපිළිවෙළ ඉදිරිපත් කළෝය. (1991)

දෝෂාභියෝගයෙන් පසු මම ලලිත්, ගාමිණී දෙදෙනාම හමුවුනෙමි. ලලිත් යම් ආරූඪකරගත් බුද්ධි පෞරුෂයක් පෙන් වූ අතර, ගාමිණී සුහද මිත්‍රත්වයක් පෙන්වූයේය. දෙදෙනාටම ලංකාවට ක්‍රියාශීලී ජනාධිපතිවරුන් වීමට ඉඩ තිබිණි. එවැනි හැකියාවක් ශ්‍රී.ල.නි.පයේ නායකයින් අතර විද්‍යමාන වූයේ නැත. රතන හාමුදුරුවෝ ගාමිණී සමග හොඳ සබඳතාවයක් ගොඩනගා ගත් අතර, එක්වරකට වඩා මා ගාමිණී හෝ ලලිත් හමුවූයේ නැත. දෝෂාභියෝගය හා බැඳුනු ප්‍රේමදාස විරෝධී අරගලයට අපේ උපරිම දායකත්වය ලැබිණි. පසුව මට හැඟී ගියේ එය නිර්ප්‍රභූ ප්‍රේමදාසට එරෙහිව ප්‍රභූවරු ගැසූ කැරැල්ලක් බවය. පසුව මේ ප්‍රභූවාදයේ කතුරට අපව ද හසුවන විට ප්‍රේමදාස පිළිබඳ අනුකම්පාවක් ඇති නොවුනා නොවේ. ජෙනරාල් කොබ්බෑකඩුව ඝාතනය ප්‍රේමදාස පිළිබඳ වෛරය තීව්‍ර කළ අවස්ථාවක් විය. කවුරු කෙසේ කීවත් කොබ්බෑකඩුව - විමලරත්න ඝාතනය සඳහා කුමන හෝ සම්බන්ධයක් ආණ්ඩුවේ මාෆියාවක තිබිණි. ඇතැම්විට ආණ්ඩුව හා කොටි අතර, ද්විත්ව ඔත්තුකරුවන් හරහා එය කළා විය හැකිය. පිපිරීම සිදු වූ මොහොතේ ගනු ලැබූ ඡායාරූප මා සතුව තිබූ අතර, එයින් පෙනී ගියේ එය බිම් බෝම්බයක් නොවන බවය. ඒවා මට ලබාදුන්නේ කොළඹ ඡායාරූප ශාලාවක සේවකයෙකු විසිනි. කොබ්බෑකඩුවගේ අවමඟුල් ගෙය ප්‍රේමදාසට එරෙහි කැරැල්ලක් බවට පත්කරන්නට අපට හැකිවිය. ප්‍රේමදාස සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව අතර, යම් විශ්වාසයක් වුණිනම් ඒ මේ ඝාතනය සමග විනාශ වී ගියේය. එය යළිත් ගොඩනැගිය නොහැකි මතවාදී බිඳවැටීමක් විය.

ලලිත් ඝාතනයට එරෙහි උද්ඝෝෂණය හා ඒ සමග පැවැති පළාත් සභා මැතිවරණය සඳහා අපි සක්‍රීයව දායක වූයෙමු. 1988 පක්ෂ නායක රැස්වීම්වලදී හඳුනාගත් ධර්මසිරි සේනානායක මහතාගේ සහායෙන් ඉහළ තලයේ දේශපාලන තොරතුරු බොහොමයක් අප වෙත ලැබිණි. විශේෂයෙන්

අනුර - චන්ද්‍රිකා ගැටුම එහි දී මූලික විය. 1993 පැවැත්වූ තීරක දකුණු පළාත් සභා මැතිවරණයේ දී අපි තීරණාත්මකව ක්‍රියා කළෙමු. ගුටි කමින් බඩගින්නේ සැතපුම් ගණන් පයින් යමින් අමරසිරි දොඩංගොඩගේ ආකර්ෂණීය "දකුණ වමට" තේමා පාඨය පෙරට ගෙන ගියෙමු. ප්‍රජාතන්ත්‍රවාදී නිදහස පොදුවේ අපේ තේමාව විය.

ප්‍රේමදාස හා යූ.එන්.පී පාලනයට එරෙහිව "පුරවැසි පෙරමුණ" නමින් අපි සංවිධානය වී දැවැන්ත ප්‍රදර්ශනයක්  ද සංවිධානය කළෙමු. එය ප්‍රේමදාස මර්දනය කළේය. පසුව අපව අත්අඩංගුවට ගත් අතර, ඔත්තුව දී තිබුණේ මංගල සමරවීරගේ නිවසෙනි. රුවන් ෆර්ඩිනැන්ඩස් ද ඒ දිනවල ජ.වි.පෙ ප්‍රතිසංවිධාන කටයුතුවලට අමතරව මංගලගේ ද ලේකම් කටයුතුවල නියැලී සිටියේය. සිර ගෙදරින් නිදහස් වී අපි කෙලින්ම එක්වූයේ මහින්ද රාජපක්ෂ සංවිධානය කළ කතරගම පා ගමනටය. බොහෝ දෙනෙක් ඒ සඳහා පුදුමාකාර කැපවීම් කළහ. විශේෂයෙන් දරුවන් අතුරුදහන් වූ අම්මලා එහිදී අති විශේෂිත විය.

අම්මලාගේ කඳුළු හා දරුවන්ගේ කැපවීම මගින් ප්‍රේමදාස පාලනයට එරෙහි බහුවිධ පෙරමුණක් ඇතිවිය. ප්‍රේමදාස ඝාතනයෙන් සිදුවූයේ එකී බලවේගය තවත් වේගවත් වීම පමණි. වරක් ප්‍රේමදාස පවුල වෙනුවෙන් ඝාතනයන්ට පවා සහභාගී වූ අයෙක් මා හට කීවේ ප්‍රේමදාස වරක් ප්‍රභාකරන්ට හමුදාපති පදවිය යෝජනා කළ අතර, බාලසිංහම්ට අගමැති පදවිය යෝජනා කළ බවය. ඒ අතරේ මහත්තයා සමග හිතවත් වී ප්‍රභාකරන් ඉවත් කිරීම ගැන ද කල්පනාවක් ඔහුට වූ බවත්, ප්‍රභාකරන් ඔහුට වඩා සූක්ෂම වී ප්‍රේමදාස හා මහත්තයා දෙදෙනාවම ඉවත් කළ බවත්ය. මෙයට සමාන අදහසක් කලක් නැගෙනහිර කොටි නායකයෙකුව සිටි අයෙක් ද මා හට ප්‍රකාශ කළ නිසා එය ඇත්තක් විය හැකි යැයි මට ඒත්තු ගියේය. කෙසේ වෙතත්, ප්‍රේමදාස මරණයෙන් මිස ඉවත්කළ නොහැක්කක් බව ඒ දිනවල මාගේ තේරුම් ගැනීම විය. කෙසේ වෙතත් ඔහුගේ මරණය දා කාලකණ්ණි සතුට විඳගත් අය අතර මාද එක් අයෙක් වීම ගැන පසුව මම හදවතින්ම කනගාටු වූවෙමි.

ප්‍රේමදාස විරෝධී බහුජන අරගලය යටින් කදිම විජාතික කුමන්ත්‍රණයක් දියත් විය. එමගින් සිදුකිරීමට ගියේ විවෘත ආර්ථිකය ඒ ලෙසම ගෙනයන අතරේ ප්‍රභාකරන්ට ෆෙඩරල් රාජ්‍යයක් ලබාදෙන දේශපාලන ක්‍රියාදාමයක්  දියත් කිරීමය. චන්ද්‍රිකා - මංගල - එස්.බී සහ ඔවුන් වටා සිටි ජයදේව උයන්ගොඩ -

වික්ටර් අයිවන් - වසන්ත රාජා වැනි අය ද සිතා සිටියේ ද බහුජන අරගලයට මුවා වී බටහිර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමය. මෙය පසුපස සිටියේ එවකට එක්සත් ජනපද තානාපතිනී ටෙරිස්ටා ෂේපර් මහත්මියයි. අපි මේ බව දැන සිටියෙමු. නමුත් රට ඉල්ලා සිටි ප්‍රජාතන්ත්‍රවාදී නිදහසට අපි මුල්තැන දුන්නෙමු.

මගේ පළමු ඡන්දය 1994 දී පොදු පෙරමුණට පාවිච්චි කළෙමි. චන්ද්‍රිකා අගමැති වී පසුව ජනාධිපති වූවාය. ගාමිණී දිසානායක ඝාතනයෙන් ඇයට ලැබුණු 62%ක ජනවරම ඇය මෙන්ම ඇයගේ කේවට්ටයින් ද උද්දාමයට පත්කරවූයේය. ඔවුන් වේගයෙන් සිය සැලසුම පෙරට ගත්හ. චන්ද්‍රිකා කළ යුත්තේ කුමක්ද යන්න ගැන ජනතා මිතුරෝ විසින්, රටපුරා සම්මන්ත්‍රණ වටයක් පවත්වන ලදි. නමුත් විජාතික බලවේග සිය සැලසුම ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කළහ. ප්‍රභාකරන් සමග ගිවිසුම්වලට එළඹුණු අතර, සාමය පිළිබඳ මහත් බලාපොරොත්තු ඇතිකරනා ලදි. පෙර නොවූ විරූ ප්‍රචාරක රැල්ලක් දියත් විය. සාම සාකච්ඡා අතරේ පුපුරණ ද්‍රව්‍ය ටොන් 60ක් හා සැම් මිසයිල ගොඩබා ගැනීමෙන් පසු ප්‍රභාකරන් යුද්ධ ප්‍රකාශ කළේය. ආණ්ඩුව සාම යුද්ධයට ගිය නමුත් ඇතුළත පළමු බෙදීම ඇතිවිය. දෙමළ ජාතිවාදී කේවට්ටයින් ආණ්ඩුවෙන් එළියට විසිවිනි. තවත් පිරිසක් සුදු නෙළුම හා තවලම හරහා එයට ඇතුළත් වූහ.

1994 මැතිවරණ වෙනසක් සමග ජනතා මිතුරෝ ද එක්තරා සන්ධිස්ථානයකට පිවිසුණේය. එය කරුණු තුනක් නිසා සිදුවිය. එකක් නම් එහි ඉහළ නායකයින් සියලු දෙනාටම ලාබාල තරුණ වියේ සිට තරුණ විය දක්වාම කළ දේශපාලනික කැපවීම නිසා පුද්ගලික ජීවිතයේ බොහෝ දේ අහිමි වී තිබීමය. සමහරුනට දෙමාපියන් හා සොයුරු සොයුරියන් නඩත්තු කිරීමට සිදු වී තිබිණි. තව සමහරුනට ගේදොර ඉඩකඩම් බලා ගැනීම ස්ථිර රැකියාවක් සොයාගැනීම ආදිය අවශ්‍යව තිබිණි. ඇතැමුනට ආචාර්ය උපාධිය වැනි ඉලක්කයන්ද තිබිණි. විවාහයද මූලික ප්‍රශ්නයක් විය. අනෙක් අතින් "ජනතා මිතුරෝ " සංවිධානයක් ලෙස ගොඩනැගුන ද එය දිගට පවත්වාගත හැකි මූල්‍ය යාන්ත්‍රණයක් නොවීය. ජ.වි.පෙ, එල්.ටී.ටී.ඊ වැනි ව්‍යාපාර හොඳ නරක දෙවර්ගයේම ව්‍යාපාර ගෙනගියහ. තමන්ගේම කියා වූ ව්‍යාපාරික ජාලයන් පවත්වා ගත්හ. වෙනත් සංවිධානවලට වෘත්තීය සමිති, විදේශ ශාඛා, විදේශ ආයතන, ආදියෙන් අරමුදල් ලැබිණි. අපි මේ කිසිවක් කිරීමට අසමත් වූයෙමු. අප කළේ අපගේ ශ්‍රමයෙන් ලැබුණු දේවලින් හා වෙහෙස මහන්සි වී කළ පත්තර විකිණීම, ලේඛන විකිණීම, කැට ව්‍යාපාර, හිතවතුනගේ අරමුදල්

ආදියෙන් යැපීමය. මා එහිදී අවබෝධ කරගත්තේ ධාර්මික ව්‍යාපාරයක් මගින් සොයනා මුදල්වලින් දේශපාලන ව්‍යාපාරයක් පවත්වා ගත නොහැකි බවය. කුඩා පරිමාණයේ ක්ෂුද්‍ර බැංකුවක් බවට ව්‍යාපාරය පත්කිරීමට ගත් උත්සාහයන් ද අසාර්ථ විය. ඇතැම් විට මුදල් උපයන ව්‍යාපාරික ඥානය සතු කිසිවෙක් අප සමග නොසිටීම එයට හේතුවන්නට ඇත. තුන්වන හේතුව 17 වසරක යූඑන්පී පාලනයෙන් හා ප්‍රේමදාසගේ භීෂණයෙන් පසු ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී පෙරළිය අප අතර සිටි බොහෝ දෙනා අතර, "දැන් අපේ කාර්යභාරය අවසන්" වැනි හැඟීමක් ජනනය කිරීමය. මෙය ඕනෑම අරගලයක යෙදී සිටින්නන් අතර, ඇතිවන කාල චක්‍රයකි. ජ.වි.පෙ දෙස බැලුවොත් එය වසර 6-12 අතර, මේ චක්‍රයට හසුවී ඇති බවත්, කොටි සංවිධානය 15-25 අතර, චක්‍රයට හසු වී ඇති බවත්, පෙනී යයි. කොටින්ගේ කාඩරයන්ගේ පැවැත්මේ චක්‍රය දිග්ගැසුණේ ඔවුන් තමන්ගේම ප්‍රදේශ පාලනය කළ නිසාය. නැතිනම් ඔවුනුත් ජ.වි.පෙ මෙන්ම කෙටි කාල චක්‍රයකට හසුවීමට ඉඩ තිබිණි. ලෝක ඉතිහාසය දෙස බලනා විට කැපවුණු ව්‍යාපාරයන් වසර 30ක පැවැත්මේ චක්‍රයකට උපරිමයෙන් යටත් බව පෙනීයනු ඇත. රාජ්‍ය බලය හෝ තමන්ගේ බල ප්‍රදේශ නැතිවුවහොත් උපරිම යාහැකි දුර එයයි.

1992 දී මම විවාහ වුනෙමි. පළමුව විවාහ වීමේ අදහසක් නැතිව සිටිය ද හදිසියේ එකී තීන්දුවට එළැඹුනෙමි. හදිසි ඉක්මන් තීන්දු ගැනීම මගේ ජීවිතයේ අංගයකි. සමහර අවස්ථාවලදී අපි සැලසුම්කර තීන්දු ගනිමු. සමහරවිට හදිසියේ ගනිමු. ඒ දෙකම ඇතැම්විට සාර්ථක වේ. නැත්නම් අසාර්ථක වේ. පළමුවැන්න මෙහෙයවන්නේ බුද්ධියයි. දෙවැන්න හැඟීම හෝ ඉව විසින් මෙහෙයවනු ලබයි.

මගේ විවාහය සිදුවුණේ මා කුඩාකල තක්ෂිලාවේ සාමාන්‍ය පෙළ එකට ඉගෙනගත් සිසුවියක් සමගයි. ඇය රේණුකා දමයන්ති නම් වූවාය. අප අතර යම් යම් පරස්පරකම් ඇති බව පසුව අපි තේරුම් ගතිමු. අප කුඩා නිවසක් තනාගත් අතර, කදිම රුවැති, නැණති දියණියක්, අමා මන්දස්මිතා, අපට ලැබිණි. (1996) මේ බිළිඳිය නිසා මා විඳි සතුට ජීවිතයේ ලද ලොකුම සුවය විය. බොහෝ විට ප්‍රතිවිරුද්ධ චරිත ඇති පිරිමියා හා ගැහැණිය විවාහ ජීවිතය සඳහා එකමුතු කරන්නේ ඔවුනට දාව ලැබෙනා දරුවාය. දරුවා නැමැති ව්‍යුහය විසින් දෙමාපිය චරිත නැවත හැඩගස්වනු ලැබේ. එය දෙමාපියන් දරුවන් හැඩගැස්වීම තරම්ම ප්‍රබල ක්‍රියාදාමයකි. පසුව අපට තවත් දියණියක්, අසිනි බුවනජා, (2001) ලැබිණි. ඇය කඩිසර, දඟකාරී, සූක්ෂම චරිතයක් වූවාය. දේශපාලනය විසින්, කළ එක් අකටයුත්තක් වූයේ ඔවුන් දෙදෙනාටම ලැබිය

යුතු පිය සෙනෙහස නිසි අයුරින් නොලැබී යෑමය. ඔවුන් වියපත් වූ විට ආපසු බලා මා වෙත සමාව දුනහොත් එය මේ දිවියේ මට ලැබෙන ලොකුම සතුට විය යුතුය. මිනිස් සබඳතා ඉදිරියේ මා දුර්වල බව ඇතැම්හු කියති. ඔවුන් මට කියන්නේ දුටුවන් හා සිනාසෙන ලෙසත්, හිතවතුන් හා නිතර විශේෂයෙන් මාධ්‍ය සමඟ සබඳතා, ප්‍රිය සම්භාෂණ පවත්වන ලෙසත්, අත්නොහැර ප්‍රිය සම්භාෂණ ආදියට සහභාගී වී සමාජශීලී වන ලෙසත්, කිසිවෙකු සතුරෙකු කර නොගෙන සියල්ලන් සමග වතුර මෙන් ක්‍රියා කරනා ලෙසත්ය. මගේ හිත මිතුරෙක් මගේ චර්යාව වෙනස් කිරීම සඳහා රොබර්ට් ග්‍රීන් විසින් රචිත දේශපාලනයේ මූලික සිද්ධාන්ත 48 (48 Laws of Politics) කෘතිය ගෙනත් දුන්නේය. එය කියවීමෙන් පසු ලොවේ රජවරු, රාජ්‍ය නායකයින්, රාජ්‍ය තාන්ත්‍රිකයන් රැවටීම, වංචාව, බොරුව ආත්මගතකරගෙන දේශපාලනය කළ ආකාරය මට තවදුරටත් පැහැදිලි විය. නමුත් මිනිස් චර්යාවන් යම් යම් ප්‍රමාණයන්ගෙන් වෙනස් කළ හැකි වුවත් ඇතැම් චර්යාවන් අපේ මරණය දක්වාම දිව යයි. මේ මගේ හැටි බැවින් එය සමග මම ජීවත් වෙමි.

ඒ දිනවල අපි අපේ මූලස්ථානය ලෙස ගොඩනගාගෙන තිබුණේ මාතර පල්ලිමුල්ලේ රතන හිමියන්ගේ විහාරස්ථානයයි. රතන හිමියන්ගේ ගුරු හාමුදුරුවෝ බොහෝ උගත් ගුරුවරයෙකු වූ අතර, පන්සලකට වඩා එය ආවාසයක් ලෙස පවත්වාගෙන ගියහ. එහි බරපැන බොහෝ දුරට දැරුවේ රතන හිමියන්ම විසිනි. සන්ධිස්ථානයකට පැමිණි සිටි ජනතා මිතුරන්ව දේශපාලන යෝජනා දෙකක් ඉදිරිපත් විය. එකකින් කියවුණේ රතන හිමියන්ගේ මාතර පන්සල අතහැර ක්‍රියාධරයනුත් සමග කොළඹ ස්ථානගත විය යුතු බවය. දෙවැන්නෙන් කියවුණේ ජාතිකවාදය ගැන අපේ අවධානය වැඩිකළ යුතු බවය. මාක්ස්වාදීන් හෝ ලිබරල්වාදීන් මෙන් නොව ජාතික හැඟීම දර්ශනයක් ලෙස පිළිගත් පිරිසක් ලෙස එය අභියෝගයට ලක්ව ඇති මොහොතේ ඒ වෙනුවෙන් ක්‍රියාකළ යුතු බව එයින් කියවිණි. අපි ඒ යෝජනා දෙකම ක්‍රියාත්මක කළෙමු. කෙසේ වෙතත් අප සමග සිටි පරිණත බොහෝ දෙනෙක් පුද්ගලික ජීවිත, උසස් අධ්‍යාපනය හා ස්ථිර රැකියාවන් කරා යොමුවූහ. නවක වඩා කැපවුණු පිරිසක් සමග අපි ඉදිරිය බලා යන්නට වූයෙමු. කොළඹ අපේ නවාතැන වූයේ කුප්පියාවත්ත ජයශේඛරාරාමයයි. රජවත්තේ වප්ප හිමියෝ අපව ආදරයෙන් රැකබලාගත්හ.

අපේ මේ දේශපාලන වෙනස ජ.වි.පෙ පුවත්පත වාර්තා කර තිබුණේ මාතර සිට දුම්රියෙන් කොළඹ පැමිණි ජනතා මිතුරෝ කොළඹ පිටකොටුව ස්ටේෂම ඉදිරියේ එක්රැස් වී විසිරී ගෙවල් බලා ගිය බවය. විශ්ව විද්‍යාල සමයේ සිට තමන්ට හිසරදයක් හා තරගයක් දුන් පිරිසක් විසිරී ගියා යැයි ජ.වි.පෙ සිත සාදාගන්නට ඇත. තවත් බොහෝ දෙනා ද එය එසේ දකින්නට ඇත. ඇත්තටම ඉන්පසු ජනතා මිතුරෝ නම් සංවිධානය විසිරී ගියේය. නමුත් අපි වෙනත් ආකාරයක සංවිධානයක් ගොඩනඟා ගත්තෙමු. එය අපේ ජීවිතවලද, රටේ දේශපාලනයේද අලුත් ආරම්භයක් බව අප ද එදා දැන සිටියේ නැත.

**සිව්වන දිගහැරුම**

# ජාතික දැහැනට සමවැදුණෙමු

**ම**රදාන, කුප්පියාවත්ත කලබලකාරී නාගරික පරිසරයක් වුවද විහාරස්ථාන භූමිය ඉතා නිසල, කදිම පරිසරයක් විය. එහි සිට අපි අපේ පිළිගැනීමට අනුව භික්ෂූන් වහන්සේ සමාජ කාර්යභාරයකට පෙළ ගැස්වීමට ඉටා ගතිමු. රතන හිමියන්ට විශ්ව විද්‍යාල සමයේ සිට තිබූ භික්ෂු සබඳතාත්, අන් අය සියල්ලන්ගේ සබඳතාත් එහිදී ප්‍රයෝජනවත් විය. ඉත්තෑපානේ ධම්මාලංකාර හිමි, මාදුළුවාවේ සෝභිත හිමි, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි වැනි ස්වාමීන් වහන්සේලා මුල්කරගත් ජාතික සංඝ සභාව (1995) බිහිවීම එනයින් සිදුවිය. එහි මූලස්ථානය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ පිහිටුවිණි.

කලකට ඉහත මහාචාර්ය නලින් ද සිල්වා, ඩී.අයි.ජී. ධර්මසේකර (දැන් අනගාරික ධර්මසේකරතුමා), මාදුළුවාවේ සෝභිත හිමි යන තිදෙනාගේ මූලිකත්වයෙන් පක්ෂයක් පිහිටුවිය යුතු බවට ද යෝජනාවක් විය. එය ක්‍රියාත්මක වූයේ නැත. ඒ නිසා අපි 1989 මහා මැතිවරණයේ දී මහජන එක්සත් පෙරමුණට ක්‍රියාකාරීව සහාය දුනිමු. පසුව ශ්‍රී.ල.නි.පය තුළ තිලක් කරුණාරත්න, එස්. එල්. ගුණසේකර ආදීන් ගොඩනගාගත් "හෙළ උරුමය" කණ්ඩායමට හා ගාමිණී ජයසූරියගේ සිංහල ආරක්ෂක සභාවට සහාය දීමට පෙළඹුන ද දිගටම පෙනී ගියේ විධිමත් සංවිධානයක් නැතුව මෙකී නායකයින්

අතනින් මෙතැනට, මෙතැනින් අතනට පාවී යන බවය. වරක් බෞද්ධ මහා සම්මේලනයේ සිංහල සමුළුවක් පැවැත්වූ අතර, (1995) ප්‍රසිද්ධ නිවේදක පාලිත පෙරේරා මගෙන් ඇසූයේ එයට සහභාගී වී සිටින එකම තරුණයා මා නිසා එයට හේතුව කුමක් ද? යන්නය. ඒ දිනවල සිංහලකම වෙනුවෙන් රැස්වීමකට හෝ ආවේ වැඩිහිටි උගත් පිරිසකි. මගේ ක්ෂණික උත්තරය වූයේ සිංහලකමට තරුණයින් පෙළගැස්සවීම සඳහා එහි ආ බවය. ඊළඟ අවුරුදු දෙකේදී ජාතික සංඝ සභාව හා එය යටතේ පිහිටුවනු ලැබූ ජාතික දහම් ගුරු සභාව යටතේ අපි සිය ගණන් නොව දස දහස් ගණන් ජාතික මනසක් ඇති තරුණ තරුණයින් අතරට යන්නට පටන් ගත්තෙමු.

මේ අතර, අපට මහා ඉදිරි පිම්මක් පැනීමට හැකි අවස්ථාවක් උදාවිය. එය නම් චන්ද්‍රිකා ආණ්ඩුව "ෆෙඩරල් පැකේජය" 1995 අගෝස්තුවේ ගෙන ඒමය.

1991 සිට එක්සත් ජනපද තානාපති කාර්යාලය ශ්‍රීලංකාව ෆෙඩරල් රටක් කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබිණි. කලින් ද සඳහන් කළ පරිදි එයට මූලිකත්වය ගත්තේ මෙහි සිටි එක්සත් ජනපද තානාපතිනිය වූ ටෙරිස්ටා ෂේපර් මහත්මියයි. මේ සඳහා පදනම කරගත්තේ නීලන් තිරුචෙල්වම් මහතාගේ ජනවාර්ගික අධ්‍යයන කේන්ද්‍රයයි. පේරාදෙණිය හා කොළඹ සරසවියේ ආචාර්ය මහාචාර්ය පිරිසක් ද, රාජ්‍ය නොවන සංවිධාන මාධ්‍යවේදී පිරිසක්ද ශ්‍රී.ල.නි.පයේ හා එජාපයේ නායකයින් පිරිසක් ද එයට ගැටගැසී සිටියහ. 1995 චන්ද්‍රිකා - ප්‍රභාකරන් සාම ගිවිසුම හරහා මේ යෝජනාවලිය පෙරට ගැනීම ඔවුනගේ පළමු උපාය විය. සාමාන්‍යයෙන් අතීතයේදී වූ ලෙස යෝජනාවලියකට (1956 බණ්ඩාරනායක - චෙල්වනායගම්, 1965 - ඩඩ්ලි - චෙල්වා 1987 ජේ.ආර්. - රජීව්) විපක්ෂයේ විරෝධතාවය එල්ලවීම වැළැක්වීම සඳහා වරෙක ගාමිණී දිසානායක ද, ඊළඟට රනිල් වික්‍රමසිංහ ද ෆෙඩරල්වාදීන් ලෙස බෞතිස්ම කරනා ලදි. ප්‍රථම වරට ප්‍රධාන පක්ෂ දෙකම 1971 දී සාමූහිකව යෝජනා කළ ඒකීය භාවය පිළිබඳ ප්‍රතිපත්තිය 1995 දී ඉවත් කරනා ලදී.

ප්‍රභාකරන් හදිසියේ යුද වැදීම නිසා (1995 අප්‍රේල් 19) කලින් සැලසුම් කළ පරිදි පියවරින් පියවර ෆෙඩරල් ව්‍යවස්ථාව හඳුන්වාදීමේ වික්ටර් අයිවන් සැලැස්ම අවුල් විය. කොටි ත්‍රස්තයින්ගේ අවසන් ඉල්ලීම ලෙස ඉල්ලා සිටි පුනරින් කඳවුර ඉවත් කිරීමේ යෝජනාව අනුරුද්ධ රත්වත්තේ ඉවතලීමෙන් පසු අයිවන් හා උයන්ගොඩගේ පහසුකම් සැපයීමේ භූමිකාව ද අවසන් විය. එයට අපේ හමුදා එකඟවූවා නම් අලිමංකඩ වැටෙන්නේ 1995 දීය. පසුව මෙහෙයුම්

ආරම්භ වූ විට (රිවිරැස) 'රාවය' පුවත්පත "පුනරින් අනතුරේ" නම් ශීර්ෂ පාඨයක් ගෙනගිය අතර, එහි අරමුණ වූයේ යාපනයේ දෙපසකින් (පලාලි - අලිමංකඩ, පුනරීන්) කොටු වී විනාශ වීමට ගිය ත්‍රස්තයිනට පුනරින් හරහා යුද අවි රැගෙන පළා යෑමට මගක් සැපයීමය. ලේඛකයින්, කතෘවරුන්, ලෙස ක්‍රියා කළ කොටි මිතුරන්ගේ තත්ත්වය තේරුම් ගන්නට අපේ හමුදා නායකයෝ අසමත් වූහ. ප්‍රතිඵලය වූයේ යාපනයේ අවි තොග වන්නියට ගෙන ගොස් පසු කාලයක දී මුලතිව් වටකර විනාශ කිරීමට කොටින්ට හැකිවීමය (1996).

ප්‍රභාකරන්ගේ යුද වැදීම නිසා සිංහල විරෝධීහු සිය සැලසුම් වෙනස්කර ගත්හ. ඊළඟ සැලසුම වූයේ යාපනය මුළුමනින්ම අල්ලාගෙන එහි ශක්තිය ද සමග ෆෙඩරල් ක්‍රමය ජයග්‍රාහී යුද සෙන්පතීන් අතින්ම පිළිගැන්වීමය. (1995 දෙසැම්බර්) මෙය පලස්තීන වෙනම රාජ්‍යයක් පිළිගැනීමේ, ඊශ්‍රායල යෝජනාව, එහි යුද වීරයෙකු වූ "යිට්සැක් රබින් " අතින් ඉදිරිපත් කිරීමට සමාන ක්‍රියාදාමයකි.

1995 අගෝස්තු මස දිනෙක මා හමු වූ ජී.ඇල්. පීරිස් ඇමැතිතුමාගේ කාර්යාලයේ සේවකයෙකු කීවේ නව ෆෙඩරල් ව්‍යවස්ථාවක් තනා නිමකර ඇති බවය. යාපනය ජය ලබා එය ජයග්‍රාහී සිංහල මනසට ගිල්ලවීමට යන බව මම දැන ගතිමි. ඉක්මණින්ම එය හෙළි දරව් කිරීම සිංහල විරෝධී බටහිර න්‍යාය පත්‍රය අඩපණ කිරීමේ මග ලෙස දැක ගතිමි. පළමුව පැකේජයේ පිටපත් මාදුළුවාවේ සෝභිත හිමි හා බෙල්ලන්විල විමලරතන හිමිවරුනට ලබාදුන් අතර, ඒ පිළිබඳ විග්‍රහයක් මවිසින්ම ලියන ලදි. දිවයින පුවත්පත එය හෙළි දරව් කළේය. ආණ්ඩුවේ උපාය මහත් අවුලක වැටිණි. එය මීට වඩා විධිමත්ව සිදුකිරීමට තිබූ බව පසුව අපට අවබෝධ වුවත් අපේ "ගරිල්ලා ප්‍රහාරය" ආණ්ඩුවේ සැලසුම අවුල් කළේය.

සියලු සිංහල සංවිධාන වහාම අවදි විය. ආණ්ඩුවේ මංගල සමරවීර සමග සිටි අයෙක් ඒ දිනවල මා හට කීවේ වයසක සිංහල ඕල්ඩ් බෝයිස්ල ටික නැගිට්ට වේගයෙන්ම නිදාගනු ඇති බව ආණ්ඩුව කරවන තවලම ඇත්තන්ගේ මතය බවය. මේ දිනවල ජවිපෙ සිටියේ මංගල හරහා ආණ්ඩුවේද අනුග්‍රහය ලබාගනිමින් පක්ෂය සීඝ්‍රයෙන් ගොඩනගමින්ය. ඔවුන් ෆෙඩරල් පැකේජය ගැන ක්‍රියාකරන්නට ආවේ නැත. නමුත් මේ වනවිට සිංහල ජාතික ව්‍යාපාරයට එය ඇදගෙන යා හැකි භික්ෂු ව්‍යාපාරයක්, තරුණ කාඩරයක් හා අරමුදල් සැපයිය හැකි ව්‍යාපාරික ජාලයක් (සිංහල වීර විදහන) බිහි වී තිබිණි.

සිංහල වීර විදහන බිහි කරනු ලැබුවේ දිඹුලාගල නාහිමියන් ත්‍රස්තවාදීන් විසින්, ඝාතනය කිරීමෙන් පසු ඒ ගැන කම්පා වූ ව්‍යාපාරිකයන් සත්දෙනෙකු විසිනි. බී.ඒ.මහීපාල, කරූ හීනටිගල, චූලා ජිනදාස, කුලතුංග රාජපක්ෂ, සුරේන් අබේගුණසේකර එහිලා මූලික වූ අතර, සූරිය ගුණසේකර හා සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහත්වරු එය සංවිධානය කිරීමේ කාර්යයට මුල් වී සිටියහ. සිංහල වීර විදහන විසින්, සිංහල ව්‍යාපාරිකයන් ජාතික මතයකට එක්කර සංවිධානය කළ අතර, එයින් සිංහල ජාතික ව්‍යාපාරයට නව ජාලයක් මෙන්ම අරමුදල් සම්පාදනය ද සිදුවිය.

චන්ද්‍රිකා - මංගල - එස්.බී. තවලම - සුදු නෙළුම් හවුල, බටහිර එන්.ජී.ඕ. ජාලය, යූ.එන්.පීය හෝ ජේ.වී.පීය මේ තත්ත්වය නිරවුල්ව විග්‍රහ කරගත්තේ නැත. පළමුවරට තරුණ ක්‍රියාධරයින්, සංවිධායකයින්, බෞද්ධ භික්ෂූන්, අරමුදල් හා ජාලයක් සහිත සිංහල ජාතික ව්‍යාපාරයක බීජුවට පහලව තිබේ. අපි අවස්ථාව අත්නොහැරියෙමු. පළමුවෙන්ම අපි දැවැන්ත භික්ෂූ කැඳවීමක් ජාතික සංඝ සභාවෙන් කළෙමු. එය අතිශයින් සාර්ථක විය. ඊළඟට සියලු සංවිධාන එක්කර ජාතික ඒකාබද්ධ සංවිධානය බිහිවිය. කීර්තිමත් විනිසුරුවරයකු වූ ආර්.එස්. වනසුන්දර එහි සභාපතිත්වයට පත්විය. එයට ගාමිණී ජයසූරියගේ සිංහල ආරක්ෂක සංවිධානයට අත්වූ ඉරණම අත්නොවීම සඳහා අපි ක්‍රියාකාරී වුනෙමු. අපට පළමු විරෝධය ආවේ අපේ පැරැණි අතීත සබඳතාවලිනි. අපේ සංවිධාන ජාලය වඩාත් ශක්තිමත් එකක් වූ නිසා එවැනි හුදකලා ප්‍රශ්න කිරීම් පහසුවෙන් ඉවත් කළෙමු. නමුත් වඩාත් බරපතල ක්‍රියාදාමයක් ද ඇරැඹී තිබිණි. එනම් යූඑන්පීයේ උපායයයි. රනිල්, ලියම් ෆොක්ස් සමග එකතු වී චන්ද්‍රිකා සමග මොන ගිවිසුම් ගැසුවත් පක්ෂයේ ප්‍රතිපත්තිය සියුම්ව වෙනස් කළත්, ආණ්ඩුව ගැන වෛරයෙන් පසුවන කොටස් විශේෂයෙන්ම කොල්ලුපිටියේ ප්‍රභූ පිරිස් පවා අනුක්‍රමයෙන් මේ නවීණ ජාතික ව්‍යාපාරයට ඇතුළු වෙමින් සිටියහ. මුලින් රනිල් එයට බාධා කළ ද පසුව සියුම් උපායක් ගනිමින් තිනියාවල පාලිත හිමි ප්‍රමුඛ පිරිසක් එයට ඇතුළු කළේය. අපි මුල සිටම මෙය දැක ගතිමු. ඉතා වේගයෙන් එකතුවන පිරිස් මතවාදී තලයකට ගැනීම අපේ ඉලක්කය විය. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ තිස්ස විතාරණ - එස්. එල්. ගුණසේකර හා මා සහභාගී වූ (එයට සහභාගී වීමට අපේ ඇතැම් සිංහල විද්වතුන් බිය වූ අතර, මා සහභාගී වූයේ ඒ නිසාය) විවාදයෙන් පසු අපේ අරගලය කූඨ ප්‍රාප්ත විය. ප්‍රසිද්ධ ව්‍යාපාරිකයන්, විද්වතුන් ඇතුළු බොහෝ තරුණ පිරිස් කීවේ සිංහලයින්ට නව නායකත්වයක් දැන් ලැබී ඇති බව ඔවුනට සහතික වී ඇති

බවය. ඒ දිනවල අපට ඉඩකඩක් ලබාදුන් එකම නාළිකාව ටී.එන්.එල් වූ අතර, වැඩසටහන ජනහඬ විය. මම නිරතුරුවම මේ විවාදවලට ගියෙමි. පසුව අනෙක් නාළිකාවලට ද සම්බන්ධ වුනෙමි. විද්‍යුත් මාධ්‍ය විසින් විවෘත කර තිබූ නව වටපිටාව ද අපි අතික්‍රමණය කළෙමු. අනුක්‍රමයෙන් පූර්ණ ජාතික ව්‍යාපාරයක් බවට අපි සිංහල ජාතික ව්‍යාපාරය පත්කළෙමු. පුවත්පත් ලිපි, වාද විවාදවලින් ඔබ්බට ගිය මහ පොළොවේ පිහිටුවනු ලැබූ මහජන ජාලයක් බවට එය පත්විය.

නමුත් කොටි සංවිධානය අපට වඩා වේගයෙන් වැඩ කළේය. ආණ්ඩුවේ මාධ්‍ය මෙහෙයුම ද අති ප්‍රබල විය. ඒකාබද්ධ කොමිසම විසින් ස්ථාපිත කළ සිංහල කොමිසම රටවටා යනවිට අනුක්‍රමයෙන් ආණ්ඩුවේ ප්‍රහාරයන් වේගවත් විය. මංගල සමරවීර විසින්, සිංහල කොමිසම ඉතිහාසයේ කුණු කූඩයට දැමිය යුතු යැයි ප්‍රකාශ කළ විට සිංහල විරෝධීන් උද්දාමයට පත්වූ මුත් ඉක්මණින්ම මංගලට එය පාරාවළල්ලක් කිරීමට අපි ක්‍රියා කළෙමු. ඉන්පසු ඔවුහු භික්ෂූන් වහන්සේ සංවිධානය කරන්නටත් අපට රැහැනිව භික්ෂු ව්‍යාපාර යොදා ගන්නටත් වූහ. මුළු ඒකාබද්ධ සංවිධානයටම කැප වී සිටි පූර්ණකාලීනයා වූයේ ආචාර්ය පියසේන දිසානායකයන් පමණි. මේ නිසා අනුක්‍රමයෙන් ඒකාබද්ධ සංවිධානය තවත් එක සංවිධානයක් වී අනෙක් සංවිධාන වෙන වෙනම ක්‍රියාකරන්නට විය.

මේ අතර, 1996 දී එල්ල කෙරුණු මහ බැංකු ප්‍රහාරය, 1996 දීම එල්ල වූ මුලතිව් ප්‍රහාරය ආදිය විසින්, ආණ්ඩුවේ යුද වැයම පුස්සක් වීමේ ලකුණු පහළවිය. සුදු නෙළුම හා තවලම ගෙනගිය "යුද්දෙට සතයක් - සෙබළෙක් නොදෙනු" ප්‍රචාරක ව්‍යාපාරය නිසා අපේ හමුදා වන්නියේ කොටු වෙමින් තිබිණි. මුදාගත් ප්‍රදේශවලට ඇතුළුවන ත්‍රස්තයින් හමුදාවේ පසුමුණට දරුණු ප්‍රහාර එල්ල කළේය. A - 09 මාර්ගය මිනීකඳුවලින් ගොඩ ගැසෙන්නට විය. 1997 - 98 දී සිදු වූ කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ප්‍රහාරය, දළදා ප්‍රහාරය හා මරදාන - දෙහිවල දුම්රිය බෝම්බ ප්‍රහාරය ආදිය කියා පෑවේ කොටි ක්‍රමයෙන් පෙරමුණ දෙකේම එනම් කොළඹ දී බිය පැතිර වීමටත්, වන්නියේ දී හමුදා ඝාතනයත් සාර්ථක ලෙස කරගෙන යන බවය. දේශපාලන මොහොත වහාම අල්ලාගත යුතු බව අපගේ නිගමනය විය. 1998 ජනවාරි 25 එල්ල වූ දළඳා ප්‍රහාරය ඒ මොහොත විය. අපි එය තිරව අල්ලා ගතිමු. අපේ දැවැන්ත උද්ඝෝෂණය නිසා කොටි සංවිධානය තහනම් කිරීමට ආණ්ඩුවට සිදුවිය. ඉන්පසු මරදානේ බෝම්බයෙන් පාසල් දැරිවියන් මියගොස් සමාජය ප්‍රකම්පනය වූ විට (1998 මාර්තු 08) අපි ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය පිහිටු

වූයෙමු. එහිලා අපේ අරමුණ වූයේ කොටි ත්‍රස්තයින්ගේ ප්‍රහාරයෙන් පීඩාවට පත්වන අසරණ ජනයා සංවිධානය කිරීමය. රටවැසි පෙරමුණ හා මව් පෙරමුණේ සංවිධාන රටාව මෙහිදී අපට ඉමහත් ප්‍රයෝජනයක් විය. ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය සෑම ත්‍රස්ත සිදුවීමක් සමගම වීදියට බැස්සේය. තරුණ තරුණියන් ඇතුළු කොළඹ ප්‍රභූ සමාජයට අයත් පිරිසක් එයට ඇපකැප වන්නට විය. ශිවන්ති මාලා ද සිල්වා මැතිණිය එහි කේන්ද්‍රයේ වූවාය. පළමු සභාපති වූයේ ජෙනරාල් තිලක් පරණගමය. අනිල් ජයවර්ධන, කුමුදිකා පහත්කුඹුර, අනුරාධා යහම්පත්, අරුණ - ශිරන්තනී බටුවන්තුඩාව යුවල වැනි තරුණ ක්‍රියාධරයින් ද, ගිල්ඩා ගුණරත්න, හද්‍රා ගුණතිලක, දයා සමරතුංග, තිලක් - කමලා එදිරිවීර වෛද්‍ය යුවල ලින්කන් - සුජාතා බැස්ටියන්, වෛද්‍ය යුවල, නෙවිල් කරුණාතිලක, පුන්‍යකාන්ති සොයිසා, මල්ලිකා වනිගසුන්දර, බියට්‍රිස් ගුණසේකර ආදී වැඩිහිටි පිරිසක් ද අපට එක්විය. මහනුවරදී ද අපට තවත් පිරිස් එක්විය. වෛද්‍ය ඉංජිනේරු, කළමනාකරණ වැනි ක්ෂේත්‍රවල වෘත්තීයවේදීන්ගේ සහාය කැපී පෙනිණි.

මෙලෙස ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය තරුණ වෘත්තීයවේදීන් පිරිසක් සංවිධානය කළා පමණක් නොව විදේශගත සිංහලයින් සංවිධානය කරන්නට ද වූවෙමු. ඒ වකවානුවේ (1998) විද්‍යුත් තැපැල, වෙබ් අඩවිය ආදිය පරිහරණය කළේ ඉතා සුළු පිරිසකි. සයිබර් අවකාශයේ මේ වනවිට කොටි සංවිධානය අති ප්‍රබලව සිටි අතර, සිංහලයින් එහි සිටියේම නැති තරම්ය. නමුත් දෙමළ විදේශගත ප්‍රජාවට සමාන ප්‍රමාණයක් සිංහලයින් ද විදේශගතව සිටිනා බව (මිලියනය බැගින්) අපි දැන සිටියෙමු. ඉතා කෙටි කලක් ඇතුළත අපි ඕස්ට්‍රේලියාව, එංගලන්තය, කැනඩාව, එක්සත් ජනපදය, යුරෝපය හා ඩුබායි ආදී ප්‍රදේශ සමග සයිබර් අවකාශයේ සබඳතා පතුරුවා ගතිමු. "සයිබර් අවකාශයේ ජාතිය ගොඩනැගීම" නම් නව ව්‍යාපෘතියක් මුදාහළෙමු. වසරක් ඇතුළත විසිදෙනෙකුගේ ජාලය 20,000 දක්වා නංවන්නට අපට හැකිවිය.

කිලිනොච්චිය කොටි විසින්, අල්ලාගැනීමෙන් පසු අපේ හිතවත් තරුණ හමුදා නිලධාරීන් කීවේ සටන දිග්ගැසීම වැඩිවීම අපේ පරාජයට හේතු වන බවය. මේ වනවිට ආරක්ෂක හමුදාවල ඉහළ තරුණ නිලධාරීන් රැසක් අප්‍රසිද්ධියේ අප සමග එක්වී සිටියහ. විශේෂයෙන් යුද්ධය පිළිබඳ තත්ත්ව වාර්තාවලට අමතරව පොලිස් ඔත්තු සේවාවලින් අපේ සංවිධානවලට රිංගවා සිදුකරනා කඩාකප්පල් ක්‍රියා අපට වාර්තා කිරීම ද ඔවූහු සිදු කළහ. එදා ගොඩනැගුණු ඇතැම් ශක්තිමත් සබඳතා අද දක්වාම පැවතීම අපේ සාර්ථකත්වයට එක් හේතුවක් විය.

මනස් දෙකක් සහිතව යුද්ධ කළ නොහැකි බව තීරණය කළ අපි "කොටි පරදන මග" නමින් ත්‍රස්ත විරෝධී ජාතික සැලැස්මක් ඉදිරිපත් කළෙමු. එයින් යුද, ආර්ථික, සමාජයීය හා දේශපාලන ක්ෂේත්‍රයේ ඉක්මණින් කළයුතු ප්‍රමුඛතා ක්‍රියා 29ක් හඳුනාගත් අතර, තුන් අවුරුද්දක් තුළ ත්‍රස්තවාදය සහමුලින් පැරැදවීම අරමුණ කරගත් මහා යුද - දේශපාලනික ප්‍රතිපත්ති උපාය මාර්ගයක් ඉදිරිපත් විය. මෙය මුලින් හමුදා හා දේශපාලන නායකත්වයට ඉදිරිපත් කළ ද එය ප්‍රතික්ෂේප වූ නිසා ජනතාව වෙතට මුදා හැරියෙමු. (1999 අප්‍රියෙල්) ළඟ එන අනතුර එළියේ සිටි අපි හඳුනාගත් නමුදු හමුදා හා දේශපාලන නායකත්වය එය හඳුනාගත්තේ නැත. 1999 වසරට ජනාධිපතිවරණය සැලසුම්කොට තිබූ අතර, පොදු පෙරමුණ, යූ.එන්.පීය හා ජ.වි.පෙ එයට ප්‍රමුඛතාවය දෙමින් සිටියහ. විශේෂයෙන් පොදු පෙරමුණට අවශ්‍ය වූයේ උතුරේ තත්ත්වය කෙසේ හෝ සාමකාමීව තබාගැනීමය. වේලුපිල්ලේගේ උපාය වූයේ දකුණ හා හමුදා ජනාධිපතිවරණයට හිස යොමුකරනා විට හිස අහිමි හමුදාවන්ට කොඳු කැඩෙන්නට ප්‍රහාරයක් දීමයි. මේ අතර, යූ.එන්.පීය සිංහල ජාතික ව්‍යාපාරයේ සිටි සිය ඒජන්තයින් යොදාගෙන හුදු චන්ද්‍රිකා විරෝධයක් මත සිංහල මතය රනිල්ට ගෙනයෑමට උත්සාහ කළහ. ඉත්තෑපානේ හිමි, මාඳුළුවාවේ හිමි පවා යූඑන්පීයට හිතවත් බවක් දැක්වූහ. අනෙක් පැත්තෙන් යුද්ධය පෙරට දමා සිංහල මතය තමන් දෙසට ගන්නට අනුරුද්ධ රත්වත්ත උත්සාහ කළේය. ඇතැම් ව්‍යාපාරිකයෝ ඒ දෙසට ද ඇදී ගියහ. නමුත් ඔවුන් දෙපිරිසම එතරම් සාර්ථක නොවූයේ බහුතර භික්ෂු ගිහි බලයක් මධ්‍යස්ථව රඳවාගන්නට අප සමත්වීම හේතුවෙනි.

ප්‍රභාකරන් සිය මෝසම් වර්ෂා ප්‍රහාරය 1999 නොවැම්බර් 01 දා ආරම්භ කළේය. දිනෙන් දින වන්නියෙන් වාර්තා වූයේ කඳවුරු පිට කඳවුරු ඇද වැටෙනා බවකි. තවත් බලා සිටියහොත් රටම කොටින්ට යටත්වනු ඇතැයි සිතූ අපි වවුනියාවට ගියෙමු.

ඒ දිනය 1999 නොවැම්බර් 05 දා විය. ඒ වනවිටත් වන්නි පෙරමුණෙන් පසුබසින දහස් ගණන් සෙබළුන්ගෙන් වවුනියාව හා අවට ප්‍රදේශ පිරී තිබිණි. ඉතා අමාරුවෙන් පවත්වගෙන ගිය පදවිය හා වැලිඔය ගම්මාන සියල්ල ඇකිලී ගිය බව ද වාර්තා වුණි.

තත්ත්වය දරාගත නොහැකිව මමත් හැඩිගල්ලේ විමලසාර හිමියනුත් ඉරට්ටපෙරියකුලම කඳවුරට ඇතුළු වුණෙමු. මහ වැස්සේ නිරාහාරව

කොටින්ගේ කාලතුවක්කු ප්‍රහාරවලට ලක්ව තුවාල ලැබූ බොහෝ සෙබළුන් එහි සිටියේ කැරැල්ලකට සූදානම්වය. තරුණ කර්නල්වරු කීපදෙනෙක් අපට සහාය වීමට පැමිණියහ. පසුව එය බ්‍රිගේඩියර්ලා, මේජර් ජෙනරාල්ලා දක්වා වර්ධනය විය. බොහෝ පමා වී දිවා ආහාරය ගත්කළ පෙනී ගියේ බත් තැම්බී නොමැති බවය. ලේ ගඳ ගහන, බොර වතුර පිරි කඳවුරු භූමියේ වෙවුලමින් සිටි සෙබළුන්ගේ ගැහෙනා මනස මට හොඳින් දැණිනි. විමලසාර හිමි ඔවුනට පන්සිල් දුන් අතර, හිමින් හිමින් මම ඔවුන් අමතන්නට වීමි. එය හමුදාවේ විනයට පටහැනි වුවත් සියල්ලෝ එය ඉවසා සිටියහ.

අපි මාන්කුලම මෙන් වවුනියාව ද අත්හළහොත් කොටි ජය ශ්‍රී මහබෝධිය ද, රුවන්වැලිසෑය ද විනාශ කර අපේ ජනයා දඹුල්ලටත් එතැනින් කුරුණෑගලටත් පළවා හරිනු ඇතැයි මම කීවෙමි. අපි ආපසු නොගොස් පෙරට ගොස් සටන් කළ යුතු බව මම කීවෙමි. අවසාන වශයෙන් ඔවුනට කීමට ඇත්තේ කුමක්දැයි ඇසූවිට පරාජයේ හේතුව ඔබ පසුපස සිටගෙන සිටිනා නිලධාරීන් බව අතක් එල්ලාගත් තරුණ සෙබළෙක් කීවේය. එවිට මහා ඝෝෂාවක් ඇතිවිය. අපි තත්ත්වය පාලනය කරගතිමු. විශේෂ බලකායේ නිර්භය නිලධාරීන් පිරිසක් වහාම පෙරට යෑමට තීරණය කළෝය. වවුනියාවට උඩින් ඕමන්තේ සීමාව ඇඳුණේ ඔවුනගේ කැපවීම නිසාවෙනි.

අපි ඊළඟට වැලිඔයට ගියෙමු. කෙසේ හෝ ජනතාව පදවියේ නතර කරගත් අපි කොළඹට කතාකර ආධාර ඉල්ලුවෙමු. පැය 24ක් තුළ වෛද්‍ය හා අත්‍යවශ්‍ය ආහාර අපේ සගයෝ ගෙන ආහ. අපි අනාථ කඳවුරු විධිමත් කළෙමු. ඉන්පසු ආධාර විධිමත් කළෙමු.

දින ගණනකට පසු කොළඹ එන අතර මා කල්පනා කළේ කොළඹ පෙළපාළිවලින් ප්‍රභාකරන් පැරැදවිය නොහැකි බවය. දේශපාලන බලය අල්ලා ගැනීම තීරණාත්මක බවය. දේශපාලන වශයෙන් බලය අල්ලා ගැනීමට එක්කෝ අපි නව පක්ෂයක් බිහිකර තවත් කාලයක් උත්සාහ දැරිය යුතුය. ඒසා කාලයක් ප්‍රභාකරන් අවසන් ජයග්‍රහණය ලැබීම වැළැක්වීමට අපේ හමුදා සමත් වේවිද? ඔහු යුද ජයග්‍රහණයක් ලැබුවත් පසුව අපට සංවිධානය වී ඔහුව පළවාහැරිය හැකි නොවේද? බැරිවෙලාවත්, ඔහු සිය යුද ජයග්‍රහණය දේශපාලන ජයග්‍රහණයක් කරගෙන ජාතික හා අන්තර්ජාතික ලෙස නිල පිළිගැනීමක් ඇතිකර ගතහොත් අපට සිදුවන්නේ කුමක්ද? බලය අල්ලාගෙන එය කලක් දරාගත නොහැකිව පසුව පරාජය වී ඇතුගෑවී ගිය ව්‍යාපාර ලොවෙහි එමටය. නමුත් දේශපාලනික ලෙස ස්ථාපිත වීමෙන් පසු එකී නව

රාජ්‍යය යටත්කර ගැනීමට යෑම එය කෙතරම් කුඩා වුවත් පහසුවන්නේ නැත. ලෝකය එය ආක්‍රමණයක් ලෙස දකිනා නිසාය. ඉරානය එක්සත් අරාබි එමීර් රාජ්‍යයන් සම්බන්ධයෙන් ද, ඉරාකය - කුවේටය සම්බන්ධයෙන් ද, ඉන්දුනීසියාව - නැගෙනහිර ටිමෝරය සම්බන්ධයෙන්ද, කලින් වෙන්වීමට ඉඩ දී පසුව යා කරන්නට ගොස් සිදුකරගත් රාජ්‍ය තාන්ත්‍රික විනාශය පිළිබඳව විවිධ ලේඛන කියවා අවබෝධයක් ලබාගතිමි. චෙච්නියාවේ බෙදුම්වාදය රුසියාව විසින්, එය ස්ථාවර වීමෙන් පසුත්, පැරැදවීම පමණක් එකම සුභවාදී උදාහරණය විය. නමුත්, රුසියාව න්‍යෂ්ඨික බලවතෙකු වූ අතර, ව්ලාදිමර් පුටින් යටතේ ආර්ථික බලවතෙකු බවට ද පත්වෙමින් සිටියේය. භූමි ප්‍රමාණයෙන් හා සම්පත්වලින් ඒ රට ලෝකයේ ලොකුම රට විය. එය කෙසේවත් අපේ සන්දර්භය හා ගැලෙපෙන්නක් නොවීය.

1995-2005 දශකයේ ලොවේ ශූරතම, නායකයා කවුදැයි ඇසුවොත් මා කියන්නේ ඒ රුසියාවේ ව්ලාදිමර් පුටින් බවය. වරක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල ගොඩනැගිල්ලේ අමුත්තන්ගේ ශාලාවේ දී (2007) මට රුසියාවේ විදේශ ඇමැතිතුමා හමුවිය. එතුමා තමන් කලක් ශ්‍රීලංකාවේ දෙවැනි තානාපතිවරයා ලෙස සේවය කළ බව ප්‍රකාශ කළා මතකය. ඔහුගේ කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙක්ප්‍රතාපවත් පෙනුමකින් යුතු වූ බව ද මතකය. බොහෝ රටවල් සිය විදේශීය කාර්ය මණ්ඩල, ගුවන් සේවා වැනි වෙනත් රටවල් සමග සම්බන්ධ වන සේවාවන්ට ප්‍රතාපවත් කඩවසම් පෙනුමැති පුද්ගලයින් පත්කරති. එමගින් පළමු දැක්මේදීම තම රට ගැන පළමු පෙළේ ආකල්පයක් ගොඩනංවා ගනිති. සිංගප්පූරුව ගොඩනගද්දී ලී ක්වාන් යූගේ චීන් ජාතික උපදේශකයා වූ ඇල්බර්ටෝ දුන් ප්‍රධානතම උපදේශය වූයේ සිංගප්පූරුවේ අනාගතය විදේශීය ආයෝජකයින්, සංචාරකයින් ගුවන් හා මුහුදු නැවියන් ආදීන් මත යැපෙනා නිසා පළමු දැක්ම ඔවුන් මවිත කරවන පිළිවෙළ සුන්දරත්වය ආදියෙන් පැවතිය යුතු බවය. සිංගප්පූරු ගුවන්තොට, වරාය, නගරයට පිවිසෙන ප්‍රධාන මාවත පිළිගැනීමේ නිලධාරීන් ආදී සියලු දෙනා "පළමු සිංගප්පූරු ප්‍රේමය" සඳහා හොඳින් සූදානම් කර ඇත්තේය. අපි මෙවැනි දේ පිළිබඳව කිසිදු උනන්දුවක් නැති ජාතියකි. වරක් අරාබියේ රාජ්‍ය නායකයෙකු හමුවී මා ඉංජිනේරුවෙකු හා ගණිත කථිකාචාර්ය කෙනෙකු බවත්, ඔහුගේ රටේ දහස් ගණනක් අපගේ ඉංජිනේරුවන්, වාස්තු විද්‍යාඥයින් ආදීන් සේවය කරනා බවත් කී විට එතුමා හා ඔහුගේ කාර්ය මණ්ඩලයට සිනහා ගියහ. ඔවුන්ට අප රට පිළිබඳ ආකල්ප ගොඩනැගී තිබුණේ අර්ධ වහලුන් හා ලිංගික භාණ්ඩ ලෙස ඇසුරුම් කර තිබූ ශ්‍රීලාංකික ගෘහ සේවක - සේවිකාවන් වෙතිනි. අපි අපේ ප්‍රතිරූපය ගොඩනංවා ගැනීමට නම් අපේ

ගුවන්තොටුපොළ, වරාය, නගරයට එන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය, නගර මධ්‍යය, රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල හා දූතයින් ආදී කාරණා ගැන ද සැලකිල්ලට ගතයුතුය.

රුසියානු විදේශ ඇමැතිතුමාගේ වශීයෙන් පසු එදිනම නිව්යෝර්ක් පොත්හලකට ගොස් පුටින් පිළිබඳ කෘතියක් මිල දී ගතිමි. එය කියැවීමෙන් පසු මා අතින් නැතිවිය. නමුත් ඔහු බිඳවැටෙනා රුසියාව යෙල්ට්සින් අතින් භාරගත් හැටි, රුසියානු ඔත්තුසේවා හා පීටර්ස්බර්ග් නගරයේ පරිපාලනයේ දී ඔහු ලබාගත් අත්දැකීම් රාජ්‍ය පාලනයට යොදාගත් හැටි, රුසියාවේ නැඟීමේ හා වැටීමේ ප්‍රධාන රහස ධනවාදී හෝ කොමියුනිස්ට්වාදය නොව තෙල් හා ගෑස් මිල බව අවබෝධ කරගත් හැටි, ප්‍රබල ජර්මනිය ඇතුළු අන් යුරෝපීය රටවල් භීතිය මුසු ගරුත්වයකින් දිනාගත් හැටි මගේ සිත තදින් පැහැරගත්තේය. සෝවියට් දේශය බිඳවැටීමෙන් පසු තැනින් තැනින් රුසියාව කෙනිත්තීම සඳහා යොදාගෙන සිටි බෙදුම්වාදී බලවේග අධිෂ්ඨානශීලීව ඔහු විසින් විනාශ කිරීම මගේ සිත වඩාත් තදින් පැහැර ගත්තේය. අපටත් පුටින් කෙනෙක් අවශ්‍ය බව බෙදුම්වාදය ත්‍රස්තවාදය ලොව කොතැනකවත් පරාජය වී නැතැයි පාරම්බාමින් සිටි දෙමළ ජාතිවාදීන්ගේ මත බිඳලීම සඳහා නිතර යොදාගත්තෙමි.

එකින් එක කරුණු සැලකීමෙන් පසු අපි තීරණය කළේ ශක්තිමත් සිංහල ජාතිකවාදී පක්ෂයක් ගොඩනැගීම විසින් ජවිපෙ ශ්‍රී.ල.නි.පය හා යූ.එන්.පීය පාලනය කළහැකි වනු බවය. ඉන්දියාව ලංකාවේ ස්වාධීන නැගීම ඉවසන්නේ නැතිමුත්, ඒ ශ්‍රීලංකාව දුර්වල කිරීම සඳහා නිරතුරුවම දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදී තුරුම්පුව පාවිච්චි කරනාමුත්, ශ්‍රී ලංකාව තුළ සන්නද්ධ බලයෙන් වෙනම රාජ්‍යයක් සතුරෙකු ලෙස බිහිවණු දැකීම ඉවසන්නේ නැති බව අපේ තක්සේරුව විය. 1948 දී පෙරියාර්ගේ දෙමළ කසාගම් සන්නද්ධ ව්‍යාපාරය ඉන්දීය නායකයෝ තහනම් කළ අතර, අන්නදොරේගේ ප්‍රජාතන්ත්‍රවාදී බෙදුම්වාදයට තමිල්නාඩුවේ බලය ලබාගන්නට (1967) ඉඩහළහ. මේ නිසා තව කලක් යනතෙක් ඉන්දියාවේ කවර ආණ්ඩුවක් බලයේ සිටියත්, ප්‍රභාකරන් වෙනම රාජ්‍යයක නායකයා වී අනාගත "ද්‍රවිඩස්ථානයක" මහරජු වීමේ සිහිනයට ඉඩනොදෙනු ඇති බව අපේ හැඟීම විය. ප්‍රභාකරන් එවැනි යුද ජයක් ලදහොත් ඉන්දියාවේ බෙදුම්වාද පමණක් නොව මාඕවාදී නැක්ස්ලයිට් ව්‍යාපාරයන්ද පිබිදවීමට ක්‍රියාකරනු ඇත. එයට ඉන්දියාව ඉඩක් දෙන්නේ නැති බවද අපගේ තක්සේරුව විය.

පක්ෂයක් පිහිටුවීම පිළිබඳ අදහස අප තුළ පමණක් නොව මේ වනවිට සිංහල ජාතික ව්‍යාපාරයේ කලක් ක්‍රියාකාරීව සිටි බොහෝ දෙනෙකුට එකවරම පාහේ වැටහී ගිය දෙයක් විය. පක්ෂයක් තරගකාරීව ඉදිරියට ගෙනයෑමට නම් අඩුම තරමින් රටපුරා විසිරී ගිය පූර්ණකාලීන කාඩරයන් දහසක් වත් අවශ්‍ය බව අප අතුරින් ආ එක් මතයක් වීය. තවත් මතයක් වූයේ එය ජවිපෙ දේශපාලන රාමුව මත බැසගත් නිගමනයක් බවත්, කැපී පෙනෙනා ජාතික මට්ටමේ දේශපාලන චරිත හත අටක් එක්වුවහොත් එයට වහාම ජනතාවගේ පිළිගැනීම ලැබෙනා නිසා සිදුකළ යුත්තේ එය බවත්ය. එතැනදී උදාහරණය වූයේ ලලිත් - ගාමිණී, බණ්ඩාරනායක - රාජපක්ෂ වැනි පක්ෂ හැරගොස් නව ව්‍යාපාරයන් බිහිකිරීමේ උදාහරණයක්ය. එවැනි ශක්තිමත් පිරිසක් ජාතික මතවාදී දේශපාලනයකට කඩා ගැනීමට අපි සමත්ද? යන ප්‍රශ්නය ඊළඟට විය. මේ අතර, තුන්වැනි මතයක් ද විය. එනම්, කාඩරය හෝ ජාතික චරිතවලට වඩා මාධ්‍ය කම්පනය කළ හැකි ජාතික තේමාවක් ඇත්නම් ඒ ඔස්සේ පක්ෂයක් සාර්ථක කළ හැකි බවය. මෙහි දී විදේශ රටවල ජාතික පක්ෂ විශේෂයෙන් ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය උදාහරණයට ගන්නා ලදි. භාරතීය ජනතා පක්ෂයේ උදාහරණයට මා කැමතිවූයේ නැත. මන්ද? රාෂ්ඨීය ස්වයං සේවක්, ජාන් සන්ග් ආදිය හරහා වජ්පායි, අද්වානි වැනි නායකයින් දශක ගණනාවක් ඉන්දියාවේ නගර සභා, ප්‍රාන්ත සභා, මධ්‍යම ආණ්ඩුව වැනි ආයතනවල විවිධ පදවි ද, රාජ්‍ය බලය ද, ඒ සියල්ලට වඩා දහස් ගණනක පූර්ණ කාලීන බලකායක් ද සහිත ව්‍යාපාරයක් මිස මාධ්‍ය පෙන බුබුලක් බවට (භාරතීය ජනතා පක්ෂය BJP) සැලකිය නොහැකි වූ නිසාය.

කෙසේ වෙතත්, මේ යුගයේ දේශපාලනයේ දී පූර්ණ කාලීන සංවිධානය හෝ පක්ෂ යාන්ත්‍රණයට වඩා මාධ්‍ය - ගුවන් විදුලිය, රූපවාහිනිය, ජංගම දුරකතනය, පරිගණකය පදනම් කරගත් සන්නිවේදන ජාලය අතිශයින් වැදගත් බව අපේ පිළිගැනීම විය. ත්‍රස්ත විරෝධී ව්‍යාපාරයේ ඇතැම් ක්‍රියා (ලංකා කම්කරු කොංග්‍රස් කාර්යාලයේ සිදු වූ ගැටුම) මාධ්‍යවල ඉහළින්ම වාර්තා වූ අතර, එහෙයින් අපට ලැබුණු ප්‍රතිචාර පුදුමාකර විය. මා මාධ්‍ය පෙන බුබුලුවලට දැඩි අකමැත්තක් දැක්වූවත් යථාර්ථය එය බව මගේ ද හැඟීම විය. රනිල් වික්‍රමසිංහ 2005 ජනාධිපතිවරණයේ දී නොසිතූ තරම් මහින්ද රාජපක්ෂට කිට්ටු කළේ සුළු ජාතික ඡන්දයෙන් පමණක් නොව විද්‍යුත් මාධ්‍යයෙන් ඔවුන් සිදුකළ දැවැන්ත ප්‍රචාරය නිසාය. රටේ ජනතාවගෙන් 5%ක පමණ ඡන්දයක් එහා මෙහා කිරීමට විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරය සමත් බව රනිල් ඔප්පු කළේය. මෙය අතේ මුදල් නැති, අයථා ක්‍රමවලින් මුදල් සෙවීමට යන්නේත් නැති බොහෝ දේශපාලකයින්ට රතු එළියකි. ඕනෑම අයථා ක්‍රමයකින් මුදල් සොයා විද්‍යුත්

මාධ්‍ය අත්පත්කරගත හැකි "ප්‍රසාංගික මොඩල වලට" ඉදිරියේ දේශපාලනය වැඩි වැඩියෙන් විවෘත වීමට නියමිතය.

මේ සියලු කරුණු සිත තබාගෙන සිංහල ජාතිකවාදී පක්ෂයක් තැනීම ගැන අපි සිත් යොමු කළෙමු.

අපට සිත සිතා සිටින්නට කාලයක් නොතිබිණි. ප්‍රභාකරන් ජනාධිපතිවරණයට පෙර තමිල් ඊළම පිහිටුවීම සඳහා වේගයෙන් ක්‍රියා කරමින් තිබිණි. වන්නිය පිසලීමෙන් පසු ඔහු පරන්තන්, අලිමංකඩ වටලෑවේය. එය ඉතා සැලසුම්ගත වටලෑමක් විය. මේ අතර, ජනාධිපතිවරණය සඳහා චන්ද්‍රිකා, රනිල් හා ජ.වි.පෙන් නන්දන ඉදිරිපත් වූහ. චන්ද්‍රිකා සිටියේ එතරම් පහසු තත්ත්වයක නොවේ. බොහෝ බලාපොරොත්තු තබා සිටි සාම යුද්ධය පරාජය වෙමින් තිබිණි. එය රත්වත්තේ කී ලෙස උපක්‍රමික පසුබැසීමක් ලෙස ජනතාව තේරුම් ගත්තේ නැත. එමෙන්ම ඇය ෆෙඩරල් පැකේජය ගෙනඒමට තැත්කිරීමෙන් භික්ෂු මහා සංඝයා අතරත් සිංහල ජාතික මත දරන්නන් අතරත් පිරිහී සිටියාය. රනිල් තමන් විසින්, සිංහල ජාතික ව්‍යාපාරයට ඇතුළු කළ භික්ෂූන් හා ගිහියන් හරහා යම් පමණකට සිංහල බලවේග මත අණසක පතුරුවාලුයේය. අප නොසිටියානම් ඔහු සිංහල ජාතික බලවේග ගිලගන්නට බොහෝ දුරට ඉඩ තිබිණි. ජවිපෙ කෙලින්ම මාක්ස්වාදී අන්තයේ සිට යුද්ධය විවේචනය කළේය. ඔවුන් ඒ වනවිට පළාත් පාලන, පළාත් සභා ආදී ඡන්දවලින් ලක්ෂ හතරක පමණ ඡන්දයක්ද, ශක්තිමත් කාඩරයක් ද ගොඩනගාගෙන සිටි අතර, සිංහල ජාතික බලවේග කෙරේ වූයේ ද අවතක්සේරුවකි. මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණේ ඉස්ලාමීය මූලධර්මවාදීන් වූ මුජිබර් රහමන්ලා ද, දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ ඉතුරු බිතුරු ද, දෙමළ ජාතිවාදී වාමාංශිකයන් වූ වික්‍රමබාහු - වාසු ආදීහු ද 1999 ජනාධිපතිවරණයේ දී ජවිපෙට සහාය දැක්වූහ. රනිල් සාම සාකච්ඡා සඳහා ෆෙඩරල් විසඳුමක ඡායාවක් යෝජනා කළ අතර, චන්ද්‍රිකා සිය 1997 නව ෆෙඩරල් ව්‍යවස්ථාව දේශපාලන විසඳුම ලෙස ප්‍රකාශ කළාය. රනිල් අතිශය තීරණාත්මක ලෙස ප්‍රභාකරන්ට වසර 05ක අන්තර් පාලනයක් යෝජනා කළ අතර, චන්ද්‍රිකා සිය ටයිම් (TIME) සාකච්ඡාවේදී අන්තර් පාලනය වසර 10කට දෙන බව ප්‍රකාශ කර සිටියාය. ජවිපෙ වර්ගවාදී යුද්ධය වහාම නතර කර සමානාත්මතාවය මත දෙමළ ජනයාට ස්වයං පාලන ප්‍රදේශ දෙන්නට පොරොන්දු වූවේය. පසුව සිංහල කොටි නමින් ප්‍රචලිත වූ රෝහිත භාෂණ විසින්, මෙහෙය වූ හිරු කණ්ඩායම ජ.වි.පෙ ප්‍රචාරක යාන්ත්‍රණය මෙහෙයවීය.

ප්‍රභාකරන් තීරකව ක්‍රියාකර තිබිණි. ඔහුගේ ඉලක්කය වී තිබුණේ දුර්වල කරන ලද "රනිල් " කෙනෙක් බලයට ගෙනඑන්නටය. ජනාධිපතිවරණය අවසන් වනවිට අලිමංකඩ ඇතුළු යාපනයට යටත්වීමට සලස්වා ස්ථිර රාජ්‍යයක් සඳහා ජාත්‍යන්තර ගිවිසුමකට යෑමටය. කොටින්ම යුද ජය එකවිටම දේශපාලන ජයක් කරගැනීමටය. බාලසිංහම් ඒ සඳහා යුහුසුළුව ක්‍රියාකරමින් සිටියේය.

ඒ දිනය මට තාමත් මතකය. මම ජනාධිපතිවරණය සඳහා කඩවත තිබූ කුඩා ජනහමුවක් - (එය දේශප්‍රිය අලහකෝන් සංවිධානය කළ එකකි) - අමතා ආපසු එමින් සිටියෙමි. රනිල් - චන්ද්‍රිකා යන කිසිවෙකුටත් ඡන්දය නොදී ඡන්දය වර්ජනය කිරීම අපේ අභිලාෂය විය. එයට ගංගොඩවිල සෝම ස්වාමින් වහන්සේගේ ද අනුග්‍රහය ලැබිණි. කඩවත හන්දිය අසල දී මේජර් ජෙනරාල් ලකී අල්ගම, අනුරුද්ධ රත්වත්තේ පතුරු ගසනා හඬ ශබ්ද විකාශනයෙන් ඇසිණි. ඔහු රනිල්ගේ ආණ්ඩුවේ ආරක්ෂක ඇමැති බව සිංහල මත ඇත්තන්ට යූ.එන්.පී කාරයින් විසින් පැවසූයේ රනිල් රට පාවා දීමට යනවාය යන්නට පිළිතුරු ලෙසය. ලකී අල්ගම නැගෙනහිර මුදාගත් කතාව යුදමය ලෙස ඇත්තක් වුවත් (1993) එය තමන්ගේ දේශපාලන ජයග්‍රහණයක් ලෙස යූ.එන්.පීය ප්‍රකාශ කිරීම අමන විහිළුවක් විය. මන්ද නැගෙනහිර පාවා දුන්නේ ද (1990) ඔවුන් විසින් වීම නිසාය. එදින ඇස්වාට්ටුව හරහා මා පැමිණියේ පෙරමුණේ රැලියද නිකම් දැකබලා ගැනීමේ ආශාව සහිතවය. මා රෑ බෝවන්නට පෙර නවාතැනට පැමිණි අතර, පළමු ආරංචිය ඒ සමග ආවේය. ජා - ඇල යූ.එන්.පී රැලියට බෝම්බ ප්‍රහාරයක් දී ලක්ෂ්මන් අල්ගම මරාදමා ඇති පුවත එයින් වාර්තා විය. ප්‍රභාකරන් රනිල්ගේ "බොඩිගාඩ්" කලින්ම ඉවත් කර තිබිණි. ජානක පෙරේරා යූ.එන්.පීයෙන් දේශපාලනයට පිවිසෙන බව මට ප්‍රකාශ කළ විට මා ඔහුට කීවේ ඔබට ද ලකී අල්ගමට වූ දේ සිදුවීමට ඉඩ ඇති නිසා එයින් වළකින ලෙසය. එය ඔහු ඇසූවේ නැත. සිදුවීම් දෙකම එකම ආකාරයට සිදුවිය. ඊළඟට වාර්තා වූයේ චන්ද්‍රිකා ඝාතන වෑයම ගැනය. මා හඳුනන කොල්ලුපිටියේ ප්‍රභූ කාන්තාවක් කීවේ යූ.එන්.පීයේ පිරිස් දැනටම ජයපැන් බොන බවය. තවමත් උදෑසන වී නොතිබිණි. චන්ද්‍රිකා සිටියේ ජීවිතය හා මරණය අතර, සටනකය. අපේ දේශපාලනයේ අන්ධ මුග්දභාවය එයින් කැපී පෙනිණි. කොටි 1994 දී ගාමිණී දිසානායක ඝාතනය කර චන්ද්‍රිකාට පාර කැපූ අවස්ථාවේදී ශ්‍රී.ලනි.ප නායකයින් හැසිරුණේ ද මේ ආකාරයටමය.

පොට්ටුඅම්මාන්ගේ ඉලක්කය වැරදිණි. චන්ද්‍රිකා දිවි ගලවා ගත් අතර, ඇය වෙත අනුකම්පාවේ රැල්ල ගලා ආවේය. අපත් සමග ඡන්දය වර්ජනය කිරීමට ගිය අය පවා චන්ද්‍රිකාට ඡන්දය දුන්නේ ප්‍රභාකරන්ට පණිවුඩයක් දීමේ පරමාර්ථය ඇතුවය. ඡන්ද වර්ජනය, ඡන්දයක් ගැනීමට වඩා අමාරු බව අපි වටහා ගතිමු. අපේ ඡන්ද වර්ජන ව්‍යාපාරයට චන්ද්‍රිකා හා එස්.බීගේ මැර කල්ලි තදින් බාධා කළෝය. ඒ සියල්ල මැද අපි අධිෂ්ඨානශීලී ක්‍රියාදාමයක් ගෙනගිය නමුදු ජනතාව ඡන්ද අපතේ හැරීමට අකමැති බව නැවත අපට පෙන්නා දී තිබිණි.

ජනාධිපතිවරණයට පෙර සිංහල පක්ෂයක් පිහිටුවීම පිළිබඳ අපි නොයෙක් දෙනා සමග අදහස් හුවමාරු කර ගතිමු. නීතිඥඑස්.එල් ගුණසේකර වැනි වෘත්තිකයන් මෙන්ම සිංහල වීර විදහන ව්‍යාපාරිකයන් ද ඒ අතර විය. ඒ දෙපිරිසම පාහේ ප්‍රතිපත්තියක් ලෙස පක්ෂයක් පිහිටුවීමට එකඟවුවත් පරස්පරයන් ද විය. වීර විදහන නායකයින් යෝජනා කළ පක්ෂ ව්‍යවස්ථාවේ වූ නායකයාට සියලු බලතල ලැබීම වෘත්තිකයෝ ප්‍රතික්ෂේප කළහ. ඔවුහු වඩාත් ලිහිල් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් ඉල්ලා සිටියහ. දෙපිරිසම භික්ෂූන් වහන්සේ පාක්ෂික භූමිකාවක් රඟදැක්වීම ගැන කැමැත්තක් දැක්වූයේ නැත. එය අපේ නොසතුටට හේතු විය. අන්තිමේදී "ජාතික සවිය" නමින් පක්ෂයක් එළි දැක්වීමට වීර විදහන තීරණය කළේය. ජනාධිපතිවරණ ප්‍රතිඵල නිකුත් වනවිට එයට අදාළ දැන්වීම් ද ප්‍රචාරය විය. නමුත් ජනාධිපතිවරණයෙන් පසු ඒ අදහස ඔවුන් අතරින් ගිලිහී ගියේය.

ජනාධිපතිවරණයට පෙර කෙසේ හෝ අලුත් පක්ෂය පිහිටුවා ලීමට අපට අවශ්‍ය වූයේ ජනාධිපතිවරණයෙන් පසු වහාම පාර්ලිමේන්තුව විසිරුවාලීමට චන්ද්‍රිකා ක්‍රියාකරනු ඇතැයි අපි සිතූ නිසාය. එය සාමාන්‍යයෙන් සිදුකළ යුත්තකි. මන්ද ජනාධිපතිවරණයේ උණුසුමත්, අරමුදල් ආදිය අවසන් වීමෙන් විපක්ෂය මන්ද උත්සාහීවීමත් නිසා පැහැදිලි බහුතරයක් එමගින් ලැබිය හැකි වීමය. නමුත් පුදුමයකට මෙන් චන්ද්‍රිකා එසේ කළේ නැත. ඇය සිතුවේ ඇය ගැන පමණකි. මහා මැතිවරණය නොපවත්වා යූ.එන්.පීයේ හොඳ හිත ද ඇතිව විධායක ජනාධිපති ධුරය අහෝසිවන ෆෙඩරල් ව්‍යවස්ථාවක් සිය දෙවැනි ධුර කාලය අවසන් වීමෙන් පසු ක්‍රියාත්මක කළ හැකියැයි ඇය සිතන්නට ඇත. පරාජයේ අළු දූවිලි වසාගන්නට යූ.එන්.පීයට ද කල් අවශ්‍ය වූ නිසා ඔවුන් ද නව ව්‍යවස්ථාව සැකසීම සඳහා බටහිර තානාපති කාර්යාලවල ආශිර්වාදයෙන් පිවිසෙන්නට විය.

මේ අතර ප්‍රභාකරන් සිය ප්‍රහාරයේ වේගය වැඩි කළේය. යුදබිමේ අපේ සගයින් වාර්තා කළේ අලිමංකඩ කෙටි කලකට වඩා අල්ලා සිටිය නොහැකි බවත්, යාපනයේ අපේ හමුදා කොටුවීම ස්ථිර බවත්ය. වීර විදහන සිංහල පක්ෂය පිළිබඳ අදහස අත්හැරිය අතර, අපේ උත්සාහය අපි අත්නොහැරියෙමු. ව්‍යාපාරිකයන් ලෙස ඍජුව දේශපාලනයට පිවිසීමේදී ඇතිවන ව්‍යාපාරික අනතුර ගැන අපි ද අවබෝධ කරගතිමු. නමුත් වෘත්තීය ක්ෂේත්‍රවලින් දිගටම පෙළඹවීම තිබිණි. මේ අතර, යූඑන්පී පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් කරුණාරත්න තමන්, පක්ෂයෙන් ඉවත්වීමට කැමති බව ප්‍රකාශ කළේය. අපි වහාම පක්ෂයක් පිහිටුවීමට කැමැත්තෙන් සිටින සුළු පිරිස අතරේ සාකච්ඡාවක් කැඳවූයෙමු. එදින හරියටම රාජගිරියේ දී අනුරුද්ධ රත්වත්ත ඉලක්ක කරගෙන කොටි ප්‍රහාරය එල්ල වූ දිනය විය. රාජගිරිය ප්‍රදේශයේ සැඟවී ගිය කොටි සාමාජිකයන් සොයා ආරක්ෂක හමුදා මෙහෙයුම් කරත්දී සිංහල දේශපාලනය සඳහා නව මෙහෙයුමක් අපි වැල්ලවත්තේ අනිල් ජයවර්ධන මහතාගේ හෝටලයේ දී ආරම්භ කළෙමු. පක්ෂයේ නම, ව්‍යුහය, ව්‍යවස්ථාව, ප්‍රතිපත්ති ආදිය ගැන මූලික එකඟතාවයකින් පසු සිංහල අලුත් අවුරුද්දෙන් පසු පක්ෂය නිල වශයෙන් පිහිටුවීමේ අරමුණින් විසිර ගියෙමු.

දින කීපයකට පසු යුද බිමෙන් ආරංචි වූයේ අලිමංකඩට උතුරින් පල්ලෙයි ප්‍රදේශය කොටි අල්ලාගෙන ඇති අතර, අපේ හමුදා කොටි ගිරයට හසු වී ඇති බවය. 2000 සිංහල අවුරුද්ද ගෙවුණේ ඉතා කාළකණ්ණි ලෙසය. 1954 දී ඩියන්බියන් පූ ප්‍රංශ බලකොටුව බිඳලූ ලෙස තම හමුදා අලිමංකඩට ඇතුළු වූ බව කොටි ප්‍රකාශ කළෝය. ස්වර්ණම් එහි ධජය එස වූ බව ටැමිල්නෙට් වර්තා කළේය. අලිමංකඩ හමුදා ප්‍රධානී බ්‍රිගේඩියර් පර්සි ප්‍රනාන්දු මරා දැමුණු බවත්, අති දැවැන්ත අවි තොගයක් කොටින් සතු වූ බවත්, වාර්තා විය. මෙය 1996 සිට බලාපොරොත්තු වූවකි. මුලතිව්, කිලිනොච්චි, පරන්තන් හා අලිමංකඩ වැටුණේ එකම ලෙසටය. එකම රටාවකටය. එකම යුද උපායකටය. එය එසේ සිදුවූයේ ඇයි? අපේ උපායන් අලුත් නොවූයේ ඇයි? චන්ද්‍රිකා හා මංගලගේ සාම යුද්ධය ඛේදවාචකයකින් අවසන් වීමේ ලකුණු පහළව තිබිණි.

අලිමංකඩ සුන්බත් වීමත් සමග ආණ්ඩුව වැඩිමනත්ම බිය වූයේ කොටින්ට නොව අපටය. සිංහල ජනතාවටය. රැස්වීම්, පෙළපාලි තහනම් කරනා ලදි. යුද හමුදා කුමන්ත්‍රණයක් ගැන කසු කුසු පැතිර යන ලදී. අවි බිම තබා අන්තර් ජාතික යටත්වීමේ ගිවිසුමක් අත්සන් කර සෙබළුනට යාපනයෙන් ඉවත්වීමට

ඉඩදෙන බව කොට් ප්‍රකාශ කළහ. ආණ්ඩුවේ නින්දිතකමට සීමාවක් නොවීය. චන්ද්‍රිකා සෙබළුන් කොළඹ ගෙනඒම ගැන සාකච්ඡා කරන්නට වූවාය. ඉන්දීය හමුදා නායකයින් මෙහි පැමිණි අතර, ඔවුන් සමග සාකච්ඡා වූයේ ද ඉන්දීය නැව්වලින් සෙබළු කොළඹ ගෙනඒම ගැනය.

මේ අතර, විශ්‍රාමික හමුදා නිලධාරීයෙකුගේ නිවසේදී ශ්‍රී ලංකා හමුදාවේ උසස් නිලධාරීන් පිරිසක් හමුවුනෙමි. ඔවුන් සියලුදෙනාම කීවේ සැපයුම් ගෙනයා නොහැකි නිසා යාපනය අත්හැරීම හැර අන් විකල්පයක් නැති බවය. මම ඔවුනට කරුණු තුනක් පෙන්නා දුනිමි. 1999 නොවැම්බර් වන්නි අත්දැකීම ගැන පළමුව කීවෙමි. ප්‍රභාකරන්ට සිය යුද ජයග්‍රහණ රැකගැනීමට තරම් පිරිස් හෝ ගිනි බලයක් නැති අතර, අප ඔහුව අධිතක්සේරු කර ඇති බවත්, අපේ ප්‍රශ්නය පිරිස් හෝ ගිනි බලය නොව යුද මානසිකත්වය නැතිවීම බවත් කීවෙමි. අනෙක් අතට සැපයුම් නැතුව කොටුවීම යුදමය ලෙස හානියක් වුවත් පෙරළා සටන "සොහොනේ සටන" (Death Ground Battle) නිසා අපේ සෙබළුන් තීරකව සටන් කරනු ඇතැයි ද කීවෙමි. මන්ද පළායන්නට අතක් නොමැති නිසාය. අනෙක් අතින් යුද්ධය පැරදී කොළඹ ආවත් කොළඹ ඇතිවන කැරලි මැඩලන්නට ගියහොත් හමුදාවේ අපකීර්තිය දෙගුණ තෙගුණ වී ඇතැම්විට රටම ප්‍රභාකරන්ට යටවනු ඇති බව ද කීවෙමි. ඒ නිසා කෙසේ හෝ කළ යුත්තේ මුළු වැරයොදා සටන් කිරීම බවත්, මුළු රටම යුද සූදානමක තැබීම බවත්, කීවෙමි. හමුදා නිලධාරීන් මදක් ඒත්තුගත් බව මට වැටහිණි. පසුව හමුදා මූලස්ථානයේ සාකච්ඡාවක් විය. මේජර් ජෙනරාල් ජානක පෙරේරා යාපනයට යැවිනි. අපි අපේ ක්‍රියාධරයන් හා හිමිවරු සමග යුද පෙරමුණට ගොස් සෙබළුන් දිරිගැන්වීමේ ප්‍රචාරක සටනකට එකතු වුනෙමු. සුදු නෙළුම් පරවී තවලම් ආපසු හැර වී තිබිණි. මේ අතර, ජානක පෙරේරා මහතා අපේ හිතවතෙකුගේ නිවසේදී හමුවුනෙමි. ඔහුට සටන ජයගැනීමට ආශීර්වාද කරනා ලෙස ඔහු ඉල්ලා සිටියේය. සටන ජයගැනීමට ඔහුට සහායවීමට ඕනෑම කැපවීමක් කරනා බව ඔහුට කීවෙමි. සටන තුළ චන්ද්‍රිකා බියගන්වන සුළු දේශපාලනය නම් නොකරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. නමුත් අපේ අවංක අරමුණුවලට එලෙසම ක්‍රියාකාරී වීමට නොහැකි විය. ජානක පෙරේරා යූඑන්පීය සමග කුමන්ත්‍රණ කරනා බවට රාවයක් පැතිර ගියේය. ඒ ඔහු විපක්ෂ නායක රනිල්ට යාපනයේ සිට දුරකතන ඇමතුමක් දීම නිසාය. අන්තිමේදී අනුරුද්ධ රත්වත්තේ ඇතුළු පිරිසක් යාපනයට ගියහ. එය සෑම අතින්ම හොඳට ගියේය. චන්ද්‍රිකා යාපනය අත්හැරීම ගැන සිතුවත් රත්වත්තේ සිතුවේ එය කෙසේ හෝ රැකගැනීමටයි.

ඔහුගේ අතීත ඥාතියා වූ ලෙව්කේ මැතිඳු මෙන් ආත්මගරුත්වය සඳහා ඔහු තනිවී සිටියේය. නැවත වතාවක් කොටින්ගේ යුද ශක්තිය අතිශයෝක්තියට නැගීම විදහා දක්වමින් යාපනයේ තීරක සටන ඔවුන් පරාජය විය. යාපනය අල්ලා ගැනීමට කොටි කළ සටන විනාශයේ ජයග්‍රහණයක්, පයිරෙක් (Phyric Victory) ජයග්‍රහණයක් විය.

යාපනය රැකගැනීමේ සටන අපේ ජයග්‍රහණයෙන් කෙළවර වුවද එයින් ඉතා ගැඹුරු දේශපාලන පණිවුඩයක් ලැබිණි. එනම් ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ දේශපාලන නායකයින්ගේ බියසුළු, කපටි, නින්දිත, ස්වරූපයයි. විශේෂයෙන් ඉන්දියාව ප්‍රභාකරන් වෙනම රාජ්‍යයක් ඇතිකිරීම අන්තිම මොහොතේ හෝ වළක්වයි යන අපේ උපකල්පනය වැරැදි බව පෙණී තිබිණි. ප්‍රභාකරන්ගේ යුද ජය පෙනීපෙනී තිබියදී ඉන්දියාව කිසිදු උපකාරයක් නොකළේය. අපට උපකාර කළේ පකිස්ථානය හා චීනයයි. එයින් පෙනීගියේ බී.ජේ.පී. පාලනය එහි ආරක්ෂක ඇමැති වූ කිතුණුවෙකු, කොංන්ග්‍රස් විරෝධියෙකු හා ගාන්ධි පවුලේ වෛරක්කාරයෙකු වූ ජොර්ජ් පර්නැන්ඩස්  නිසා ඇතිතරමට කොටි හිතවාදී වී ඇතිබවය. බී.ජේ.පී.යේ න්‍යායාචාර්ය හා සංවිධායක වූ එල්.කේ.අද්වානිගේ ජීවිත කතාව (My Country My Life) කියවීමෙන් පසු මා තේරුම් ගත්තේ බී.ජේ.පී ය පවා ප්‍රචලිත දෙමළ ජාතිවාදී මතයෙන් එනම් ලංකාවේ දෙමළ ජනයා පීඩාවට පත්ව ඇත.කොටි එහි විමුක්තිදායකයාය යන මතයෙන් ගැලැවී ගත් එකක් නොවන බවයි.අනෙක් අතට බී.ජේ.පී ය සිය බ්‍රාහ්මණ වංශික කම පසුපසට දමා දකුණු ඉන්දියාවේ දේශපාලන පදනමක් දමා ගැනීම සඳහා දෙමළ හිතවාදී උපායක්ද  ගෙන ගියේය. ඉන්දිරා සහ රජීව්, ජේ.ආර්ට පාඩමක් ඉගැන්වීමට හා තමිල්නාඩු දේශාපාලන නැලැවීමට (1983 - 89) ප්‍රභාකරන් නැලවූවාසේ බී.ජේ.පීයද එය සිය පදය කරගෙන තිබිණි. නොර්වේ රාජ්‍යය පවා සිය කොටි හිතවාදී කාර්යයන් සඳහා බී.ජේ.පීයේ ආශිර්වාදය ලබාගත් බව පසුව වාර්තා විය. කේ.පී. හෙළිදරව් කළේ උඩසිට පහළට ඉන්දීය දේශපාලනය සිය පැරැණි මුම්බායි පාතාලයේ කප්පම්වලින් දිනාගත් ආකාරයයි. ඉන්දියාව කවුටිල්ලයන් ලෙස නොව මෝඩයින් රැලක් ලෙස හැසිරෙන බව පෙනී ගියේය. ඉන්දියාවේ බී.ජේ.පී.පක්ෂයේ ප්‍රබලයෙක් මාහට 1997 වර්ෂයේදී හමුවිය. ලංකාව පිළිබඳ කොන්ග්‍රස් ආණ්ඩුව දැක්වූ සිංහලයින් සතුරු පිරිසක් යන ආකල්පය ඉවත්කර සිංහලයින් හා ලංකා වෙළඳපොල හොඳ ආශීර්වාදයක් ලෙස සලකන ලෙස ඉල්ලා සිටියෙමි. ඔහු එය පිළිගත්තේය.නමුත් බී.ජේ.පිය කොන්ග්‍රසයටත් වඩා මෝඩ ලෙස ප්‍රභාකරන්ව විශ්වාස කරමින් සිටියේය.මේ 1948 දී දෙමළ

ත්‍යාගම් සන්නද්ධ ව්‍යපාරය (පෙරියාර්ගේ) මර්දනය කළ ඉන්දියානු නායකයින්ගේ පරපුරුමද ? එදා දෙමළ බෙදුම්වාදය සඳහා මුස්ලිම් අලිජීන්නා හා පීඩිත කළ නියෝජනය කළ අම්බෙඩ්කාර්ගේ සහාය පෙරියර් හා අන්නදොර්යි ඉල්ලා සිටි අතර බ්‍රාහ්මණ - හින්දු විරෝධය ඔවුනගේ පොදු පදනම විය. දැන් බ්‍රාහ්මණ - හින්දු - මූලධර්මවාදීන් ද්‍රවිඩස්ථානය රැකීමට ඉදිරිපත්වී ඇතිද? බී.ජේ.පිය හා එහි හින්දුත්ව දර්ශනය ගැන පැහැදීමකින් සිටි මාහට ඔවුන්ගේ මේ තමිල්නාඩු අවස්ථාවාදය ගැන ඇතිවුයේ පිළිකුලකි. 2009 මැයි මස වේලුපිල්ලේ හා කොටි ගලවා ගැනීම සඳහා තමිල්නාඩු මැතිවරණ වේදිකාව බී.ජේ.පිය විසින් භාවිතා කළ ආකාරයෙන් පෙනී ගියේ ඔවුනගේ මුග්ද උපාය මාර්ගය වෙනස් නොවී ඇති බවයි.

2000 අප්‍රියෙල් 19 වැනිදා අපි සුභමොහොතින් සිහළ උරුමයේ නව ව්‍යවස්ථාව හා නිලධාරී මණ්ඩලය අනුමත කරගනිමු. පක්ෂයේ  සභාපති ලෙස එස්.එල්. ගුණසේකර මහතාත්, මහලේකම් ලෙස තිලක් කරුණාරත්න මහතාත්, ජාතික සංවිධායක ලෙස මාත්,භාණ්ඩාගාරික ලෙස නෙවිල් කරුණාතිලක මහතාත්, තේරී පත්වුහ.අප්‍රියෙල් 26 වැනිදා පදනම් ආයතනයේදී අපි පක්ෂය කළඑළි බැස්සවූවෙමු. රට පුරා හොඳ ප්‍රතිචාර අපට ලැබුණි. මහනුවර, කුරුණෑගල ආදී ප්‍රදේශවලද විශ්ව විද්‍යාල මහාචාර්යවරු, වෛද්‍ය, ඉංජිනේරු හා ව්‍යාපාරික වෘත්තිකයන් රැසක් අපට එක්විය. අපි නුගේගොඩදී පළමු ජනහමුව සුදානම් කළෙමු.

චන්ද්‍රිකා අපේ පළමු ජනහමුව තහනම් කළාය. එය ප්‍රජාතන්ත්‍රවාදීව පැවැත්වීමට ගිය අපට කඳුළු ගෑස් ප්‍රහාර එල්ලවිය. ඒ ජනහමුව සාර්ථක වන බවත් එය සිංහල ජාතික ව්‍යාපාරයේ මහා ඉදිරි පිම්මක් වන බවත් මංගල සමරවීර වටා සිටි විජාතික කල්ලි හා ජ.වි.පෙ කේවට්ටයින් අවබෝධ කරගෙන තිබිණි. ඒ දරුණු මර්දනය යටතේ වුව අපි තැන්තැන්වල අප්‍රසිද්ධියේ රැස්වීම් පැවැත්වුයෙමු. මහනුවර රැස්වීම පැවැත්වුයේ සුපිරි වෙළඳ සැලකය. ගාල්ලේ රැස්වීම හර්මන් ගුණරත්න මහතාගේ වතුයායේදීය! ජාතික සංවිධායක ලෙස උපරිම ශක්තියෙන් පක්ෂය සංවිධානය කළෙමි. යම් හෝ ස්වාධීන සංවිධාන ජාලයක් තිබුණේ කළුතර තිලක් කරුණාරත්න මහතාට පමණි. අන් කිසිවෙකුට සංවිධාන ජාලයක් නොතිබිණි. අරමුදල් සඳහා පුද්ගලික දායකත්වය හැරුණුවිට පොදු ක්‍රමවේදයක් නොවිණි. රතන හිමි මධ්‍යම කාරක සභාවට පැමිණීම වැළැක්වීම සඳහා භික්ෂූනට දේශපාලනය අකැපය යන සටන් පාඨයද නැගිණි. ඉංග්‍රිසි උගත්, නූගත් භේදයද සිහළ උරුමය තුළ මතුවිණි. මේවා සියුම් අයුරින් නොව

කළමනාකරණය කෙරුණේ තරමක් රළු අයුරිනි. හිත්බිඳීම් ආදිය මේ නිසා මුලසිටම පැවැතිණි.

මහා මැතිවරණයට පෙර චන්ද්‍රිකා තවත් මෝඩ උත්සාහයක් දරමින් ෆෙඩරල් පැකේජය අනුමත කරගන්නට උත්සාහ කළාය. මේ අතර ජ.වි.පෙ ඉහළටම සම්බන්ධ මගේ හිතවතෙකු කීවේ සිහළ උරුමය නිසා ලයින් මාරු කිරීමට ජ.වි.පෙට ඉහළින් උපදෙස් ලැබී ඇති බවය. චන්ද්‍රිකාගේ ෆෙඩරල් පැකේජය අධිෂ්ඨානශීලී උපවාසයකින් පැරැදවීමට අපි ඉටා ගතිමු. හැඩිගල්ලේ විමලසාර හිමියන් එයට එක්වූ අතර, අපේ අරගලය දින කීපයක්ම ජාතික අරගලයක් විය. චන්ද්‍රිකා පැකේජය අතහැර පාර්ලිමේන්තුව විසුරුවා හැරියාය.

චන්ද්‍රිකාගේ පැකේජය පැරැදවීම සඳහා විමලසාර හිමියන් මාරාන්තික උපවාසයෙන් ලද ජවය මැතිවරණය සඳහා අපට හොඳ උත්තේජකයක් විය. ඡන්දය සඳහා අපට අත්දැකීමක් නොවූ අතර බොහෝදුරට පන්සල හා හිමිවරු උපරිම ශක්තිය අපට ලබා දුන්හ. මුදල් ප්‍රශ්න මුලසිටම විය. අපේ එංගලන්ත ශාඛාවේ වෛද්‍ය රණතුංග ප්‍රමුඛ පිරිස් හා ප්‍රංශයේ කරුණානායක මහතා අපට සෘජුව උපකාර කළෝය. මෙහි නම් සඳහන් කළ නොහැකි හමුදා නිලධාරීන් පිරිසක් අපට ආරක්ෂාව හා පිරිස ලබාදීමෙන් උදව් කළෝය.මෙහි නම් සඳහන් කළ නොහැකි ව්‍යාපාරික මහතෙක් අපේ ප්‍රචාරක ව්‍යාපාරයෙන් බහුතරයක බර දැරුවේය.

මැතිවරණ ප්‍රතිඵල අපේ බොහෝ දෙනා අධෛර්යයට පත්කර තිබිණි. ඡන්ද දහසක් වැනි සුළු ප්‍රමාණයකින් අපට කොළඹ ආසනය අහිමි විය. මා සංවිධානය කළ කැස්බෑව ආසනය වැඩිම ඡන්දය ගත් අතර වැඩිම මනාපයත් (37,550) වැඩිම මනාප ප්‍රතිශතයත් (75%) ලැබුණේ මාහටය. මැතිවරණයට දින පහකට පෙර ප්‍රබල රාජ්‍ය නොවන සංවිධායකයෙකු වූ කුසල් පෙරේරා විද්‍යුත් තැපෑලට පණිවුඩයක් දමා කීවේ සිහළ උරුමයට කොළඹින් අසුනක් එන බවත් එය ලැබෙන්නේ වැදගත් මහත්වරුන්ට නොව සිංහල ෆැසිස්ට් නායක චම්පික රණවකට බවත් කුමන ක්‍රමයකින් හෝ එය වැළැක්විය යුතු බවත්ය.

සිහළ උරුමය බිහිකිරීමේදීම අපට විචිකිච්ජාවක් විය. එනම් පක්ෂයක් බිහිකිරීමට තරම් අප සංවිධානාත්මක ද? දේශපාලන ඒකාග්‍රතාව ද පරිණතද යන්නය. ඒ ගැන කිවයුත්තේ ඒ දෙකම අපට නිසි පමණට නොතිබූ බවය.

රටේ අවශ්‍යතවය අපට ප්‍රමුඛ විය.සන්නිවේදනය හරහා ගොඩනැගෙන ජාලය ගැන අපි විශ්වාස කළෙමු. අපේ බිඳවැටීමද ඒ හරහාම සිදුවිය.

මැතිවරණය අවසානයේ අපි මධ්‍යම කාරක සභාව රැස් කළෙමු! අපිට එකඳු දිස්ත්‍රික්කයක හෝ ආසනයක් නැති බව ඒ වනවිට දැන සිටියෙමු. ඉදිරියේදී ද පරාජය නොතකා කටයුතු කරන්නට සියල්ලන් තීරණය කළද පක්ෂය මෙතැනින් අවසාන බව දේශපාලනය දත් සියල්ලෝම දැන සිටියහ. හදිසියේම ජාතික ලැයිස්තුවෙන් අපට ආසනයක් ලැබී ඇති බව වාර්තා විය. ඒ වනවිට බොහෝ දෙනෙක් සභාවෙන් පිටවී සිටියහ. ජාතික ලැයිස්තු ධුරයට පත්කරන්නේ කවුරුන්දැයි පසුව තීරණය කරමු යන්න අදහසක් ලෙස ඉදිරිපත් වුවද එයට එස්.එල්.ගුණසේකර මහතා පත්කළ යුතු බවට මහාචාර්ය ඉන්ද්‍රරත්න ඇතුළු ඇතැම් පිරිසක් තරයේ ප්‍රකාශ කර සිටියහ. ඔහු එයට නුසුදුස්සෙක් නොවීය. නමුත් අපේ තරුණ පිරිස් හදවතට මුල්තැනදී ක්‍රියාකළහ. සමහරු ඉන්ද්‍රරත්න මහතාගේ යාබද පිහිටි නිවසට ගොස් කලබල ඇතිකර ගත්හ.බොහෝ දෙනෙකුට අවශ්‍ය වූයේ විවේකපාඩුවේ මේ පිළිබඳ සාකච්ඡාකර තීරණයක් ගැනීමයි. පක්ෂය වෙනුවෙන් ගුටිකමින් වෙහෙස මහන්සි වූ බොහෝ දෙනෙක් තමන් එකී වැදගත් තීරණවලින් ඉවත් කළේයැයි කෝපවී සිටියහ. ඔවුන් සිය කෝපය පළ කළේ ඒ සඳහා මාවම පත්කළ යුතු බව කියමිනි. අනෙක් පිරිස ගුණසේකර මහතාවම පත්කළ යුතුබව කීවෝය. අන්තිමේදී බොහෝ අමාරුවෙන් දෙපිරිසම එක්වී මධ්‍යම කාරක සභාවක් පැවැත්වූයෙමු. ඒ වනවිට අපව ගොඩනැගූ මාධ්‍ය අපව විනාශ කර තිබිණි. විජාතික බලවේග අපේ පිබිදීම තිඹිරිගෙයදීම නැසීමට සිතාගෙන සිටියෝය. ජ.වි.පෙ සිය පැරැණි ණය සියල්ල ගැනීමට සූදානමින් උපරිම ලෙස සිය ප්‍රචාරණය අපට එරෙහිව මුදාහැරියේය. ඒ වනවිට ජ.වි.පෙට ආසන 10 ක් ලැබී හොඳ මැතිවරණ ප්‍රතිඵලයක් ලැබී තිබිණි.

කලින් මධ්‍යම කාරක සභාවේ න්‍යාය පත්‍රයේ නොවූ නිසාත් එයට බහුතරය සහභාගී නොවූ නිසාත් ඉදිරි සයවසර සඳහා පක්ෂයට මේ එකම අසුන ඉතා වැදගත් නිසාත් මේ පිළිබඳ ගැඹුරු ලෙස සංවාද කර නිගමනයකට ආ යුතු බව ජනාධිපති නීතිඥවූලා ද සිල්වා ආරම්භයේදීම ප්‍රකාශ කළේය.පක්ෂයේ සමගිය තීරක හෙයින් අවශ්‍ය නම් මෙය පත්නොකර අපි අපේ කටයුතු කරමුයි පේරාදෙණියේ හිටපු උපකුලපති මද්දුම බණ්ඩාර මහාචාර්යතුමා කීවේය. අන්තිමේදී බහුතර තීරණය වූයේ මාත්, ගුණසේකර මහතාත් දෙදෙනාම නොව මහලේකම් තිලක් කරුණාරත්න මහතා පත්කිරීමටය.පක්ෂය දෙකඩ විය.චෝදනා ප්‍රතිචෝදනා ඇතිවිය. ක්‍රියාධරයින්

අප සමග රැඳුනත් ඡන්ද දායකයා අපෙන් වෙන්විය. තුවාලය සුවකර ගැනීමට බොහෝ කලක් යනු ඇතිබව අපේ හැඟීම විය. මාස කීපයකට පසු තිලක් කරුණාරත්න මහතා ධුරය මට පැවැරුවේය.ඉහළ මණ්ඩලයේ පූර්ණකාලීනයෙකු ලෙස දේශපාලනයේ යෙදුනේ මා පමණි. මේ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය පූර්ණකාලීන දේශපාලනයට මහත් රුකුලක් විය. පාර්ලිමේන්තුවට එන මාව රැග් කිරීම සඳහා පක්ෂයේ අයවලුන්ගෙන් තමනට යෝජනාවක් ආ බවත් නමුත් මගේ පළමු කතාව (එය පරිසරය ගැන විය) ඇසූ පමණින් තම අදහස අත්හැරගත් බවත් පසුව ටී.මහේෂ්වරන් මහතා ප්‍රකාශ කර සිටියේය. මට පළමු දිනයේ බාධා කළේ අස්වර් හා මනෝ විජේරත්න දෙපෙළය. ඒ රනිල්ගේ ඉගෙන්නුම් බහටය. පසුව ඔවුන් සියලුදෙනා මගේ මිතුරන් විය. 17 වන සංශෝධනය මගින් ස්වාධීන කොමිෂම් සහා සඳහා ජාතිවාදී පදනමින් ව්‍යාවස්ථා සභාව පිහිටුවීම විරුද්ධත්වය පළකළ එකම මන්ත්‍රී මම වීමි. පසුව 17 වැනි සංශෝධනය හා ස්වාධීන කොමිෂම් පසුව විකාරයක් බවට පත්විය. ඇත්තටම පොදු පෙරමුණ හා ජ.වි.පෙ සති දෙකක් පාලන බලය දිගුකර ගැනීම සඳහා කළ දේශපාලන විකාරයකි එය. දේශපාලනයෙන් තොර රාජ්‍ය සේවයක් ඉතා හොඳය. නමුත් අපි කරුණු දෙකක් තේරුම් ගත යුතු වෙමු. ලංකාවේ සිදුවූ ලොකුම වංචා (වැට් වංචාව,හේජින් සූදුව, රක්ෂණය හා තෙල් පුද්ගලීකරණය) සිදුකළේ නිලධාරීන්ය. රාජ්‍ය සේවය දේශපාලන දූෂිතයන්ගෙන් ඉවත්කර නිලධාරී දූෂිතයන්ට ලබාදීමෙන් පලක් නැත. දෙවැන්න රාජ්‍ය සේවා කොමිෂම් (රාජ්‍ය සේවා, මැතිවරණය, පොලීස්, නීති) පත්කිරීම් මූලික ව්‍යවස්ථා සභාව පත්කරන්නේ දේශපාලකයින්ය. එයද ජාතිභේදය අනුවය එහි සිංහල නියෝජනයක් නැත. මෙසේ හෙයින් එකී 17වැනි සංශෝධනයට එරෙහිවූ එකම මන්ත්‍රී ලෙස අදටත් මට ආඩම්බරයක් දැනේ. මා පාර්ලිමේන්තුවේ සිටියදී සිදුවූ තවත් වැදගත් කරුණක් වූයේ සිංහරාජය ඇතුළු වනාන්තර එක්සත් ජනපදයට පැවැරීමට ගිය ගිවිසුම පරාජය කිරීමට හැකි වීමය. පාර්ලිමේන්තුව තුළ පක්ෂ නායකයාත්, එකම නියෝජිතයාත් මා වීම නිසා බොහෝ දේ ඉගෙන ගැනීමට මට හැකිවිය.

විශේෂයෙන්ම ආනන්ද සංගරි වැනි දෙමළ නායකයින් සමග පාර්ලිමේන්තු පක්ෂ නායක හමුවේදී අදහස් ගැටීමට ලැබීම ලොකු අත්දැකීමක් විය. කථානායක ලෙස අනුර බණ්ඩාරනායක මහතා ස්වාධීන මෙහෙයක් කළේය. විශේෂයෙන් අගවිනිසුරු සරත් සිල්වාට එරෙහිව ඔහු ලබාදුන් තීන්දුව ඉතා නිර්භිත එකක් විය.

නමුත් අපේ දෙපා යටින් වේගයෙන් විජාතික බලවේග ක්‍රියාත්මක වෙමින් තිබිණි. කොටි සංවිධානය කටුනායක ගුවන්තොටුපළට පහරදුන් අතර (2001) රටේ ආර්ථිකය ප්‍රථම වතාවට ඍන ආර්ථික වර්ධනයක් පෙන්වූයේය. මාවනැල්ලේ ඇතිවූ මුස්ලිම් - සිංහල කෝලාහලය පදනම් කරගෙන එස්.බී. හකීම්ව විවේචනය කළේය. බොහෝ දෙනා ඒ ප්‍රශ්නයේදී සිංහල මුවහමට තඩිබාත්දී එහි ගොස් පාවාදී තිබු සිංහලයින්ගේ අභිමානය රැකදුන්නේ අපය. අන්තිමේදී හකීම් විපක්ෂයට ගියේය. පසුපසින් එස්.බී.ද ආවේය. බන්දුල ගුණවර්ධන හා එස්.බී. යන දෙදෙනා සමග ම ඔවුන්ගේ පිල්මාරුව ගැන මම කතා කළෙමි. ඔවුනට ගැලපෙන්නේ යූ.එන්.පීය නොව ශ්‍රී.ල.නි.ප දේශපාලනය බව මම අවංකව විශ්වාස කරනා බව කීවෙමි. එහෙත් ඔවුන් වෙනස් වූයේ නැත. ජී.එල්. ඇමැතිතුමා මට පෙන්වා දුන්නේ චන්ද්‍රිකාගේ ආකාර්යෂම පාලනයේ ස්වරූපයයි. ඇතැම් විට ඔවුන් සියලුදෙනා සිදුවීම් විසින් හෙම්බත්වී සිටියා විය හැකිය. නමුත් කොටියා කුරුමානම් අල්ලන්නේ වෙන දෙයකට බව මගේ අදහස විය.

කටුනායක ප්‍රහාරය සමග ජනබලමෙහෙයුම ආවේය. ඉක්මණින් ආණ්ඩුව පෙරළිය යුතුබවට විපක්ෂයේ මතයක් විය. නමුත් විපක්ෂ නායක රනිල් ගණන් බැලුවේ ආණ්ඩුව 2001 දී නොව පෙරළිය යුත්තේ 2005 දී ජනාධිපතිවරණයට පෙර බවය. ඔහු දේශපාලනික වශයෙන් නිවැරදි විය. නමුත් තදියම්කරුවෝ කොටි හා විජාතික සල්ලි මලු විසින් කුලප්පු කරනු ලදුව ආණ්ඩුව පෙරළා ගත්තෝය. එය පෙරළාගත්තේ එය අනෙක් පැත්තට පෙරළා ගැනීම සඳහා ඉඩකඩක් පෙරමුණට හා ජ.වි.පෙට ලබා දෙමිනි. ඔවුන් ඒ දේ කළා පමණක් නොව ජනාධිපතිවරණයෙන් නැවතත් යූ.එන්.පීයට බලයට ඒමට තිබූ ඉඩකඩ අහුරා දැමිණි. ඒ අරුතින් 2005 රනිල් පරාජය වූයේ 2001 ජනබල මෙහෙයුම නිසාය.

2001 මැතිවරණයට අපි වඩාත්ම සංවිධානාත්මකව ඉදිරිපත් වුනෙමු. මිත්‍ර වෙත්තමුනි වැනි හොඳ නව මුහුණු එකතු කරගත්තෙමු. නමුත් මාධ්‍ය හරහා බිඳ දමමින් තිබූ අපේ ප්‍රතිරූපය ගොඩනැගී තිබුණේ නැත. එමෙන්ම යූ.එන්.පීයේ ප්‍රචාරය එනම් ආර්ථිකය ගොඩගැනීම හා සාමය ගැන බොහෝ වෘත්තිකයන් ආකර්ෂණය විය. අපට තිබුණු අසුනද අහිමි වී ගියේය. අපට ලැබෙන වෘත්තික පාවෙන ඡන්දය අවස්ථාව හා තේමාව මත ලැබෙන්නක් බව නැවත ඔප්පු විය. තවත් දුෂ්කර ගමනක් යෑමට වනබව එයින් අවබෝධ කර ගතිමු.

## පස්වැනි දිගහැරුම

# සාම අඳුර මැද අරුණාලු

**2**001 මැතිවරණ පාරාජය අපට පමණක් නොව සමස්ත ජාතික ව්‍යාපාරයටම තියුණු ලෙස බලපෑවේය. කොළඹ නාගරික උගත් ඡන්ද දායකයා සිය සාම ව්‍යාපෘතියට යම් පමණකට දිනාගන්නට යූ.එන්.පී යේ දැවැන්ත ප්‍රචාරක මාධ්‍යය සමත් විය. නව මාධ්‍ය යථාර්ථයේ බලය තවදුරටත් පැහැදිලි විය. එක අතකින් එය සිහළ උරුමය පරදන්නටත් සිහළ විරෝධීන් ජයග්‍රහණය කරවන්නටත් යොදාගෙන තිබිණි. පසු කලෙක මට ඕස්ට්‍රේලියාවේ පැවැති සිංහල සමුළුවක දී හමු වූ ශ්‍රීලංකිකයෙකු අපූරු හෙළිදරව්වක් කළේය. තමන් එක්තරා බටහිර තානාපති කාර්යාලයක් සමගත් යූ.එන්.පී යේ ප්‍රචාරක මධ්‍යස්ථානය සමගත් එකට කටයුතු කළ අතර, ලංකාවේ සිංහල ජාතික බලවේග පරාජය කිරීම සඳහා නැගෙනහිර යුරෝපයේ පැරැණි කොමියුනිස්ට් ආණ්ඩු පරාජය කිරීමට මාධ්‍ය මෙහෙය වූ බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ උපදෙස් ලැබුණු ආකාරය හෙතෙම පැහැදිලි කළේය. ඔවුන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල අනුගමනය කරනා උපක්‍රම කීපයක් ප්‍රකාශ කළ ඔහු ඒවායින් ප්‍රවේශම් වන ලෙස කියා සිටියේය. තවත් වරක් පොලිස් ඔත්තුසේවා අංශවල ප්‍රධානියකු සිය සගයෙකු සමග මා ඇමැතිවරයෙකු වූවාට පසු හමුවිය. ප්‍රධානියාගේ සගයා මට හොඳින් දැක

පුරුදු මුහුණක් විය. පසුව ඔහු මට කීවේ තමන් ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය, සිංහල වීර විදහන හා සිහළ උරුමයට එක් වී සිටි බවයි. එම සංවිධාන ඇතුළතින් බිඳ දැමීම සඳහා කුඩා අර්බුද මහා අර්බුද බවට ඔවුන් පෙරළු ආකාරය ඔහු පැහැදිලි කර දුන්නේය. වරක් වීර විදහන කාර්යාලයේ සේවය කළ අයෙකුගේ මළ ගෙදරට ගියකල අපට දැනගන්නට ලැබුණේ ඔහු ජාතික ඔත්තු සේවාවේ නිලධාරියෙකු බවය! සංවිධාන අතර, මතුවන කුඩා අර්බුද ඒවා විසිර යවන මහා අර්බුද බවට පත්වන, පත්කරන ආකාරය අපට වැටහුණේ බොහෝ දේ සිදුවීමෙන් පසුවය.

මැතිවරණ පරාජයෙන් පසු අප අතර අර්බුද ඇතිවිය. බොහෝ දෙනෙකුට තේරුම්ගත නොහැකිවූයේ වසර 2000 මහා මැතිවරණයට සාපේක්ෂව ඉතා හොඳ පූර්ණ කාලීන ජාලයක්, සංවිධානාත්මක මැතිවරණ ව්‍යාපාරයක් කැපී පෙනෙනා අලුත් මුහුණු ආදිය ඉදිරිපත් කළ ද අපේ ඡන්ද ප්‍රමාණය අඩකින් අඩු වූයේ කෙසේ ද යන්නය. ජාලයට වඩා මාධ්‍ය මගින් ඇතිවන මතවාදයේ බලවත්කම නැවත ඔප්පු විය. වසර 2006 දී "ගම ජවිපෙට" සටන් පාඨය යටතේ ජ.වි.පෙ ලබාගත් ඡන්ද ප්‍රමාණය වසර 2009 දී අඩකින් නොව බොහෝ ස්ථානවල 1/5 දක්වා අඩුවූයේ ද මේ නිසාමය. විමල් වීරවංශ - නන්දන ගුණතිලක මහත්වරුන්ගේ ඉවත්වීමෙන් ජ.වි.පෙ පූර්ණකාලීන ජාලයට විශාල හානියක් නොවුව ද මතවාදී තලයේ මාධ්‍ය යථාර්ථයේ ඇති වූ කඩාවැටීම අති විශාල විය. ඉදිරි කාලවල දී කැපවී කරනා ජාලගත දේශපාලනය වෙනුවට මාධ්‍ය මගින් සහ වෙනත් ආකාරවලින් සිදු කරන බලය ප්‍රදර්ශනය කිරීමේ ප්‍රදර්ශකයින් ජයග්‍රහණය කිරීමේ ඉඩකඩ බොහෝ දුරට වැඩි බව තේරුම්ගත යුතු කරුණකි. මේ යථාව තේරුම්ගැනීම වෙනුවට අප පක්ෂය තුළ සිදු වූයේ අපේ දෙවැනි පෙළ කැපවුණු නායකයින් අතර, මතයක් ඇතිවූයේ පළමු පෙළ සිටි නායකයින් (මාද ඇතුළුව) නිවැරදි උපායන් හා කැපවීම් සිදු නොකරන නිසා මේ පරාජයන් අත්වන බවටය. ඔවුන් බොහෝ දෙනෙක් වෙන වෙනත් සංවිධාන ඇති කරගැනීම සඳහා යොමු වූහ. මුල් කාලයේදී අප වෙනුවෙන් බොහෝ කැපවීම් කළ සුජිත් අක්කරවත්ත එයින් එක් අයෙක් විය. ඔහු අපෙන් වෙන්වී ගියේය. තවත් බොහෝ දෙනා ද ඒ ලෙස වෙන්වී ගිය අතර, ඒ බොහෝ දෙනෙක් අවසානයේ යූ.එන්.පීයේ ව්‍යාපාරිකයන් අතර නතර විය.

මේ අතර, අප සමග එක්වූ වැඩිහිටි ව්‍යාපාරිකයන්, වෘත්තීයවේදීන් ආදීන් ද අකර්මන්‍ය වූවා හෝ වෙනත් පක්ෂවලට එක්වීම සිදුවිය. භික්ෂූන් වහන්සේලා ද වෙන වෙනත් සංවිධාන සමග ක්‍රියාකරන්නට වූහ.






**ත්‍රස්තවාදයටත් එහි සහයකයන්ටත් එරෙහිව අපි සැමදා නැගී සිටියෙමු. (2002)**



පොංගු තමිල් උළෙල නැවැත්විය






**ජනාධිපතිවරණ සටන, නුගේගොඩ රැළිය (2005)**








Charge of the
LAUNCHING OF
LION BRIGADE
Sri Lanka's Epic Victory Over Terrorism
Patali Champika Ranawaka





මේ ඉතාමත් දුෂ්කර සමය තුළ චරිත කිහිපයක් ජාතික ව්‍යාපාරය සඳහා කැපවීමෙන් එක්වූහ. එයට නායකත්වය දීමට නිරායාසයෙන්ම මතු වී ආහ. එහිදී කලක සිට විවිධ මට්ටමෙන් අප සමග සිටි උදය ගම්මන්පිල, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හා එච්.එම්.ජී.බී. කොටකදෙණිය මහත්වරු කැපී පෙනුනහ. ඔවුන් සිංහල ජාතික ව්‍යාපාරයට කැපවීමට තීරණය කළේ එය එහි දුෂ්කරම අවධියට වැටී අනාගතයක් නොපෙනෙන තත්ත්වයට පත්වී පැරැණි නායකයින් බොහෝ දෙනෙක් එය අත්හැර ගිය අවස්ථාවේදීය. පසුව ඔවුන් සියලුදෙනාම ජාතික නායකයින් බවට පත්වූහ.

අත්නොහැර අපේ අරගලය පෙරට ගෙනයා යුතු බවට අප අතර, ආත්මීය එකඟතාවයක් ඇතිවිය. එයට හේතු දෙකක් විය. එකක් නම් සිය පවුල් ජීවිත, ආර්ථික සවිය, සමාජ තත්ත්වයන් මේ සියල්ල ජාතියේ නිදහස වෙනුවෙන් කැපකළ දහස් ගණනක් මිනිසුන් හා ගැහැනුන්ගේ ජීවිතවල වගකීම අප මත රැඳී තිබීමය. දෙවැන්න වඩා වැදගත් විය. අප සටන් කළේ යම් අරමුණක් සඳහා ද ඒ අරමුණ අන්කවරදාටත් වඩා අවශ්‍ය වාතාවරණයක් රටේ ගොඩනැගී තිබීමය. ප්‍රභාකරන් මහා පිම්මක් ඉදිරියට පණිමින් සිටියේය. එය ආපසු හැරවිය නොහැකි දීර්ඝ ඉදිරි පිම්මක් වීම වැළැක්වීම අපේ අභියෝගය විය.

ප්‍රභාකරන් ඊනියා සාම ගිවිසුමකට 2002 දී ගමන් කළේ ඔය අතරය. ඔහු එවැන්නකට ආවේ කරුණු කීපයක් නිසාය. එකක් නම් යුදමය හේතූන්ය. 1995 සිට රිවිරැස, ජයසිකුරු ආදී මෙහෙයුම්වලට මුහුණ දීමෙන් කොටි සංවිධානයේ 12,000ක් පමණ මියගොස් තිබිණි. මේ නිසා නව පිරිස් බඳවාගැනීමත් ඔවුනට මනා පුහුණුවක් ලබාදීමත්, ඔවුනගේ යුද අවශ්‍යතාවයක් විය. එමෙන්ම ගරිල්ලා ව්‍යාපාරයක සිට යුද, ගුවන්, නාවික සම්ප්‍රදායික හමුදාවක් බවට පත්වීමේ යුද අවශ්‍යතාවය ද ඔහුට විය. ඒ සඳහා අවශ්‍ය යුද උපකරණ සහ සංවිධාන ව්‍යුහය ගොඩනැගීම දෙවැනි ඉලක්කය විය. ඒ අතර, යම් දිනෙක ලංකාවම අල්ලා ගැනීම සඳහා පුද්ගලයින්, උපකරණ රටපුරා ස්ථානගත කිරීම ද උතුරු හා නැගෙනහිර දෙපළාත සහමුලින් යටත්කර ගැනීම සඳහා වූ යුද මූලෝපායන් සැකසීමද, ඉන්දියාව ආදී රටවල් පවා බියගැන්වීම සඳහා රසායනික හෝ හැකිනම් න්‍යෂ්ඨික අවි පවා ලබාගැනීම ද ඔහුගේ ඉලක්කය විය. ප්‍රභාකරන්ට දේශපාලනික අවශ්‍යතාවයන් ද විය. මූලිකම කරුණ වූයේ 1999-2000 වසරවල වන්නි - අලිමංකඩ යුද පෙරමුණේ ඔහු ලැබූ ජයග්‍රහණයන් දේශපාලන ජයග්‍රහණයන් කරගැනීමය. ඊශ්‍රායලයේ යුද වීරයා වූ මොෂේ දයාන් විසින්, රචිත ස්වයං

චරිතාපදානය කියවීමෙන් මා ලද මූලිකම දැනුම වූයේ යුද ජයග්‍රහණ දේශපාලන ජයග්‍රහණ කිරීමට කෙතරම් අපහසු ද යන්නය. සිනායි (1959) දින හයේ යුද්ධය (1967), යොම් කිපුර් සටන (1973) ආදී සටන්වල දී ඊශ්‍රායලේ හමුදා ලබාගත්, ලොව මවිත කරවූ යුද ජයග්‍රහණ දේශපාලන ජයග්‍රහණ කරගෙන ජාතික හා ජාත්‍යන්තර ලෙස අල්ලාගත් ප්‍රදේශ ඊශ්‍රායෙල් රාජ්‍යයේ කොටස් ලෙස පිළිගැනීමට ලක්කර ගැනීමට ඇති වූ අපහසුතාවය එයින් මොෂේ දයාන් මනාව පැහැදිලි කර ඇත. නමුත් ප්‍රභාකරන් සිය නොර්වේ උපදේශකයින්ගේ උපදෙස් මත වසර 03ක් යන්නට මත්තෙන් සිය යුද ජයග්‍රහණ දේශපාලන විජයග්‍රහණ කරගත්තේය. 1995 චන්ද්‍රිකා සමග ඇතිකරගත් සටන් විරාමයට වඩා ඉදිරියට ගොස් සිය බලහත්කාරී ප්‍රදේශ නෛතික ප්‍රදේශ බවට ජාතික හා ජාත්‍යන්තරව පිළිගැනීමකට ලක්කර ගත්තේය. ඒ අතර, නිල වශයෙන්ම විදේශ රටවලට ඔහුට උපකාර කරගත හැකි ආකාරයන් තනා ගත්තේය. වරක් තිලක් කරුණාරත්න මහතා හා මම ජපාන නියෝජිතයන් හමු වූ විට ඔවුන් විසින්, කොටින්ගේ ඊනියා සාම මහ ලේකම් කාර්යාලය ගොඩනැගීමට අරමුදල් ලබාදීම ගැන ප්‍රශ්න කර එය යුද අපරාධයක් ලෙස පෙන්වා දිනිමු. ජපනුන් ඒ පිළිබඳව කීවේ ශ්‍රීලංකා රජයේ අනු දැනුම ඇතිව එය කළ බවත්, තවත් බොහෝ රටවල් එලෙස ක්‍රියාකරනා බවත්ය. පසුව හෙළි වූ අයුරු මුහුදු උමං, සබ්මැරීන, ටෝපිඩෝ, ගුවන් යානා, ගුවන් පථ, මිසයිල ආදී උපකරණවල සිට උමං මාලිගා දක්වා බොහෝ දේ විදේශ රටවල් ඒ දිනවල ගොඩනගා දුන් ඒවා බව හෙළි විය. දේශප්‍රේමී රේගු නිලධාරියෙකු මා හට ලබාදුන් ඔත්තුවක් නිසා ඔරුගොඩවත්තේ කන්ටේනරයක රඳවා තිබූ සැහැල්ලු ගුවන්යානා දෙකක් අත්අඩංගුවට ගන්නට ද ආණ්ඩුවට හැකියාව ලැබිණි. සුනාමියට මුවාවී ද සැලකිය යුතු විදේශ සහායක් කොටින්ට ගලා ආවේය. මුල් කාලයේ දී පේරාදෙණිය හා මොරටුව විශ්ව විද්‍යාලවල ඉංජිනේරු පීඨවල සිටි දෙමළ මහාචාර්යවරුන් හා ඉංජිනේරුවන් කීපදෙනෙකු කළ යම් යම් නිර්මාණ වෙනුවට ජාත්‍යන්තර විශේෂඥයින්ගේ සහාය ලංකා ආණ්ඩුව හරහාම කොටින්ට ලැබෙන්නට විය. අනෙක් අතින් අල්කයිදා 9/11 ප්‍රහාරය නිසා ලොව පුරා ඇතිව තිබූ ත්‍රස්ත විරෝධී ගෝලීය සංග්‍රාමයෙන් ගැලවී ගන්නට ද මේ ගිවිසුම නිසා කොටින්ට හැකි විය. නැගෙනහිර ආසියාවේ අල්කයිදා ජාලය එක්සත් ජනපද ඔත්තුසේවාවලට පාවාදීමෙන් කොටි බටහිර සමග හොඳ හිත තනාගත්තෝය. කොටි හා අල්කයිදා ජාලය අතර, ඇතිවූ තාක්ෂණික හා වෙනත් ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක සටහනක් මුලින්ම සිංහල පාඨකයාට ඉදිරිපත් කළේ අල්කයිදා අල්ජිහාද් කෘතියෙන් මා විසිනි. පසුව කොටි එක්සත් ජනපද

ඔත්තුසේවාව විනිවිද යන්නට ද නැගෙනහිර ආසියාව හා උතුරු අප්‍රිකාව අතර, කෙරුණු න්‍යෂ්ඨික ජාලයට රිංගන්නට ද උත්සාහ කළ අතර, අන්න එතැනදී එක්සත් ජනපදය බියට පත්වී ශ්‍රී ලංකා රජයට කොටින්ගේ නාවික ජාලය පිළිබඳ වැදගත් තොරතුරු ලබාදුන්නේය. එක්සත් ජනපදය කොටින්ට එලෙස පොඩි පාඩමක් ඉගැන්වීමෙන් පසු අවසන් මොහොතේ එය ගලවාගන්නට ද ක්‍රියා කළේය. කුමාරන් පත්මනාදන් අත්අඩංගුවට පත්වන විට ඔහු බටහිර ඔත්තුසේවාවල රැකවරණය යටතේ සිටි බවට ඇතැම් බටහිර ජනමාධ්‍යන්ම වාර්තා කර තිබීමෙන් මේ සබඳතාවයන් වඩාත් පැහැදිලි විය.

ප්‍රභාකරන් කරන්න යන දෙය පැහැදිලි වූවත් රනිල් කරන්නට යන දෙය මුලදී අපට වැටහුණේ නැත. අන්තර් ජාතික සාම සම සභාපතිවරුන්ගේ එකතුවක් ඇතිකළ අතර එහි ඉන්දියාව සිටියේ නැත. එය අන්තර්ජාතික ආරක්ෂක දැලක් ලෙස රනිල් ප්‍රකාශ කළ අතර, ප්‍රභාකරන් සාම ක්‍රියාදාමයෙන් ඉවත්වීමෙන් පසු (2003 අප්‍රියෙල්) එකී ආරක්ෂක දැල ප්‍රභාකරන් යළි සාමයට ගෙන එන්නට කිසිවක් සිදුකළේ ද නැත. අනෙක් අතින් ඉන්දියාවට ගිය රනිල් ලංකාව ඉන්දියාවේ දකුණු නිදහස් වෙළෙඳ කලාපයේ අඛණ්ඩ කොටසක් එනම් වෙළෙඳ ප්‍රාන්තයක් කරගන්නා ලෙස ඉල්ලා සිටියේය. 1999 වසරේදී ඉන්දියාවේ හිටපු ජනාධිපති අබ්දුල් කලාම් විසින්, රචිත ඉන්දියාවේ අනාගතය ගැන වූ කදිම කෘතියක් කියවීමි. එහිදී පකිස්තානු හා චීන මිසයිල පද්ධතිවලින් ආරක්ෂා වූ මිලිටරි අගනුවරක් (බැංගලෝරය) හා ඉංග්‍රීසි බස හොඳින් දත්, හින්දු සංස්කෘතිය ද ස්ථාපිත නොවූ දකුණේ ප්‍රාන්ත එකම වෙළෙඳ කලාපයක් කිරීමක් ගැනත් (චීනය ෂැංහයි බිහිකළා සේ) කතාකර තිබිණි. සේතු සමුද්‍රම් ඇළ ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර නාවික කලාප එක්කරනා යුදමය මාවතක් වූ අතර, මන්නාරමේ සිට ත්‍රිමලය හා මාතර යාවෙන ආසියානු අධිවේගී මාර්ග ජාලය ඉන්දියානු වෙළෙඳ පොළ ලංකාවට ව්‍යාප්ත කිරීමේ මගක් විය. රනිල් එකවර ඉන්දියාවේ වාණිජ පරමාර්ථ හා බටහිර ලෝකයේ දේශපාලන පරමාර්ථ ඉටුකරන්නේ කෙසේද කියා විමතියක් මා හට පහළ විය. ඉස්ලාම් මූලධර්මවාදය හා චීනයේ ආර්ථික ව්‍යාප්තවාදය පාලනය කිරීමට ඉන්දියාව බටහිරට අත්‍යවශ්‍ය දේශපාලන-යුදමය පදනමක් වුවත් ආර්ථික අතින් වැඩෙනා ඉන්දියාව තවදුරටත් තමන්ට රුචි ලෙස පාලනය කළ නොහැකි බව බටහිර හොඳින් දැන සිටියේය. චීනයේ හා ඉන්දියාවේ ගුවන්, සාගර ව්‍යාප්තිය පාලනය කිරීම හා තොරතුරු ලබාගැනීම සඳහා ලංකාව බටහිර ලෝකයට විශේෂයෙන් එක්සත් ජනපදයට අත්‍යවශ්‍ය වුවත් ඉන්දියාව එයට කැමතිවනු ඇතැයි මට පිළිගත නොහැකි

විය. දිල්ලියේ පර්නැන්ඩස්ගේ ආරක්ෂක අමාත්‍යාංශය හා මිස්රාගේ අගමැති කාර්යාලය අතර, රනිල්ට කුමන සබඳතා තිබුණ ද ඉන්දීය ස්වාධිපත්‍යය ප්‍රශ්න කෙරෙනා තැනට ලංකාවේ සාම ක්‍රියාදාමය පත්වූ දාට රනිල්ගේ මේ විජ්ජා දැක්ම අවසන් වන බව අපි වටහා ගතිමු. ඉන්දීය නාවුක හමුදාපති විෂ්ණු භගවාන් පළමු වෙඩිල්ල පත්තු කළේය. ජෝර්ඩ් පර්නැන්ඩස් ඉන්දීය ආරක්ෂක ඇමැති ඉන්දීය නාවික හමුදාව අල්ලාගත් කොටි නැව නිදහස් කරන ලෙස කළ නියෝගය විෂ්ණු භගවාන් නොතකා හැරියේය. වරක් අපි ඉන්දීය මහ කොමසාරිස් නිරූපම් සෙන් (2003) හමු වූ විට ඔහු කීවේද ප්‍රභාකරන් සම්ප්‍රදායික හමුදාවක් හා විකල්ප රාජ්‍යයක් සාමයට මුවා වී ගොඩනැගීම ගැන ඉන්දියාව සීරුවෙන් සිටිනා බවය. ඉන්දීය මහා කොමසාරිස් කාර්යාලයේ වීදුරුවලින් ලංකාවේ බටහිර මුහුදු තීරය පෙන්වූ සෙන් මුහුදු ප්‍රහාරයකින් තම තානාපති කාර්යාලය පවා විනාශ කිරීමට ඔවුනට හැකියාව ලැබී ඇතැයි බිය පළකළේය.

රනිල්ට වැඩිකලක් කඹයේ යන්නට බැරිබව අප සියල්ලන්ට පැහැදිලි විය.

නිරූපම් සෙන් හමුවන්නට ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයට ගිය අපේ නියෝජිත පිරිසේ බොහෝ දෙනෙක් වෘත්තීය ඉංජිනේරු හෝ විද්‍යාඥයෝ වූහ. අපේ වෘත්තීය පසුබිම විමසීමෙන් පසු ඔහු අපූරු දෙයක් කීවේය. එනම් ඔහු ලංකාවට පැමිණි අවස්ථාවේදී මහ කොමසාරිස් කාර්යාලය නිතර තොරතුරු ලබාගන්නා කොළඹ විශ්ව විද්‍යාලයේ කුප්‍රකට මහාචාර්යවරයෙකුගෙන් සිහළ උරුමය ගැන විමසූ විට එහි සිටින්නේ නූගත් රස්තියාදුකාරයින් පිරිසක් බවත්, ඉන්දියානුවන් හා දෙමළුන් මැරීම ඔවුනගේ එකම පරමාර්ථය බවත් ප්‍රකාශ කළ බවයි. ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය සිය කොක්ටේල් සාදවලට ආරාධනා කරනා සීමා සහිත පිරිස මතින් ලංකාව දැකීමේ බරපතලකම තමාට දැන් අවබෝධ වූ බව ද හෙතෙම කීවේය. ලංකාවේ සිංහල ජාතික ව්‍යාපාරය ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය වැනි මාධ්‍යමික උගතුන්ගේ ව්‍යාපාරයක් ලෙස ඔහු හඳුනාගෙන තිබිණි. ඉන්දියාව නිතරම දෙමළ හා සුළු ජාතීන්ගේ ආරක්ෂකයා ලෙස පෙනී නොසිට සිංහලයින් ද තම මිතුරන් ලෙස සලකන ලෙස අපි ඉල්ලා සිටියෙමු. 1989 සිට ඉන්දියාව ජවිපෙ සමඟ කිට්ටු සබඳතා ගොඩනගාගෙන තිබුණේය. කවුරුත් නොදන්නවා වුවද වර්ධරාජාගේ ආණ්ඩුවට ලැබුණු ඇතැම් ඉන්දීය අවි තොග ජ.වි.පෙට ද 1989 අගභාගයේ දී ලැබිණි. ඒ වනවිට ජ.වි.පෙ සිටියේ බිඳී විසිරී යමිනි. ජ.වි.පෙ ඉතුරු බිතුරු වූ නායකයින් පණ බේරාගත්තේ

ඉන්දියාවේ රැකවරණ මත ඉන්දියාවට පැන ගැනීමෙනි. ඒ ඉන්දියානු පොළොවේ සිට ඉන්දියානු ව්‍යාප්තවාදය පරාජය කරන්නට නම් නොවේ. 2004 මහා මැතිවරණයට සියරට පැමිණි ජ.වි.පෙ නායක අමරසිංහ මහතා කළුතර දී කළ පළමු කතාවේ දී පළමුවෙන්ම ස්තුති කළේ තම පණබේරා දුන් ඉන්දියාවටය. ඉන්දියාවට පක්ෂ වීමේ චෝදනාව මත ඔවුන් විසින්, මරාදැමූ වාමාංශික නායකයින් මිනීවළවල් සිට වුව දත්කුරු කන්නට, ඉන්දියාවට එරෙහිව සටනට යවා ඝාතනයට ලක්වූ ජවිපෙ සාමාජිකයන්ගේ ආත්මයන් දෙකඩ කරන්නට ඒ ස්වයං විවේචනය සමත් විය. කෙසේ වෙතත් නිරූපම් සෙන් මහතා සිංහල දේශපාලනය සමග ද විවෘතව ගනුදෙනු කරන්නට පැමිණි ප්‍රථම ඉන්දීය රාජ්‍ය තාන්ත්‍රිකයා විය. එය ඉන්දියාව ලංකාව කෙරේ තැබූ නිවැරදි පියවරක් විය. සිය කොක්ටේල්වලට එන සීමා සහිත පිරිස විසින්, ලංකාව පිළිබඳ චිත්‍ර මවාගන්නා බටහිර තානාපති අංශවලට පවා මෙය කදිම ආදර්ශයකි.

ප්‍රභාකරන්ගේ චිරප්‍රසිද්ධ 2002 අප්‍රියෙල් දින මල්ලාවි මාධ්‍ය සාකච්ඡාව වනවිට උදය ගම්මන්පිලත්, මමත්, වවුනියාවේ සිටියෙමු. නාවික හමුදා ඔත්තුසේවා නිලධාරියෙකු සමග දිවා ආහාර ගනිමින් එහි ඇති තත්ත්වය විග්‍රහ කරගත්තෙමු. පසුදින ත්‍රීමලයට ගිය අපට යුද හමුදා ඉහළ නිලධාරියෙකු කීවේ කොටි පෙරදින කාලතුවක්කු කීපයක් සාම්පූර් වෙරුගල් දෙසට තඹලගමුව හරහා ගෙනගිය බවය. දැන් ඉතින් ත්‍රීමල වරාය රැකගැනීම ඉතාම අපහසු කටයුත්තක් බව ඔහු ප්‍රකාශ කර සිටියේය. රනිල්ට මේ පිළිබඳව ඒ දිනවල එක්සත් ජනපද යුද නිලධාරීන් පිරිසක් ද ත්‍රීමලයේ සංචාරයකින් පසු ප්‍රකාශ කළ බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය. අපි තිගැස්සුනෙමු. දෙමළ ඊළම අත්හැරියොත් තමනට වෙඩි තබනා ලෙස සිය සගයින්ට ප්‍රභාකරන් මාධ්‍ය සාකච්ඡාවේ දී ප්‍රකාශ කළේ නිකමටම නොවේ යැයි අපි තේරුම් ගතිමු. ත්‍රීමල වරාය හා නගරය කොටුවන සේ කොටි කඳවුරු ජාලයක්ද, නැවත පදිංචි කිරීම් යටතේ ජයලත් ජයවර්ධනගේ ආධාරවලින් නිවාස ජාලයක් ද (පසුව සුනාමිය යටතේ නිවාස සංකීර්ණ ජාලයක් ද) බර අවි ස්ථානගත කිරීමක් ද සිදුවෙමින් තිබිණි. ඓතිහාසික විල්ගම්වෙහෙර ජනයාට අවුරුදු නැගම් (2003 අප්‍රියෙල්) රැගෙන ගිය අපි දුටුවේ එයට නුදුරින් ගොඩනැගෙනා කොටින්ගේ දැවැන්ත කඳවුරු ජාලයයි. ත්‍රීමලය වටකර හබරණ-ත්‍රීමලය ගොඩබිම් ප්‍රධාන සැපයුම් මාර්ගයත්, ත්‍රීමලය- කන්කසන්තුරේ නාවික සැපයුම් ජාලයත් එකවර අල්ලාගැනීමේ කොටි උපාය මැනවින් පෙනිණි. එමගින් යාපනය කොටුකර යටත්කර අවසන් යටත්වීමේ ගිවිසුම ඇතිකර

ගැනීම කොටින්ගේ යුද මූලෝපායික සැලැස්මේ මුල් අදියර විය. රනිල් කිසිවක් කරකියාගත නොහැකිව ක්‍රියාකරමින් සිටියේ එයට තවතවත් ඉඩදෙන ලෙසය. යූ.එන්.පීයම ඇතිකරගෙන තිබූ සාම සෝෂාවෙන් ඔවුන් වැසී යමින් සිටියෝය.

ප්‍රභාකරන් හදිසි ප්‍රහාරයකට සූදානම් වන බව ඉව වැටීමෙන් පසු රනිල් කළේ එක්සත් ජාතීන්ගේ හමුදාවක් ගෙන්වා ගැනීමේ හැකියාව සොයා බැලීමය. එක්සත් ජනපදය ඇෆ්ගනිස්තානයෙන් නතර නොවී ශ්‍රී ලංකාවට ද ගොඩබැසීමට යන බව ඉන්දියාවට ප්‍රථමවරට වැටහුණේ එවිටය.

රනිල් ගිවිසුම අත්සන් කළ පෙබරවාරි 22 දා එයට එරෙහිව පිටකොටුවේ පැවැත්වූ සිහළ උරුමය පෙළපාළියට සිටියේ අපි කීප දෙනෙකු පමණි. වැඩිහිටි හිමිවරුන්ගෙන් වැඩම කර සිටියේ රන්පත්විල විමලරතන නායක හාමුදුරුවන් පමණි. ආපසු සිහළ උරුමය කාර්යාලයට පැමිණි විට අගමැති කාර්යාලයෙන් ෆැක්ස් පණිවුඩයක් ලෙස රනිල් - ප්‍රභා ගිවිසුම ලැබී තිබිණි. එය රනිල්ගේ කාර්යාලයේ සිටි දේශමාමකයෙකුගේ වැඩකි. පසුව අගමැති රනිල්ම එය නිල වශයෙන්ම අපිට එව්වේය. ඒ පිළිබඳව අරලිය ගහ මන්දිරයේදී සාකච්ඡාවකට ද ඉඩකඩ ලබාදුන්නේය. පසුව මා ඇමතූ අගමැති කාර්යාලයේ හිතවතා කීවේ ජෝන් වෙස්ට්බර්ග් ලංකා ආණ්ඩුව නොමග යැවූ බවය. 1995 චන්ද්‍රිකාගේ ගිවිසුමට සමාන දළ ගිවිසුමක පිටපතක් (Draft) වන්නියට රැගෙන ගිය වෙස්ට්බර්ග් එයට ප්‍රභාකරන්ගේ අත්සන ගෙන ඇති අතර, දැන් අගමැති රනිල්ටත් එය අත්සන් කෙරීමට බලකෙරී ඇති බවය. මෙහි ඇත්ත නැත්ත නොදනිමි. නමුත් වෙස්ට්බර්ග් පසුව කොටින්ට සන්නිවේදන උපකරණ ලබාදීමේ දී හා සටන් විරාම නිරීක්ෂණයේ දී ලබාදුන් නිගමන දෙස බලනාවිට ඔහු එවැනි දෙයක් නොකළානම් පුදුමය. වන්නියේ කොටි මූල කඳවුරු සඳහා ඉන්දියානු දෙමළ ජනයා පදිංචිකිරීමට මුල්වූයේත් වෙස්ට්බර්ග් හා රෙඩ්බානා ව්‍යාපාරයමය. (1978-80)

ගිවිසුමත් සමග උතුරට, නැගෙනහිරට යෑමට සිංහල ජනයා තුළ සංචාරක උමතුවක් ඇතිකරනා ලද මුත් එය ආණ්ඩුවට මාරාන්තික එකක් විය. කොටි ඉතා සැලසුම් සහගත ලෙස වීසා හා වෙනත් ගාස්තු අයකිරීමෙන් ද තම බලය ප්‍රදර්ශනය කිරීමෙන් ද සිංහලයින්ගේ හද පාරවනු ලැබූ නිසාය. මෙය තමනට කළ මහත් නින්දාවක් බව ඉක්මණින්ම සිංහල සමාජය තේරුම් ගත්තේය. අනෙක් අතින් ආරක්ෂක හමුදා පත්ව ඇති නින්දා සහගත ස්වභාවයත්,

දිනෙන් දින නිර්ලජ්ජිතව සටන් විරාමය කඩවන ආකාරයත්, ආණ්ඩුව පත්ව ඇති නිවට ස්වභාවයත් ඉතා හොඳින් පැහැදිලි වන්නට විය. රනිල්ගේ ලැජ්ජා සහගත ක්‍රියාකාරීත්වය යූ.එන්.පීයේ නායකයින් පවා කෝපයට පත්කර තිබුණේය. නිදාශීලී සිංහයා සාම කිතියෙන් අවදිවිය. ඌ නැගිටුවා ගැනීම අපේ ඊළඟ වැයම විය.

අපි නිර්භීත තීරණ දෙකක් ගත්තෙමු. පළමු සිදුවීම වූයේ පූජ්‍ය එල්ලාවල මෙධානන්ද නාහිමියෝ අම්පාර වලතාපිටිය බුද්ධංගලට අයත් ගල්වැටියක සෙල්ලිපියක් පිටපත් කරන්නට ගිය අවස්ථාවේ නැගෙනහිර කොටි එය නවතාලීමේ සිදුවීමය. දෙවැන්න මුස්ලිම් ගමක් බිය වද්දා බලයෙන් රජයේ ප්‍රදේශයක ඉදිකළ මනිරාසකුලම් කඳවුර පිළිබඳ සිදුවීමය.

අපේ උපාය මාර්ගය පැහැදිලි එකක් විය. මේවනවිටත් ගිවිසුම් විරෝධීව පොදිකමින් සිටි ජ.වි.පෙ හා පොදු පෙරමුණ අගමැති රනිල්ව පාර්ලිමේන්තුවෙන් පළවාහැරීම දක්වා තල්ලු කිරීම අපේ ඉලක්කය විය. ඒ සඳහා ජනතාව තුළ කොටින්ගේ සාමයට මුවා වී සිදුකරනා යුද ක්‍රියාදාමය හෙළි දරව් කිරීම මගින් ජනතා විරෝධය උත්සන්න කරවීම අපේ උපායික ක්‍රියාදාමය විය.

එල්ලාවල නාහිමියන් සමග අපි වලතාපිටියට ගියෙමු. නැගෙනහිර කොටි නායකයින්ගේ විරෝධතා මැද අපි සෙල්ලිපි පිටපත් කරගත්තෙමු. එයින් අපි නැගෙනහිර සිංහල උරුමය සහතික කරගත්තෙමු. අනෙක් අතින් ජ.වි.පෙ හා ශ්‍රී.ල.නි.පය ගාල්ලේ සිට කොළඹට පැමිණි දේශප්‍රේමී පා ගමනටත් වඩා දැවැන්ත මාධ්‍ය කීර්තියක් ලබාගත්තෙමු. මේ හා සමගම සිහළ උරුමයට තිබූ මාධ්‍ය අන්ධකාරය දුරුවිය. පාර්ලිමේන්තු අසුනට ගුටි කෙළගත්තා කියා අපට තිබූ චෝදනාව නිෂේධ විය. බලය තිබුණත්, නැතත්, අපි ජාතිය වෙනුවෙන් සටන් කරනා පිරිසක් බව ඔප්පු විය. අපි සිතූ පරිදිම අපේ ප්‍රහාරයෙන් කලබල වූ ජ.වි.පෙ සිය දේශපාලන ප්‍රහාර වේගවත් කළේය. අපි ඩයිනමෝව කරකවන විට ප්‍රධාන එන්ජිමත්, පුංචි දැති රෝදයෙන් ලොකු දැති රෝදත් කරකැවෙන්නට විය.

අපේ මනිරාසකුලම් ගමන එයටත් වඩා උද්වේගකර එකක් විය. මුළු රටම ඒ ගැන විමතියකින් බලා සිටියේය. ජාතියේ ගෞරවය පතා ජීවිත හෝ පූජා කිරීමට අපි මැලිනොවන බව ආණ්ඩුව දැන සිටියේය. එහෙයින් මේ ගමන වැළැක්වීමට ඔවුන් ගතහැකි සෑම පියවරක්ම ගත්හ. අපේ උත්සාහය වූයේ

හැකි උපරිම ලෙස කොටි සහ ආණ්ඩුව හෙළිදරව් කිරීමය. මම අපේ හමුදාවල හිතවතුනගෙන් උදව් ඉල්ලා සිටියෙමි. සිවිල් ඇඳුමින් සැරසුණු ඔවුන් ද පෙළපාළියට එක්විය. තඹලගමුවේදී කොටි ආධාරකරුවෝ අපට ප්‍රහාරයක් එල්ල කළහ. අපේ පිරිස් ද ඔවුනට සෘජු ප්‍රතිචාර දැක්වූහ. අපේ පිරිස්වල තිබූ ලොකුම දුර්වලතාවයක් වූයේ පොඩ්ඩක් ප්‍රකෝප කරවූ විට ප්‍රකෝපයෙන්ම පිළිතුරු සැපයීමයි. අපව මර්දනය කිරීමට ඉටා සිටිනා බලවේග බොහෝ විට මේ නොඉවසීමේ ගුණය අපට එරෙහිව යොදා ගත්හ. කෙසේ හෝ පෙළපාළිය විධිමත්කරගෙන පාරට ගන්නට අපට හැකිවිය. යළිත් එවැනි සිදුවීමකින් සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමට අපි අපේ විශේෂ ආරක්ෂක පිරිසක් යොදවා පෙළපාළිය පරීක්ෂා කර අමුත්තන් තිදෙනකු අල්ලා ගත්තෙමු! ඔවුන් තිදෙනාම කොටි නොව අපේ තොරතුරු සෙවීමට පෙළපාළියට ආණ්ඩුවේ ඔත්තු සේවා එවනු ලැබූ පිරිසකි! පසු කලෙක හමුදාවේ බුද්ධි අංශ නිලධාරියෙකු මා හට කීවේ, තඹලගමුවේදී අපට ප්‍රහාරය සංවිධානය කෙරුණේ කන්තලයෙන් අප පිටත් වන විට ජනමාධ්‍ය හා එහි රැස්ව සිටි පිරිස අමතා මා කළ කතාව එහි සිටි මාධ්‍යවේදියෙකු ජංගම දුරකතනය මගින් ප්‍රාදේශීය කොටි නායකයෙකුට අසන්නට සැලැස්වීමෙන් පසු බවය! ඒ මාධ්‍ය නිදහස ත්‍රස්තවාදය සඳහා යොදාගත් ආකාරයයි!

සූරංකල් හන්දියේදී අපට අනපේක්ෂිත ක්‍රියාදාමයකට මුහුණ දෙන්නට සිදුවිය. හතර අතින් වෙල්යාය මැදින් අපේ පෙළපාළිය මෙන් කීප ගුණයක ජනයා පෙළපාළිය දෙසට එක්වන්නට දිවගෙන ආහ. අපි මුලින් සිතුවේ ඔවුන් අපට පහරදීමට එන පිරිසක් ලෙසය. නමුත් ඔවුන් කොටින්ගෙන් බැටකා සිටි මුස්ලිම් ජනයා බව වැඩිවෙලා නොගොස් අපට තේරුම් ගියේය. ඔවුන් පැමිණීමත් සමග පෙළපාළිය අපට පාලනය කරගත නොහැකි තත්ත්වයකට පත්විය. ආවේග පුපුරායෑමට තරම් වේගවත් වී තිබිණි. හමුදාව සිය මුළුවැර යොදා අපව නතර කළේය. සත්‍යග්‍රහයකින් පසු බැරිකේඩයක් උඩට නැගගත් මම උස් හඬින් ජනතාව අමතා කොටින් හා කොටි රකිනා නිවට ආණ්ඩුවට එරෙහිව නැගී සිටිනා ලෙස ඉල්ලා සිටියෙමි.

"අවි තොපේය බිම අපේය" ලෙස වූ අපේ අවිහිංසා විරෝධය රටේ මාධ්‍ය වෙතින් මුළු සමාජයටම ගලා ගියේය. අපි බලාපොරොත්තු වූ ලෙසම ආණ්ඩුව නින්දාවටත්, අවමානයටත්, ලක්වූ අතර, විපක්ෂයේ ක්‍රියාදාමයන් තවත් උත්සන්න අතට හැරිණි.

උද්ඝෝෂණයෙන් පසු මනිරාසකුලම් ප්‍රදේශයේ මුස්ලිම් වැසියන් කීපදෙනෙකු ඝාතනය කෙරිණි. අසරණවූවනට සහන ද රැගෙන මම එහි ගියෙමි. ගිනි ගහන අව්වේ රටකජු වවමින් අතිශය දුෂ්කර ජීවිත ගෙවනා මුස්ලිම් ජනයා හමුවුනෙමි. මියගියවුන්ගේ බිරිඳ නෑසියන් හමුවීමට තල් වැටකට යටින් මා රිංගා යන ඡායාරූපයක් මාධ්‍යවල පලකර තිබිණි. ඔවුනගේ ගමේ පල්ලියේ දී මම ඔවුනගේ පිරිමි වැඩිහිටියන් හමුවුනෙමි. බොහෝ දෙනෙක් කීවේ මුස්ලිම් කොංන්ග්‍රසය ඔවුනගෙන් ඡන්දය ගත්තමුත් මේ පැත්ත පළාතක නොඅාබවය. අම්පාරේ දීඝවාපී ඉඩම්වලින් මා වන සංරක්ෂණ ඇමැති ලෙස මුස්ලිම්වරුන් පලවා හැරියේ යැයි අසත්‍ය චෝදනාවක් කර ආණ්ඩුවෙන් ඉවත් වූ මුස්ලිම් කොංග්‍රස් නායකයින් (2007) එදා මනිරාසකුලමට ගියේ නැත. බටහිර තානාපති කාර්යාලවලින් මුදල්ගෙන මුස්ලිම් උරුමය ගැන කතා කරනා මාලිගාවත්තේ මුස්ලිම් අන්තවාදීන් අපට එරෙහිව පෙළපාළි ගිය ද (2008) එදා වචනයක්වත් කොටින්ට එරෙහිව කතාකරන්නට බිය වූහ. රවුෆ් හකීම්, ප්‍රභාකරන් සමග අත්සන් කළ ගිවිසුම (2002 අප්‍රියෙල් 13) තදින් විවේචනය කළ මම මුස්ලිම්වරු නිවට නොවී නැඟී සිටිය යුතු බව නැවත අවධාරණය කළෙමි.

ඒ අවස්ථාවේදී මා අසලට ආ මුස්ලිම් තරුණයන් කොටින්ට එරෙහිව සටන් කරන්නට තමන් කැමති බව කී අතර, දුරකතන අංකයක් ලබාදුන්නේය. ඒ වනවිට කොටින්ට එරෙහිව නිවට ආණ්ඩුවේ නියෝග නොතකා ක්‍රියා කරනා ආරක්ෂක අංශ පිරිසක් වෙත ඔවුන් සම්බන්ධ කර දුනිමි. පසුව මූතූර්වල ඇති වූ සටන්වලදී කොටි ත්‍රස්තවාදීන් (2006) මේ දේශප්‍රේමී මුස්ලිම්වරුන්ව සොයා විනාශ කළ බව පසුව මට අපේ හමුදා නිලධාරියෙක් ප්‍රකාශ කළේය. මුතූර්වලදී ඝාතනය වූ ප්‍රංශ සහන සේවාවේ දෙමළ 17 දෙනාගේ ජීවිත ගැන තරම්වත් අඩුතරමින් මුස්ලිම් කොංග්‍රසය හෝ මරා දැමුණු මුස්ලිම්වරු 116 දෙනා ගැන කතා නොකිරීම ඇත්තෙන්ම රටේ ඛේදවාචකයකි.

මෙයට අමතරව නුවර එළියේ ඇති වූ ජාතිවාදී ගැටුමේදී ද, කොළඹ පැවැත්වූ පොංගුතමිල් උළෙලේදී ඇති වූ සිදුවීම් නිසාද අපි තව තවත් සිංහල සමාජය තුළ ස්ථාපිත වීමු.

බණ්ඩාරවෙල කොටි සැකකරුවන්ගේ කඳවුරක් හා අවට ගම්වාසීන් අතර, ඇති වූ ගැටුමක් පාදක කරගෙන චන්ද්‍රසේකරන් මහතා තලවාකැලේ ප්‍රදේශයේ සිංහලයින්ට පහරදෙන ලදි. විශේෂයෙන් යූ.එන්.පීයේ ප්‍රාදේශීය නායකයින් වූ හේමචන්ද්‍ර ආයතනයට පවා පහරදුන්න ද ප්‍රදේශයේ මන්ත්‍රී

එස්.බී. හෝ ආණ්ඩුව චන්ද්‍රසේකරන්ට නීතිය ක්‍රියාත්මක කළේ නැත. තලවාකැලේ පංසලේ අනාථව සිටි සිංහලයින් බලාකියා ගනිමින් ඔවුනගේ දුක කොළඹ වීදිවලට ගෙනාවේ අප ය.

උතුරු හා නැගෙනහිර කොටි පාලනයේ සිටියේ තුන් ලක්ෂයක් පමණ ජනකායකි. නමුත් එමෙන් සතර ගුණයකට ආසන්න පිරිසක් උතුරු හා නැගෙනහිර රජයේ පාලන ප්‍රදේශවල දෙමළ ජනයා වාසය කළහ. අගමැති රනිල් කළ භයානකම වරද වූයේ මේ ජනකාය පොංගු තමිල් හරහා හා පසුව ඍජු කොටි පාලනය යටතේ කොටින්ට පාවාදීමයි. මෙය පසුව සිදුවූ ඡන්ද වර්ජනයේදී (2005) රනිල්ටම පාරාවළල්ලක් විය. පොංගු තමිල් උතුරින් නැගෙනහිරින් නතර නොවී නුවරඑළියටත් එතැනින් කොළඹටත්, ආවේය. කොටින්ගේ දකුණේ නියෝජිතයෝ එහි සංවිධායකයෝ වූහ. එය පැවැත්වූයේ කලා උළෙලක මුවාවෙනි. එහිදී කවීකයෙකුගෙන් ප්‍රශ්නයක් ඇසීමට ගිය අපේ සාමාජිකයෙකු හට සංවිධායකයෝ පහරදුන්හ. පසුව එය ගැටුමක් විය. තුවාල වූ අපේ පිරිස් බලන්නට රෝහලට ගිය නිශාන්ත ශ්‍රී වර්ණසිංහ, රොෂාන් ගුණතිලක වැනි අයත්, තුවාල ලැබූ සෙසු අයවත්, අත්අඩංගුවට ගැණිනි. රටේ පොලීසිය නඩේසන්ගේ පොලීසිය බවට පත්වී ඇති බව පෙණිනි. පසුදා අපි පොලීසියට එරෙහිව දැවැන්ත විරෝධතාවයක් දැක්වීමු. පොලීසියේ සිටි තමාගේ ආදි ආනන්දීය මිතුරන් පවා තමන්ව පාවාදුන් බව තිලක් කරුණාරත්න මහතා පසුව මා හට ප්‍රකාශ කළේය. පසුව මගෙන් ප්‍රශ්න කිරීමට පැමිණි විශේෂ විමර්ෂණයේ නිලධාරීයාට මා කීවේ මුලින් ඔහුගේ මස්සිනා බොරැල්ලේ පවත්වාගෙන යන කොටින්ගේ ඡායාරූපාගාරය පරීක්ෂා කරන ලෙසය. ඔහු නැවත මගෙන් ප්‍රශ්න කිරීමට පැමිණියේ නැත. පොලීසියේ ඉහළ තනතුරුවල සිටියේ එවැන්නන්ය.

මේ ලෙස සිහළ උරුමය නැවත සිය අහිමි කළ බිම දිනාගත්තේය. කොටින්ගේ ශීඝ්‍ර ඉදිරි ගමන වළක්වාලීමට නම් ඉක්මණින් රාජ්‍ය යන්ත්‍රය ඔවුනට එරෙහිව යොදාගත යුතු බව අපට වැටහිණි. ඒ සඳහා පූර්ව කොන්දේසිය වූයේ හමුදාව හා පොලීසියට අණදෙන අගමැති රනිල් හා ඇමැති මාරපන ඉවත්කරලීමය.

මේ අතර, සමාජයේ තවත් ක්‍රියාවලියක් ආරම්භ වී තිබිණි. එයනම් විවෘත ලෙසම එවැන්ජලික පල්ලිය විසින්, සිදුකරනා ලද ජනතාව බලයෙන් කිතුණුවන් කිරීමේ ව්‍යාපෘතියයි.

මේ පිළිබඳව පනතක් පාර්ලිමේන්තුවට ගෙනඒම සඳහා ටී. මහේෂ්වරන් හින්දු කටයුතු ඇමැතිවරයා ක්‍රියාකළ අතර, ඔහු හමු වූ අපි එයට අපේ සහයෝගය පළ කළෙමු. මහේෂ්වරන් එතැන් පටන් අපේ මිතුරෙකු විය. හින්දු-බෞද්ධ සමගිය සඳහා හින්දු නායකයින් සමග ඔහු සාකච්ඡාවක් ද සංවිධානය කළේය. ඔහු කීවේ යුද්ධයට මුවා වී වන්නියේත්, යාපනයේත්, මඩකළපුවේත් පුදුමාකාර ලෙස ජනයා ක්‍රිස්තියානියට ගන්නා බවය. පසුව කොටි කඳවුරුවලින් ඔප්පු වූයේ ද මේ සත්‍යයයි. 2003 දී මා මඩකළපුවට ගියකළ එහි හින්දු නායකයින් කීවේ ද 1983-2003 මඩකළපුවේ අලුතින් ඉදිවූයේ පල්ලි පමණක් කියාය. පල්ලියට ව්‍යාප්ත වීමට ඉඩ දී බටහිර හොඳහිත දිනාගැනීමේ ප්‍රභාකරන්ගේ උපාය හින්දු සමාජය දියකරහැර තිබිණි. මුලින් වතුකරයෙන් ඇරඹුණු මේ ව්‍යාපාරය ඉක්මණින්ම දුෂ්කර ගම්මානවලටත්, කොළඹටත් ව්‍යාප්ත විය. කොළඹ සිඟන්නන්, සිරගෙදර සිරකරුවන්, මාවතේ ගණිකාවන් ආදීන් ගිලගෙන මොන්ටිසෝරි ළඳරුවන්, ප්‍රකට ගායක ගායිකාවන්, නළු නිළියන් ව්‍යාපාරිකයන්, ක්‍රීඩකයන් හා දේශපාලකයින් දක්වා එය ව්‍යාප්ත විය.

වරක් කඩුවෙල එවැනි පල්ලියක් විසින් ගිලගත් නිවසකට මා ගියවිට එහි සිටි මිත්තණිය කීවේ ගල්වැඩපළේ වැඩ නැතිව ඇති නිසා සිය සැමියා අහිමි දියණියට කෑමට යමක් ලැබුණේ පාස්ටර්තුමාලාගෙන් බවය. ඒ හැර තමන් බුදු දහම අතහැර නැති බව ඇය කීවාය. නමුත් ඇයගේ දියණියගේ, කුඩා දරුවාගෙන් ලොකු වුණාම පුතා කවුරු වෙන්නද ඉන්නේ කියා ඇසූ විට දෙවියන්ට සේවය කිරීමට කැපවෙන බව සුරතල් මුවින් පිටවිණි. ලොකුවුන්ට පාස්ටර්ගේ එවැන්ජලික තෑගි බඩගින්නට ගොදුරු වුවත්, කුඩාවුන්ගේ ආත්මයම ඔවුනට ගොදුරු වී තිබිණි.

මේ අසාධාරණයට එරෙහිව සටන්කළ යුතු බව මම අවධාරණය කරගත්තෙමි. ලතින් ඇමැරිකාවේ හා කොරියාවේ ඔවුන් ලබාගත් සාර්ථකත්වය දකුණු ආසියාවේදී ලබානොදිය යුතුය යන අදිටන ඉන්දියාවේ හා ලංකාවේ හින්දු-බෞද්ධ සියලුදෙනා තුළ ඇතිකළ යුතු බව ඉටා ගතිමි.

මේ අතර, ආණ්ඩුව තවත් මෝඩ වැඩක් කළේය. එයනම් දෙසැම්බරයේ දී පුරා මාසයක් නගර ආලෝකකරණයට යොමුකරවීමය. මේ සඳහා කිතුණු ඇමැතිවරයෙකු වූ ජෝන් අමරතුංග පොලීසියට නියෝගයක් දුන්නේය. බොහෝ බෞද්ධ හින්දු-මුස්ලිම් ව්‍යාපාරිකයෝ මේ නත්තල් ආලෝක පූජාවට කැමැති වූයේ නැත. ඔවුන් අපව සොයාගෙන ආවෝය. රජයේ ඇමැතිවරුනට පමණක් නොව රජය පසුපස සිට මෙහෙයවන ලලිත්

කොතලාවල, රෝසි සේනානායක, දුලාංජලී ප්‍රේමදාස වැනි මූලධර්මවාදීන් කෙරේ සමාජයේ මහත් වෛරයක් කැටි ගැසෙනා බව එකී හමුවලින් අපට වැටහිණි.

බෞද්ධ වෘත්තීයවේදීන් විසින්, සංවිධානය කෙරුණු "ජයග්‍රහණය" නම් ව්‍යාපාරයක් ඉතා කැපවීමෙන් මේ "ආගම්කරණය"ට එරෙහිව ක්‍රියාකරමින් සිටිය ද එය දේශපාලනීකරණයක් වී තිබුණේ නැත. මේ වනවිට ජාතික සංඝ සභාව තිබුණේ ද අකර්මන්‍ය තත්ත්වයකය. එය 1999 ජනාධිපතිවරණයේ දී ජාතික සංඝ සභාව යූ.එන්.පීයට ඇදගෙන යෑම නිසා ඇති වූ තත්ත්වයක් බව කලින් කීවෙමි. අලුත් තත්ත්වයට මුහුණදීම සඳහා අලුත් සංඝ සභාවක් අවශ්‍ය විය. එයට යළිත් මූලික වූයේ අතුරලියේ රතන හිමියන්ය. හැඩිගල්ලේ විමලසාර හිමි, මිස්සක කමලසිරි හිමි, ගලගොඩඅත්තේ ඥාණසාර හිමි වැනි තරුණ හිමිවරු එහිදී මූලික වූහ. වැඩිහිටි ප්‍රඥාසම්පන්න හිමිවරුන් ලෙස එල්ලාවල මේධානන්ද නාහිමි, ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි, කොටපොළ අමරකිත්ති හිමි වැනි ප්‍රචලිත හිමිවරුන් එහි නායකත්වයට පත්වූහ. ජාතික සංඝ සම්මේලනය බිහිවිය. තැන තැන පල්ලි කල්ලිවලට එරෙහිව අවධිවෙමින් තිබූ බෞද්ධ නැගිටීම මනා සංවිධානාත්මක නැගිටීමක් විය. ජාතික සංඝ සම්මේලනය මගින් රටවටා පවත්වනු ලැබූ, "බොදු සමුළු" පුදුමාකාර ලෙස සාර්ථක විය. මොනතරම් පීඩනයක් බෞද්ධයින් තුළ පැසවමින් තිබෙනවාද යන්න එකී මහා ජනගඟින් හෙළි විය. අනෙක් අතින් ඍජු දේශපාලන වාගාලාපවලට වඩා ධාර්මික නිවුණ ආයාචනාවලට අතිවිශාල ජනකායක් පිබිඳවිය හැකි බව පැහැදිලි විය. එය පැහැදිලිවම මෙතෙක් කිසිවෙක් අත්හදා නොබලා තිබූ නව දේශපාලනික ආගමික ප්‍රවේශයක් විය. එහි ඇති දැවැන්ත අවිහිංසාවාදී විභවය දුටු අපි එයට උපරිම සහාය දෙමින් එය වැඩී යන්නට ඇති බාධා ඉවත් කරමින් කළ හැකි උපරිම දේ ඉටුකර දුනිමු.

සිංහල බෞද්ධ සමාජයේ එක් ගුණාංගයක් වන්නේ විටින් විට කැපී පෙනෙනා බෞද්ධ භික්ෂූන් බිහිවීමයි. ඇතැම් අය දක්ෂ ධර්ම කථිකයින් විය. ඇතැමුන් බෝධි පූජා ආදී භක්තිය වඩවන සුළු වතාවත් සඳහා පුදුමාකාර ලෙස සමත්කම් දැක්වූහ. ඇතැමුන් ජාතික හා ජාත්‍යන්තර ලෙස පැතිරීගිය දාර්ශනික දැනුම ඇත්තවුන් වූහ. ඇතැම් අය අතිදක්ෂ සංවිධායකයින් හා සමාජ සේවකයින් වූහ.

ඉංග්‍රීසින් යටතේ පාගාදමන සිංහල විමුක්ති අරගලය නැවත මතුවන්නේ මොහොට්ටිවත්තේ ගුණානන්ද, හික්කඩුවේ ශ්‍රී සුමංගල ආදී මෙවැනි ගුණ සහිත ස්වාමින් වහන්සේලා නිසාය. යළිත් විද්‍යාලංකාරය වෙතින් බිහි වූ යක්කඩුවේ හිමි, වැල්ලවත්තේ හිමි හා විශේෂයෙන් වල්පොල රාහුල හිමියන් කැපී පෙනිණි. භික්ෂුවට දේශපාලනය කැප ද අකැප ද යන ප්‍රශ්නය මත විද්‍යාලංකාරය හා ඩී.එස්. සේනානායක ආදී ප්‍රභූවරුන් අතර, ඇති වූ මත ගැටුම කෙළවර වූයේ ඓතිහාසික විද්‍යාලංකාර ප්‍රකාශය මගිනි. එමගින් නූතන භික්ෂුවගේ දේශපාලන සමාජ කාර්යභාරය මැනවින්, ධර්මානුකූලව පැහැදිලි කරගනු ලැබීය. අපේ ඇතැම් ප්‍රභූවරුන්ට අවශ්‍ය වූයේ ලංකාවේ හින්දු කෝවිල්වල වාසය කරනා පූසාරිවරුන්ගේ තත්ත්වයට බෞද්ධ භික්ෂුව ඇද දමා තමන්ගේ සේවකයෙකු කරගැනීමය. ඇතැම් අය නම් දේශපාලන කතා ආදියෙන් භික්ෂුවගේ විනය පිරිහී යනු ඇතැයි සැබෑවටම බියට පත්වූහ. මේ ගැන වරක් දවුල්දෙන ඥානිස්සර මහනායක හිමි සමග කරනා ලද සාකච්ඡාවකදී උන්වහන්සේ පෙන්නා දුන්නේ එකල (40-50 දශකය) කාන්තාවන් ක්‍රීඩා උත්සව ආදියට සහභාගි වීම පිළිබඳව ද භික්ෂූන් වහන්සේ රජයේ විද්‍යාලයේ ගුරුවරුන් ලෙස සේවය කිරීම ගැන ද, භික්ෂූන් වහන්සේලා සෙසු සිසු සිසුවියන් සමග විශ්ව විද්‍යාලයේ එකට අධ්‍යාපනය කිරීම ගැන ද මහත් සංවාදයක් තිබුණු බවය. "දැන් ඔය හාමුදුරුවන්ට මන්ත්‍රීලා වීම අකැපයි කියනවා වගේ තමා ඒ කාලේ ගෑනු ළමයි ක්‍රීඩා කළ යුතු නැහැ, පාසල් යැවිය යුතු නැහැ කියලත් ඇතැම්හු කීවේ" යැයි දේශනා කළ උන්වහන්සේ බාලිකාවන් ක්‍රීඩාවල නිරත විය යුතු නැතැයි කියමින් චිරප්‍රසිද්ධ දේශපාලන නායකයෙක් ඒ දිනවල පුවත්පතකට ලියූ ලිපියක පිටපතක් මා අතට පත්කළ සේක.

1940 ගණන්වල සමාජවාදී ව්‍යාපාරයේ නැගීමට භික්ෂූන් වහන්සේගේ දායකත්වය ලැබුණා සේම 1950 ගණන්වල සිංහල ජාතික බලවේගයේ නැගිමට ද උන්වහන්සේලා දායක විය. බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හිමි, මඩිහේ පඤ්ඤාසීහ හිමි, හේනේපිටගෙදර ඥානසීහ හිමි වැනි අය එහිදී කැපී පෙනුණහ. නිදහස් අධ්‍යාපනය නිදහස් සෞඛ්‍යය, ස්වභාෂා අධ්‍යාපනය ආදීය බෞද්ධ භික්ෂුව නිසා ඇති වූ ක්‍රියාදාමයන්ය. අද අඩුතරමින් කිසිම කොමියුනිස්ට් රටක හෝ මෙවැනි සමාජ සේවාවන් රජය පවත්වාගෙන යන්නේ නැත."අපේ මග" නමින් 1989 දී මා ලියනා ලද කෘතියෙන් භික්ෂුවගේ මේ ඓතිහාසික කාර්යය ඇගයීමට ලක්කළෙමි. කුඩාකල මට මතක ජනප්‍රියම හිමිනම වූයේ පානදුරේ අරියධම්ම හිමියන්ය. උන්වහන්සේගේ මත් විරෝධී

වැඩපිළිවෙළ හා කවියෙන් පැවසූ බුදුගුණ අති දැවැන්ත බෞද්ධ ප්‍රබෝධයක් ඇති කළේය. උන්වහන්සේ අකාලයේ අපවත් කළේය යන බොහෝ බෞද්ධයින් අතර, අද දක්වා තිබෙනා මතය කොළඹ විජේරාමයේ සම්බෝධි විහාරස්ථානයට යන එන්නට පටන්ගැනීමෙන් පසු ස්ථිරව දැනගත්තෙමි. කලක් ජාතික සංඝ සභාවේ ලේඛකාධිකාරී වූයේ දරණාගම කුසලධම්ම හිමියන් වීම එහි යෑමට ඒමට මූලිකම හේතුව විය. හිටපු අගවිනිසුරු සරත් සිල්වා මහතා නිසා වඩාත් ආලෝකමත් වූ සම්බෝධිය ගංගාරාමයට කොළඹ ප්‍රභූ පන්තිය අතර තිබූ ස්ථානයට අභියෝගයක් ද එල්ල කළේය.

වත්මන් කාලය සලකාබලත් දී කැපී පෙනෙනා ජනප්‍රිය භික්ෂු චරිත ගණනාවක් එකවිටම පාහේ මතුවිය. එයින්, වඩාත්ම මතු වී ආවේ මහරගම ධර්මායතනයෙන් මතු වූ ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේය. ධර්මායතනය වජිරඥාන නාහිමි, මඩිහේ නාහිමි මෙන්ම කොළඹ බෞද්ධ දානපතින්ගේ මූලිකම සංවිධානාත්මක ආයතනයක් විය. එය මගින් රටපුරා විහාරස්ථාන සේම සමාජ ව්‍යාපාර ගණනාවක් පවත්වාගෙන යන ලදී. විදේශ රටවල් බොහෝමයක ද එහි ශාඛා පැවැතුණු අතර, ඒ අතින් වඩාත්ම සංවිධානාත්මක බෞද්ධ ආයතනය විය. මා මුල්වරට එහි ගියේ 1988 දී විය යුතුය. ධර්මායතනයට ලලිත් ඇතුළත්මුදලි මහතා උත්සවයකට පැමිණි සිටි අතර, ඔහුගේ අරමුණ වූයේ එහි සිටි ජාතිකවාදී භික්ෂූන් වහන්සේලාව පළාත් සභා ක්‍රමය ගැන අවබෝධයක් දීමය. එයට හදිසියේ පැමිණි අතුරලියේ රතන හිමි ප්‍රමුඛ විශ්ව විද්‍යාල භික්ෂූන් වහන්සේලා පිරිසක් ඇතුළත්මුදලි මහතාගෙන්, ප්‍රශ්න කිරීමට යෑමෙන් මහත් විවාදයක් ඇතිවිය. මෙයට කලින් 1985 දී පුද්ගලික විශ්ව විද්‍යාල රටට හිතකරය යන මාතෘකාව ඔස්සේ විශ්ව විද්‍යාල සිසුන් සමග ප්‍රසිද්ධ වාදයකට පිවිසෙන බව ප්‍රකාශ කර මගහැර ගිය නිසා ඇතුළත්මුදලි මහතා සමග අපි කාටත්, යම් ගැටීමක් විය. උතුරට ගොස් වෙඩි කන්නටත්, දකුණේදී බල්ලන් වෙන්නටත්, පොලීසියට බැරි බව පද්මසිරි අබේසේකර සාතනයේ දී ජාතික ආරක්ෂක ඇමැති ලෙස ඔහු කළ ප්‍රකාශයෙන් (1984) ඔහු "මහපොළ" ශිෂ්‍යත්වයෙන් ඇතිකරගෙන තිබූ ප්‍රතිරූපය ඔහුම බිඳ ගත්තේය. කෙසේ වෙතත් ධර්මායතනයේ සිටින්නේ ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා පමණක් නොව ජාතිකවාදී ශාසනලැදි ක්‍රියාකාරීන් පිරිසක් බව ද ඒ සිදුවීමෙන් තේරුම් ගතිමි. මේ නිසා සෝම හිමියන් ඒ අඛණ්ඩ ඉතිහාසයේ අවශ්‍යම පුනරාගමනයක් විය. සෝම හිමියන්ගේ ධර්ම දේශනා ජනප්‍රිය වූයේ උන්වහන්සේ කාලීන මාතෘකා ගත් නිසාත්, නිතරම එකී මාතෘකා ධර්ම ගාථාවලට සම්බන්ධ කරලීමත් නිසාය. මා

පසුව තේරුම් ගත්තේ ධර්මායතනයේ කීර්තිමත් දාර්ශනිකයා වූ වැලිගම ඥානරතන නාහිමියන් මේ ධර්ම දේශනා සම්ප්‍රදායේ ප්‍රමුඛයා බවය. ඥානරතන හිමියන් කිසිම විටෙක සිය මතවාද බලයට, ධනයට වෙනස්කර ගත්තේ නැත. 2002-2004 කාලයේ යූ.එන්.පීයට බර ජාතික මතයේ ප්‍රභූවරුන්ගෙන් දැඩි බලපෑමක් එල්ල වූ නමුත් නොසෙල්වුණු මහතෙර නම වූයේ මල්ලිකාරාමයේ වැඩසිටි වැලිගම හාමුදුරුවෝය.

සෝම හිමියන් විසින්, රූපවාහිනියෙන් හඳුන්වාදුන් බණ කලාව ඉතා ඉක්මණින් ජනප්‍රිය විය. ඒ දිනවල මට මතක හැටියට ජයන්ත චන්ද්‍රසිරිගේ "දඬුබස්නාමානය" නම් ටෙලි නාට්‍යය බැලීමට සෙනග රූපවාහිනී තිරය මතට රොක්වූවා සේ මාධ්‍යමික ජනතාව සෝම හිමිගේ බණ ඇසීමට රොක් වූහ. මෙහිදී චන්ද්‍රිකා මාරක වරදක් කර ගත්තේය. එනම් ස්වාධීන රූපවාහිනියෙන් කළ උන්වහන්සේගේ ධර්ම දේශනා නතර කිරීමය. එය ඇතැම් විට දේශපාලනිකව සුළු සිදුවීමක් වුවත් මා සිතන්නේ ශ්‍රී.ල.නි.පයේ මධ්‍යමික සිංහල ඡන්ද පදනමට එය තදින් දැනුණු බවය. එමෙන්ම එය අෂ්රෆ් මහතාගේ ද අදූරදර්ශී බලපෑමක් විය. මුස්ලිම් මූලධර්මවාදී දේශපාලනය දෙස සැකමුසුව බලන්නට සිංහලයා යොමුවූයේ අෂ්රෆ් මහතා සෝම හිමිට එරෙහිව සිදුකළ මේ මැදිහත්වීම නිසාය. දීඝවාපිය පිළිබඳ ප්‍රශ්නය කරලියට ආවේත් ඒ සමගය. වරක් සෝම හිමියන් සමග කළ පෞද්ගලික සාකච්ඡාවක දී ලංකාවේ මුස්ලිම් ජනගහණයේ වර්ධනය ගැන ද සාකච්ඡා විය. එයට නිමිත්ත වූයේ මරදාන, දෙහිවල, කොළොන්නාව ආදී ප්‍රදේශවල බහුතරය බවට මුස්ලිම් ජනතාව පත්වීමත් වැඩි වැඩියෙන් අන්තවාදී දේශපාලනයට මුස්ලිම්වරු නැඹුරුවීමත්ය. වරක් මරදාන ප්‍රදානගර විහාරයට (එය කීර්තිමත් වූයේ ත්‍රිපිටකය එහි පරිවර්තනය කළ නිසාය) ගියකල එහි නායක හිමියන් කීවේ 1988 දී සිංහල දායක පවුල් 1350ක් පමණ සිටි නමුත් දැන් විසිවසකට පසු ඒ ගණන (2008) පවුල් 39කට සීමා වූ ඇති බවත්ය. මුස්ලිම් ජනගහණය ශීඝ්‍රයෙන් වර්ධනය වීමත්, ඔවුන් සංවිධානාත්මකව ඇතැම් නගරවල ඉඩම් මිල දී ගැනීම සිදුකිරීමත් මේ වනවිට කැපී පෙණින. මා සෝම හිමියන්ට එදා කීවේ වත්මන් ජනගහණ වර්ධන වේගයෙන් ඒ ලෙසම තිබුණොත් 2090 පමණ වනවිට ශ්‍රී ලංකාවේ බහුතරය බවට මුස්ලිම් ජනතාව පත්වනු ඇති බවය. වරක් රුසියානු රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ද කීවේ රුසියාවේ ද බහුතරය බවට මේ සියවස අවසන් වීමට පෙර මුස්ලිම්වරුන් පත්වීමේ තත්ත්වයක් ඇති බවය. ලංකාවේ බෞද්ධ ගීත බොහොමයක් කීවේ මොහිදින් බෙග්ය. සිංහල බෞද්ධ බහුතරයක් ජීවත්වූ බලන්ගොඩ (අබුසාලි), බොරැල්ල (මොහොමඩ්),

බේරුවල (බාකිර්මාකර්) ආදී ආසනවල මුස්ලිම්වරු මන්ත්‍රීවරුන් වූහ. අප තුළ පවා 1980 ගණන්වල පමණක් නොව 90 ගණන්වලත්, මුස්ලිම්වරු සිය අනන්‍යතාවය පවත්වා ගැනීම සඳහා බටහිර ලෝකය සමග කරනා අරගලය ගැන ගෞරවයක් විය. ඒ පිළිබඳ මගේ ගෞරවය සැකයක් බවට පත්වීමට පුංචි පුංචි සිදුවීම් කීපයක් ඉවහල් විය. පළමුවෙන්ම 1988 දී අෂ්රෆ් මහතා සිංහල දෙමළ ගැටුම උත්සන්න වීම තමන්ගේ වාසියට හේතුවන බවත්, අනාගත ජයග්‍රාහකයා තීරණය කරන්නේ මුස්ලිම්වරු බවත් මා හට කළ ප්‍රකාශය මූලික විය. කොළඹ සිංහල මිනිසුන් මුස්ලිම් ව්‍යාප්තිය ගැන බිය වනවා සේම නැගෙනහිර දෙමළ මිනිසුන් ද බියට පත්වී ඇති බව මඩකළපු විශ්ව විද්‍යාලයේ ආචාර්යවරු කීප දෙනෙකු ඒ දිනවල මට පැවසූහ. දෙවනුව වරක් මා විවෘත විශ්ව විද්‍යාලයේ ගණිත පාඩම උගන්වමින් සිටිය දී මුස්ලිම් සිසුන් පිරිසක් මට ලිපියක් භාර දුන්හ. එහි තිබුණේ අපේ පන්තියේ මුස්ලිම් සිසුවියක් මුස්ලිම් නොවන සිසුවෙකු හා පෙම්බැඳ ඇති නිසා ඇයව පන්තියෙන් නෙරපන ලෙසය. එය මගේ කෝපයට හේතු විය. අපි විශ්ව විද්‍යාලයේ සිටිනා කාලයේ අපේ ළඟම සගයින් වූයේ අමීර්, රමේෂ් වැනි මුස්ලිම් සිසුන්ය. ඔවුන් අතර, කවදාවත් මෙවැනි මත නොවිනි. අන්තිමේදී එක් සිසුවෙකු වෙතින් ඔවුන්ගේ ගුරු යැයි කියාගත්, දෙහිවල පැත්තේ ආගමික ගුරුවරයෙකු ගෙන්වාගෙන සාකච්ඡා කළෙමි. ඔහුට අනුව දෙවියන් විශ්වාස නොකරන අපි සියලුදෙනා කපීර්ලා හෙවත් පව්කාරයන්ය. පිළිම වන්දනාව කරන බෞද්ධයින් වැනි අය විනාශ විය යුතුය. මේ කතාවෙන් මගේ කුහුල ඇවිස්සුනා පමණක් නොව කුරානය කියවන්නටත් මහම්මත්තුමා පිළිබඳ කියවන්නටත් පෙළඹුණෙමි. පසුව මා විසින්, ලියනා ලද "අල් ජිහාද් අල්කයිදා" නම් විස්තරාත්මක ඉස්ලාම් මූලධර්මවාදයේ දේශීය හා විදේශීය නැඟීම විස්තර කරන ලද මුල්ම විස්තරාත්මක සිංහල කෘතියට පාදක වූයේ එදා සටහන් කරගත් විස්තරයන්ය. තුන්වෙනුව වරක් මුස්ලිම් කොංග්‍රසයේ ප්‍රබල නායකයෙක් ප්‍රකාශ කර තිබුණේ සිංහලයින් නගරවල දුර්වල කිරීම සඳහා සිංහල කතුන් විවාහ කරගැනීමත්, සිංහල පිරිමින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම සිදුකිරීමත්, තමන් චේතනාන්විතව සිදුකරනා බවය.මේ සියල්ලෙන් මට පෙනී ගියේ තලිබාන් වර්ගයේ අන්තවාදයක් මුස්ලිම් කොංග්‍රසය, මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ ආදී පක්ෂ පසුපස තිබෙනා බවය. 1947 දී මුස්ලිම්වරු වෙනම රාජ්‍ය යෝජනාවලට කැටිනොගැසී සිංහලයින් හා එක්වී පෙරට යන්නට තීරණය කළ ද ඒ සමාජ සහජීවනය දැන් බිඳ වැටී ඇති බවය. සෝම හිමියන් හා වීරවිදහන කළ එක් ඓතිහාසික කාර්යභාරයක් වූයේ මුස්ලිම් මූලධර්මවාදී දේශපාලනය ඡන්ද කුට්ටි දේශපාලනයක් වීමේ ප්‍රතිවිපාකය පෙන්නා දීමය.

සෝම හාමුදුරුවෝ 2002 දී සිහළ උරුමය විසින්, කොළඹ නව නගර ශාලාවට කැඳවන ලද රනිල් - ප්‍රභා ගිවිසුමට එරෙහි "බොදු සමුළුව"ට වැඩම කළහ. ඉතා හොඳ දේශනාවක් කළහ. පසුව වරක් මා තනියෙන් ද, වරක් කොටකදෙණිය මහතා සමග ද ගොස් උන්වහන්සේ හමුවීමි. වජිරාරාමයේ දී සිදු වූ දෙවන හමුවේදී උන්වහන්සේ විවෘතවම සිය දේශපාලන අභිලාෂය අපට ප්‍රකාශ කළහ. රනිල්ගේ බෞද්ධ විරෝධී ආණ්ඩුවේ දේශපාලනය උතුරු හා නැගෙනහිරට පමණක් නොව ධර්මායතනයට ද වැටී ඇති බව උන්වහන්සේ පෙන්නා දුන්හ. ඇතැම් ගිහි පිරිස් උන්වහන්සේව ධර්මායතනයෙන් නෙරපීමට උත්සාහ දැරූ බව වාර්තා විය. 2006 ජනාධිපතිවරණය සඳහා සංවිධානත්මක වැඩ පිළිවෙළක් යොදාගත යුතු බවට අපි කතිකා කරගතිමු.

කොළොන්නාවේ සුමංගල හිමියන් මට මුලින්ම හමුවුණේ 1995 දීය. ඒ මාතර රතන හිමියන්ගේ විහාරස්ථානයේය. උන්වහන්සේ එකල සිටියේ මිරිස්සේ විහාරස්ථානයකය. චන්ද්‍රිකාගේ ෆෙඩරල් පැකේජය ගැන මා කළ විවේචනාත්මක සාකච්ඡාවකට ඇහුම්කන්දීම සඳහා උන්වහන්සේ එදා වැඩම කර සිටියහ. පසුව අපි මාතර පොදු සංවිධාන එකතුකර කොටුවේගොඩ රැලියක් පැවැත්වීමු. රැලියේ නිවේදකයා වූයේ සුමංගල හිමියන්ය. උන්වහන්සේ නිවේදකයෙකුට වඩා හොඳ කථිකයෙකු බවත්, කරුණු අනුවේදනීය ලෙස පළකිරීමට ප්‍රදුමාකාර සමත්කමක් තිබුණු බවත්, එදා වටහා ගතිමු. පසුව උන්වහන්සේ කොළඹට සංක්‍රමණය විය. ආරෝහ පරිනාහ දේහ සම්පත්තියත්, භක්තිය වඩවන දේශනා ශෛලියත්, විසින් ඉතා ඉක්මණින්ම උන්වහන්සේ ඉහළට ගමන් කළේය. මා තේරුම්ගත් ආකාරයට උන්වහන්සේට තිබූ වැදගත්ම කුසලතාවය නම් සංවිධාන ශක්තියයි. "බුදුමග" සංවිධානය ඉතා සුළුවෙන් අරඹා දැවැන්ත ව්‍යාපාරයක් බවට පත්වූයේ ඒ නිසාය. ජාතික හෙළ උරුමය බිහි වූ විට එහි සංවිධායකවරයා වූයේත් උන්වහන්සේය. සුමංගල හිමියන්ට ඇප උපකාර කළ බොහෝ දායකයින් යූ.එන්.පීයට දේශපාලනිකව හිතවත් අය වූහ. මේ බව උන්වහන්සේගේ බුදුමග දහම් හමුවලට සහභාගී වීමෙන් මට වඩාත් පසක් විය. නමුත් 2002 දී පැමිණි රනිල්ගේ ආණ්ඩුව බෞද්ධ විරෝධී බව ඉක්මණින්ම අවබෝධ කරගත්තේ සුමංගල හිමියන්ය. "අල් ජිහාද් අල්කයිදා" කෘතිය ලියා එය උන්වහන්සේට පිළිගැන්වීම සඳහා දෙව්රම් විහාරයට ගිය දා (2003) උන්වහන්සේ මෙවැනි අදහසක් ඉදිරිපත් කළහ. "මේ ආණ්ඩුව නම් කොටින්ට රට දෙන්නයි යන්නේ. දකුණෙත් මහ විපරීත බෞද්ධ විරෝධී පිරිසක්නේ දැන් ඇමැතිකම් දරන්නේ.

බෞද්ධ භික්ෂුව පෙරට ඇවිල්ලා පාර්ලිමේන්තු ගිහිල්ලා හරි මේ දෙපක්ෂයේ ඇත්තන්ගෙන් රට බේරාගන්න වෙනවා මහත්තයෝ" ලෙසින් භික්ෂූන් වහන්සේ සෘජුව දේශපාලනයට පිවිසිය යුතු බවට මුල්ම අදහස මා හට එලෙස ඉදිරිපත් කළේ කොළොන්නාවේ හිමියන්ය.

2004 හදිසියේ පාර්ලිමේන්තුව විසුරුවා හැරිය විට භික්ෂුව දේශපාලනයට පිවිස රට යන අත වෙනස්කළ යුතු බවට සෘජුවම අදහස් දැක්වූයේ සුමංගල හිමියන්ය. පාර්ලිමේන්තුවට තේරී පත්වී පක්ෂය ගත් මගට වෙනස් පුද්ගලික අදහසක් මත ක්‍රියාකළ කතළුවේ රතන සීහ හිමියන්, සුමංගල හිමියන්ගේ ලඟ හිතවතෙකු වීය. මේ සිදුවීම උන්වහන්සේ තුළ ප්‍රකම්පනයක් ඇති කළේය. ඊළඟට උන්වහන්සේට පාර්ලිමේන්තුවේදී ශ්‍රී.ල.නි.ප හා ජ.වි.පෙ පිරිස් හිරිහැර කළහ. අපි කළුතර සිට කැලණියට පෙරහැරක් පවත්වා එයට දැඩිව විරෝධය පළකළෙමු. පක්ෂය ඉදිරියට යායුතු ආකාරය ගැන උන්වහන්සේට වෙනම අදහසක් තිබුණු අතර, සෘජුව ඒ අදහස පළකළහ. අප සමග පවා විවාදසම්පන්න අවස්ථා පැන නැගිණි. චන්ද්‍රිකාගේ ආණ්ඩුව අපිට හිරිහැර කරන්නේ ඒවා දරාගත නොහැකිව අපිව දේශපාලනයෙන් ඉවතට ඇද දැමීමට බව අපේ අදහස විය. නමුත් උන්වහන්සේ ඒ සියලු සිදුවීම්වලින් කළකිරුනහ. දේශපාලනයෙන් ඉවත් වූහ. මහත්මා ගුණය පෙන්වමින් හෙළ උරුමයේ කිසිවක්, කිසිවෙක් විවේචනය කළේ නැත. කවර පක්ෂයකට හෝ යළි සම්බන්ධ වූයේ ද නැත. බොහෝ අපහසුවෙන් යළි " බුදුමග" ගොඩනගාගන්නට ද සමත්විය. පසුව 2009 දී උන්වහන්සේ හමු වූ විටක දී අපට ප්‍රකාශ කළේ "බෝසත් කුමරු උගුරේ සිරවූ කටුව ගැනීමට වේදනා නොතකා ක්‍රියා කළාසේ එදා අප කළ ක්‍රියා කළේ ත්‍රස්තවාදය පැරැදවීමේ කාර්යයට විනා අන් කිසිවකට නොවන බව" තමන් වහන්සේ අවබෝධ කරගෙන ඇතිබවය. හෙළ උරුමය නිසා ත්‍රස්තවාදය දුරුවීමට පාර කැපීම ගැන තමන් වහන්සේට අන්තිමේදී සතුටක් දැනී ඇතැයි ද ප්‍රකාශ කෙරිණි. අන්තිමේදී අපි සැවොම වෙන වෙනස් පාරවල විටෙක එක්වෙමින් විටෙක වෙන්වෙමින් එකම අරමුණක් කරා යන පිරිසක් බව අවබෝධ කර ගතිමි.

උඩුවේ ධම්මාලෝක හිමියන් දැන හැඳින ගත්තේ උන්වහන්සේ කැලණිය - විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිටිනා යුගයේදීය. ශිෂ්‍ය සභා සඳහා හැඩිගල්ලේ විමලසාර හිමියන් ඉදිරිපත් වූ විට උන්වහන්සේ එයට ආශීර්වාද කරමින් ඒ සබඳතාවයට මුලපිරුහ. කෝට්ටේ නාග විහාරයෙන් උන්වහන්සේ කොල්ලුපිටිය වාලුකාරාමයට ගියේය. ත්‍රස්ත විරෝධී

ව්‍යාපාරයේ ලන්ඩන් සමුළුවේදී (2000) වේදිකාවේ වැඩමකර සිටියේත්, සිහළ උරුමයට ආශීර්වාද පිණිස විහාරමහා දේවි උද්‍යානයට කැඳවන ලද භික්ෂු මහා සමුළුවෙන් (2000 අගෝස්තු) බුද්ධ වන්දනාව ඉදිරිපත් කළේත් ධම්මාලෝක හිමියන්ය.

වසර 2002න් පසු ධම්මාලෝක හිමියන් වේගයෙන් නාගරික තරුණ පරපුර අතර, ජනප්‍රියවන්නට විය. මතුපිටින් පෙනුණේ උන්වහන්සේගේ ආකර්ෂණීය පෙනුම එයට දායක වූ බවය. නමුත් මගේ හැඟීමේ හැටියට මිනිස් ඇසුරට උන්වහන්සේ සතුව තිබූ කුසලතාවය වඩාත්ම කැපී පෙනෙනා ගුණය බවය. දේශපාලනයට පිවිසි ඉහළ භික්ෂූන් වහන්සේලා සයනම අතුරින් මිනිස් සබඳතා හොඳින්ම වර්ධනය කර ගත්තේ උන්වහන්සේ විසිනි.

2003 වසර අවසානයේ දී වරක් උන්වහස්නේ කීවේ තමන්ගේ රූපවාහිනී බණ වැඩසටහන් නතර කිරීමට ඇතැම් අබෞද්ධ ව්‍යාපාරිකයන් උත්සාහ කරනා බවය. ඇතැමුන් ඒ දිනවල සැක පහළ කළේ ධම්මාලෝක හිමියන් යූ.එන්.පීය විසින් සූක්ෂම ලෙස ගොඩනගනා බවය. ඒ සම්ප්‍රදායිකව යූඑන්පීයට රැහැනිව භික්ෂු බලවේගයක් ගොඩනැඟීම සිදුවන නිසා එයට විකල්පයක් ලෙස බවත් පැහැදිලි කෙරිණි. මෙයට හේතුව උන්වහන්සේගේ දායකයින් යූඑන්පීයට හිතවත්වීම විය යුතුය. මෙහිදී එකක් කිව යුතුය. සාමාන්‍යයෙන් වාමාංශිකයන් කෙලින්ම භික්ෂු දේශපාලනය හා ගැටීමට යති. සමසමාජ කොමියුනිස්ට් පමණක් නොව ජවිපෙ පවා තමන්ගේ භික්ෂු සංවිධාන තනාගෙන මෙය සිදුකළහ. චන්ද්‍රිකාගේ ශ්‍රීලනිපය ද ඒ අනුව යමින් ජාතිකවාදී භික්ෂූන් සමග ගැටුනහ. නමුත් යූඑන්පීය අනුගමනය කරන්නේ වඩා උපායශීලී ක්‍රමයකි. ඔවුන් දායක සභාවලට ඇතුළු වී ඒවායේ සක්‍රීය වී එමගින් භික්ෂුවහන්සේලා පාලනය කිරීමට උත්සාහ කරති. ජාතිකවාදී දේශපාලනයට පිවිසීම නිසා තම තමන්ගේ පන්සල්වල භෞතික දියුණුව ඇනහිටුවා ගත් නායක මට්ටමේ භික්ෂූන් වහන්සේලා විශාල ගණනක් ගැන මම දනිමි. ඒ සෑම තැනකම තිබුණේ යූඑන්පී දේශපාලනයයි.

භික්ෂුව දේශපාලනයට පිවිසිය යුතු බවට ඍජු මතයක් ධම්මාලෝක හිමියන්ට ද විය. සෝම හිමිගේ අපවත්වීමේ කාලයේදී ද, 2004 පෙබරවාරි පාර්ලිමේන්තුව විසුරුවාහැරිය විටදී ද උන්වහන්සේ මේ මතය ඍජු ලෙස පළකළහ. ජාතික හෙළ උරුමයේ ප්‍රධාන කාර්යාලය වූයේ උන්වහන්සේගේ 'අසපුව'ය. ඉබේම වාගේ උන්වහන්සේ එහි ප්‍රධාන ප්‍රකාශකයා බවට ද පත්විය. ජ.වි.පෙ උන්වහන්සේගේ චරිතය ඝාතනය කරමින් බිත්තිවල

ලියනාවිට, උපවාස කරනා විට ප්‍රචණ්ඩ බාධාවන් කරනා විට "ජ.වි.පෙ පුතාලා නරක වැඩ කරන්න එපා" ලෙස සිදුකළ දේශනා ජ.වි.පෙට මාරක විය. අපිනම් අතීතයේදී කළේ ජවිපෙට එකට එක කිරීමයි. ධම්මාලෝක හිමියන්ගේ කරුණාවන්ත ප්‍රතිචාරය ජ.වි.පෙට වඩා රිදෙන්නට හේතු වූ බව අපට දැනිණි. උන්වහන්සේගේ සම්පූර්ණ හැසිරීමම නව දේශපාලන අත්දැකීමක් විය.

දේශපාලනයේ අනතුර භාරගන්නට ද ධම්මාලෝක හිමියෝ මැලිනොවූහ. වරක් උන්වහන්සේ චන්ද්‍රිකාට කීවේ පාර්ලිමේන්තු කථානායක පදවිය හෙළ උරුමයට භාර දී පාර්ලිමේන්තුව විනය ගරුක කරනා ලෙසය. වරක් උන්වහන්සේ අපෙන් ස්වාධීන වී පාර්ලිමේන්තුවේ තනිව අසුන් ගත්හ. වරක් කෙළින්ම රනිල් වික්‍රමසිංහට ජනාධිපතිවරණයේ දී උපකාර කිරීමට ඉදිරිපත් වූහ. තවත් වරක් උතුරට ගොස් ප්‍රභාකරන් හමුවිය යුතු යැයි යෝජනා කළහ. විජාතික බලවේග රොද බැඳගෙන ජනපති මහින්දගේ ආණ්ඩුව පෙරළීමට උත්සාහ කළ අවස්ථාවේදී (2007) ආණ්ඩුවේ ජාතිමාමක වැඩ පිළිවෙළට සහාය පළකළහ. මේවා ඇතැම්විට ප්‍රතිපත්තියක් නැති පරස්පර අදහස් ලෙස පෙනී ගිය ද එයින් පෙන්වූයේ දේශපාලනයේ දී අත්‍යවශ්‍යයෙන්ම දැරිය යුතු "අනතුර" දැරීමට ඇති හැකියාවයි.

ජාතික හෙළ උරුමයේ ගමනට දායක වූ අනෙක් භික්ෂු චරිතය වූයේ කොටපොළ අමරකිත්ති හිමියෝය. උන්වහන්සේ ද ජනප්‍රිය ධර්මකථිකයෙක් වූහ. නමුත් එය අමුතු ආකාරයේ එකකි. එහි තැන්පත් කමක් ද, තිරසාර කමක් ද තිබිණි. කිරිබත්ගොඩ ඥාණානන්ද හිමියන් පවා සිය දිගු ශාසනික ගමන ඇරඹූයේ කොටපොළ හිමියන් සෙවණේය. පුංචියට ඇරඹූ පිච්චමල් ව්‍යාපාරය දළදා පෙරහැර, පොසොන් උළෙල යනාදියට නොදෙවැනි දැවැන්තම බෞද්ධ පෙළහරක් කරන්නට උන්වහන්සේට හැකිවිය.

කොටපොළ හාමුදුරුවෝ සතු වැදගත්ම ගුණය ලෙස මා දුටුවේ ගැමි නුවණයි. ආචාර්ය මහාචාර්ය පදවිලාභීන්ට වඩා ධර්මය ගැන ජීවිතය ගැන සමාජ සබඳතා ගැන උන්වහන්සේට දැනුමක් තිබිණි. අපේ කොළඹ නිවස මාරුවනතෙක්ම පාහේ අපේ දරුවන් දහම් පාසලට යැව්වේ ශාන්ති පදනමටය. ශාන්ති පදනමේ සාමාජිකයන් ද හාමුදුරුවන් මෙන්ම උගත්, දැනුවත්, තැන්පත් තිරසර පැවැතුම් ඇත්තෝ වූහ. දේශපාලන ගමනකට කොටපොළ හිමියන් තුළ එතරම් කැමැත්තක් තිබුණේ නැත. නමුත් සිහළ උරුමය බිහිකළ විට පවා උන්වහන්ගේ ආශීර්වාදය එයට පළවිය. විශේෂයෙන් සේරුවිල විහාරය උන්වහන්සේගේ පදනම් භූමිය වීම නිසා

නැගෙනහිර සිංහලයින් විඳිනා දුක ගැන පුදුමාකාර සංවේගයකින් සිටියහ. 2003 වසරේ දී ලංකාපටුන විහාරය කොටි ත්‍රස්තයින් විනාශ කර සිරිවද්ධන බෝධිය උගුලුවා දැමූවිට උන්වහන්සේ ආවේග සම්පන්න විය. විනාශ කළ ලංකාපටුනට වරක් මම ගියෙමි. කොටි කොල්ලන්ගේ තර්ජනයට ලක්වූ මට පෙනුණේ විදේශිකයන්ගේ ද සහායෙන් එහි කෝවිලක් ඉදිවෙන බවය. හේමමාලී - දන්ත කුමරු ප්‍රථම වතාවට ලක්දිවට ගොඩබට දන්තධාතූන් වහන්සේට සෙවන දුන් ස්ථානය ත්‍රස්ත බිමක් වී තිබිණි. පසුව අපට දැනගන්නට ලැබුණේ චිරප්‍රසිද්ධ සිරවද්ධන බෝධිය ද උගුලුවා ඇති බවය. මේ පිළිබඳව වරක් රූපවාහිනී විවාදයක දී යූ.එන්.පී නායකයෙකුගෙන් ඇසූවිට ඔහුගේ පිළිතුර වූයේ ත්‍රීමලයේ බොහෝ බෝධීන් ඇති බවත් ඇතැම් ඒවා කාක බෝධීන් බවත්ය. අන්තිමේදී ත්‍රීමල නගරයේ බුදු පිළිමයක් පිහිටුවා තිබූ ස්ථානයේ නව පිළිමයක් තබන්නට ගියවිට එයට බෝම්බ ප්‍රහාර එල්ල කෙරිණි. එවකට ත්‍රීමලයේ නාවික ආඥාපතිව සිටි අප හිතවත් සරත් වීරසේකර මහතා එය රකින්නට බොහෝ මහන්සි විය. අන්තිමේදී නීතිපතිවරයා ලවා පිළිමය ඉවත්කරලීමට චන්ද්‍රිකා උත්සාහ කළාය. ඒ සියලු උත්සාහයන් ව්‍යර්ථ කරන්නට අපි දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කළෙමු. නීතිපති කාර්යාලය වටකරන්නට පවා අපට සිදුවිය.

ත්‍රී/මලයේ සිදුවන මේ සිදුවීම්වලින් කොටපොළ හිමියන් ඉමහත් කම්පාවට පත්වූහ. සියලුම ජනප්‍රිය ජනපදනමක් සහිත හිමිවරුන්ගේ කැඳවීමක් උන්වහන්සේ විසින්, සිදුකරනා ලදි. ගංගොඩවිල සෝම හිමි, කිරිබත්ගොඩ ඥානානන්ද හිමි, කොළොන්නාවේ ශ්‍රී සුමංගල හිමි, උඩුවේ ධම්මාලෝක හිමි වැනි හිමිවරුන් ද ජාතික සංඝ සම්මේලනයේ එල්ලාවල මේධානන්ද නාහිමි, ඕමල්පේ සෝභිත හිමි, අතුරලියේ රතන හිමි ආදී හිමිවරු ද එයට එක්වූහ. ඇත්තෙන්ම ජාතික හෙළ උරුමයක් බිහිවීමට මුල් එකමුතුව සිදුවුණේ ඒ භික්ෂු හමුවෙනි. සෝම හිමි අපවත් කිරීම නිසා එයට නව ශක්තිමත් පදනමක් වැටිණි. ජාතික හෙළ උරුමය බිහිකිරීම සඳහා ජනප්‍රිය භික්ෂූන් වහන්සේලා හා ක්‍රියාකාරී භික්ෂූන් වහන්සේලා අතර පාලම වූයේ කොටපොළ නායක හාමුදුරුවන්ය. මා ජාතික හෙළ උරුමයේ ලේකම් පදවිය දරනාවිට ඇතැම් අය එරෙහි වූ විට එකී ලේකම් ධුරය භාරගෙන පක්ෂයේ අර්බුදය නිමා කළේද උන්වහන්සේය.

ජාතික හෙළ උරුමයේ නායකත්වයට උත්තරීතර සංඝ සභාව විසින්, ඒකමතිකව පත්කරගත්තේ පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක හාමුදුරුවන්වය. ජාතික සංඝ සම්මේලනයේ සභාපතිත්වයට

එනතෙක් උන්වහන්සේ මා පුද්ගලිකව දැන සිටියේ නැත. උන්වහන්සේගේ ශාස්ත්‍රීය කටයුතු අසා තිබිණි. කියවා තිබිණි. උන්වහන්සේට දේශපාලනික අත්දැකීම් ද විය. ඒ සියල්ල කදිම කෘතියක් ලෙස නිකුත්ව ඇති නිසා ඒ පිළිබඳව වැඩියමක් නොකියමි. උන්වහන්සේ පිළිබඳ කරුණු දෙකක් සඳහන් කළ යුතුය. එකක් නම් උන්වහන්සේ මොන සභාවල මොන ආකාරයට වැජඹුනත් සිය ගමට, නාපාවල සුමංගලාරාමයට පුදුමාකාර ලෙස බැඳී සිටිනා බවයි. බොහෝ ව්‍යාපාරිකයන් පන්සල නවීකරණය කිරීමට උත්සාහ කළ ද උන්වහන්සේ සම්මාදම් භාර නොගත්හ. සුළඟකට හසු වී පැරණි විහාර මන්දිරය බිඳවැටුණු විට එයට දානපතියෙකුගෙන් ආධාරයක් ලබාදීමට මා දැරූ උත්සාහයට කැමැත්ත පළකළේ එය මගේ පරිත්‍යාගයක් ලෙස සිදුකළ විටය. ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා සමග වරක් විහාරස්ථානයේ උත්සවයකට ගියවිට එහි ඇති චාම් ගැමි බව දැක පළමුව පුදුම විය. පසුව පුදුමාකාර ලෙස සතුටු වූයේ අහස උසට මහ මැදුරු මෙන් පන්සල් ඉදිකිරීමේ මෝස්තරයක් ද ඇතැම් දායකයින් ගෙනයන බව ප්‍රකාශ කරමිනි. උන්වහන්සේගේ මේ නිහතමානී ගැමිකම ඔප්නැංවෙන්නේ දෙසුම් පවත්වන විටදීය. ගැමි උපහරණ රළු කතාදිය සිය දේශනා සඳහා උන්වහන්සේ යොදාගන්නා අතර, සමහරවිට අපි බියවන්නේ නායක හාමුදුරුවන්ගේ කතාවෙන් යම්කිසි අවුලක් උන්වහන්සේට සිදුවේයැයි සිතාගෙනය. නමුත් ඒවා ඇසූවන්ගේ ප්‍රතිචාර බලනාවිට එය ඉතා සාර්ථක දෙසුමක් බව පසුව අවබෝධ කරගන්නෙමු. නායක හාමුදුරුවන්ගේ දෙවැනි ගුණය ඉතිහාසය පිළිබඳ උන්වහන්සේගේ මනා දැනුමයි. මහාචාර්ය පරණවිතාන, කඹුරුපිටියේ වනරතන නාහිමි ආදී විද්වතුන්ගෙන් පසු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ නොමැකෙන ලකුණ එල්ලාවල නාහිමියන්ය. වැදගත්ම දේ නම් උන්වහන්සේ තනිව සොයාගත් සෙල්ලිපි ප්‍රමාණය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එක්ව සොයාගත් ප්‍රමාණයට වඩා වැඩි වීමය. පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් උන්වහන්සේට ලැබුණු වරප්‍රසාද සියල්ල යෙදවුණේ විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පන්සල් හා අපේ උරුමය ලොවට විදහා දක්වන්නටය. පාතාල සාමාජිකයෙකු යොදාගෙන රනිල් වික්‍රමසිංහ හා රවි කරුණානායක උන්වහන්සේට බෙන්ස්කාර්වලින් දමා ගසන්නට ක්‍රියා කළවිට උන්වහන්සේගේ පමණක් නොව පක්ෂ විපක්ෂ බොහෝ බෞද්ධයින්ගේ සිත් රිදුනි. මන්ද ජාතික මට්ටමෙන් ගත්කළ මහා සිංහලේ වංශකතාවෙන් නායක හාමුදුරුවන්ව සාමාන්‍ය ජනයා පවා හැඳින සිටි නිසාය. ජ.වි.පෙ න්‍යායෙන් හාමුදුරුවන්ට පහරදීමට ගිය රනිල් දේශපාලනිකව තවත් අතරමං විය. මුලදී එල්ලාවල නාහිමියන්, භික්ෂුව ඍජු දේශපාලනයට පැමිණෙනවාට කැමැත්තක්

දැක්වූයේම නැත. උන්වහන්සේ එය කීප වාරයක් ප්‍රතික්ෂේප කර මහා කොන්දේසි ගණනාවකට යටත්ව පිළිගත්තේය. නමුත් එයට එකඟවීමෙන් පසු එය අත්නොහැර දැඩිව රැකගත්තාහ. එමගින් බොහෝ භික්ෂූන්ට ආදර්ශයක් වූහ.

ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන් ගැන මා දැනගත්තේ 1999 ජනාධිපතිවරණය වර්ජනය කිරීමට උන්වහන්සේගේ ද සහාය ලැබීම නිසාවෙනි. ඉන්පසු උන්වහන්සේ ජාතික සංඝ සම්මේලනයේ ප්‍රතාපවත්, කථිකයා විය. අපගේ ජාතික ව්‍යාපාරයේ සිටි සමාජ සේවයද, ධර්ම ඥානයද, දේශපාලන බුද්ධිය ද, අවංකකම ද ඉහළින්ම තිබූ යතිවරයාණන් කෙනෙක් වූහ. අවස්ථා දෙකකදීම සිය ජීවිතය පරදුවට තැබූහ. පළමු අවස්ථාව වූයේ සෝම හිමි අපවත් වීමෙන් පසු 2003 දෙසැම්බර් 23 දා බලහත්කාරයෙන් ආගම්වලට හැරවීමට එරෙහිව පනතක් ගෙනඑන ලෙස බලකරමින් ආගමික අමාත්‍යාංශය ඉදිරිපිට කළ උපවාසයයි. කරු ජයසූරිය හා විජමු ලොකුබණ්ඩාර ඇමැතිවරු ඒ සඳහා පොරොන්දුවක් දී පනතක් ද කෙටුම්පත් කළහ. චන්ද්‍රිකා පාර්ලිමේන්තුව විසුරුවාලීම නිසා එය වැළකී ගියේය. දෙවැනිවර උන්වහන්සේ සුනාමි මණ්ඩලයක් තනා ප්‍රභාකරන්ට වෙරළ තීරය භාරදීමට එරෙහිව දළදා මැදුර ඉදිරිපිට උපවාසයක් ආරම්භ කළහ. (2005) මහ දැවැන්ත විරෝධයක් බවට එය පත්විය. අවසානයේ චන්ද්‍රිකා, මහානායක හිමිවරු සතරනමට එවැන්නක් නොකරන බවට පොරොන්දු විය. ජවිපෙට ආණ්ඩුවෙන් ඉවත්වීමට සිදුවූවේත්, සෝභිත හිමි අනුකරණය කරන්නට ගොස් මහා අතරමංවීමක් සිදු වූයේත් ඒ සමගමය. සුපුරුදු ලෙස චන්ද්‍රිකා පොරොන්දු කඩකළත් උන්වහන්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් යුක්තිය ඉටුකරවා ගත්හ. මත්ද්‍රව්‍ය, දුම්වැටි පනත, උතුර හා නැගෙනහිර වෙන්කරලීමේ නඩුව, ජනාධිපතිවරණය 2005ට ගැනීමේ නඩුව ආදී ඓතිහාසික සිදුවීම් ගණනාවක කර්තෘ උන්වහන්සේ විය. හිටපු අගවිනිසුරු සරත් නන්ද සිල්වා හා උන්වහන්සේ අතර තිබූ හිතවත්කම මේ නඩුවලට බලපෑ බවට බොරු මතයක් ඇතැම් අය පතුරවන්නට උත්සාහ කළ ද, අසාධාරණය දුටුකළ සරත් සිල්වා මහතාට පවා උන්වහන්සේගෙන් සමාවක් ලැබුණේ නැත. ශබ්ද දූෂණ චෝදනා මත හිමිනමක් රිමාන්ඩ් බන්ධනාගාර ගතකළ විට උන්වහන්සේ විවෘතවම හිටපු අගවිනිසුරුතුමා විවේචනය කරන්නට පසුබට නොවූහ. තමනට ලැබුණු මන්ත්‍රී ධුරයෙන් ලැබූ සියල්ල පක්ෂයට පූජාකළ උන්වහන්සේ අන්තිමේදී එම මන්ත්‍රී ධුරයම පවා පක්ෂයටම සුදුසු යමක් කරන්නැයි කියා පරිත්‍යාග කරන්නට තරම් පරිත්‍යාගශීලී වූහ. ප්‍රතාපවත් බව උන්වහන්සේගේ චරිත ලකුණ වූ අතර, එය ඕනෑම සභාවක

ඕනෑම අයෙකුට ප්‍රකාශ කිරීමට තරම් උත්තර ස්වාභවයක් විය. මට නිතරම ඕමල්පේ සෝභිත හිමියන් පෙනෙන්නේ පීඩිත සිංහල ගම නවීකාරක ලෝකය සමග ගොඩනැගිය හැකි සමාජ සේවය වෙනුවෙන් දිවි කැපකළ පරමාදර්ශී භික්ෂු චරිතයක් ලෙසය. ක්‍රමයෙන් ප්‍රධාන ලාංකික නගරයක් ලෙස ගොඩනැගෙන ඇඹිලිපිටියේ ප්‍රථම බෞද්ධ ජාත්‍යන්තර පාසල ඇතිකරමින් උන්වහන්සේ කළේ ගැමි දරුවන් සමාජයේ ඉහළට ඔසොවා තැබීමේ යුතුකම ඉටුකරලීම පමණක් නොවේ. අනාගත ශ්‍රී ලංකාවේ සිදුවීමට යන මහා ප්‍රජාතාන්ත්‍රික විප්ලවය සංකේතවත් කිරීමය.

අතුරලියේ රතන හිමියන් මුලින්ම මට හමුවූයේ 1987 මුලදී කැලණිය විශ්ව විද්‍යාලයේ ඇති වූ ශිෂ්‍ය භික්ෂු අරගලයක් නිසාය. ප්‍රේමදාස අගමැතිතුමා එකී වසර (1987) ජාතික නිවාස වසර ලෙස නම්කර තිබිණි. වරක් මා නයිරෝබි නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයට පරිසර සමුළුවකට ගියවිට (2009) එහි පැරණි නිලධාරියෙක් ප්‍රේමදාස මහතා ගැන විමසීය. එය මා මවිත කළේය. මන්ද බොහෝදෙනා මෙන් මාද සිතා සිටියේ එක්සත් ජාතීන් වැනි සංවිධානවල ප්‍රේමදාස වැනි නිර්ප්‍රභූ දේශපාලකයෙකු මතක සටහන් තියෙන්නේ කෙසේද කියාය. ප්‍රේමදාස මහතා ලෝක ජනාවාස දිනය යෝජනා කිරීමෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉතිහාසයට එක්වී තිබූ බව මා දැනගත්තේ එදාය. වරක් එතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමතීම කරනාවිට කාලය හමාර බව පවසන රතු විදුලි බුබුල පත්තුවූ විට එය සිය ලේන්සුවෙන් වසා කතාව දිගටම කරගෙන ගිය බව නිව්යෝර්ක් හි වසන මාධ්‍යවේදියෙකු වූ තැලිප්ඩීන් පැවසූ බව ද මතකය.

ප්‍රේමදාස මහතාට ඉඩක් ලැබුනානම් ඔහු ජාතික දේශපාලනයේ මෙන්ම අන්තර්ජාතික දේශපාලනයේදී ද කැපී පෙනෙනා නායකයෙකු වීමට බොහෝ දුරට ඉඩක් තිබිණි.

1987 ප්‍රේමදාස අගමැති නම්කළ නිවාස වසරේ කැලණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂුන් පෙළපාළි ගියේ උන්වහන්සේලාට නේවාසිකාගාර නැතිබව කියමිනි. එය පොදු ශිෂ්‍ය අරගලයක් විය. එය මෙහෙවීමට මම එහි ගියෙමි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජයශ්‍රී සමග අතුරලියේ රතන හිමියන්ද එහි වැඩම කර සිටියහ. රතන හිමියන් භික්ෂුන් වහන්සේලා අමතා කළ කතාව මගේ සිත් ගත්තේය.අන් භික්ෂු වහන්සේලා මෙන් නොව කතාවේ කදිමට දර්ශනීක සාරයක් ද බොල් මාක්ස්වාදී වාගාලාපයට එහා ගිය සැබෑ ජාතිකවාදී උද්වේගයක් ද විය. රතන හිමියන් පේරාදෙණියේ දර්ශන අංශයේ

උපාධිය සමත් වූයේ එයට පෙර වැඩිම ලකුණු ගත් වසන්ත රාජාගේ වාර්තාවද බිඳ දමමිනි. රතන හිමිට කථිකාචාර්ය පදවියක් ලබා නොදීමට විශ්ව විද්‍යාල පරිපාලනය සූක්ෂම ලෙස ක්‍රියාකළේය. කැලණිය භික්ෂු සටන ආණ්ඩුව මර්දනය කළේය. අපව විශ්ව විද්‍යාලය තුළ සිරකර පොලිස් වැටක් බැඳ, ජලය හා විදුලිය කපා හරිනා ලදී. ටික දිනකට මම උපකුලපති කාර්යාලයේ පදිංචි විමි. ආහාර හා ජලය නැතුව වැඩිකලක් සටන ඇඳගෙන යා නොහැකිබව අපි අවබෝධ කර ගත්තෙමු. පොලීසිය හා ගැටුමක් ඇතිකරගෙන සටන විසුරුවා හරින ලෙස ජ.වි.පෙ නායකයෝ බලකරමින් සිටියහ. අපි එයට කැමැති නොවූවෙමු.

මේ අවස්ථාවේ කැලණියේ "රොනී" ඉදිරිපත් විය. ඔහු ගැන ද මෙහි දී යමක් සඳහන් කළ යුතුමය. රොනී ජවිපෙ දැඩි ක්‍රියාකාරිකයෙකු වූ අතර මනා වැඩීගිය සිරුරක් සහිත ක්‍රීඩා ශූරයෙක්ද විය. එමෙන්ම ළයාදර මිනිසෙක් විය. කෑම ප්‍රශ්නය හා ජල ප්‍රශ්නය ඔහු විසඳුවේය. විශ්ව විද්‍යාලයේ ළිඳ විවෘතකර දැවැන්ත ටැංකි දෙකකට ජලය පුරවා දුන්නේය. තාප්පයෙන් පැන ගොස් පාන් පුරවන ලද ගෝනි කීපයක් ගෙන ආවේය. සටන වැටෙන තෙක් බලා සිටි පොලීසියට තේරුම් ගියේ අපි යටත් නොවී දිගමට අල්ලාගෙන සිටිනා බවය. රහස රොනීගේ අධිෂ්ඨානයයි. ශිෂ්‍යයින්ගේ අධිෂ්ඨානය පවත්වා ගැනීම සඳහා රතන හිමිත්, මාත් බලහරුවේ හිමිත්, එක දිගමට කතා පැවැත්වූ බව මතකය. අන්තිමේදී අපි සටන ජයගතිමු. ඒ ජ.වි.පෙ නියෝගවලට පටහැනිව යමිනි.

ජ.වි.පෙ තුළ සිටි එඩිතර උදාර මිනිසෙක් වූයේ රොනීය. වරක් අපට කොළඹ විශ්ව විද්‍යාලයේදී (1986 ) සංවිධානය වූ දයා පතිරණ,ධර්මසිරි හා තිසරණී ගුණසේකර ආදීන් පොලු මුගුරුවලින් ප්‍රහාරයක් එල්ල කළහ. බොහෝ ජවිපෙ සමාජිකයන් පැන දුවද්දී නොසෙල්වී සිටියේ රොනී පමණි. "අද මම තොපිට ගහනවා. මොකද මට භයිය තියෙන නිසා " ජවිපෙට භයිය තිබුණොත් උන් මට ගහන බවත් මං හොඳට දන්න නිසා" යැයි එදා දයා පතිරණ ප්‍රකාශ කළබව මට හොඳට මතකය. ඒ ප්‍රකාශය ඇත්තක් විය. දයා පතිරණ මරා දැම්මේ ජ.වි.පෙට ඔහුට මුහුණදිය නොහැකි වූ නිසාය. පසුව කටුනායක කඳවුරට පහරදීමට ගොස් රොනී ද මිය ගියේය. සන්ඩේ ටයිම්ස් පුවත්පතෙන් ඔහුගේ මළ සිරුර අපි හඳුනාගත්තේ එයට පෙරදා රෑ අපේ බෝඩිමෙන් රාත්‍රී ආහාර ගෙන එහි තිබූ අඳුරු පැහැ කොටු කමිසයක් ද ඇඳගෙන ඔහු පිටත්ව ගොස් තිබූ හෙයින් ලෙයින් පෙඟී ගිය කමිසයෙනි. රොනීගේ මිතුරෙකු වූ

අශෝක හඳගම පසුව ඔහුගේ ටෙලි නාට්‍යයකට රොනීගේ ප්‍රියතම ගීතයක් වූ ආයෙත් කියන්නේ නෑ වසන්ති ගීතය මුසු කළේය.

මා පසුව විදුලිබල මණ්ඩලයේ පුහුණුව සඳහා නුවර ගියවිට රතන හිමි සමග සබඳතා තරකර ගතිමි. උන්වහන්සේ විවිධ දර්ශනයන් පිළිබඳ වැදගත් හැදෑරීමක් කර තිබූ අතර ධර්මසේකර වැනි ජ.වි.පෙ නොවන ජාතිකවාදී දේශපාලන නායකයන්ද ඇසුරු කළේය. පේරාදෙණියේ " නිෂ්මි " මට කීවේ රතන හිමි අනාගතයේ ද්‍රෝහියෙක්වීමට ඇති ඉඩකඩ බොහෝ වැඩිබවය. වාමාංශික ළදරු වලිප්පුව හදා නොගෙන ඉන්නැයි නිෂ්මිට ප්‍රකාශකළ බව මට මතකය. වෛද්‍ය පීඨයේ සුදත් බණ්ඩාර නම් රතනහිමි සමග සුහද විය. භිෂණ යුගයෙන් පසු ( 1987-89 ) ජවිපෙ ඉහළ මණ්ඩලවල ඉතුරු වූ අතලොස්සෙන් එක් අයෙකු වූ සුදත් බණ්ඩාර පසුව ජ.වි.පෙට ආයුබෝවන් කියා ජාතික චින්තකයෙක් විය. පසුව සුදත් තමන් විසින් පරිවර්තනය කළ ස්පාටකස් කෘතිය රැගෙන මා හමුවීමට පැමිණි අතර අතීතයේදී සීතල පේරාදෙණියේ සිදුවූ උණුසුම් දාර්ශනික වාදවිවාද ගැන මතකයන් බොහෝ වේලාවක් රස කරමින් විමසා සිටි බව මතකය.

රතන හිමියන්ගේ අතිවිශේෂය වූයේ ඕනෑම ක්‍රියාදාමයක් පුද්ගලික මැදිහත්වීමෙන් අවුල්කර වෙනස් කිරීමට උන්වහන්සේට තිබූ හැකියාවය. කවුරු මොනවා කීවත් මාතරින් කොළඹ පැමිණි රතන හිමියන් රජවත්තේ වප්ප හිමියන්ගේ කාරුණික භාවය සරණ කොටගෙන පූර්ණකාලීන ලෙස ජාතික අරමුණට කැප නොවුනා නම් ජාතික සංඝ සභාව බිහිවන්නේ නැත. වෙනත් සංඝ සභා බිහිවුණත් ඒවා පහසුවෙන් දේශපාලන අතකොලු වීමට ඉඩ තිබිණි. ජාතික සංඝ සම්මේලනයත් එසේමය. චන්ද්‍රිකා හා ජ.වි.පෙ එක්වී මහනුවර ආධාර සමුළුවක් පවත්වා රටේ ප්‍රතිරූපය විකෘති කළවිට වහා නැගිට එය නිවැරදි කළේ බුදුරජාණන් වහන්සේ භික්ෂුනට දේශනා කළ "වැරැද්ද දුටුතැන එය නිවැරදි කරනු" යන දේශනාව මත සිටගෙනය. මාවිල් ආරු සිදුවීමද එවැන්නකි.

2006 ජූලි 23 දා රතන හිමියන් මට දුරකතනයෙන් කතාකර ඇසුවේ මාවිල් ආරුව වසා ඇති නිසා සේරුවිල ජනතාව මහත් දුෂ්කරතාවයකට පත්ව ඇති බවය. අපි වහාම මැදිහත් විය යුතු බව උන්වහන්සේ තවදුරටත් ප්‍රකාශ කළහ.එය වහාම සිදුකරනා ලෙසත් නිශාන්ත කැටුව එහි යන ලෙසත් ඉල්ලා සිටියෙමි. රතන හිමියන් මාවිල් ආරු බලා ගිය අතර නිරායුද ජනයා සංවිධානය කර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා අවශ්‍ය දැවැන්ත මානසික පසුතලය නිර්මාණය කර දුන්නේය. ත්‍රස්තවාදීන්ගේ මානසික

යුද්ධයේ ගොදුරු වී සිටි යූ.එන්.පීය හා වෙනත් බලවේග විශ්වාස කළේ රතන හිමිගේ "බාල ප්‍රචාරක ප්‍රදර්ශනය " රට මහත් යුද ව්‍යසනයකට ගෙනයන බවය. ජ.වි.පෙ දැරුවේද මෙවැනි මතයකි. ජ.වි.පෙ මන්ත්‍රී විජේසේකර, මහින්ද පුරයට පැමිණි ජනතාව අධෛර්ය කිරීමට තැත්කළ අතර එය ජනතාවගේ කෝපය වැඩිකිරීමට හේතුවක් විය. ප්‍රදේශයේ ඇතැම් හිමිවරුන් පවා කීවේ එලීලන් සමග සාකච්ඡා කර ප්‍රශ්නය විසඳාගත යුතු බවය. ආණ්ඩුවේ ඇතැමුන් පවා සිතුවේ දිගුකාලීන යුද සැලැස්මට මෙය බාධාවක් බවය.

ශ්‍රීපති සූරියාරච්චි වරක් ප්‍රකාශකර තිබුණේ කොටි මාවිල් ආරු සොරොව්ව වැසුයේ මහින්ද - ප්‍රභාකරන් ගිවිසුමට අනුව සාම්පුර් ජල යෝජනා ක්‍රමයක් සඳහා ආණ්ඩුව මුදල් නොදුන් නිසා බවය. නමුත් ඇත්ත වූයේ ප්‍රභාකරන් සිය මූලෝපායික යුද සැලසුම එනම් ත්‍රිමලය වටකර යාපනය ඇල්ලීමේ සැලසුම ක්‍රියාවේ නැංවීමට මෙය සිදුකළ බවය.එයට ආසන්නතම හේතුව වූයේ ශ්‍රීලංකා හමුදාවන් නැගෙනහිර බිඳීගිය කොටි සාමාජිකයන් සිය ගණනින් සන්නද්ධ කරනා බව සිය ඔත්තුසේවාවලින් ප්‍රභාකරන් දැන ගැනීම ය.

අපි මෙය දැන සිටියෙමු. බලා නොසිට ප්‍රතිප්‍රහාරය එල්ල නොකළා නම් තවත් ප්‍රභූ ඝාතන පෙළක් (මේ වනවිට යුද හමුදාපති ඝාතනයට උත්සාහ දරා තිබිණි) සමග යාපනය වටකිරීම සිදුවීමට ඉඩ තිබිණි. රතන හිමියන්ගේ ක්‍රියාව මගින් සිදුවූයේ කොටි උපාය මාර්ගය අවුල්වී සැලසුම්කළ කලට කලින් කොටින්ට එරෙහිව ජනතා යුද්ධය ඇරැඹීමය.

චන්ද්‍රිකා රනිල්ගේ පාලනයේ අමාත්‍යාංශය පවරා ගැනීම. සිදුකළ දා ( 2004 පෙබරවාරි 03) අපේ ජනහමුවක් මහනුවර පැවැත්විණි. චන්ද්‍රිකාගේ කාර්යාලයේ සිටි අපේ හිතවතෙකු කීවේ ගැසට් නිවේදනය මුද්‍රණය කරගැනීමට රණවිරාජා මහතා සමත්වී ඇති බවය. පසුවූ දිනෙක තිලක් රණවිරාජා මහතා රනිල්ගේ ආණ්ඩුවේ අමාත්‍යාංශ පවරා ගැනීමේ ගැසට් නිවේදනය ලබාගත් ආකාරයත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ආරක්ෂක ඇමැති ධුරය සඳහා කියවීම ලබාගත් ආකාරයත් නාට්‍යායනුසාරයෙන් මට පැහැදිලි කරදුන්නේය. රනිල්ගේ පාවාදීම නතර කිරීමට එය නිර්භීත පියවරක් වනු ඇතැයි අපේ විශ්වාසය විය. අනෙක් අතට කරුණාගේ බිඳී යෑම ස්ථිර වී තිබූ නිසා ප්‍රභාකරන් කඩිමුඩියේ යුද වැදීමේ අනතුරක් ද නොවීය. එක්සත්

ජාතීන්ගේ හමුදා මැදිහත්කරවීමේ තැත නිසා <u>නිරූපම්සෙන්</u> හා ඉන්දියාව සිටියේද දත්කුරු කමිනි. එකම කනස්සල්ල වූයේ රනිල් ජනතා විරෝධය පාරට ගෙන ආණ්ඩුවට අභියෝග කරයිද යන්නය. නමුත් ගුවන්තොටුපොළ දී මාධ්‍ය ඇමැතු රනිල් කීවේ තම දුක්ගැනැවිල්ල ජොර්ජ් බුෂ්ට කිවූ බවය. මුහුණට මුහුණ සටන් කිරීමට සිදුවූ විට එය නොකර හැකිතාක් සටන මගහැර අන් අය පිට යැවීම රනිල්ගේ නායකත්වයේ දුර්වලම ලකුණයි. චන්ද්‍රිකා හරියටම එතැනට ගැසුවේය. ප්‍රකෝටි ගණනක් දේශීය විදේශීය අරමුදල් වියදම්කර තැනූ දේදුනු සන්ධානය බොඳවී ගියේය.

අපි සිහළ උරුමයේ රැස්වීම් කීපයක් තැබූවෙමු. සෝම හිමියන් අපවත්වීම කොටින්ට රට පාවාදීම ආදීය නිසා පුදුමාකාර ප්‍රතිචාරයක් අපට ලැබී තිබිණි. ඊළඟ මැතිවරණයේ කොළඹ පමණක් නොව ගම්පහ, කළුතර , මහනුවර, ආදී ප්‍රදේශවලද අපේ තත්ත්වය සුභදායි බව පැහැදිලි විය.
මේ අතර භික්ෂූන් වහන්සේ වෙතින් යෝජනාවක් ඉදිරිපත් විය. එනම් උන්වහන්සේලා ශාසනික වුවමනාව වෙනුවෙන් මැතිවරණයට ඉදිරිපත් විය යුතුය යන්නය.

මේ පිළිබඳ පූර්ව සාකච්ඡා කුප්පියාවත්ත ජයසේඛරාරාමයේ පැවැත්විණි.එල්ලාවල මේධානන්ද නාහිමි, කොළොන්නාවේ සුමංගල හිමි, උඩුවේ ධම්මාලෝක හිමි , කොටපොළ අමරකිත්ති හිමි, අතුරලියේ රතන හිමි, ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා රැසක් ද තිලක් කරුණාරත්න මහතා හා මා ද එයට සහභාගී වුවෙමු. එතැනදී මත කීපයක් ඉදිරිපත් විය. එල්ලාවල හිමි ප්‍රකාශ කළේ සෘජුව මැතිවරණවලට ඉදිරිපත් වීම භික්ෂුත්වයට හානිකර වීමට ඉඩ ඇති බැවින් සුදුසු ගිහි පිරිසකට සහාය දියයුතු බවය. කොළොන්නවේ හිමි හා උඩුවේ හිමි ඒවනවිටත් සැලකිය යුතු දුරක් සංවිධාන කටයුතු කර තිබුණහ. කොළඹ අවට සිටිනා බොහෝ වැදගත් හිමිවරුන් තම අදහස ඉදිරිපත් කර තිබූ අතර ඡන්දයට තරග කිරීම සඳහා ලලිත් පෙරමුණ පක්ෂයද තෝරාගෙන තිබිණි. කොටපොළ හිමි,රතන හිමි ආදීන්ගේ මතය වූයේ ඉදිරි දිනවල මේ සඳහා සාකච්ඡාවක් කර තීරණය කළ යුතු බවයි. ධර්මායතනයේ මහරගම ධම්මසිරි හිමි, ඕමල්පේ සෝභිත හිමි, මැදගම ධම්මානන්ද හිමි ආදීන්ද එයට සම්බන්ධ කරගත යුතු බව යෝජනා විය. මැදගම ධම්මානන්ද හිමි භික්ෂුව වෙනම ඡන්දයට ඒම ගැන කැමැත්තක් දැක්වූයේ නැත. ගොඩනැගෙන ශ්‍රී.ල.නි.ප - ජ.වි.පෙ සන්ධානයට සහාය දියයුතු යන මතයේ උන්වහන්සේ

මුලදී සිටිය මුත් පසුව හෙළ උරුමය ඉදිරියට යද්දී එයට දායකවී මධ්‍යම කාරක සභාවටද ඇතුළත් විය. මුලදීම උන්වහන්සේ ඉදිරිපත්වුවානම් උත්තර සංඝ මණ්ඩලයට පවා එක්කර ගැනීමේ සූදානමක් විය. මහරගම ධම්මසිරි හිමි භික්ෂුව දේශපාලන බලයක් ගොඩනගා ගතයුතුයි කීව ද තමන් එයට පුද්ගලිකව කැපවීමට ඇති ප්‍රායෝගික ගැටලු පෙන්නා දුන්නේය. වෙනස්ම මඟක් ගෙන හරවත් දේශපාලනයක් කිරීම සඳහා භික්ෂුව දේශපාලනයට ඉදිරිපත් විය යුතුය යන්න ඕමල්පේ හිමිගේ අදහස විය.

අප පක්ෂය තුළින්ද මේ අදහසට විරුද්ධත්වය පළවිය. තිලක් කරුණාරත්න මහතාගේ අදහස වූයේ අප සන්ධානයට එක්වී ඡන්දය ඉල්ලිය යුතු බවයි. ඔහු මේ අදහස 2001 දී ද ඉදිරිපත්කළ අතර එයට පටහැනිව අපි තනියෙන් ඉල්ලා පරාජය පිළිගත්තෙමු. අපේ බොහෝ දෙනෙකුගේ අදහස වුයේ ජය පරාජය නොව ප්‍රතිපත්තියට මුල්තැන තිබිය යුතු බවයි.

උදය ගම්මන්පිල මහතා ඇතුළු පක්ෂයට කැපවුණු ක්‍රියාකාරීන් බොහොමයක් ප්‍රකාශකර සිටියේ තනිව තරග කිරීමෙන් මෙවර අනිවර්යෙන්ම හොඳ නියෝජනයක් ගතහැකි නිසා අප අනිවාර්යෙන් තනිව තරග කළ යුතු බවයි. මේ අතර, භික්ෂූන් වහන්සේලාගේ පුද්ගලික මිතුරන් ලෙස පෙනී සිටි ඇතැමුන් සිහළ උරුමය පාච්චල් කරන්නත් භික්ෂූන්ට අපේ සහාය අවශ්‍ය නැතැයි කියමින් අපව හෙළා දකින්නටත් වූහ. එහි කණ්ඩායම් දෙකක් විය. එකක් ආණ්ඩුවට හෝ යූ.එන්.පීයට හිතැති කණ්ඩායමයි. ඔවුන් හොඳින් දැන සිටියේ අප වැනි අය සිටිය හොත් අනාගත භික්ෂු බලය ඔවුනට අවශ්‍ය ලෙස පාලනය කළ නොහැකි බවය. අනෙක් පිරිස නොයෙක් ප්‍රශ්න නිසා අපෙන් වෙන්ව ගිය පිරිසක් විය. ඔවුනට අවශ්‍ය වූයේ හැකිතාක් අපට බාධාකිරීමය.

අවසානයේ දී දීර්ඝ සාකච්ඡා ගණනාවකින් පසු සිහළ උරුමය ජාතික හෙළ උරුමය බව පත්කරගන්නත් එහි ලකුණ ලෙස සුභ ලකුණක්වූ ජයශංඛය යොදා ගන්නටත් අපට හැකිවිය. 2004 පෙබරවාරි 14 අමා වැස්ස තරුණ සිල් වැඩසටහන (මෙය වැලන්ටයින් දිනයට එරෙහිව යොදාගත් පුනුරුද වැඩපිළිවෙළක් විය) දිනයේ එය ප්‍රකාශ කරන්නට ඉටාගත්ත ද නොයෙක් බාධා නිසා එය ඉටු නොවීය. උඩුවේ හා කොළොන්නාවේ හිමිවරුන්ට දැඩි පීඩනයක් විවිධ ක්ෂේත්‍ර වලින් ඇතිවිය. අන්තිමේදී පිළියන්දල බොදු සමුළුවේ දී දහස් ගණනක සාදුකාර නද මැද්දේ අශෝක මැණික්ගොඩ මහතාගේ ආරාධනයෙන් ජාතික හෙළ උරුමය ප්‍රකාශයට පත්කෙරිණි. සම්පත් බැංකුව, හැරී ජයවර්ධන මහතාගේ ග්‍රහණයෙන් බේරාගැනීම සඳහා

අප දියත් කළ සටනින් මතු වූ වැදගත් චරිතයකි අශෝක මැණික්ගොඩ. එක් දිනක ඔහුව මට හඳුන්වාදුන්නේ ඒ සටනෙහි පෙරමුණෙහිම සිටි කළුතර සුගුණ හිමියන් විසිනි. ඔහුව මම කුඩාකළ සිට දනිමි. අපි තක්ෂිලාවේ ක්‍රීඩාකටයුතු කරනවිට ඔහු ශ්‍රීපාලියේ ක්‍රීඩා කටයුතු කළේය. මැණික්ගොඩගේ හැඟීම්බර බෞද්ධ ආයාචනය ඊළඟට රටපුරා ජාතික හෙළ උරුමය වේදිකාවේ රැව්දුන්නේය. ඔහු රත්තරන් පපුවක් ඇති හොඳ ශ්‍රද්ධාසම්පන්න බෞද්ධයෙක් විය.

තිලක් කරුණාරත්න මහතා සිහළ උරුමය භික්ෂූන් වහන්සේට පූජාකිරීම ගැන කැමැත්තක් දැක්වූවේ නැත. නමුත් පානදුර හෙළ උරුමය රැලිය දැකීමෙන් පසු ඔහු භික්ෂූ ජයග්‍රහණය සඳහා කැපවිය. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු (කලක් පානදුර මන්ත්‍රී) දුරකථනයෙන් මාහට කීවේ පානදුර නගර සභා පිටියට 1977 මැතිවරණයේ දී පිරීගියාට පසු පුරවනු ලැබුයේ හෙළ උරුමයේ ස්වාමින් වහන්සේලා බවය. එදින රැලියේ දී අප පිළිබඳ ඔත්තු බලමින් සිටි සෙලින්කෝ සමාගමේ සේවය කළ හිටපු හමුදා නිලධාරීන් කීපදෙනෙකු අපට හසුවිය. අපේ වාහනවලට සමාන වාහන යොදාගෙන අපේ චරිත ඝාතනය සඳහා ඒවා යොදා ගන්නා අන්දම ගැනවූ මහා කුමන්ත්‍රණයක් පසුව මහනුවරින් අල්ලාගත් හිටපු හමුදා නිලධාරීන් දෙදෙනෙකු ද හෙළිදරව් කළේය. කොතලාවල මහතා රතුඉර පැන ඇති බව අපි තේරුම් ගත්තෙමු. කොතලාවල මහතා මහා මූල්‍ය වංචාවක් හසුවී සිරගෙදරට යනතෙක්ම ඔහුගේ ආගමික හා ධනබලය සමග අපට ධර්ම යුද්ධයක් විය.

රටපුරාම ගොස් ජාතික හෙළ උරුමයට අවශ්‍ය අපේක්ෂක ලැයිස්තුව තැනුයේ මාය. ගම්පහ ලැයිස්තුව සකස් කරද්දී (සතිරෝ ආයතනනයේදී) හිමිනමකගේ අඩුපාඩුවක් පැනනැගී අතර ඒ සඳහා අපේ මීරිගම ඉන්දාසර හිමි සමග වැඩමකර සිටි අපරැක්කේ පුඤ්ඤානන්ද හිමිගේ නම යොදාගැනීමට සිදුවිය. අපරැක්කේ හිමි පසුව මන්ත්‍රීවරයෙකු විය. හෙළ උරුමය සමග මත ගැටුම් ඇතිකරගත් අතර සුප්‍රකට කථානායක ඡන්දයේ දී සන්ධානයට ඡන්දය දුන්නේය. අපි ඒ ඡන්ද නිෂේධ කිරීමෙන් අලුත් ඉතිහාසයක් නිර්මාණය කළෙමු.

හෙළ උරුමය ප්‍රකාශ කළදා සිට ජ.වි.පෙ ප්‍රචණ්ඩ ලෙස අපට බාධා කළේය. ඇතැම් භික්ෂුන් පිරිසක් තිලක් කරුණාරත්න මහතාගේ නිවස ඉදිරිපිට උපවාසයක් කිරීමටද ඉදිරිපත් වූහ. මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර ඝාතනය

සඳහා ඔත්තු බැලූ බවට චෝදනා ලැබූවෙක්ද ඒ අතර විය. ඡන්දයේ දී ජ.වි.පෙ බාධාවලට මුහුණ දීමේ වගකීම සිහළ උරුමයේ තරුණ පරපුර බාරගන්නා ලදී. ජ.වි.පෙ පොලිස් බලය හා රාජ්‍ය යාන්ත්‍රය අපට එරෙහිව යොදා ගත්තේය. දැන් (2009) විපක්ෂයේ සිට ඔවුන් රාජ්‍ය මර්දනය ගැන කියමින් උසාවි යෑම විහිළුවක් වන්නේ එදා රාජ්‍ය බලය ජාතික හෙළ උරුමයට එරෙහිව යොදාගත් ආකාරය දෙස බැලීමෙනි. මහනුවර, කුරුණෑගල, කළුතර හා කොළඹ දිස්ත්‍රික්කවල මැතිවරණ කටයුතුද, මාධ්‍ය ප්‍රචාරක කටයුතු ද මෙහෙයවීම මම සිදු කළෙමි. ධම්මාලෝක හිමියෝ අමුතුම ආකාරයකට කොළඹ සංවිධානය කළ නිසාත් දහස් ගණනක් ස්වේච්ඡාවෙන් එයට දායක වූ නිසාත් එහි එතරම් වෙහෙසක් දැරීමට වූයේ නැත. නමුත් අනෙක් දිස්ත්‍රික්කවල අපිට උපරිම ලෙස කැපවන්නට සිදුවිය. කළුතර හා මහනුවර ආසන ලැබුණේ ද, කුරුණෑගල ආසනයක් ආසන්නයට ආවේද ඒ කැපවීම නිසාය. ඇතැම් ව්‍යාපාරිකයන් සන්ධානයට හා යූ.එන්.පීයට සැබෑවටම මුදල් වියදම් කරනා අතරේ හෙළ උරුමය කරන්නේත් තමන්යැයි පෙන්නා දෙන්නට උත්සාහ කළහ. නමුත් හෙළ උරුමයට මහාපරිමාණයෙන් උපකාර කළේ අප්‍රකට මිනිසුන් දෙතුන් දෙනෙකි. ස්වර්ණවාහිනිය විවෘතව ලබාදුන් ප්‍රචාරක සහාය නාගරික ප්‍රදේශවල මැතිවරණ ජයග්‍රහණයට බොහෝ ඉවහල් විය.

කළුතර චන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ රාත්‍රියේ සිටියේදී මට අපේ පැරැණි ගණිත ගුරුවරයාවූ සෙන්දනායක මහතා හමුවිය. තමන් දේශපාලයේ දී නිෂ්ක්‍රීය නමුත් මෙවර පිරිසිදු දේශපාලනයක් පතා හෙළ උරුමයට ඡන්දය දුන් බව ප්‍රකාශ කළේය. හෙතෙම ඡන්ද ගණන් කරීමේ නිලධාරියෙකුද වූ නිසා අපට ආසනයක් තිබෙනා බව පරිගණකය පරීක්ෂාකර බලා ඔහු කීවේය. අපි ප්‍රිතීයෙන් පිනා ගියෙමු. කළුතරින් පළමුවැනියා නොවුනහොත් ඉල්ලා අස්වන බව කිවූ රෙජිනෝල්ඩ් කුරේ පඩිපෙළේ දී හමුවිය. ජ.වි.පෙ නන්දන ගුණතිලක ඔහු මෙන් දෙගුණයක් මනාප ගෙන තිබුණු අතර ජ.වි.පෙ තිදෙනාම ඔහුට උඩින් විය. ඉල්ලා අස්නොවන මෙන් ද තමන් කීවේ ශ්‍රී.ලනි.පයේ පළමුවැනියා වීම ගැන බව මාධ්‍යවලට පැහැදිලි කරන මෙන් ද එතුමාට විහිළුවට මෙන් කීවෙමි. දිසාපති කාර්යලයේ දී මට නන්දන හා මහින්ද සමරසිංහ හමුවිය. සිනාමුසු මුහුණින් මහින්ද කීවේ ජාතික ආණ්ඩුවකට කාලය අවුත් ඇති බවය. හැබැයි ඒ තීරණය ගන්නට ඔහුට තවත් දෙවසරක් ගතවිය.

අපේ ඡන්ද ප්‍රතිඵලය බොහෝදුරට සිහළ උරුමයේ ප්‍රතිඵලයට සමාන විදහා දැක්වීමක් විය.නමුත් 2000 දී සිහළ උරුමය ගත් ඡන්ද ප්‍රමාණය මෙන්

ආසන්නයෙන් සතර ගුණයක් හෙළ උරුමය ලබාගෙන තිබිණි. කෙසේ වෙතත් කොළඹ, ගම්පහ, කළුතර, නුවර, කුරුණෑගල ආදී නාගරික උගත් පිරිස බහුල ප්‍රදේශවල ඉහළින්ම ඡන්දය වැටී තිබිණි. කැස්බෑව හා මහරගම යූ.එන්.පීය ද පැරැදී තිබිණි. භික්ෂූන් වහන්සේ ඡන්දය නොඉල්ලා සිහළ උරුමය ඉල්ලුවත් අඩුතරමින් ආසන තුනක්වත් ලැබෙන්නට ඉඩ තිබිණි. ප්‍රතිපත්ති පමණක් නොව අපේක්ෂකයා ද, පණිවුඩය පමණක් නොව පණිවුඩකරු ද වැදගත් බව ජාතික හෙළ උරුමය පෙන්නා දුන්නේය.

එක්සත් ජනතා නිදහස් සන්ධානයහි ඇතැමුන් කීවේ අපි ඔවුන්ගේ ඡන්ද කැඩූ බවය. එය අසත්‍යයකි. 2001 දී ශ්‍රී.ල.නි.ප, ජ.වි.පෙ වෙන වෙනම ගත් ඡන්දය මෙවර ඔවුන් එක්වී ලබාගෙන තිබිණි. යූඑන්පීයේ ඡන්දය නම් අඩුවී තිබුණේය. මට පසුව රනිල් වික්‍රමසිංහ හා මලික් සමරවික්‍රම යන දෙදෙනාම කීවේ හෙළ උරුමය නිසා පාඩු වූයේ යූ.එන්.පීයට බවය.මගේ මතය නම් අපි දිනාගත්තේ පක්ෂවලට ගැති නොවූ මධ්‍යමික ඡන්දයක් බවයි. 2005 ජනාධිපතිවරණයේදී අපි හෙළ උරුමයට වැටුණු ඡන්දවලින් 65% ක් පමණ මහින්ද රාජපක්ෂ වෙතට ගෙනයෑමට සමත් වීමෙන් මෙය තවත් පැහැදිලි විය. හෙළ උරුමයේ ස්වාමින් වහන්සේලාට පහරදී බියවද්දා අප අඩපනකළ හැකියැයි සිතූ මංගල - ශ්‍රීපති - රුවන් - ජේ.වී.පීය කල්ලියේ පදනම අපි පරාජය කළෙමු. දිවයින පුවත්පතින් අපට පහර එල්ලකළ ඇතැම් ජාතිකවාදී ලේඛකයෝද අපේ මහා පිම්ම ගැන මවිත වූහ. කිසිවෙකුට ආපසු හැරවිය නොහැකි සිංහල බෞද්ධ බලවේගයක් බල කරළිය වෙනස් කිරීම අරඹා තිබිණි.

## සයවැනි දිගහැරුම

# මහින්දාගමනය

2004 මහා මැතිවරණය ශ්‍රී ලාංකික සමාජයේ ජාතිකවාදී උද්වේගය පෙන්නුම් කළේය. ජාතික හෙළ උරුමය ලබාගත්තේ ඡන්ද ලක්ෂ පහමාරක් වුවත් එය උගත් මතවාදි නායකත්වයක් සහිත මාධ්‍යමික සමාජයේ ඡන්දයක් විය. විශේෂයෙන්ම වෘත්තීයවේදීන්, වෛද්‍ය, නීති, ඉංජිනේරු, කළමනාකරණ හා ව්‍යාපාරික ක්ෂේත්‍රවල ඡන්දය එයට ලැබිණි. මෙය කිසිවෙකුට මගහැරිය නොහැකි සිංහල බෞද්ධ බලය සමාජගත වීමක් විය. සන්ධානයේ ලයිස්තුවල ජ.වි.පෙ අපේක්ෂකයින් මුල්තැනට ඒමත්, ඔවුනට මිලියන 02ක පමණ ජනයා මනාපය පළකිරීමත්, ශ්‍රී.ල.නි.පය පක්ෂයක් ලෙස දුර්වල වීමත් ඒ සමගම සිදුවිය. කොටි සංවිධානයේ බලය යෙදවීමෙන් ඡන්ද ලක්ෂ හයක් ලබාගෙන දෙමළ සන්ධානය ආසන 22ක් ලබාගත්තේය. අනුපාත ක්‍රමයේ විකෘතිය එයින්, පෙනිණි. සිංහලයෙකුට පාර්ලිමේන්තු නියෝජනයක් සඳහා ඡන්ද 60,000 ඉක්මවා අවශ්‍ය වෙත්දී දමිළයෙකුට පාර්ලිමේන්තු නියෝජනයක් සඳහා අවශ්‍ය වූයේ ඡන්ද 27,000ක් පමණි. උතුරු හා නැගෙනහිර නොපවතින ව්‍යාජ ඡන්දත් (ආසන්නයෙන් 50%ක්) කොටි සංවිධානයේ බලහත්කාරයත්, එයට රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව දැක්වූ බයාදු යටත්වීමත් නිසා ප්‍රජාතන්ත්‍රවාදය විකෘති කෙරිණි.

මැතිවරණය අහවර වූ වහාම කවර පක්ෂයකට හෝ නොබැඳී අපි මධ්‍යස්ථව සිටිය යුතුයැයි උත්තර සංඝ මණ්ඩලය ද හෙළ උරුමයේ මධ්‍යම කාරක සභාව ද තීරණය කළේය. උත්තර සංඝ මණ්ඩලයේ (ප්‍රධාන භික්ෂූන් වහන්සේ සය නම) තීරණ ගැනුණේ ඒකමතිකවය. කෙසේ වෙතත්, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට බහුතරය නොවීය. චන්ද්‍රිකා මැතිණිය පැමිණ ධම්මාලෝක හිමියන්ගේ අසපුවේ දී අපේ හිමිවරු මුණගැසුනාය. මේ අතර, ඇයගේ උපදේශකයින් විටින් විට අපව ද මුණ ගැසිණි. එහි දී අප දැනගත්තේ අගමැති පදවිය සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් මහතාව ජ.වි.පෙ විසින් යෝජනා කර ඇති බවය. රනිල්ගේ ආණ්ඩුව පෙරළීම සඳහා කදිර්ගාමර් මහතා එකඟ කරගෙන ඇත්තේ ද මේ පොරොන්දුව ඉදිරියට දමාගෙනය. ජ.වි.පෙ ඉලක්කය වූයේ මහින්ද රාජපක්ෂ අගමැති ධුරය ලබාගැනීම වැළැක්වීමය. හම්බන්තොට ප්‍රාදේශීය දේශපාලනයේ සිට ජාතික දේශපාලනය දක්වා මහින්ද රාජපක්ෂ හා ජවිපෙ අතර, මතුපිටින් නොපෙනෙන ගැටුමක් විය. තමනට අභියෝගයක් වියහැකි චරිත ජ.වි.පෙ ඉවසුයේ නැත.

අපි මහින්ද රාජපක්ෂට අගමැතිකම දෙන ලෙස ඉල්ලුවෙමු. එමෙන්ම කථානායක තරගයේ දී නිහඬව සිටින්නට ද තීරණය කළෙමු. මහින්ද රාජපක්ෂ මහතාට අගමැතිකම දුන්නේ හෙළ උරුමය සතුටු කරන්නට බව පසුව එස්.බී.දිසානායක සිය කෘතියක ලියා තිබුණේය. එය ජ.වි.පෙ උපාය මාර්ගය පිළි පැන්නවීමක් විය. අගමැති ධුරය කදිර්ගාමර්ට දිය නොහැකි නම් අඩුතරමින් එය මෛත්‍රීපාල සිරිසේනට හෝ දෙන ලෙස ජ.වි.පෙ ඉල්ලා තිබූ බව පසුව වාර්තා විය. ජ.වි.පෙ උපාය මාර්ගය මහින්ද රාජපක්ෂ අගමැතිවීමෙන් අවුල් වී ගියේය.

චන්ද්‍රිකා, මහින්ද රාජපක්ෂ අගමැති කළේ ජනාධිපති ධුරය ඊලග දෙවසර තුළ අහෝසි කර තමන් එතැනට ඒම සඳහාය. විජේදාස රාජපක්ෂ ලවා කඩිමුඩියේ ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කරනා ලදී. මෙවැනි ව්‍යවස්ථා සංශෝධනයක දී කථානායක පදවිය තීරණාත්මක විය.

මේ අතර, නැගෙනහිර යුදබිමේ නව තත්ත්වයක් ඇති විය. නැගෙනහිර කොටි නායක කරුණා, රනිල්ගේ ආණ්ඩුවටත්, පසුව චන්ද්‍රිකාගේ ආණ්ඩුවටත්, යෝජනා කර සිටියේ තමන් සමග වෙනම සාම ගිවිසුමක් ඇතිකර ගැනීමටත්, කරුණා සහ සගයින් 3000ක් හමුදාවට එක්වීමටත්ය. කරුණා අප්‍රියෙල් 04 මහා මැතිවරණයේ දී සිය නියෝජිතයන් 05 දෙනෙකු පත්කර ගන්නට ද ඡන්දය "පාවිච්චි" කර තිබිණි. ප්‍රභාකරන් එවැනි යෝජනාවක් තමනට මාරක

බව දැනගත්තේය. එමිල් කාන්තන් චන්ද්‍රිකාගේ උපදේශකයින් සමග සාකච්ඡා ආරම්භ කළේය. පවාදීම ඇරැඹිණි. අප්‍රියෙල් 10 දා හදිසි ප්‍රහාරයකින් වෙරුගල් හා වාකරේ අල්ලාගත් කොටි, කරුණාගේ සොයුරා වූ රෙජී මරා දමා වැලිකන්ද පාර පැන කරදියනාරු ප්‍රදේශයට ඇතුළු වූහ. ඒ අතර, බාලසිංහම් හා විදේශගත කොටි සාකච්ඡා අරඹා තිබිණි. අවි අතහැර පිරිස විසුරුවා කරුණා සහ හිතවතුන් කොළඹට පළා එන ලදි. කොළඹදී ද ඔවුන් අතරමං කරනා ලදි. ආරක්ෂක හමුදාවල, බුද්ධි අංශවල හා සිංහල සමාජයේ දේශප්‍රේමීන් අතළොස්සක් නොවන්නට කොළඹ දී හා නැගෙනහිර දී ඔවුන් අතුගෑවී යන්නට ඉඩ තිබිණි.

ප්‍රභාකරන් එකක් දැනගත්තේය. එනම්, ශ්‍රී.ල.නි.ප - ජ.වි.පෙ සන්ධානය තමන් සමග යුද කිරීමට බිය බවය. ඔවුනට කිසිම යුද දේශපාලනික සැලැස්මක් නැති බවය. කරුණා පරාජය කිරීමෙන් පසු ප්‍රභාකරන් චන්ද්‍රිකාට ද කොකා පෙන්වීය. ඒ කථානායක තරගයේ දී යූඑන්පී අපේක්ෂකයාට ඡන්දය දීමෙනි.

දින දෙකක සමුළුවක් සඳහා විදේශගතවීමෙන් පසු මා ලංකාවට පැමිණියේ අප්‍රියෙල් 18 දා උදෑසනය. උදයෙන්ම ගොස් පළමුවරට පාර්ලිමේන්තුවට වඩිනා හිමිවරුන්ගේ ගමනට ආශීර්වාද කළෙමු. හිමිවරු ගිහි කථානායක එත්දී අසුන්වලින් නැගිටීම, අසුන්වලට ඇතිරිලි දැමීම, දානය ලබාගැනීම ආදී විනයානුකූල කටයුතු සඳහා අපි විශේෂ වැඩසටහනක් යොදා ගතිමු. ගෙදර ගොස් නිදාගත්තේ සන්ධානයේ අයෙක් කථානායක වනු ඇති බවත්, අපට ඊළඟ සටන ඇතිවන්නේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සිදුවනවිටදී බවත් සිහිකරලමිනි. නමුත් උදේ වරුවේ හදිසියේ නිවසට කඩා වැදුණු උදය මා සමග කීවේ, කථානායක ඡන්ද ප්‍රමාණය සම වී ඇති බවත්, කතළුවේ හිමි හා අපරැක්කේ හිමිගේ ඡන්දය ආණ්ඩුව සඳහා පාවිච්චි කර ඇති බවත්ය. කතළුවේ හිමි හා අපරැක්කේ හිමි ආණ්ඩුව විසින්, රඳවාගෙන සිටි ස්ථාන දෙක පිළිබඳව අප දැන සිටියත් ගැටුම් මගහරවා ගෙන සිටිය යුතු බව වටහාගෙන කිසිවක් නොකර සිටියෙමු. නමුත් මේ සිදුවූ සිදුවීම අප කෝප කරවන්නක් විය. උදයත් මාත් පාර්ලිමේන්තුවට ගොස් අගමැති මහින්දගේ කාර්යාලයට ගියෙමු. බැසිල් රාජපක්ෂ මහතාත් ලලිත් වීරතුංග මහතාත්, එහි විය. අපේ ස්වාමීන් වහන්සේලා සමඟ සාකච්ඡාවෙන් පසු නැවත මෙවැනි බලහත්කාරකම් නොකරන්නට ඡන්ද දෙක නිෂේධ කිරීමට තීරණය කළෙමු. වි.ජ.මු ජයගත්තේය. අගමැති වී තවත් වසර හයක් බලයේ සිටීමට උත්සාහ කළ චන්ද්‍රිකාගේ සැලසුම ව්‍යර්ථ විය. අපි කොටින් සමග පාර්ලිමේන්තුවේ දී එක්වූවා යැයි කියමින් ජ.වි.පෙ හා මංගල දැවැන්ත ප්‍රචාරක යුද්ධයක් ආරම්භ

කළේය. අපි එයට මුහුණ දුන්නෙමු. මෙය ආණ්ඩුවේ මෝඩ උපක්‍රමයක් විය. පහර දී බියකළ හැකි පිරිසක් නොවේ අපි. කථානායක තරගයෙන් මංගල-චන්ද්‍රිකා හා ජවිපෙ දෙවැනි උපායික පරාජය ලබාගත්හ.

ඊළඟ ගැටුම ඇතිවූයේ කතළුවේ හිමි සම්බන්ධයෙනි. උන්වහන්සේ කොළොන්නාවේ හිමියන්ගේ අතිජාත මිත්‍රයෙකු විය. කතළුවේ හිමි ඉල්ලා අස්වීමට කැමති බව කොළඹ විශ්ව විද්‍යාලයේ සේවය කළ දායක සභාවේ අයෙක් අපට දැන්වීය. අපි ඒ අනුව කතළුවේ හිමි සමග සාකච්ඡාවක් ඇතිකර ගත්තෙමු. තියුණු කාල සැලසුමකින් පසු සිකුරාදා දිනයක පාර්ලිමේන්තුවේ දී ඉල්ලා අස්වෙන්නටත් එදිනම නව මන්ත්‍රිවරයා මැතිවරණ කොමසාරිස් ලවා ගැසට් කරවා ගන්නටත්, ඊළඟ සතියේ අඟහරුවාදා නව මන්ත්‍රී ලෙස දයාරතන හිමි දිවුරුම් දෙවීමටත්, අපට හැකි විය. මනාප පොරයට නොයෑමේ ප්‍රතිඵලයක් ලෙස මෙය මුලින්ම මතු වූයේ ජවිපෙටය. ඒ 1994 දීය. ඒ අවස්ථාවේදී ආණ්ඩුව එය කොල්ලකන්නට ගියවිට ජ.වි.පෙ සහායට අපිත් ඉදිරිපත් වීමු. හම්බන්තොට ජයග්‍රහණය කළ අය අස්වී ගලප්පත්ති පත්වුණේ එලෙසය. දැන් අපේ ඡන්දය කොල්ලකෑම සඳහා ජවිපෙ හා මංගල, ශ්‍රීපති, ජෙයරාජ් වැනි කීප දෙනෙක් විවෘතව ක්‍රියාකරමින් සිටියෝය. ආණ්ඩුවේ සියලු ආරක්ෂක විධිවිධාන ඔත්තුසේවා නොමග යවමින් අපි දයාරතන හිමියන් දිවුරුම් දෙන තැනට ගෙන ආවෙමු. එයට පෙරදින උසාවියෙන් ඒ සඳහා අතුරු තහනමක් ගන්නට විජේදාස රාජපක්ෂ මහතා සමත්වුව ද උසාවියේ සාමාන්‍ය ක්‍රමයට අනුව නිවේදනය අතට පත්වීමට පෙර දිවුරුම් දීමට දයාරතන හිමි සමත්විය. හැබැයි ඒ ශ්‍රී.ල.නි.ප - ජ.වි.පෙ සමාජිකයන් පාර්ලිමේන්තුව තුළ අපේ හිමිවරුන්ට පීඩා කරත්දීය. හැමතැනම මෙන් එතැනත් මර්වින් සිල්වා කැපී පෙනුණේය.

අපි කළුතර සිට දැවැන්ත විරෝධතා පෙරහරක් පැවැත්වූ අතර, එය තමන්ගේ දේශපාලන අවශ්‍යතාවයට යොදාගන්නට යූ.එන්.පීය ගත් උත්සාහය නිසා එය ද කෙළවර වුණේ කකුල් අමාරුවලට අමතරව හිතේ අමාරුවලිනි. ගැටුම්වලට මැදිකර අපේ ප්‍රශ්න පුළුල් කර අප දියකර හැරීමේ ආණ්ඩුවේ උපක්‍රමය පළදරනා බව මට පළමුවරට හැඟී ගියේය. ඒ නිසා අපරැක්කේ හිමි ඔහේ සිටියදී පක්ෂ යන්ත්‍රය පිළිසකර කරගැනීමට අපි යොමු වුනෙමු. බොහෝ අපහසුවෙන් පක්ෂ සමුළුවක් පවත්වා නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගතිමු. ඒ දිනය ද බොහෝ කලබලකාරී දිනයක් විය. මන්ද කතළුවේ හිමි සම්බන්ධ සිද්ධියකට අපට උසාවි යෑමට සිදුව තිබූ නිසාය. මේ අතර, ශ්‍රීපතිගේ ආරක්ෂකයෙකු වූ ආමි රොෂාන් නැමැත්තා ඝාතනය කළා යැයි චෝදනාවක්

මංගල සමරවීර අප වෙත එල්ල කළේය. මරා දැමුණු පුද්ගලයාගේ ඥාතියෙකු මා හමුවී ශ්‍රීපතිට චෝදනා කර ශ්‍රීපතිගේ පාතාල සබඳතා ගැන බොහෝ වටිනා තොරතුරු රැසක් ලබාදුන්නේය. ඝාතනය තමන්ට පාරාවළල්ලක් වන බව දැක ශ්‍රීපති ආපසු හැරුණේය.

පක්ෂ සමුළුවේදී තිලක් කරුණාරත්න මහතාගේ ඉල්ලා අස්වීම අපට සිදු වූ මහත් පාඩුවක් විය. පක්ෂයේ ලේකම් මැතිවරණ කොමසාරිස් දන්නා එකම පාක්ෂිකයා නිසා තිලක් ඒ පදවියේ තබන්නට ඇතැම් හිමිවරුන් කැමති වූයේ නැත. එය බොරු බියකි. තිලක් ඒ පදවියට සුදුසු බව තවත් හිමිවරු පිරිසකගේ හා අපේ අදහස විය. පීඩනය මැද ඔහු ඉවත්විය. ඊළඟට ඔහු යූඑන්පීයට ගියේ අප මවිත කරවමිනි. රනිල් හා කරු, තිලක්ගේ කලකිරීම ප්‍රයෝජනයට ගත්තෝය. නමුත් ඒකීය භාවය පිටුදැක යූඑන්පීයේ ෆෙඩරල් ක්‍රමය වර්ණනා කරනා තැනට ඊළඟ ජනාධිපතිවරණයේ දී තිලක් කරුණාරත්න මහතා පත්වූ විට එතුමා ගැන තිබූ ගෞරවය බොහෝ බොඳවී ගියේය.

පක්ෂ සංවිධානය සඳහා සියල්ලන් යොමු කරවන්නට අපි වෙහෙස ගත්තේ ආණ්ඩුවෙන් හා යූඑන්පීයෙන් එල්ලවුණු පීඩනය ඉතා බරපතල වූ නිසාය. ඒ තත්ත්වය තුළ කොළොන්නාවේ සුමංගල හිමියන් ද ඉල්ලා අස්වූහ. උන්වහන්සේගේ ශාසනික කටයුතුවලට ද දේශපාලනය මහත් නරක ආකාරයට බලපා තිබිණි. ඊලගට ධම්මාලෝක හිමියෝ ද ස්වාධීන වූහ. මේ මගින් අපට ඇති වූ පසුබෑම ඉතා විශාල විය. මාධ්‍යවල ඇති වූ නරක ප්‍රතිචාර බොහෝ බලවත් විය. මේ සියල්ල යටපත් කරගත් අපි 2000 සිහළ උරුමයේ පාඩම් ද සිතට ගෙන බොහෝ සීරුවෙන් ඉවසා සිටියෙමු. සියලු සබඳතා එකට එකක් බැඳී ඇති නිසා කාලය ඇතැම් ප්‍රශ්න විසඳන බව බෞද්ධයින් ලෙස දැන සිටීම ප්‍රයෝජනවත් විය.

2004 දෙසැම්බර් පොහොය දින උදෑසන ගෙදර පුවත්පත් බලනාවිට බිම් දෙදරීමක් මට දැනිණි. අපේ ලොකු දුවට ද එය දැනී තිබිණි. විනාඩි ගණනකට පසු ගාල්ලෙන් මට දුරකතන ඇමතුමක් ලැබිණි. ගාල්ල නගරය මුහුදට යටවී යන බව අපේ හිතවතා කීවේය. මට එය නුහුරු දෙයක් විය. ඊළඟට තංගල්ලෙන්, හික්කඩුවෙන්, බේරුවලින් සෑම තැනින්ම ඇමතුම් ආවේය. මම මේ ගැන රතන හිමියන්ට පවසා ඊළඟට අගමැති මහින්දට දැන්වූයෙමි. ඔවුන් මට වඩා තත්ත්වය ගැන දැනුවත් වී සිටියෝය. සුනාමිය නම් ව්‍යසනයක් පැමිණ තිබිණි. අපේ නිවස අසල ඇළ (වැල්ලවත්ත) උතුරා යන්නට සූදානම් වූ අතර, හෝමාගම නිවසට යෑම සඳහා දරුවන් සූදානම් කරගත්තෙමි. පැය

කීපයකින් සිදුවූ ව්‍යසනය පිළිබඳ නිවැරදි තොරතුරු ලැබීමෙන් පසු ආහාර හා ඖෂධ රැගෙන බේරුවලට හා හික්කඩුවට පිටත්ව ගියෙමි.

සුනාමි ව්‍යසනය නැවත අප සියල්ලන් එක් කළේය. ශ්‍රී ලංකාවේ සමාජ සංයුතියේ භික්ෂුවගේ ශාසන කාර්ය භාරය මෙන්ම සමාජ කාර්ය භාරය ද නැවත සහතික විය. භික්ෂුව සහ බෞද්ධ දායකයින්ගේ පරිත්‍යාග නොවන්නට සුනාමි ව්‍යසනයෙන් සිදුවිය හැකිව තිබූ ඛේදවාචකය තවත්, දරුණු වන්නට ඉඩ තිබිණි. එක්සත් ජනපදයේ කැට්රිනා කුණාටුවේදී මෙන් සාගින්නෙන් මියයෑම්, ආහාර මංකොල්ලකෑම්, ඝාතන ආදී කිසිවක් සිදුවූයේ නැත. රජයේ යාන්ත්‍රණයට කලින් බෞද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක විය. පයාගල පිරිවෙනේ වූයේ කිතුනුවන්ය. අම්පාර පිරිවෙනේ වූයේ දමිළයන්ය. මුසුල්මානුවන්ට පානම පන්සලේ රැකවරණය ලැබිණි. බෞද්ධ කෘතවේදීත්වය එහිදී ලොවටම පැහැදිලි විය.

සුනාමියේ දී ජාතික හෙළ උරුමයට මහා පිටුබලයක් වූයේ ඕමල්පේ සෝභිත හිමියන්ය. උන්වහන්සේගේ නැගෙනහිර ආසියානු සබඳතාවලින් පළමු ස්ථිර නිවාස ඉදිකිරීම මසක් ඇතුළත කරන්නට (පානදුරේදී) අපට හැකිවිය. ඒ සියල්ලේ අධීක්ෂණ කටයුතු පළමු මාස හතර තුළ කළේ මාය. ගොඩනැගිලි ඉදිකිරීම ගැන මගේ ඇඟ ඇතුළේ වූ වාස්තු විද්‍යාඥයා අවදි විය. සෝභිත හිමියන් නිවාස 650ක් පමණ රට වටාම ඉදි කළේය. මුළු පක්ෂ යාන්ත්‍රණයම නන් අයුරින් දායක වෙමින් එකට එක්විය.

කදිර්ගාමර් මහතා ඝාතනය වූයේ ද (2004) ඒ අතරය. මෙය ප්‍රභාකරන්ගේ අග්නි පරීක්ෂාවක් විය. ජ.වි.පෙ - ශ්‍රී.ල.නි.ප එක්සත් සන්ධානය දක්වන ප්‍රතිචාරය බලාගැනීමට අමතරව ජාත්‍යන්තර වශයෙන් කොටින්ට ඇති පිළිගැනීම දුරුකිරීමට හැකි ශක්තිමත් චරිත ඉවත් කිරීම ඝාතනයේ අරමුණ විය. ආණ්ඩුව තවත් නිවට විය. කිසිලෙස සිංහලයින් තමනට රැහැනිව නැඟී නොසිටින බවට ප්‍රභාකරන් නිගමනයකට ආවේය. දැන් ඔහුට ඉතුරුව තිබුණේ ජාත්‍යන්තර පිළිගැනීම සහතික කරගැනීම පමණි.

මේ අතර, ආණ්ඩුව තුළ ජවිපෙ ඉතා අපහසුවට පත්ව සිටියේය. දැවැන්ත ප්‍රචාරක රැල්ලක් මගින් වසාගෙන තිබුණ ද අමාත්‍යාංශ පාලනයේ දී ඔවුන් අසාර්ථක විය. එයට හේතු වූයේ චන්ද්‍රිකාගේ නිලධාරීන් එක් අතකින් ද පක්ෂයේ නිලධාරීන් අනෙක් අතින්ද ජවිපෙ ඇමැතිවරුනට සීමා පැනවීමත්, තමන්ම තනාගත් කොටුවල සිට ක්‍රියාකිරීමට සිදුවීමත්ය. ජ.වි.පෙ වැඩිම

වුණොත් අවුරුදු දෙකක් ආණ්ඩුවේ සිටිවීය යන්න මුලසිටම මගේ ස්ථාවරය විය. එය එසේම වන බවට තොරතුරු ජවිපෙ තුළින්ම ගලා ආවේය.

සුනාමිය සඳහා මහනුවරදී පැවැත්වූ ජාත්‍යන්තර ආධාර කණ්ඩායමේ රැස්වීමේ දී රතන හිමියන් ජනාධිපතිනිය හා ආණ්ඩුවේ ක්‍රියාකලාපය විවේචනය කිරීමත් එයට සමාජයෙන් ලැබුණු අනගි ප්‍රතිචාරයත් අපේ විශ්වාසය දියුණු කළේය. ජ.වි.පෙ සිටියේ සසල වෙමිනි. ඊළඟට චන්ද්‍රිකා කිසි පැකිලීමකින් තොරව සුනාමි සහන මණ්ඩලය ගෙන ආවාය. එහි අරමුණ වූයේ නැගෙනහිර වෙරළ තීරය කොටි සංවිධානයට නීත්‍යානුකූලව ලබාදීමත් ඔවුනට ඍජු විදේශ ආධාර නීත්‍යානුකූලව ලැබීමට සැලැස්වීමත්ය. 1776 දී ලන්දේසි ප්ලැක් හා සිංහලේ රජු රාජසිංහ අතර මෙවැනිම එකඟතාවයක් වෙරළ තීරය සඳහා ඇතිවිය. ඒ වෙරළ තීරය නැවත අපට ආපසු ලැබුණේ නැත. 1654 දී ඩෙන්වරු සමග නෝර්විජියානුවන් ද ලංකාවට පැමිණි අතර, ඔවුනගේ ඉලක්කය වූයේ ද වෙරළ තීරයයි. දැන් මේ උතුරු යුරෝපීය බෝල්ටික් ජාතීන් කොටි සංවිධානය ලවා අපගේ නැගෙනහිර වෙරළ අත්පත්කරගන්නට යන බවත්, මෙයට ඉඩදුනහොත් සදහටම එය ඔවුන් සන්තක වන බවත්, අපට පැහැදිලි විය. මේ වනවිට නොර්වේජියානු TGS නොපෙක් සමාගමේ තෙල් ගවේෂණ දත්ත (මන්නාරම් ද්‍රෝණිය) ලැබී තිබූ අතර, එහි රුසියානු උප කොන්ත්‍රාත් සමාගමේ සේවය කළ ලාංකීය ඉංජිනේරුවෙක් මා හට පුද්ගලිකව දැනුම් දුන්නේ තෙල් හා විශේෂයෙන් ස්වාභාවික ගෑස් සම්පතත් තෝරියම් නිෂ්කාසනය සඳහාත් අවශ්‍ය දත්ත රහසේ සැකසෙන බවය. දෙවැනි ලෝක (යුරෝපා) යුද්ධයේ දී කොන්ගෝවට සිදුවූවා සේ අපේ දුර්ලභ සම්පත් සඳහා මහා පරිමාණ අරගලයක් ඇරඹෙන්නට යනවාදෝයි සැකයක් ද ඇතිවිය. තීරක ප්‍රහාරයක් චන්ද්‍රිකාට එල්ලකරන්නට අපි තීරණය කළෙමු.

චන්ද්‍රිකාගේ එක් ගුණාංගයක් එනම් හදවතින්ම දෙමළ ජාතිවාදීන්ගේ තර්ක විශ්වාස කිරීමත්, ඒ අනුව ක්‍රියාකිරීමත් නිසා ඇය යූඑන්පී නායකයින්ටත් වඩා දුෂ්ඨ චරිතයක් ලෙස හඳුනාගතිමු. ජේ.ආර්. හෝ ප්‍රේමදාස කොටි සමග සාකච්ඡා ආදියට ගිය ද ඔවුන් දෙමළ ජාතිවාදී මතය හිසට ගෙන තිබුණේ නැත. එමෙන්ම මේ රටේ බහුතර සිංහල මතයට කන්දීමේ අවශ්‍යතාවය ද දැන සිටියහ.

මාරාන්තික උපවාසයක් මගින් ජාතියම අවදි කළයුතු බව තීරණය කළෙමු. එල්ලාවල හිමියන් රෝහල් ගතවී සිටි නිසා ඕමල්පේ හිමි, කොටපොළ හිමි,

රතන හිමි සහ අපගේ සෙසු හිමිවරු උදෑසනම දළදා මාලිගයට ගොස් ශ්‍රී දළදාව වැඳපුදාගත්හ. ඕමල්පේ හිමි සියරට පැමිණියේ එදින පාන්දර ජාමයේය. මාළිගය දක්වා යන ගමනේදී ශ්‍රී ලංකික ආර්යදේව භික්ෂුවගේ තර්ක විලාසය ගැනත් නාගර්ජුනගේ ශූන්‍යවාදයේ පදනම් ගැනත් සාකච්ඡා කරමින් ගියෙමු. දන්තධාතූන් වහන්සේ වැඳපුදා ගැනීමෙන් පසු පාත්‍ර ධාතුව තැන්පත් කර ඇති ස්ථානයට පැමිණ කාටවත් අවහිර නොවන ලෙස එහි එරමිනියා ගොතා ගෙන තැන්පත් වූ ඕමල්පේ හිමියෝ සිය ජීවිතය දළදා හිමිට කැපකර උපවාසය ආරම්භ කළේ අප සැමගේ නෙත්වල කඳුළු නංවමිනි.

දළදා මාලිගයට මෙය අවමානයක් යැයි කියමින් ඇතැමුන් මේ උපවාසයට අවමන් කිරීමට තැත් කළ ද දියවඩන නිලමේ සමග සාකච්ඡා කර දළදා මන්දිරය ඉදිරිපිටට ස්වාමීන් වහන්සේ වැඩම කරන ලදි. රටම අවදි කිරීම අපේ පරමාර්ථය වූ අතර, දහස් ගණන් ක්‍රියාකාරීන් රටපුරා පන්සල් හා සේවා ස්ථාන කරා පිටත් කරවීමු. තුන්වන දිනය වනවිට ජ.වි.පෙ ආණ්ඩුවෙන් එළියට ආ අතර, වෙනම උපවාසයක් ආරම්භ කළේය. කපටි චන්ද්‍රිකා සුනාමි සහන මණ්ඩල (PTOM) යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනාවේ අගමැති මහින්ද හරහාය. ඒ එතුමා වෙතට ජාතික බලවේගවල වෛරය තල්ලු කර හරින්ටය. උපවාසයේ තුන්වැනි දින තම පැරැණි මිත්‍රයා වූ සෝභිත හිමියන් බැලීමට අගමැති මහින්ද උපවාස භූමියට පැමිණියේය. ඕමල්පේ හිමියන් සමග සාමීචියේ යෙදී ආපසු ගියේය. මහානායක හිමිවරුන් සිව්නම එකට එකතු වී ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කළ අතර, චන්ද්‍රිකා සිය නියෝජිතයන් ලෙස රෝහිත බෝගොල්ලාගම හා විජේදාස රාජපක්ෂ නුවරට එව්වාය.

මහා සංඝයාගේ අනුමැතියෙන් තොරව සුනාමි සහන මණ්ඩලය ක්‍රියාත්මක නොකරන බව චන්ද්‍රිකාගේ ලිඛිත පොරොන්දුව විය. මේ වනවිට රටම මහා උද්වේගයකට පත්වී තිබූ අතර, කොටුව, පිටකොටුව ජනාධිපති මන්දිරයටම උද්ඝෝෂණයේ උණුසුම රැගෙන ගියෙමු. කොටපොළ හිමියන් ද විහාර මහා දේවී උද්‍යානයේ උපවාසයක් ඇරැඹීමට සූදානම පළකළේය.

මහානායක හිමිවරු සතර නම වෙනුවෙන් මල්වතු මහානායක හිමියන් ජනාධිපතිනියගේ පොරොන්දුවේ වගකීම භාරගත් අතර, අපි උපවාසය අත්හළෙමු. අප පසුපස දිගින් දිගටම ජාතිකවාදය කොපි කරමින්

පැමිණි ජවිපෙහි උපවාසය අන්තිමට අවසන් වූයේ පොලීසියේ පැමිණිල්ලක් කර හිමිවරුන් පොලීසිය ලවා උපවාස බිමෙන් ඉවත්කරලීමෙනි. "චම්පිකගේ දහංගැටයට" ජවිපෙ යළි අසුවී ඇතැයි මාධ්‍ය වාර්තා කළේය.

චන්ද්‍රිකා මහනාහිමිවරුන්ට දුන් පොරොන්දුව කඩ කළාය. අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පැතුයෙමු. අගවිනිසුරු ප්‍රමුඛ විනිසුරු මඩුල්ල සුනාමි සහන මණ්ඩලයේ මූල්‍ය පදනම ඉවත් කළහ. එය එතැණින්ම ඉතිහාසයට එක්විය.
පසු කලෙක (2009 මාර්තු) අපේ ආරක්ෂක හමුදා චූන්ඩිකුලමේ සිට මුලතිව් දක්වා වෙරළ තීරය අල්ලා ගත්විට එදා සිදුවීමට ගිය දෙය පැහැදිලි විය. සබ්මැරීන, ටෝර්පිඩෝ, මුහුදු යට උමං පද්ධතිවලින් සමන්විත නවීන මුහුදු කොටි කඳවුරු සංකීර්ණයක් සුනාමියට මුවා වී විදේශීය විශේෂඥයෝ ඉදිකරමින් සිටි බව වාර්තා විය. ඉතින් සුනාමි සහන මණ්ඩලය ආවානම් මුළු නැගෙනහිරම සිදුවන්නේ ඒ ක්‍රියාදාමයය.

උතුර හා නැගෙනහිර වෙන්කිරීමට අගවිනිසුරු දුන් තීන්දුව ද ඓතිහාසික එකක් විය. උතුර හා නැගෙනහිර එක්කළේ හදිසි නීතිය යටතේ නිසාත් එය හදිසි නීතිය අවසන් වනවිට අවසන් විය යුතුය ලෙස තර්කයක් විය. නමුත් විමසිල්ලෙන් එකී ඒකාබද්ධතාවය විමසීමේ දී පෙනී ගියේ අවි සියල්ල ත්‍රස්තවාදීන් භාරදීමෙන් පසු එකී ඒකාබද්ධතාවය වලංගු වන බවය. නමුත් පසුව අවි භාරදීම පිළිබඳ කොන්දේසිය අවි භාරදීම සඳහා මෙහෙයුම් සිදුකරනා බවට ජනාධිපති සෑහීමකට පත්වී ඇතිවිට ලෙස සියුම්ව වෙනස්කර තිබුණි. උතුර හා නැගෙනහිර එක්කර වසර ගණනාවක් ගතවී ඇති නිසා මූලික අයිතිවාසිකම් පෙත්සමකින් එය වෙන්කළ නොහැකි බවත්, මූලික අයිතීන් පිළිබඳ පෙත්සමක් සිද්ධිය සිදුවී මසක් ඇතුළත ඉදිරිපත් විය යුතුයැයි නියමයක් තිබෙනා බවත්, අපේ නීතිඥමතය විය. අපි මේ නිසා කොටපොළ අමරකිත්ති හිමි නමින් උතුර හා නැගෙනහිර වෙන්කිරීම සඳහා පනත් කෙටුම්පතක් ගෙන ආවෙමු. එයට හේතු වූයේ පළාත් සභා පනත යටතේ ඕනෑම මොහොතක ඕනෑම පළාත් දෙකකට ස්ව කැමැත්තෙන් එක්වීමට හැකියැයි කියා නීතිමය ප්‍රතිපාදනයක් තිබීමය. සුනාමි මණ්ඩල නඩුවේදී ද මූලික අයිතීන් පිළිබඳ රාමුව පුළුල් කෙරිණි. අපි සුනාමි සහන මණ්ඩලයට එරෙහි මූලික අයිතීන් නඩුව පැවරුවේ සුනාමියට ගොදුරු වූ නැගෙනහිර පුද්ගලයින් තිදෙනෙකු මගිනි. ජවිපෙ දේශපාලන වාසිය තකා එය සිය

මන්ත්‍රීවරුන්ගේ පෙත්සමක් කළේය. එහිදී මූලික විරෝධයක් ගොඩනැගුණේ එයට සෘජු ලෙස බලපෑමට හසුනොවූවන් මූලික අයිතීන් පිළිබඳ නඩුවක් ගොනු කරන්නේ කෙසේ ද ලෙසය. එවකට සිටි අගවිනිසුරුතුමා එකී තර්කය ද ප්‍රතික්ෂේප කළේය. මේ හෙයින් එතුමා මූලික අයිතීන් පිළිබඳ සංකල්ප පුළුල් කළේය. එය ඇතැමුන්ගේ දැඩි විවේචනයට ලක්විය. විශේෂයෙන්ම එතුමා උතුරු හා නැගෙනහිර තාවකාලික එක්වීම වෙන්කළේ ඊනියා සාම සම සභාපතිවරු මෙන්ම ඉන්දියාව හා ආණ්ඩුවේ ඇතැම් පිරිස්වල ද විරෝධය මතය. ඔහු ගත් ඒ පියවර දෙකම ඓතිහාසික විය.

ජනාධිපතිවරණය 2005ට නොතබා ව්‍යවස්ථා සංශෝධනයක් මගින් එය අහෝසිකර අගමැති ධුරයට පත්වීම සඳහා චන්ද්‍රිකා ව්‍යවස්ථා සංශෝධනයක් විජේදාස රාජපක්ෂ හරහා ගෙන ආවාය. ඒ අතර, යූඑන්පීය 1999 මෙන් ජනබල මෙහෙයුමක් ආරම්භ කළේය. එහි පිටට පෙන්වූ අරමුණ වූයේ 2005ට ජනාධිපතිවරණය දිනාගැනීමයි. එහෙත් යටින් වූ අරමුණ වූයේ චන්ද්‍රිකා ප්‍රකෝපකර ඝාතන සිදුවීම් ඇතිකර පාර්ලිමේන්තුව විසුරුවා ගැනීමයි. පළමුව අගමැති වී පසුව ජනපති වීම කවදත් සෘජු සටනට අකමැති රනිල්ගෙ උපක්‍රමික තේරීම විය.

ජනාධිපතිවරණය 2005ට ලබාගත යුතුයැයි අපි තීරණය කළෙමු. සුනාමි මණ්ඩල සටනින් ජාතික බලවේග ජයග්‍රාහීව රත්වී ඇති නිසා ඒ රස්නය මගින් ජාතික න්‍යාය පත්‍රයක් යටතට ජනාධිපතිවරණය ගැනීම අපේ උපාය මාර්ගය විය. අපි නඩුමගට ගියෙමු. එයට පෙරාතුව පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගොස් 1982 දී සිව් වසරකට පසු ජනාධිපතිවරණයක් කැඳවීමට ජනාධිපතිට බලය දුන් ව්‍යවස්ථා සංශෝධන විවාදය කියවා පිටපත් කර ගතිමි. නීතිවේදී මනෝහාර ද සිල්වා, උදය ගම්මන්පිල හා මා අතර, සාකච්ඡා වට කීපයක් ඇතිවිය. 1982 ව්‍යවස්ථාව සංශෝධනය කර තිබුණේ තම සිව්වෙනි වසර අවසන් වීමෙන් පසු (1982 පෙබරවාරි 04) ජනාධිපතිවරණයක් කැඳවීමට ජයවර්ධනට හැකිවන ලෙසය. නමුත්, 1999 දී චන්ද්‍රිකා එය පාවිච්චි කර තිබුණේ සිය පස්වන වසරට පසුය. අපි මේ විසංවාදය නඩු නිමිත්ත කරගතිමු. එමෙන්ම ඇයගේ ධුර කාලය (මෙය ව්‍යවස්ථාවේ වැරැදි ලෙස සඳහන් වී ඇත්තේ දුර කාලය ලෙසය) ඇයගේ කලින් දිවුරුම් දිනයේ සිට ඇරඹෙන්නේ ද, නව දිවුරුමේ සිට ඇරඹෙන්නේ ද, දෙවන වර දිවුරුමක් අවශ්‍යය ද

යන තර්ක ගොඩනැගිනි. ඇය මිය යනු ඇතැයි බියෙන් තවත් ජනාධිපතිවරණයක් වළක්වා ගැනීම සඳහා නියමිත දිනයට පෙර ඇය දිවුරුම් දී තිබිණි.

අපේ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය විභාගයට ගත්තේය. එවකට අගමැති මහින්ද රාජපක්ෂගේ සමීපතම ආධාරකරුවන්ගේ අදහස වූයේ එතුමා අගමැති වී වසරක් පමණක් නිසා තව වැඩකර ඡන්දයට යා යුතු බවය. තවත් වසරක් ගියහොත් ජනතාවට ආණ්ඩුව සහමුලින් එපා වී කවුරුන් ඉදිරිපත් වුවත් ජයගත නොහැකි වනු ඇති බව අපේ තර්කය විය. එයට එකඟවූයේ බැසිල් රාජපක්ෂ මහතා පමණි. චන්ද්‍රිකා මෙයට තරයේ එරෙහි වූවාය. මෙය තමන්ගේ ව්‍යවස්ථා සංශෝධන උපාය මාර්ගය අවුල් කරන්නක් ලෙස ඇය දුටුවාය. අපට විරුද්ධව ශ්‍රීලනිප ලේකම් මෛත්‍රීපාල සිරිසේන උසාවි ගිය අතර, අනුර බණ්ඩාරනායක ද උසාවියට පැමිණියේය. රනිල් මේ මගින් සිය පළමුව අගමැති දෙවනුව ජනපති උපාය වැරැදී යන නිසා අපෙන් ආයාචනය කළේ නඩුව ඉවත් කරගන්නා ලෙසය. නඩුව දා ජනාධිපතිවරණය 2005ට පැමිණි විට යූඑන්පී ආධාරකරුවන් දැවැන්ත රතිඤ්ඤා සංදර්ශනයක් පැවැත්වූ නමුත් රනිල්ගේ මුහුණේ එළියක් නොවීය. එය අගවිනිසුරු දුන් තවත් ඓතිහාසික තීන්දුවක් විය. චන්ද්‍රිකාගේ ඉරණම තීරණය වූ අතර, රනිල්ගේ ඉරණම තීන්දු කිරීම ජනාධිපතිවරණයට භාර කෙරිණි.

ජනාධිපතිවරණය දිනාගැනීමත් සමග මොහොතක් පමා නොවූ අපි ජනාධිපතිවරණයට සහාය දීම සඳහා පංච ධර්ම ප්‍රතිපත්තියක් (2005 සැප්තැම්බර්) නුගේගොඩ පංච පද්ම පූජාවකදී ඉදිරිපත් කළෙමු. ත්‍රස්තවාදය මැඩලීම, රටේ ඒකීය භාවය සුරක්ෂිත කිරීම, ජාතික ආර්ථිකය ආදිය එහි තේමාව විය. අපි අපේ යෝජනා සමග මුලින්ම රනිල් හමුවුනෙමු. රනිල් සුපුරුදු ලෙස කීවේ තමන් බටහිර රටවලට ෆෙඩරල් ක්‍රමයක් ගෙනඒමට පොරොන්දු වී ඇති නිසාත්, ශ්‍රී ලංකා රජයට සටන් විරාමයෙන් ඉවත් විය නොහැකි නිසාත්, තමනට එය කළ නොහැකි බවය. රනිල්ගේ අවංක ප්‍රකාශය ගැන අපි එක අතකින් සතුටු වූ අතර, රටේ ජාතික ශාසනික බලවේග පිළිබඳ ඔහුට තක්සේරුවක් නොවීම ගැන කනගාටු වීමු. ඔහු කියා සිටියේ කෝට්ටේ ප්‍රභූ භික්ෂූන් කීප දෙනෙකු මගින් බෞද්ධයින් අන්දවා ගතහැකි බවය.

ඊළඟට අපි අගමැති මහින්ද හමුවුනෙමු. එතුමා අපේ තත්ත්වය තේරුම් ගත්තේය. නමුත් ශ්‍රීලනිපයේ බලය චන්ද්‍රිකා සතුවූ නිසා ඒකීයභාවය පිළිබඳව ස්ථාවරයක් ගැනීම ගැන උපාය මාර්ගයක් යෝජනා කරනා ලෙස ඉල්ලා

සිටියේය. රනිල් සමග කොහොමත් සුළු ජාතික පක්ෂ යන නිසා ජාතික හෙළ උරුමය හා ජවිපෙට උචිත ප්‍රතිපත්තිය ගැනීමට ශ්‍රීලනිපයට සිදුවන බවත්, එවිට ඉබේම ජයග්‍රහණය ස්ථිර වන බවත්, පෙන්නා දීමෙන් පසු එකඟතාවය පළවිය.

අගමැති මහින්ද මුලින්ම අත්සන් කළේ කරුණු දොළහකින් යුතු හෙළ උරුමය - එල්ලාවල මේධානන්ද නාහිමියන් සමග එකඟතාවයය. අපි එය රහසක් ලෙස තබාගත්තේ එය ජවිපෙ සමග එකඟතාවයට බාධාවක් වේයැයි සිතාය. සිරිමාවෝ සමග 1988 දී අසාර්ථක වූ සාකච්ඡා පිළිබඳ හොල්මන් මගේ සිතේ නිරතුරු රඟ දැක්විණි. එමෙන්ම ජවිපෙ අභ්‍යන්තර ආරංචි මාර්ග කීවේ තනියෙන් ඡන්දය ඉල්ලිය යුතු බවට කණ්ඩායමක් තරයේ ප්‍රකාශ කරනා බවය. හෙළ උරුමයේ ද නායක මට්ටමේ ප්‍රබල පිරිසක් මොනම හේතුවක් නිසා හෝ ශ්‍රීලනිපයට, මහින්ද රාජපක්ෂට එක්නොවිය යුතු බව ප්‍රකාශ කළෝය. අපි විහාර මහා දේවී උද්‍යානයට සාමාජිකයන් කැඳවා සිය මතය සඳහා ඡන්දයක් ගත්තෙමු. වරක් විශ්ව විද්‍යාලයේදී ද වර්ජනය දිග්ගැස්සීම සඳහා ඡන්දයක් ගත් අතර, දීර්ඝ කතාවකින් පසු මනස වෙනස් කිරීමේ හැකියාව පිළිබඳ මට ලොකු ආත්ම විශ්වාසයක් එදා සිට ඇතිවිය. අපි පාක්ෂික බහුතර කැමැත්ත ද දිනාගත්තෙමු. මුලදී ජවිපෙ ඒකීයභාවය අවධාරණය නොකළේය. ඔවුන් 2004 සන්ධානයේදී ද එය අවධාරණය කළේ නැත. නමුත් අපේ ගිවිසුමේ එය තිබෙනු බව දැක එය ඇතුළු කරගත්හ. ඒ ගැන මුළු ලකුණු ඔවුන් දමාගැනීම ගැන අපේ විරෝධයක් තිබුණේ නැත. මන්ද විජාතික සල්ලිවලින් ගෙන යන රනිල්ගේ ජනාධිපතිවරණය දිනන්නට ජවිපෙ කාඩරය අත්‍යවශ්‍ය බව අප දැන සිටි නිසාත්, ඒ ශ්‍රීලනිපය ඡන්දය මගහරිනා බව අපට හොඳින්ම පැහැදිලි වී තිබූ නිසාත්ය. මුලදී ශ්‍රීලනිප නායකයින්ගෙන් ඍජුව ඉදිරියට ආවේ මංගල, ජෙයරාජ්, ශ්‍රීපති පමණි. රූපවාහිනී වාද විවාදවලට යන්නට සිටියේ ශ්‍රීපති පමණි. පසුව එකා දෙන්නා ප්‍රවාහයට එක්විය. බිම් මට්ටමේ ජනයා නම් පැකිලීමකින් තොරව එක්විය.

ජනාධිපතිවරණය මෙහෙයවීම සඳහා ජාතික මට්ටමේ කමිටුවක් පිහිටුවිණි. මංගල සමරවීර මහතා එහි නිල මෙහෙයුම්කරු වූ අතර, බැසිල් රාජපක්ෂ එහි නොනිල මෙහෙයුම්කරු විය. ඩලස් අලහප්පෙරුම එහි සාමාජිකයෙකු වූ අතර, චන්ද්‍රිකා ගැන අවිශ්වාසයෙන් යුතුව විදේශ ගතවී සිටි ඔහු ආපසු පැමිණියේ මහින්ද රාජපක්ෂ මහතා ස්ථිරව ඡන්දය සඳහා යෝජනා වීමෙන් පසුවය. විමල් වීරවංශ හා අනුර දිසානායක මහත්වරුන් මාරුවෙන් මාරුවට එය නියෝජනය කළේය. ජනාධිපතිවරණයක් මෙහෙයවන ජාතික කමිටුවක

මා සිටියේ පළමුවරටය. නමුත් මහ මැතිවරණ තුනක් ජාතික මට්ටමෙන් මෙහෙයවීම විසින්, මට ලැබී තිබුණු අත්දැකීම් බොහෝ ප්‍රයෝජනවත් විය. විවිධ සාධක දිනාගැනීම, මැතිවරණයේ තීරක මොහොතවල් තීරණය කිරීම උපාය මාර්ග හා උපක්‍රම නිර්මාණය, ජාතික ප්‍රචාරක ව්‍යාපාරයක් සැලසුම් කිරීම විශේෂයෙන් මාධ්‍ය ප්‍රචාරණය පිළිබඳ නව උපාමං සැකසීම සිදුවිය. අපට මහත් ප්‍රයෝජනයක් වූයේ වරින් වර ලැබුණු සමීක්ෂණ වාර්තාවන් හා අරලියගහ මන්දිරයට වගකියනා නිලධාරීන්ගෙන් ලැබුණු තොරතුරුය. ඒ අනුව උපායික ක්‍රියා සැලසුම්කරනා ලදී.

හෙළ උරුමයෙන් ජාතික ප්‍රචාරක රැලිවලට දායක වූයේ මා පමණය. මගේ දායකත්වය ද බස්නාහිර පළාතට සීමා විය. නමුත් අපි ජාතික හෙළ උරුමය ලෙස මහින්ද රාජපක්ෂ වෙනුවෙන් වෙනම බොදු හමු පැවැත්වීමු. පැවැත්වූ දැවැන්ත භික්ෂු හමුවකදී ඒකීය රාජ්‍යය දිනවීම පිණිස යෝජනාවක් ද සම්මත කරගතිමු. පසුව ඇතැම් නායක හිමිවරු තමන් එහි නොසිටි බව කියන්නට වුව ද එමගින් සාතිශය බහුතරයක් භික්ෂු පරපුරේ අනුමැතිය ජනපති මහින්දට ලැබිණි. ජාතික හෙළ උරුමයට 2004 දී ලැබුණු ඡන්දයෙන් 65%ක් මහින්ද රාජපක්ෂට ලබාගැනීම අපේ ඉලක්කය විය. ලක්ෂ 48 සීමාව පැනගතහොත් ජයග්‍රාහකයා මහින්ද රාජපක්ෂ බව අපේ ස්ථාවරය විය. අපි ඒ ඉලක්කයට වැඩකරන්නට වීමු.

මෙහිදී ඇතැම් ප්‍රභූ භික්ෂූන් වහන්සේලා රනිල් වික්‍රමසිංහ මහතා සමග සිංහල විරෝධී, බෞද්ධ විරෝධී පිරිස් පොදිගැසී සිටිනා බව දැන දැනම ඔහුට සහාය දෙන්නට විය. ඒ බොහෝ දෙනා කොළඹ වැඩ වාසය කළ සර්ව ආගමික සමුළු ආදිය පවත්වමින් විජාතික න්‍යායපත්‍රවලට වැඩකළ එයින් යැපුණු අය වූහ. ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ පුද්ගලික ජීවිතය පෙන්වා උන්වහන්සේලා බියවද්දා තිබිණි. දැන් අරලියගහ මන්දිරයේ නිතර නිතර බණට වඩින ප්‍රකට හිමිනමක් දෙහිවල විහාරස්ථානයක පැවැති බෞද්ධ උත්සවයකදී ප්‍රසිද්ධියේ මගෙන් ප්‍රශ්න කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපති වන්නේ වීරකැටිය ප්‍රාදේශීය සභාවට ද කියාය. උන්වහන්සේගේ උපහාසයේ තිබුණේ මහින්ද රාජපක්ෂ මහතා විදේශගත අධ්‍යාපනය නොලැබූ අයෙක් නිසා ඔහුට විදේශ රටවල් කළමනාකරණය කළ හැකි ද යන්නය. ජනාධිපති බවට පත්වීමෙන් පසු මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය පළමු දේශනය විදේශ තානාපතීන් අරභයා කළේ සිංහලයෙනි. එතුමා වරක් සිංහල භාෂාවෙන් එක්සත් ජාතීන් (2007) ඇමැතූ අතර, එහි තිබූ ඇතැම් අඩුපාඩු අන්තිම මොහොතේ සකස් කළේ මාය. ඊළඟ අවස්ථාවේ එතුමා දෙමළ භාෂාවෙන් ද එක්සත් ජාතීන්

ඇමැතුයේය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේදී මානව හිමිකම් සභාවලදී අපට එරෙහිව බලගතු රටවල් පෙනී සිටියදී ඒවායේ බහුතර බලය ජයගන්නට අපි සමත්වීමු. ගමේ මිනිසුන් ගැන නගරයේ ඇතමුන් මොනතරම් හැල්ලුවට සිතනවාද කියා මට ඒ ජනාධිපතිවරණයේ දී තදින් දැනිණි. එයින් මාගේ අධිෂ්ඨානය තවත් දැඩි වූයේය.

මහින්ද රාජපක්ෂ මහතාට සහාය දෙන පක්ෂ 26ක් විය. ඒ අතර, එතුමා ජාතික හෙළ උරුමය සමග හා ජවිපෙ සමග වෙන වෙනම ජාතික එකඟතා ඇතිකරගෙන තිබිණි. ශ්‍රීලනිපයේ තවමත් නායිකාව වූයේ චන්ද්‍රිකාය. මේ නිසා ඒකීය රාජ්‍යය වැනි සංකල්පයකට ඇයගේ අනුමැතිය ගැනීම ජනාධිපති අපේක්ෂකත්වය ලබාගැනීමටත් වඩා දුෂ්කර කාර්යයක් විය. 2004 මහා මැතිවරණයේ දී ජවිපෙට පවා ශ්‍රීලනිපය ඒකීයභාවයට ගත නොහැකි විය. මේ සියලුදෙනා එක්කර එක ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තැනීම අතිශය දුෂ්කර කාර්යයක් විය. ශ්‍රීලනිපයේ ප්‍රතිපත්තිය ලෙස ඒකීය ද - එක්සත් ද කියා කිසිවක් සඳහන් නොවන ලියවිල්ලක් ද වරක් ඩලස් මා වෙත යොමුකර තිබිණි. පොදු ප්‍රතිපත්තිය තැනීම සඳහා ශ්‍රීලනිපයට හිතවත් විශ්ව විද්‍යාල ඇදුරන් කීපදෙනෙකු පත්කර තිබුණු අතර, ප්‍රායෝගිකව එය ලිවීම සඳහා ලලිතසිරි ගුණරුවන්, අජිත් කබ්රාල් හා ජගත් වැල්ලවත්ත යන මහත්වරු ක්‍රියා කළහ. සියලු පක්ෂ ඔවුන්ගේ යෝජනා ලබාදී තිබිණි. දින සති ගතවුන ද ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් වූයේ නැත. ඒ අතරේ සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොටස් යූඑන්පිය අතට පත්වී එය රනිල්ගේ ප්‍රතිපත්තියට එක්වී ඇති බව ද වාර්තා විය. අපේ ප්‍රතිපත්ති භාරදීමට ගියවිට මා දුටුවේ ප්‍රකාශන කීපයක්ම තනා ඇති බවය. එහි තිබූ මුළු පිටු ගණන 713ක් විය. (එය තවම මා සතුව ඇත) මේ පිළිබඳව අගමැති මහින්ද රාජපක්ෂ හා බැසිල් රාජපක්ෂ මහත්වරුන් සමග වරක් සාකච්ඡාවක් ඇති වූ අතර, මෙලෙස සියලුදෙනා තෘප්තිමත් වන ප්‍රතිපත්ති ප්‍රකාශයන් තැනීම කළ නොහැකි කාර්යයක් ලෙස පෙන්නා දුනිමි. එවිට අගමැතිතුමා මට යෝජනා කළේ සුදුසු පරිදි හැකි ඉක්මණින් සියල්ලන්ට ගැලපෙන දෙයක් පිටපත් කරනා ලෙසය. ඒ අනුව එක් දිනක් ගෙන සියලු යෝජනා කියවීමි. එහි දළ සාරංශයක් ලබා ගතිමි. පසුදින බැසිල් රාජපක්ෂ මහතා සමග අග්‍රාමාත්‍ය කාර්යාලයේදී හමුවුනෙමි. එය කදිම ගොඩනැගිල්ලකි. එය මා එහි ගිය පළමු වතාවය. වරක් මට නීතිවේදී චූලා ද සිල්වාගේ ඥාතිවරියක වූ නෙලුෆර් මැඩෝන්සා කීවේ එය ඔවුන්ගේ මහ ගෙදර ලෙස කලක් වැජඹුණු බවයි. කෙලින් වැඩකරනා ගැහැනියක් ලෙස නෙලුෆර් ජනප්‍රිය වූ අතර, වරක් යුක්තිය පුවත්පතේ ඇය ත්‍රස්ත විරෝධී

ව්‍යාපාරයේ පත්‍රිකා බෙදන දර්ශනයක් පළකර ලියා තිබුණේ කොළඹ නෝනා හාමුලාගේ සිංහල දේශපාලනය ලෙසයි. අග්‍රාමාත්‍ය කාර්යාලයේ මා සිත් ගත්තේ එහි ඇමැති මණ්ඩල කාර්යාලයයි. එය මගේ ප්‍රියතම සිත්තරකු වන ජයසිරි සේමගේ ගේ චිත්‍රවලින් අලංකාර වී තිබිණි. වරක් අපේ රතන හිමියන්ගේ ගමේ හිතවතෙකු වූ මොටාගෙදර වනිගරත්න සිත්තරා කීවේ සේමගේ අනුකරණය කරන්නේ සිය ශෛලිය බවය. එහි ඇත්තක් තිබිණි. නමුත් සේමගේ මොටාගෙදරගේ සම්ප්‍රදාය වඩාත් සුකුමාල ලිහිල් සරල මෙන්ම තැන්පත් රටාවක් බවට පත්කළේය. ප්‍රේමදාස මහතාගේ රුචිකත්වය ගැන යම්කිසි ඉවක් තිබුණු මට ඔහු සේමගේ තෝරාගැනීම ගැන පුදුමයක් ඇතිවිය.

මේ වනවිට කුමන ආකාරයක සැකැස්මක් ප්‍රතිපත්ති ප්‍රකාශනයට තිබිය යුතු ද යන්න ගැන අදහසක් මට තිබිණි. එය සම්ප්‍රදායෙන් මිදී, "මා" උක්ත කර නවකතාවක ස්වරූපයෙන් ලිවිය යුතු බවත්, එවිට පක්ෂවලට කිසිවක් කිවනොහැකි බවත්, සියලුදෙනා වට වී ඇත්තේ මහින්ද රාජපක්ෂ නම් පුද්ගලයා වටා බවත්, මම බැසිල් රාජපක්ෂ මහතාට පැහැදිලි කළෙමි. එක් කොටසක් ලියා පෙන්වන්නැයි ඔහු ඉල්ලා සිටියේය. අමාරුම කොටස වන ත්‍රස්තවාදය සම්බන්ධ කොටස ලියන්නට තීරණය කළෙමි. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ වූ විශේෂ කාමරයකට (එය මංගල සමරවීර මහතා පරිහරණය කළ කාර්යාලයක් විය) ගොස් පැයක් ඇතුළත ලියවිල්ල ලියා ගෙන ආවෙමි. නොබෙදුණු රටක්, බහුතර සම්මුතියක්, ගෞරවනීය සාමයක් තේමාව සහිත පරිච්ඡේදය ලියැවුණේ එලෙසය. බැසිල් මහතා එය රැගෙන ගොස් පසුව අගමැතිතුමා සමග සාකච්ඡාවක් පැවැත්වීය. විවිධ ප්‍රශ්න මගෙන් අසනු ලැබූ අතර, සියලුදේට පිළිතුරු දුනිමි. එදිනම එය අනුර දිසානායක මහතා හරහා ජවිපෙට යැවිනි. ඔවුන් වෙනස්කම් දෙකක් කළේය. එකක් නම් මා උතුරු හා නැගෙනහිර ප්‍රශ්නය ලෙස නම්කර තිබූ "සංසිද්ධිය" ඔවුන්, "ජාතික ප්‍රශ්නය" ලෙස නම්කිරීමයි. ජනවාර්ගික අර්බුදය, ජාතික ගැටලුව වැනි වදන්වලට ජනවර්ග දෙකක හෝ ජාතීන් දෙකක ප්‍රශ්නයක් හැඟවෙන නිසා ඒවා භාවිතයෙන් වැළකී සිටීම මගේ ස්ථාවරය විය. ඇන්ටන් බාලසිංහම් පවා ශ්‍රීලංකාවේ ගැටලුව ජාතික ප්‍රශ්නයක් (National Question) ලෙස ගත්තේ එය ජාතීන් දෙකක් අතර ප්‍රශ්නයක් ලෙස, හුවා දක්වන්නටය. අකමැත්තෙන් වුව එය යොදන්නට සිදුවිය. දෙවැනි කරුණ වූයේ "පුද්ගලයාට බලය බෙදීම" යන සංකල්පය ගෙනඒමයි. එයට නම් කිසිඳු විරෝධතාවයක් නොවීය. දීර්ඝ සාකච්ඡාවකින් පසු එකී ශෛලියෙන්ම සෙසු පරිච්ඡේදයන් ද ලිවීමට තීරණය කෙරිණි. කුඩා අනුමාතෘකා අංග ද සහිතව දින දෙකකින් පිටු සියයකට

ආසන්න මුළු ලියැවිල්ලම සකස් කළෙමි. මෙහිදී ගැමි ප්‍රබෝධය පිළිබඳව වූ "ගම නැගුම" වැඩ පිළිවෙළ ගැන වරක් රාත්‍රියේ සාකච්ඡාවක් විය. අගමැති මහින්ද හා බැසිල් රාජපක්ෂ යන දෙපොලම සිය ගම ගැන කළ කතාවන්ගෙන් මට හැඟී ගියේ අපි තෙත් කලාපයේ ජීවත් වූවද, ඔවුන් කටුක වියළි කලාපයේ ජීවත් වූව ද, වයස් කාණ්ඩ දෙකකට අයත් වූව ද අත්දැකීම් බොහෝවිට එකක් බවයි. මගේ කුඩාකල සිහිනය වූයේ සෝවියට් පන්නයේ සාමූහික ගමක් හා පොදු පහසුකම් සැපයීම සිදුකිරීමයි. පසුව මම ඒ අදහස වෙනස්කර ගත්තෙමි. ගම ගොඩනැගීම සිදුකරන්නේ කෙසේද යන්න අපේ ප්‍රධාන තේමාවක් විය. ජල සංරක්ෂණය, පාංශු රක්ෂණය පොදු පහසුකම්, පරිසර හිතවාදය ඇතුළත්වූ ගම නැගුම හා ජාතික සවිය වැඩසටහන් නිර්මාණය වූයේ එසේය. ගම නැගුම යටතේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස පසුව අපේ ගම ද ගොඩනගා එය ජනතාවට පැවරීමට හැකිවීම මා ලද මහත් භාග්‍යයක් විය. ගම නැගුම බොහෝ උත්සවවලදී මට නිම් නැති සතුටක් ඇතිවන්නේ එදා රාත්‍රීයේ අපි කළ සුහද කතාබහ යථාර්ථයක් වනු දැකීමෙනි.

ඒ දිනවල දිනක් මම හිතවත් නාවුක ඉංජිනේරුවෙකුගේ ගෙදර ගියේ පරිගණක මෘදුකාංගයක් ඉල්ලා ගැනීමටය. කිරුළපන පදිංචිව සිටි ඔහු හා බිරිඳ මට කීවේ ඔවුනට කුඩුකාරයින්ගෙන් බොහෝ කරදර ඇති බවයි. වැලක රෙද්දක් එළන්නත් බැරි බවය. "අනේ ඔය ජනාධිපතිවරණයේදීවත් මේ මතට තිත තියන්නකෝ " කියා ඒ දෙපොළ මාගෙන් ඉල්ලා සිටියහ. "මතට තිත" වැඩපිළිවෙළට සංකල්පය ආවේ එලෙසය. පසුව අමද්‍යප සමිති එක්වී ඕමල්පේ සෝභිත හිමියන් හරහා පාර්ලිමේන්තුවට පනතක් ගෙනඑන ලදි. එය පසුව සෞඛ්‍ය ඇමැතිතුමා විසින්ම ඉදිරිපත් කරනා ලද අතර, අගවිනිසුරු සරත් සිල්වා බියර් මුදලාලිලාගේ ඉල්ලීම තඹයකට නොගෙන පනත සම්මත කිරීමට ඉඩහසර තනාදුන්නේය. ශ්‍රී ලංකාවේ බියර් ව්‍යාප්තියට වැඩිම සේවය කෙරුණේ චන්ද්‍රිකාගේ ආණ්ඩුවෙනි. පසුව මත්ද්‍රව්‍ය අධිකාරියක් පිහිටුවා රට පුරා "මතට තිත" වැඩ පිළිවෙළ දියත් කළේ අතුරලියේ රතන හිමියන්ගේ ප්‍රධානත්වයෙන් අපේ ස්වාමීන් වහන්සේලා විසිනි. මඩිහේ හිමි, සෝම හිමි, මාදුළුවාවේ හිමි ආදී හිමිවරු සිංහයා බියර්වලට යොදාගැනීම ගැන ගෙනගිය සටන ජයග්‍රහණයෙන් කෙළවර කරගන්නට අපට හැකිවිය. තරුණ පරපුර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිකර දුර්වල ජාතියක් ඇතිකිරීම සඳහා වැඩපිළිවෙළක් බෞද්ධ විරෝධීන් සූක්ෂමව ගෙනයන බව ද කලින් සඳහන් කළෙමි. ඉංග්‍රීසින් විසින්, ඇතිකළ මේ දුර්ගුණය නිසා ඕස්ට්‍රේලියාවේ නිජබිම හිමි ඇබෝර්ජින්වරු විඳිනා දුක දුටුවිට සිංහල-දෙමළ මිනිසුනට ඔවුන් සිදුකර ඇත්තේ එතරම් අපරාධයක් නොවන බව හැඟී ගියේය. ජාතික සවිය,

නැගෙනහිර නවෝදය වැනි ව්‍යාපෘතිවල නම් ඇසෙනා සැමවිටම මට දැනෙන්නේ පිටු සිය ගණනක මහා ප්‍රතිපත්ති ප්‍රකාශනය සංස්කරණය කිරීමට මා දැරූ වෑයමයි. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කටයුතු සිදුවේදැයි සෙවීමට පසු විපරම් සභාවක අවශ්‍යතාවය පසුව මතු වූ අතර, එය සකස්කරගෙන ආවේ උදය ගම්මන්පිල විසිනි. ගුණරුවන් හා ජගත්, ආචාර්ය ජයසුන්දර සමග වාද වෙමින් බොහෝ ආර්ථික සහනාධාරවල ප්‍රායෝගික පැත්ත ගැන සොයාබලා සටහන් කරනා ලදි. ආචාර්ය ජයසුන්දරට රටේ ආර්ථිකයේ ඉලක්කම් ගැන තිබුණා වූ අවබෝධය ගැන සතුටු වුනෙමි. වරක් එතුමා අප අමාත්‍යාංශයේ උඩුමහලක් විවෘත කිරීමට පැමිණීමේ උත්සවයක ඡායාරූපයක් දැකීමෙන් පසු හිටපු අගවිනිසුරුතුමා මා සමග අමනාප වූ බවක් ද වාර්තා විය. ප්‍රතිඵලය වූයේ අපේ පරිසර සංරක්ෂණ බදු පනත හෙතෙම අධිකරණ ක්‍රියාවකින් කලකට අත්හිටුවීමයි. එය සම්මත කරගැනීම සඳහා බොහෝ කරුණු අධිකරණයට කීමට අපට සිදුවිය. උත්සවයක් හා පුද්ගලික ආරවුලක් ජාතික ප්‍රශ්නයක් වූයේ එසේය.

රනිල්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අපට කලින් නිකුත් විය. එය දුර්වල එකක් විය. එහි ඇති ඇතැම් කරුණුවලට ද පිළිතුරු දෙමින් අංගසම්පූර්ණ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සැකසුවෙමු. අජිත් කබ්රාල් මහතා සුදුසු ලෙස සංශෝධනය කරමින් එය ඉංග්‍රීසියට නැගුයේය. මෙයට චන්ද්‍රිකාගේ අනුමැතිය ගැනීම දුෂ්කර විය හැකි බව මේ පිළිබඳව උනන්දුවෙන් කටයුතු කළ ශ්‍රීපතිගේ අදහස විය. මෙය පක්ෂයේ නොව මහින්ද රාජපක්ෂගේ පුද්ගලික අදහස බව මාගේ තර්කය විය. ජනාධිපති අපේක්ෂකත්වය ගත්තා සේ මෙයත්, ලොක්කීගෙන් අනුමත කරගන්නා බව සිනාමුසු මුහුණින් අගමැතිතුමා කීවේය. සිය ආර්යාව සමග එහි ගොස් සුහද තේ පානයකින් පසු එතුමා ජයග්‍රාහීව ආපසු ආවේය. අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය මුද්‍රණයට යැව්වෙමු. රාත්‍රියේ කවුදෝ චන්ද්‍රිකාට "ඒකීය භාවය" ශ්‍රීලනිපය පිළිගෙන ඇතැයි දන්වා තිබේ. එවිට ඇය සැමදා මෙන්ම පමා වැඩි වී සිටියාය. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය මිලියන 04ක් මුද්‍රණය කෙරිණි. ඒ සඳහා උපකාරී වූයේ ප්‍රසිද්ධ පුවත්පත් සමාගමකි. එය බෙදාහැරීමේ දී තීරක කාර්යභාරය කළේ ජවිපෙයි. අපේ ජාලයන් හරහා ද ලක්ෂ 03කට ආසන්න ප්‍රමාණයක් බෙදා හැරිමුත් අතිවිශාල බහුතරයක් ප්‍රතිපත්ති ප්‍රකාශන ජනතාව අතරට ගියේ ජ.වි.පෙ කාඩරය මගිනි. චන්ද්‍රිකා ඉතා දක්ෂ ලෙස ශ්‍රීලනිප යාන්ත්‍රණය අඩපන කර තිබුණාය. ඇතැම් මැති ඇමැතිවරු විදේශ ගතවූ අතර, තවත් අය චන්ද්‍රිකා සමග සාප්පු සවාරි යන දර්ශන ද පළවිය.

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ සිදුවූයේ පුදුමාකාර පසුබෑමකි. අගමැති මහින්ද වෙනුවෙන් සෘජුව පෙනී සිටියේ ස්වාධීන රූපවාහිනිය පමණි. වාණිජ කලා මාධ්‍ය මගින් ජනතාව ආකර්ශනය කර තිබූ පුද්ගලික රූපවාහිනී කෙලින්ම වික්‍රමසිංහ මහතාගේ ප්‍රචාරක මාධ්‍ය බවට හැරවිණි. ආණ්ඩුවේ ජාතික රූපවාහිනිය පවා යම් දුරකට අක්‍රීය වී තිබිණි. එමෙන්ම ඉතා කාර්යක්ෂම ලෙස විද්‍යුත් පරිගණක ජාලයන් හා ජංගම දුරකතන ජාලයන් ද විපක්ෂය විසින් යොදා ගැනිණි. විශේෂයෙන් නව තරුණ පරපුර හා වෘත්තීයවේදීන් එහි ඉලක්කය විය. මෙහි බලපෑම අපට දැනුණේ මැතිවරණ ප්‍රතිඵලයේදීය. මගේ තක්සේරුව වූයේ ජනවාර්ගික හා ආගමික ලෙස බෙදී ගිය ජනාධිපතිවරණයේ දී බෞද්ධයින්ගෙන් 65%ක් එනම් තුනෙන් දෙකක් මහින්ද රාජපක්ෂට ඡන්දය දෙනු ඇති බවයි. එමෙන්ම මුස්ලිම්, දෙමළ, කතෝලික ආදී ජාතික, ආගමික කණ්ඩායම්වල සාතිශය බහුතරය රනිල් වික්‍රමසිංහයන්ට ලැබෙනා බවයි. බිෂොප්වරු, මූලධර්මවාදී කිතුණුවන්, ඉස්ලාම් මූලධර්මවාදී බලවේග, දෙමළ ජාතිවාදී බලවේග සියලුදෙනා ඉතා තීරණාත්මක ලෙස ක්‍රියාත්මක වී තිබිණි. කෙසේවෙතත්, අපේ ඉලක්කය තිබුණේ ඡන්ද ලක්ෂ 04කින් පමණ ඉදිරියට එන්නටත් ඡන්ද ලක්ෂ 48 ඉක්මවීමත්ය. සන්ධානයේ ලක්ෂ 42 හා ජාතික හෙළ උරුමයේ ලක්ෂ 3½ ක් ද, නව ඡන්ද ලක්ෂයක් පමණ ද අපි බලාපොරොත්තු වූයේ සංගණන ප්‍රතිඵල දෙස ද බලමිනි. නමුත් අධික ලෙස යෙදවුණු විපක්ෂයේ විද්‍යුත් මාධ්‍ය පෙළහර විසින්, අළුතින් ඡන්දපොළට කැඳවුනු ලැබූ 05%ක පමණ පිරිසෙන් සාතිශය බහුතරය (70%ක් පමණ) විපක්ෂ නායකවරයාට කැමැත්ත පළකර තිබිණි. සාමාන්‍යයෙන් ජයග්‍රාහී රැල්ලකදී 5-7% අතර ද, ඡන්ද දායක විචලනයන් ඇතිවන බව අපේ ජාතික මැතිවරණ ප්‍රතිඵල විග්‍රහයකදී පෙනී යයි. නමුත්, මාධ්‍ය සංග්‍රාමයකින් මෙවැනි ප්‍රතිඵල වෙනසක් ඇතිවේයැයි අපි සිතා තිබුණේ නැත.

නැගෙනහිර දෙමළ ප්‍රදේශවල ඡන්දය සඳහා අපි වැඩපිළිවෙළක් යෙදුවෙමු. නමුත් අපි නොසිතූ ලෙස කරුණාගේ හිතවතුන් ලෙස, මැතිවරණය ජයග්‍රහණය කළවුන් පවා විපක්ෂ නායකයාගේ ඡන්ද ව්‍යාපාරයට කැපවී තිබූ අයුරු දැකගන්නට තිබිණි. නැගෙනහිර මුස්ලිම් ජනයාගේ බලපෑම ද දෙමළ, සිංහල ඡන්ද දායකයාට බලපා තිබිණි. මෙය මධ්‍යම පළාතේ ද සිදුවූ "ආසන්න ප්‍රදේශයේ උණුසුම" පිටතට ගලායෑමේ ප්‍රතිඵලයයි. නැගෙනහිර කරුණා සමග සිටි පිරිස්වල ඉතුරුවී සිටි පිරිස් යොදාගෙන සිදුකරලීමට උත්සාහ කළ ඡන්ද ව්‍යාපාරය ද චන්ද්‍රිකාගේ අණ පරිදි ආරක්ෂක අංශ අවුල් කරනා ලදි. අපි යාපනයේ ද එවැනි උත්සාහයක් දැරුවෙමු. මන්ද වසර 2000 දී කොටි යාපනයේ දොරකඩ සිටිය දී චන්ද්‍රිකා ඡන්ද 52,000ක් ගෙන යාපනය

ජයග්‍රහණය කර තමන් ඝාතනය කිරීමට තැත්කළ කොටින්ට පාඩමක් කියාදුන් නිසාය. ඩග්ලස්ගේ සහායයෙන් දියත්කිරීමට ගිය වැඩපිළිවෙළට චන්ද්‍රිකා ආරක්ෂක අවසරය නොදීමෙන් සම්පූර්ණයෙන් අවුල් කළාය. වන්නියේ හා නැගෙනහිර ඇතැම් කොටි ප්‍රදේශවල ඡන්ද ලක්ෂ දෙකක් පමණ බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටිවලට වැටීම වැළැක්වීම පිණිස ඡන්ද පෙට්ටි ආරක්ෂක හමුදා බලප්‍රදේශවල පමණක් තැබිය යුතුයැයි කියා අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ද තීන්දුවක් ගත්තෙමු. විපක්ෂය බලයේ සිටියදී (2002-04) ආරක්ෂක හමුදා පත්කර තිබූ නින්දිත තත්ත්වය නිසා ආරක්ෂක හමුදාවල නම් යම් පිබිදීමක් ඇති වී තිබිණි. ගෝඨාභය රාජපක්ෂ මහතා මැතිවරණ ක්‍රියාදාමයට එක්වීමත් සමඟ කලකිරී සිටි හමුදා පිරිස් මෙන්ම යුද්ධය වෙනුවෙන් කැපකිරීම් කළ ආබාධිත සොල්දාදුවන් ද, මියගිය සෙබළුන්ගේ පවුල්වල ද පිබිදීමක් ඇතිකිරීමට හිටපු හමුදා නායකයින් වූ එම්.ඩී. ප්‍රනාන්දු, ශාන්ත ජයතිලක වැනි අය සමත්වූහ.

ප්‍රභාකරන් ඡන්දය දැමීම වැළැක්වීමට මෙවර ද ක්‍රියාකරනා බව ඡන්දයට පෙරදා හමුදා බුද්ධි අංශ මගින් දැන ගතිමු. 2004 ඡන්දයේ දී බස් රථ යොදවාගෙන කළ ඡන්ද මංකොල්ලය වෙනුවට බලහත්කාරය යාපනය වැනි ප්‍රදේශවල ද යෙදවී තිබිණි. දෙමළ ජනයාගේ මේ ප්‍රජාතාන්ත්‍රික අයිතිය උදුරාගැනීම ගැන සම්පූර්ණ වගකීම 2002-04 ආණ්ඩුවේ ත්‍රස්තවාදයට නිරායුද ජනයා බිලිදුන් "පොංගුතමිල්" වැඩපිළිවෙළ භාර ගතයුතුය. පසුව රනිල් වික්‍රමසිංහගේ ප්‍රධාන චෝදනාව වූයේ මහින්ද රාජපක්ෂ ප්‍රභාකරන් සමග ගිවිසුමක් ගසා ඡන්ද වැළැක්වූයේය යන මතය ප්‍රචාරණය කිරීමය.

1982 සිට පවත්වන ලද සියලු ජනාධිපතිවරණ සිය ශක්ති ප්‍රමාණයේ හැටියට වේලුපිල්ලේ වර්ජනය කළේය. එයට හේතුව තමිල් ඊළාමයේ ජනාධිපති තමාය යන හැඟීමය. 2005 ජනාධිපතිවරණයේ දී එය යාපනය වැනි හමුදාව සතුව තිබූ ප්‍රදේශවලට ද ව්‍යාප්ත වූයේ ආණ්ඩුවේ මුග්ද සාමය නිසාවෙනි. අනෙක් අතින් හමුදා බලප්‍රදේශවල පවත්වන මැතිවරණයක දී තමනට සිතූ හැටියේ ඡන්ද පෙට්ටි පිරවීමට කොටින්ට හැකිවන්නේ ද නැත. පෙරළා දකුණ, බස්නාහිර, උතුරු මැද, වයඹ, සබරගමුව වැනි සිංහල ප්‍රදේශ අතිවිශාල වැඩි ඡන්දයකින් දිනා ඒ ප්‍රතිඵලය වන්නියේ දෙමළ ඡන්දවලින් ආපසු හැරුණා නම් රට තුළ ඇතිවන්නේ කැරැල්ලකි. එමෙන්ම විපක්ෂයේ චෝදනාව ඇත්ත යැයි ගත්ත ද වේලුපිල්ලේ ප්‍රභාකරන් ප්‍රථමවතාවට රැවටීමේ ශූරකම, මහින්ද රාජපක්ෂට ලැබෙන්නේය. මන් ද එයට පෙර ඔහු

ගනුදෙනු කළ සියල්ලෝම ඔහු විසින්, රැවටීමට ලක්කර මරාදමා හෝ මරාදැමීමට තැත්කර හෝ තිබුණු හෙයිනි.

ජනාධිපතිවරණ ප්‍රතිඵලය රාත්‍රියේ නිදිවරා ඇසීමටත් මට අවශ්‍යතාවයක් නොවීය. ප්‍රතිඵලය එතරම්ම ස්ථිරවී තිබිණි. ඡන්දය දී ඡන්ද මධ්‍යස්ථාන කීපයකට ගොස් ඡන්ද ගණන් කිරීම සඳහා අප පොරොන්දු වූ නියෝජිතයන් යැවීමෙන් පසු ගෙදර ගොස් නිදා ගතිමි. උදෑසන මා අවදි කළ අපේ පක්ෂයේ සගයෙකු කීවේ රනිල් ළඟටම ඇවිත් ඇති බවත්, ඇතැම්විට ජයග්‍රහණය කිරීමට පවා ඉඩ ඇති බවත්ය. දුරකතනය ක්‍රියාත්මක කළවිට පළමු ඇමතුම ආවේ රත්නපුරයෙනි. අගමැතිතුමා පරාද බව ඇත්තදැයි එහි ව්‍යාපාරිකයෙක් මගෙන් ඇසීය. අගමැතිතුමා ජය ලබනා බව කී විට ඔහු විශ්වාස නොකළේය. ඔහු සමග ඡන්ද ඔට්ටුවක් ද දමා අරලිය ගහ මන්දිරයට ගියවිට දුටුවේ ඇතැමුන්ගේ මුහුණ මැළ වී ඇති බවය. දැනට ඇති වී ඇති ප්‍රතිඵල ගැන වහාම සංඛ්‍යාලේඛන විග්‍රහයක් කරගතිමි. අම්පාර ඡන්ද ප්‍රතිඵලය පිළිබඳ දළ අදහසක් ඩලස් ප්‍රකාශ කළේය. ඒ අනුව කළ ගණනය කිරීමෙන් අපි අනූනවයෙන් 50% ඉක්මවා ඇති බව දැන ගතිමි. අගමැති මහින්ද ජනපති මහින්ද වී ඇති බව දැනගැනීමෙන් පසු එතුමාට සුභ උපන්දිනයක් පතන්නට අරලිය ගහ මන්දිරයේ උඩුමහලට ගියෙමි.

අගමැති පදවිය හා ඇමැති පදවි බෙදීමේ දී සුපුරුදු ලෙස හිත් අමනාපකම් ඇතිවිය. මංගල - ශ්‍රීපති ජනාධිපතිවරණයට අතිශයින් කැපවූවත් පළමු පියවරේදීම හිත් අමනාපකම් ඇතිවිය. ඉල්ලා අස්වූ ශ්‍රීපති අස්වසා ඔහුට ඇමැති ධුරයක් ලබාදීමට ද අගමැති ධුරය ඇතුළු තවත් ඇමැති ධුර තීරණය කිරීමට සහාය වීමට ද මැදිහත් වන්නට මට සිදුවිය. ජ.වි.පෙ ඇමැති ධුර ලබාදී ඇතුළට දමා ගතයුතු වුවත් එය ද සිදුවූයේ නැත. ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට ජ.වි.පෙ එකඟතාවය ද ගෙන මහා මැතිවරණයක් තබනා ලෙස අප ඉල්ලා සිටියත් නොයෙක් හේතු මත එය ඉටුවූයේ ද නැත. 2007 ඇතිවන ආණ්ඩු විරෝධී කුමන්ත්‍රණය ගැන මට කලින්ම තේරුම් ගියේය.

ජනාධිපතිවරණයෙන් පසු පැවැත්වූ පළාත් පාලන ඡන්දයේ දී ජාතික හෙළ උරුමය එතරම් සාර්ථක වූයේ නැත. පණිවුඩය මෙන්ම පණිවුඩකරු ද වැදගත් බව අපේ නොයෙක් දෙනා තේරුම් නොගැනීම එයට හේතු විය. ජ.වි.පෙ නම් සාර්ථක විය. ඡන්ද මිලියනයකට වඩා ඔවුන් ලබාගත් නමුත්, පළාත් පාලන ආයතන 25ක් පමණ ජය ගැනීමේ ඔවුනගේ අභ්‍යන්තර ඉලක්කය පරාජය විය. ඒ සමගම අභ්‍යන්තර ප්‍රශ්න ජවිපෙ තුළ ඇතිවී ඇති බව දැන ගත්තෙමි.

සුභවාදී ලෙස පෙනුණු එකම දෙය ආරක්ෂක අමාත්‍යාංශයේ සිදුවූ පෙරළියයි. ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ පත්විය. එහි උපදේශකයින් ලෙස එම්.ඩී.ප්‍රනාන්දු හා එච්.එම්.ජී.බී.කොටකදෙණිය මහත්වරු පත්වූහ. හමුදාපති ලෙස සරත් ෆොන්සේකා මහතා පත්විය. මේ සියලුදෙනාම ප්‍රතිපත්තිගරුක දේශප්‍රේමීන් වූහ. අප බලාපොරොත්තුවන ඉලක්කය කරා හමුදාව ගමන් කරනු ඇතැයි දැඩි විශ්වාසයක් ඇතිවිය. ඊළඟට සිදුවූ ක්‍රියාදාමයන්ගෙන් පෙනී ගියේ එය සිදුවෙමින් පවතින බවය.

කොටි සමඟ සාකච්ඡා ඇරැඹීමේ උත්සාහයක් ද දැරිණි. අපේ ස්ථාවරය වූයේ විධිමත් ලෙස සූදානම් වීමට කල්ගන්නා අතර, සාකච්ඡා "සාම සාකච්ඡා" නොව සටන් විරාමයේ පවතින දුර්වලතා මගහරවා ගැනීම සඳහා වූ සාකච්ඡා විය යුතු බවය. දේශපෙම් නීතිවේදීන් වූ එච්.එල් ද සිල්වා හා ගෝමින් දයාසිරි එකී සාකච්ඡාවලට සහභාගී වූහ. නමුත් කුමන හේතුවක් නිසා හෝ සටන් විරාම ගිවිසුම ආණ්ඩුව පිළිගන්නා බවට එකඟතාවයක් ඇතිවිය. අපි මෙයට අපගේ විරුද්ධත්වය පළ කළෙමු. විදේශ බලවේග ආණ්ඩුව පරාජය කිරීමට කළහැකි සියල්ල කර දැන් එය දියකර හැරීමට තැත් දරනා බව පෙනී ගියේය. වට කීපයකින් පසු සාකච්ඡා ඇණහිටිනි. ශ්‍රී ලංකා හමුදා තමන් සමග යුද්ධ කිරීමට නිර්භය නොවනු ඇතැයි ප්‍රභාකරන් කල්පනා කළ ද අපේ දේශප්‍රේමී යුද නායකයෝ ඒ සඳහා සූදානම් වෙමින් සිටියහ.

මා විසින්ම නම් තබනා ලද ජාතික සවිය වැඩසටහන සඳහා සම්බන්ධ වන ලෙස බැසිල් රාජපක්ෂ මහතා ආරාධනා කළ ද ඒ පිළිබඳ හැදෑරීමකින් පසු කොටි උතුරු හා නැගෙනහිර ආධිපත්‍යය උසුලනතාක් ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ නොහැකි බව අවබෝධ කරගතිමි. පසුව ප්‍රධාන ආර්ථික මර්මස්ථාන පාලනය වන උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) සමග එක්වීමි. රජ්‍ය බැංකු, වරාය, ගුවන්තොට, තෙල් හා විදුලිය, වැවිලි වැනි ක්ෂේත්‍රවල පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ කදිම අවබෝධයක් එහි සිටි කෙටිකල ඇතුළත ලබාගතිමි. සාමාන්‍යයෙන් සමාජයේ සිදුවන අල්ලස් ගැනීම්, වංචා දූෂණ පිළබඳව මහජන පිළිකුලක් තිබුණ ද රාජ්‍ය සැලසුම්කරණයේ දී නිලධාරීන් හා දේශපාලකයින් ගන්නා තීන්දු ගැන මහජනයා නොදැන සිටීම ගැන මට අපේ සමාජ දේහය ගැන පිළිකුලක් ඇතිවිය. සුළු සුළු අල්ලස් නිසා රට බංකොළොත් වන්නේ නැත. නමුත් සැලසුම්කරණයේ දී සිදුවන ක්‍රියාවන් නිසා රටක් බංකොළොත් විය හැකිබව දැන ගතිමි. හිතවත් ව්‍යාපාරිකයෙක් විසින්, මට ආර්ථික ප්‍රහාරකයා

(Economic Hit Man) නම් කෘතිය ලබාදුන් අතර, එමගින් ලෝකයේ බලවත් ධනවත් රටවල් ගෙනයන සූක්ෂම මූල්‍ය උගුල් පිළිබඳ කදිම දැනුමක් ලබා ගතිමි. ඒ අනුව ඊළඟට එකී මූලධර්මයන් යොදාගෙන ලංකාවේ උපාය මාර්ගික වැදගත්කමක් ඇති රාජ්‍ය ආයතනවල තත්ත්වය විමසන්නට වීමි. රටේ ආර්ථිකයේ සාරය ගැන කදිම අත්දැකීමක් එමගින් මට ලැබිණි. වරක් ලංකාවේ කීර්තිධර ඉංජිනේරුවෙකු වූ ඒ.එන්.එස්. කුලසිංහ (එතුමාට නිල විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් නොවීය. අනුභවික දැනුම පදනම් වූ ශ්‍රී ලංකාවේ මෑත කාලීන විශිෂ්ඨතම ඉංජිනේරු නිර්මාණ ඔහුගේ විය). වරක් මහවැලි කඩිනම් ව්‍යාපාරයට අයත්, ජලාශයක් පිළිබඳව දේශීය ඉංජිනේරුවන් විමසා වියදම පිළිබඳව ගණනයක් කර ඇත. එය 1978 වර්ෂයේදී රු. මිලියන 750ක් විය. මේ ඇස්තමේන්තුව මුදල් ආමාත්‍යාංශයට ගියකල රොනී ද මැල්ගේ නිලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ එතරම් මුදලක් ලබාදිය නොහැකි බවය. ඒ අනුව යෝජනාව ජනාධිපති ජයවර්ධනට ගියේය. කුලසිංහ, සිරිල් මැතිව් සමග 1977 මැතිවරණ ජයග්‍රහණය සඳහා කැපවී වැඩකළ ජාතිකවාදියෙකු විය. ඒ බව දැන සිටි ජයවර්ධන ජනාධිපති අදාළ නිලධාරීන් විමසා කුලසිංහ මහතාට කියා ඇත්තේ ඒ සඳහා බටහිර රටක සහන ණයක් ලබාදෙන අතර, මුළු වියදම රුපියල් මිලියන 3000ක් පමණ විය හැකි බවත්, එයින් මිලියන 2150ක් අදාළ බටහිර රට ද, ඉතිරි 850 භාණ්ඩාගාරය ද යොදනා බවත්, එයට එකඟව ක්‍රියාකරනා ලෙසත්ය. කුලසිංහ පුදුමයටත්, කලකිරීමටත් පත්වී ඇත. මන්ද මිලියන 750ක් නැතැයි කී මුදල් අමාත්‍යාංශය දැන් දේශීය දායකත්වය ලෙස මිලියන 850ක්ම යෙදවීමට යන නිසාය. ජයවර්ධන සමග තර්ක කිරීම පදවිය නැතිවන වැඩක් බව දැනගත් කුලසිංහ සිය ඉංජිනේරු ගෝලයින්ට තත්ත්වය වාර්තා කර ඇත්තේ "ඉතින්, රටේ රජාට වඩා අපිට දේශප්‍රේමී වෙන්න බැහැනේ " කියමිනි. මහවැලි ව්‍යාපාරයේ එවැනි අධික වියදම් සහිතව කරවූ ව්‍යාපෘති ගණනාවක් ගැන විස්තර එහි සේවය කළ ගාමිණී සෙනෙවිරත්න මහතා පසුව හෙළිකර තිබිණි. ඔහුට අනුව එක් මහවැලි ජලාශයක් සඳහා සහමුලින්ම වැයවූ මුදලට සමාන මුදලක් බටහිර රටක උපදේශකයින් ඔවුනගේ පවුල්, ගුවන් හා හෝටල් ගාස්තු සඳහා ලංකාව ගෙවා තිබේ. ගාමිණී සෙනවිරත්න සුන්දර ඉංග්‍රීසි කවියෙකි. පේරාදෙණිය සරසවියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් කලා විෂයන් කළ "කඩුමෙඩ්ඩෝ" නමින්, ප්‍රචලිතව සිටියදී හඳුනාගන්නා ලද මාලින්ද ඔහුගේ පුත්‍රයාය. අපූරු ඉංග්‍රීසි ලිවීමේ හැකියාවක් ද නිදහස් චින්තනයක් හා හැසිරීමක් ද ඔහුට විය. ඔහුගේ අයියා වූ අර්ජුන ද එසේමය. වරක් මාලින්දට හෙළ උරුමයෙන් ලබාදෙන

පරිවර්තන තොගය ගැන පැමිණිලි කරමින් ඔහු කීවේ ක්‍රිස්තියානි මූලධර්මවාදයට හරි ගිහිල්ලා මේ බරින් නිදහස් විය යුතු බවය.

කඩිනම් මහවැලිය ආර්ථික ප්‍රහාරකයින්ගේ වැඩකි. තවමත් එහි ණය අපි ගෙවමු. එය ආර්ථික අතින් ඵලදායක ව්‍යාපෘතියක් නොවන්නේ අධික ව්‍යාපෘති මිල ගණන් නිසාය. තිස් අවුරුදු වැඩපිළිවෙළ තිබුණා නම් එය රටට උකහා ගතහැකි වැඩ පිළිවෙළක් වන්නට ඉඩ තිබිණි. සුනිල් බැස්ටියන් විසින්, රචනා කර ඇති විදේශ ආධාරවල දේශපාලනය නම් කෘතිය හා විශ්ලේෂණය මේ පිළිබඳව කදිම විවරණයක් කර ඇත. මගේ ගණන් බැලීම්වලට අනුව 1978-2000 කාලය තුළ එක්සත් ජනපදයෙන් අපට ඩොලර් මිලියන 68ක් ලැබී ඇති අතර, 2000න් පසු සතයක් ලැබී නැත. නමුත්, 2000-2008 අතර, පමණක් අපි ආපසු ගෙවා ඇති ණය ප්‍රමාණය මිලියන 314කි. තවත් මිලියන 560ක ප්‍රමාණයක් ගෙවීමට ඇත. සහන ණයවල ණය උගුල එයයි. සුසාන් ජෝර්ජ් විසින්, රචිත "ඉරණම ණය බරට වඩා ශෝචනීයි". (Fate is worse than debt) කෘතිය ලොව පුරා විශේෂයෙන් අප්‍රිකාවේ මේ ඛේදවාචකය පෙන්නා දී ඇත. දේශීය ඉංජිනේරුවන් තැනූ මච්ආර, වේලිඔය, වෙහෙරගල, රඹකැන්ඔය ආදී ජලාශ පෙන්නා දුන්නේ අඩු වියදමින් අපටම අපේ වාරි කර්මාන්ත කරගත හැකි බවය. වෙහෙරගල තැනූ ගුණවර්ධන ලේකම්තුමා හා ගුණදාස (අපේ විශ්ව විද්‍යාල මිතුරෙකි) ඉංජිනේරු මහතා සමග දින ගණනක් ලුණුගම් වෙහෙර උද්‍යානයේ සිට රටේ වාරි කර්මාන්තය ගැන වැදගත් කතාවන් රැසක් කළෙමු. වියළි ගොස් තිබූ මැණික් ගඟ දිනපතාම තෙත බරිත කර ලුණුගම්වෙහෙර අංගසම්පූර්ණ උද්‍යානයක් කළේ ඔවුන්ය. ගැමි සිරිත් දන්නා චමල් ඇමැතිතුමා නිතරම අපට ඇප උපකාර කළේය. ඉදිරි කාලගුණ විපර්යාසවලට මුහුණදීමට නම් රටේ ගංගා 103 අරභයාම ජල සංරක්ෂණ ක්‍රමවේදයක් ඉදිරි දශකයේ දී රටට අත්‍යවශ්‍ය බව වටහා ගතිමි. නැත්නම් අතීතයේ දී මෙන් රජරට ශිෂ්ටාචාරය නැවත බිඳවැටීමට ඉඩ ඇත්තේය.

වාරි ක්ෂේත්‍රවල පමණක් නොව අධික වියදම් පෙන්වා (Inflated Costs) සංඛ්‍යා විජ්ජාවන්ගෙන් මුදල් ඉපයීම සියලු ක්ෂේත්‍රවල සිදුවේ. වරක් කොළඹ චිරප්‍රසිද්ධ සුඛෝපභෝගී තට්ටු නිවාස ව්‍යාපෘතියක් සඳහා නැගෙනහිර ආසියානු රටක ආයෝජකයෙක් ඉදිරිපත් විය. ඔහුගේ ආයෝජනය රුපියල් මිලියන 900ක් වූ අතර, තවත් මිලියන 960ක් ඔහු දේශීය බැංකුවකින් ලබාගත්තේය. එකී ව්‍යාපෘතියේ වියදම් විස්තරය එහි වැඩකළ අප හිතවත් ඉංජිනේරුවෙක් මා අත තැබුවේය. එහි විවිධ වියදම් යටතේ පමණක් වියදමෙන් හරිඅඩක් මිලියන 930ක් දමා තිබිණි. මගේ ඉංජිනේරු මිතුරාගේ

අදහස නම් එය බොරුවක් බවය. ආයෝජකයා මුදල් පෙන්නා දේශීය බැංකු මගින්ම ව්‍යාපෘතිය නිමකර තවත් කීයක් හරි විදේශ ගිණුමකට දමාගෙන ඇති බවය. විවිධ රාජ්‍ය ආයතනවලින් මේ ව්‍යාපෘති අනුමත වන්නේ ඒවායේ නිලධාරීන්ගේ අනුහසිනි. දූෂණය ගැන දේශපාලකයාටම දොස් කීමෙන් පලක් නැත.

ලංකාවේ විදුලිබල සැලැස්ම 1991 සිට ක්‍රියාවිරහිත කොට තෙල්වලින් විදුලිය නිපදවන රටක් බවට පත්වී ලෝකයේ අධිකතම විදුලිය මිල ගණන් ඇතිකර ගැනීමත්, හෙජින් ගනුදෙනුවෙන් රට තෙල් මිලෙහි සිරකරුවෙකු කිරීමත්, ලංකාවේ ආර්ථික ප්‍රහාරකයන්ගේ වැඩ ලෙස සලකමි. ඇතැම් නිලධාරීන් මේ නිසා උරණ වී පරිසර ඇමැති නිසා රට අඳුරේ ලෙස වූ මාධ්‍ය වාර්තා පවා සකස් කළ බව දනිමි.

ගෝලීයකරණය හා විදේශ ණය ක්‍රියාත්මක වන ආකාරය ගැන කදිම කෘතීන් දෙකක් නොබෙල් ත්‍යාගලාභී ලෝක බැංකුවේ හිටපු සභාපතිවරයෙක් ද වන ජෝශප් ස්ටිග්ලිට්ස් (Joseph E Stiglitz) ලියා ඇත. (GLOBALIZATION AND ITS DISCONTENTS – MAKING GLOBALIZATIOION WORK) මේ කෘති කියවීමෙන් ලෝක මූල්‍ය ක්‍රමය හැසිරෙන ආකාරය හා අපි එහිදී ක්‍රියා කළ යුතු ආකාරය ගැන කදිම දැනුමක් ඕනෑම අයෙකුට ලබාගත හැක. ස්ටිග්ලිට්ස් අපේ හිටපු විදේශ ලේකම් පාලිත කොහොනගේ හිතවතෙකි. පාරිසරික ණය හා ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා වෙළෙඳපොළ ක්‍රමය විසින් යොදාගත යුතු උපක්‍රම ගැන පාලිත හරහා ඔහුගෙන් කදිම උපදෙසාවලියක් ද ලබාගතිමි. කුලසිංහ මහතා කිව්වාසේ රජා පමණක් නොව සියලු ඇමැතිවරු දේශප්‍රේමී වන අතරේ ජාත්‍යන්තර ක්‍රියාදාමයන් පිළිබඳ අවබෝධයක් ද ලබා සිටිය යුතුය. නැත්නම් රට ආර්ථික බිම්බෝම්බවලට හා ක්ලේමෝ ප්‍රහාරවලට පහසුවෙන් ගොදුරු විය හැකිය.

## හත්වැනි දිගහැරුම

# අපි දිනුම්

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වීමෙන් පසු ආරක්ෂක අංශවල සිදු වූ නායකත්ව වෙනස්කම් මගින් ඉක්මණින්ම සියලුදෙනා දැනගත්තේ ආණ්ඩුව කොටින්ගෙන් එල්ලවන ඕනෑම අභියෝගයක් සඳහා සූදානම් වන බවයි. විශේෂයෙන්ම කොටින්ගෙන් බිඳී ගිය කොටස් හා කොටි විරෝධී කොටස් අනුක්‍රමයෙන් අප හා සම්බන්ධ වන්නට විය. පැරීසිය, ලන්ඩනය හා ෆ්‍රැන්ක්ෆර්ට් සහ තවත් නගර ගණනාවක දී විවිධ අවස්ථාවලදී විදේශ ගත කොටි විරෝධීන් අප සමග සාකච්ඡාවලට එළැඹුනහ. වරක් ෆ්‍රැන්ක්ෆර්ට් නගරයේ දී හමු වූ තරමක් වයසක දෙමළ තාක්ෂණ ශිල්පියෙකු මා හට කීවේ 1984 තරම් ඈත කාලයක දී තමන් ප්ලොට් සංවිධානයේ ෂර්ලි හා ජාතික ආරක්ෂක ඇමැති ලලිත් ඇතුළත්මුදලි අතර, සාකච්ඡාවකට ද සම්බන්ධ වූ බවය. මට ක්ෂණයකින් කරුණු දෙකක් මතක් විය. එකක් නම් දකුණේ වාමාංශිකයන්ගේ වේදිකාවලට නැතුවම බැරි දෙමළ කථිකයෙක් බවට 1980 දශකයේ දෙවන භාගයේ පත්වූ, ටී ෂර්ටය, ඩෙනිම් කලිසම, ට්‍රැක් සපත්තු පැළඳ සිටි ප්ලොට් සංවිධානයේ ෂර්ලිය. ඊළඟට 1988 වර්ෂයේ දී විපක්ෂ සන්ධානයක් සඳහා සාකච්ඡා පැවැත්වෙත් දී දිනක් මදක් බියපත් මුහුණින් කුමාර් පොන්නම්බලම් මහතා අවට සිටි නායකයින්ට කී රහසක්ය. ඇන්ටන් බාලසිංහම් තමනට ඊයේ රාත්‍රියේ දුරකතනයෙන් කතාකළ බවත්,

*"Is Muhandan ( alias Uma Maheshawaran) there, Beware of these buggers, they are Athulathmudali's fellows"*, කියා කිවූ බවත්ය. ඒ දිනවල ප්‍රචලිත රහසක් වූයේ කොටි හඬ නමින් ප්‍රචලිත වූ ප්ලොට් ගුවන් විදුලිය ප්‍රචාරණය කරන ලද්දේ කොළඹ මරදානේ එක්තරා බෞද්ධ නොවන ආගමික මධ්‍යස්ථානයක සිට බවත්, එය පිටුපස ද ඇතුළත්මුදලිගේ සෙවණැල්ල වැටී තිබූ බවත්ය. වරක් 1983 ජූලි සිරකරුවන් අතර, ගැටුම්වල දී කුට්ටමනී හා ජේගන් මියගිය පුවත අසා ජේ.ආර්. ජයවර්ධන සංකාවට පත්වූ බවත්, එයට හේතුව ඒ වනවිට ඔවුන් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග "සාකච්ඡා" ආරම්භ කර තිබූ නිසා බවත්, සිංහ රත්නතුංග ගේ කෘතියක (Politics of Terrorism) තිබුණා ද මතකය. අපේ ආණ්ඩු එක අතකින් ත්‍රස්තවාදය සමග ගැටෙනා අතරේ අනෙක් අතින් විවිධ කල්ලි සමග ගනුදෙනුව ද ගෙන යමින් තිබී ඇත. යුද්ධයක දී සතුරා දුර්වල කිරීම අත්‍යවශ්‍ය දෙයකි, ප්‍රධාන සතුරාට රැහැනිව දුර්වල සතුරන් යොදාගැනීම නරක උපායක් නොවේ. මේ කොටි විරෝධී දෙමළ සංවිධාන හා පුද්ගලයින් සමග අදහස් හුවමාරු කරගනිද් දී මට හැඟී ගියේ ඔවුන් බොහෝ දුරට ශ්‍රී ලංකාවේ දකුණේ වාමාංශික ව්‍යාපාරයට සමාන අදහස් හා ක්‍රියාකාරීත්වයෙන් යුතු බවය. ජ.වි.පෙ විසින් බිය වද්දා 1987 - 1989 දී මෙකී බලවේග තමනට රැහැනිව උසිගන්වා ගත් ආකාරයටම කොටින් ද ඔවුන් ඝාතනය කිරීමෙන් හා බිය වැද්දවීමට තැත් කිරීමෙන් තමනට එරෙහිව උසිගන්වා ගෙන තිබිණි. එමෙන්ම ඔවුනගෙන් ඇතැමෙකුගේ සිත ඇතුළේ කොටි ගෙන යන්නා වූ සටන ගැන ගෞරවයක් තිබුණු බව ද මට හැඟී ගියේය. සංවාද පැවැත්වෙන විට කතා නොකළ හා සමහරවිට වේගයෙන් අදහස් දැක්වූ ඇතැම්හු කොටින්ගේ ඔත්තුකරුවන් ද වීමට ඉඩ තිබිණි.

2006 අලුත් අවුරුද්දෙන් පසු දිනෙක මෙවැනි පිරිසක් කොළඹ හෝටලයක දී හමුවූ පසුව වෙනත් කරුණක් සඳහා බැසිල් රාජපක්ෂ මහතා හමුවීමට ගියෙමි. එදින අපේ මාධ්‍ය සාකච්ඡාවක් ද සූදානම් වී තිබූ හෙයින්, ආපසු යෑමට සැරසෙත් දී ජනාධිපති කාර්යාලයේ කම්පනයක් ද, ජනේලයෙන් ඒ දෙස බලත් දී දහස් ගණනක් කපුටන් ගිජුලිහිණියන් මෙන් හමුදා මූලස්ථානයේ දැවැන්ත අඳුරු වෘක්ෂයන් වෙතින්, ඉඟිලී යන අයුරු ද දැකගතිමි. බෝම්බයක් පිපිරී ගිය බව මම බැසිල් රාජපක්ෂ මහතාට කීවෙමි. බෝම්බ නිෂ්ක්‍රීය වීමක් හැර හමුදා මූලස්ථානයේ එවැන්නක් සිදුවිය නොහැකි බව ඔහුගේ අදහස විය. නමුත් සුළු මොහොතකින් ආරංචිය කාර්යාලයට ආවේය. "කමාන්ඩර්ට ගහලා" හමුදාවේ භාෂාවෙන් කියවුණේ හමුදාපති සරත් ෆොන්සේකා මහතාට බෝම්බ ප්‍රහාරයක් එල්ල වී ඇති බවයි. වහාම අරලියගහ මැඳුරට යමුයැයි බැසිල් මහතා යෝජනා කළ අතර, මම එකඟවීමි.

අපේ පළමු ප්‍රශ්නය වුණේ හමුදාපතිතුමා ජීවතුන් අතර ද යන්නයි. හමුදා බුද්ධි අංශයේ මගේ හිතවතෙකුගෙන් විමසූ විට ඔහු කීවේ රෝහලට ගෙනයන විට හොඳින් කතා කළ බවත්, හොඳින් සිහිය තිබූ බවත්ය. නමුත් දැන් තත්ත්වය බරපතල බවත්ය. අරලියගහ මන්දිරය කරා යන අතර, මම කල්පනා කළේ ප්‍රභාකරන් මේ මොහොතේ මෙවැන්නක් කළේ ඇයි කියාය. 2004 ශ්‍රී.ල.නි.ප - ජ.වි.පෙ සන්ධානය බලයට පැමිණිවිට ඔවුන් තමනට විරුද්ධව යුද ප්‍රකාශ කරනු ඇතැයි කොටි බලාපොරොත්තු වූ අතර, කදිර්ගාමර් ඝාතනයට දැක්වූ නිවට ප්‍රතිචාරයෙන් අතිශය වැරැදි තක්සේරුවකට එනම් සිංහලයින් යළි තමනට එරෙහිව නැඟී නොසිටිනා බවට වූ නිගමනයකට එළැඹිණි. නමුත් ගෝඨාභය - ෆොන්සේකා සුසංයෝගය ශීඝ්‍රයෙන් වැඩකරගෙන යන බවත්, නැගෙනහිර තම සතුරන් බලමුළු ගන්වමින් තැන තැන ප්‍රහාර ආරම්භ කර ඇති බවත්, ඔහු නොබෝ දිනකින් දැනගත්තේය. ඊළඟ මහා ප්‍රහාරයට පෙර මේ සුසංයෝගය නිෂ්ක්‍රීය කිරීම ඔහුගේ නිශ්චිත අරමුණ විය. එසේනම් ඊළඟ ප්‍රහාරය ගෝඨාභයට එල්ලවන බව පැහැදිලි විය. දැන් ප්‍රශ්නය තිබුණේ අපි මෙයට කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද කියාය. එදා අරලිය ගහ මන්දිරයට එක්වූ බොහෝ දෙනෙකුගේ අදහස් විවිධ විය. ඇතැමුන් කීවේ සටන් විරාමයෙන් ඉවත්විය යුතු බවයි. තවත් අය කීවේ එය ජාත්‍යන්තර වශයෙන් අවාසි විය හැකි බවයි. මගේ අදහස වූයේ සටන් විරාම ගිවිසුම ඔහේ තබාගෙන කොටි බලාපොරොත්තු නොවනා ශීඝ්‍රතාවයකින්, බලාපොරොත්තු නොවනා ස්ථානවලට පහර දිය යුතු බවයි. ඒ අතරේ කෙටි කලක් තුළ අවසන් සටනට සූදානම් විය යුතු බවයි. ඇතැම්හු කොටින්ට පහරදීමට බිය වූහ. අපි ප්‍රමාණවත් ලෙස සූදානම් නැතැයි යන්න ද කියවිණි. එතැන දී ගෝඨාභයගේ අධිෂ්ඨානය කැපී පෙණින. කොළඹත්, වන්නියේත් එකවිට කොටින්ට නොසිතූ ප්‍රහාර වටයක් එල්ල විය. එතැන් සිට ප්‍රභාකරන්ගේ කන්ණාඩි ප්‍රතිබිම්බය ඔහුට හමුවිය. තැන සීමා නැති ගරිල්ලා යුද්ධය එහි ප්‍රකාශකයාට එරෙහිව ඇරැඹිණි.

ඊළඟට ප්‍රභාකරන් මාවිල් ආරුවට ගියේත්, ගෝඨාභය රාජපක්ෂ මහතා ඝාතනය සඳහා උත්සාහ කළේත් සිය උපාය තවදුරටත් ක්‍රියාවේ නංවමිනි. මාවිල්ආරු ජයග්‍රහණයෙන් පසු සාම්පූර්, කට්ටපරිච්චාන් හා වෙරුගල් දක්වා මුළු දකුණු ත්‍රිකුණාමලයම මුදාගත් විට ආරක්ෂා හමුදා පමණක් නොව දේශපාලනයේ නියැලී සිටි බොහෝ දෙනෙකුට ද ආත්ම ශක්තිය ලැබිණි. 2006 ජූලි 26 සිට අගෝස්තු මුල දකුණු ත්‍රීමලයේ දී හා උතුරු යාපන මුහමලේ දී එකවිට කොටින්ගේ ද්විත්ව ප්‍රහාරය පරාජය කිරීමේ මුල් සතිදෙක අතිශය තීරණාත්මක විය. ජනාධිපතිතුමා පක්ෂ නායක රැස්වීමක් කැඳ වූ අතර,

යූ.එන්.පීය හා විශේෂයෙන් මුස්ලිම් කොංග්‍රසය අඳුරු චිත්‍රයක් රටට මවා පෙන්වීය. සුපුරුදු පරිදි ජ.වි.පෙ කීවේ හරි සූදානමක් නැතිව ආණ්ඩුව සටනට ගොස් ඇති බවයි. මේ පිළිබඳව ඔවුන් හා ජනාධිපතිතුමා අතර, වචන හුවමාරුවක් ද ඇති වූ බව පසුව හෙළි දරව් විය. ඒ දුෂ්කර දින කීපය තුළ අධිෂ්ඨානය ඉහළම තත්ත්වයේ තබාගත යුතු බව අපේ අදහස විය. සියල්ල වැරදී ගියා නම් චෝදනාව එන්නේ රතන හිමියන්ට හා හෙළ උරුමයට බව අපි හොඳින්ම වටහාගෙන සිටියෙමු.

යුද්ධය අවසානය දක්වා මේ චංචල භාවයන් විටින් විට පැවැතිණි. ජයග්‍රහණ ලබනවිට මාධ්‍ය ඉදිරියට ගොස් රණවිරු කීර්තියෙන් ප්‍රභාමත් වන අය පරාජයේ දී හැකිතාක් සැඟවී සිටියහ. වරක් අනුරාධපුර ගුවන් කඳවුරට ප්‍රහාරයක් එල්ල වී අපි මදක් පසුබෑ විට සියලු නාලිකාවලට ගොස් එය මහා පසුබැසීමක් නොවනා බව පැහැදිලි කරන්නට වූයේ මටය. බොහෝ සෙබළුන් හා නිලධාරීන් මට දුරකතනයෙන් කතාකර යුද්ධයේ උපාය මාර්ගය ගැන මා කළ විග්‍රහය ගැන මට ස්තුති කළහ. පුදුමය නම් මා පරිසර ඇමැති ලෙස ජපානයේ දී යසුෂි අකාෂි හමුවූ විට අපේ ත්‍රිමාන උපාය මාර්ගය ගැන (Demilitarization, Democratization, Development – 3D) පැවසූ විට ඔහු එය ඉතා ඉහළින් ඇගැයීමට ලක්කළ බවය. ඕස්ට්‍රියාවේ මහාචාර්ය ගුඩ්රන් ආදී සාමාන්‍යයෙන් කොටි හිතවාදී විද්වතුන් සංවිධානය කළ සංවාදයක දී මා පළකළ අදහස් ඇසූ බොහෝ දෙනා (2007) කීවේ ඒවා ඉතා ආකර්ශනීය සංවිධානාත්මක අදහස් හා ඒවා තමන් පළමුවරට අසනා දේ බවත්ය. කොටි පරාජය කළ නොහැකිය යන මතයේ සිටි බොහෝ බටහිර තානාපතිවරු (බොබ් බ්ලේක් ඇතුළු) හා විද්වතුන් රැසකට එය අපි කරනා බව ඒත්තු ගැන්වීමට අපට හැකිවිය. මෙයින් විශේෂ වූයේ කීප විටක් ඉන්දියාවේ දී හමු වූ ඔවුනගේ විද්වත් ප්‍රභූ පිරිස් සමග ඇති වූ සංවාදයන්ය. අපව මෝඩ ෆැසිස්ට් රැළක් ලෙස හංවඩු ගැසීමට තැත්කළ බොහෝ දෙනෙකුට සෛද්ධාන්තිකව ද, ප්‍රායෝගිකව ද අපි පිළිතුරු සැපයීමු. අපේ සංවිධානාත්මක සංකල්ප හා සැලසුම් ගැන ඔවුන් පැහැදී සිටිය ද ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ද යන්න ගැන ඔවුන් සියලු දෙනාට විචිකිච්ඡාවන් තිබිණි.

2007 වසර මුලදීම පැහැදිලි වූයේ කොටි සහ විජාතික බලවේග ආණ්ඩුව අස්ථාවර කිරීමට දේශපාලන ප්‍රහාරයක් දෙමින් සිටිනා බවය. අපේ ස්වාමීන් වහන්සේලා හා ගිහියන් අතර, ඇතිවූ විශේෂ සාකච්ඡාවකින් පසු ඍජු ලෙස ආණ්ඩුවට එක්වී කොටි විරෝධී සටන ශක්තිමත් කළයුතු බවට තීරණය කළෙමු. ඕමල්පේ හිමියන් සිය අසුන පරිත්‍යාග කළේත් සංඝ ආඥාව

ක්‍රියාත්මක කිරීම සඳහා මා පාර්ලිමේන්තු ගියේත් ඒ අනුවය. ඕමල්පේ හිමියන්ගේ ඉල්ලා අස්වීම හා මා මන්ත්‍රීවරයෙකු ලෙස පත්වීමේ ගැසට් නිවේදනය නිකුත් වීමට ගියේ එක් දිනකි. පාර්ලිමේන්තුවේ දිවුරුම් දීමටත් පෙර පරිසර හා ස්වාභාවික සම්පත් ඇමැති ලෙස ජනාධිපතිතුමා ඉදිරියේ දිවුරුම් දුන්නෙමි. මන්ත්‍රී ලෙස පාර්ලිමේන්තුවේ දිවුරුම් දුන්නේ ඉන්පසුවය. (2007 පෙබරවාරි 01-02) පාර්ලිමේන්තුවේදී මට පෙනී ගියේ අනුර - මංගල - ශ්‍රීපති හා තවත් කිහිප දෙනෙක් යූ.එන්.පීයෙන් පැමිණි පිරිස ඉදිරිපෙළ අසුන් ගැනීම ගැන මහත් හාහූවක් ඇතිකරනා අයුරුය. වහාම පියවර නොගතහොත් තත්ත්වය තවත් උග්‍රවිය හැකි බව පැහැදිලි විය.

මංගල සමරවීර මහතා සමග සාකච්ඡා සඳහා අන්තිමට ගිය කණ්ඩායමට මමත් අයත්වීමි. ටිරාන් අලස් හා උදය ගම්මන්පිල මහත්වරුන් ද එහි විය. ඔහුගේ තීරණය ආපසු හරවා ගැනීමට යම් ඉඩකඩක් නොතිබුණාම නොවේ. සැකයක ආකාරයෙන් ප්‍රශ්නයක් මතු වූ විට එය පළමු මොහොතේ දීම විසඳා නොගතහොත් සැකයේ බැල්ම සියලු ක්‍රියාවන්ට යොමුවී සැකය වෛරය බවටත්, එය පළිගැනීම බවටත් පත්වේ. මංගල - ශ්‍රීපති පත්වූයේත් ඒ තත්ත්වයටය.

මා ඇමැති ධුරයේ දිවුරුම් දී කෙලින්ම ගියේ ජනාධිපති ලේකම් කාර්යාලටය. ඒ සුදුසු පුද්ගලයෙකු අමාත්‍යාංශ ලේකම් පදවිය සඳහා තෝරා ගැනීමටටය. බැසිල් රාජපක්ෂ හා උදය ගම්මන්පිල මහත්වරු සහායට සිටියහ. තෝරාගත් ලේකම්තුමා පත්කර ගැනීමෙන් පසු පරිසර අමාත්‍යාංශයට අයත් සියලු අංශ පනත්, ආයතන, ව්‍යාපෘති ආදිය පිළිබඳ දින දෙකක් අධ්‍යයනය කිරීමෙන් පසුව මම වැඩභාර ගැනීම පිණිස කාර්යාලයට ගියෙමි.

මට කාර්යාලයක් නොවීය. කුඩා කාර්යාලයක තාවකාලිකව ලැගුම් ගත්තෙමි. නිල රථ නොවීය. නිල රථ ලෙස වාහන 23ක් කලින් සිටි ඇමැතිවරු රැගෙන ගොස් තිබිණි. දිවුරුම් දුන් දිනයේ ඉහළ මාලයට යද්දී පොදු වැසිකිළිවල දුර්ගන්ධයෙන් කාර්යාල පිරීගොස් තිබිණි. මගේ පළමු කාර්යය වූයේ පොදු වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීමය. එයට මිලියන ගණනක් වැය විය. නමුත් එළැඹුණු අවුරුදු නිවාඩුවට "ගෙදර යන ගමන්" බොහෝ වැසිකිළි, කැසිකිළි උපාංග සේවකයින් සමග ගෙදර ගියේ මා කෝපයටත්, කම්පාවටත් පත්කරවමිනි. ඒ අතරේ අපි කණ්ඩායමක් ලෙස කාර්ය මණ්ඩලයම උදෑසන හමුවී වැඩ බෙදාගැනීමත්, පසුදින වැඩ පසුවිපරමත් කරගෙන ගියෙමු. සුභ පතන්නන් ඇතුළු දහස් ගණනක් පළමු දින කීපය තුළ වැල නොකැඩී ආහ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා උත්සවයකට ප්‍රධාන අමුත්තා ලෙස ගොස් කළ කතාව අසා සිටි මහාචාර්ය ශාන්ත හෙන්නායක කීවේ මෙය හීනයක් වැනි බවයි. මෙලෙස තුටු පහටු වූ දහස් ගණනක් රට පුරාම සිටියහ. සති කීපයකට පසු ජවිපෙ පුවත්පතක් වාර්තා කළේ පරිසර ඇමැතිගේ කෑම බිල රුපියල් 20,000යි ලෙසය! මසක් පුරා පැමිණි දහස් ගණනකට තේ පැන් සංග්‍රහ කිරීමේ සහ උදේ 7 සිට රාත්‍රී 10 දක්වා විවිධ ආයතන කැඳවමින් සියලු ආයතනවල තත්ත්වය විග්‍රහ කරමින් කාර්යාලයේම ජීවත් වෙමින් ගතකළ, කැපකළ කාලයට ලැබුණු පළමු පිළිගැනීම එය විය.

පළමු සති කිහිපය මෙලෙස ගෙවී ගියේ බොරුවළවල්, කටකතා, ඇනුම්පද, ව්‍යාජ මාධ්‍ය ප්‍රචාර අතරේය. කාර්යාලයක් හා එයට අවශ්‍ය පහසුකම් ලබාගැනීමට නිල වාහන පහසුකම විධිමත් කරගැනීම කුලී නිවසක් සොයාගැනීම ආදී කාර්යයන්ට මාස ගණනක් ගතවිය. නමුත් ඒ අතරේ දී රටෙන් 1/3ක (30%) භූමි භාගය හා සම්පත් පාලනය කරනා මේ දැවැන්ත අමාත්‍යාංශය විධිමත් තලයකට ගෙනඑන්නටත්, රටපුරා සියලු ස්ථානවලට ගොස් තත්ත්වය සියැසින් දැකගන්නටත්, ඒ අතරේ සියලු දිසාවන්වල පක්ෂය සහමුලින්ම ප්‍රති සංවිධානය කරගන්නටත් අපි සමත්වූයෙමු. 2006 පළාත් පාලන ඡන්ද තරග කිරීමෙන් හා වෙනත් කරුණු නිසා කලකිරී සිටි පිරිස් හා නව පිරිස් දිනාගෙන පක්ෂය ශක්තිමත් කරගැනීම විශේෂයෙන් ගිහියන් අතර, සංවිධානාත්මක කරගැනීමට අපි සමත් වූයෙමු.

පෞද්ගලිකවම මට ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්නට සිදුවිය. මට අයත් නිවසක් තිබුණේ හෝමාගමටත් එහා මාවතගමය. එහි සිට කාර්යාලයට ඒමට පැයකටත් වඩා ගතවේ. උදෑසන මාර්ග තදබදය හිසරදයකි. පොලිස් සයිරන් ගසාගෙන ඉඩකඩ ලබාගැනීම මහත් අප්‍රියකාරී එකක් වූ අතර, ආරක්ෂාවට ද මාරක විය. ආරක්ෂාව සඳහා මා අනුගමනය කළේ හැකිතාක් සාමාන්‍ය ලෙස ගමන් බිමන් යෑමත්, උත්සව මගහැරීමත් අනපේක්ෂිත ලෙස ක්‍රියාකිරීමත්‍ය. මට අපේ ආරක්ෂක බුද්ධි අංශවල සහාය ද එයට ලැබිණි. සියල්ලන්ගේ උපදේශය වූයේ පාරමී කුලතුංගට, ද.මූ. දසනායකට වූවාමෙන් දිගු දුරක් එකම ආකාරයට ගමන් කිරීම නිසා මරණය අප කැඳවා ගන්නා බවය. ඒ අනුව අපි නාවලින් නිවසක් කුලියට ගත්තෙමු. එය අමාත්‍යාංශයට යෑමටත් දරුවන් පාසල් යැවීමටත් පහසු විය. ඒ සඳහා ආණ්ඩුවෙන් ලැබුණු රුපියල් ලක්ෂයක මාසික කුලිය ලබාගතිමි. එමගින් ඇත්තටම සිදුවූයේ මසකට කාර්යාලයට යෑමට හා ඒමට වැයවන රුපියල් 60,000ක පමණ ඉන්ධන ඉතුරු වීමය.

මසකට රුපියල් ලක්ෂය බැගින්, ගෙවල් කුලී ගන්නා ඇමැතිවරයෙකු ලෙස මගේ නම එක්තරා පුවත්පතක් මුල් පිටුවේ පළකළේය. ඒ වනවිට රුපියල් ලක්ෂයේ දීමනාව රුපියල් 50,000ටත්, ඇමැති පඩිපත රු.42,000ටත් කපා දමා තිබිණි. මසකට විදුලි, ජල බිල්පත් සහිතව රුපියල් ලක්ෂයක් ලැබේ යැයි සිතා කුලියට ගත් නිවසට ලැබෙන්නේ රුපියල් 50,000කි. ඒ අතර මගේ වැටුප මම පක්ෂයට පරිත්‍යාග කළෙමි. ඇමැති ධුර වැඩියි, ඔවුනට සැප වැඩියි ආදී ලෙස විවේචන කරනා බොහෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප රුපියල් ලක්ෂය ඉක්මවා නැති බව වරක් ජ.වි.පෙ මන්ත්‍රී බිමල් රත්නායකම පිළිගත්තේය. ඔවුනට ඉතා අඩු කුලියට රජයේ නිවාස මාදිවෙලින් ලබාදී ඇති අතර, එයට සමාන නිවසක් කිසිසේත් රු.50,000කට කුලියට ගතහැකි නොවේ. ඇමති ධුරයෙන් සිදුවූයේ මා ණයවීම පමණි. මගේ දුෂ්කර තත්ත්වය අවබෝධ කරගත් හිතවතුන් තිදෙනෙක් මගේ වියදම් නොමසුරුව දැරුව නමුත්, ණය බර උසුලාගත නොහැකිව මම මගේ මෝටර් රථය විකුණා දැම්මෙමි. ඇන්.ඇම්.ට ගිණිදර මෝල පෙන්වා මඩගසා අසරණ කළ ලෙස දේශපාලනයෙන් හම්බ නොකළ ඇත්තන්ට කරනා අසාධාරණ විවේචනය ගැන මුලදී කම්පා වුණත්, පසුව එය දරාගැනීමට ඉටාගතිමි. ඇත්තටම ඇමැති හෝ මැතිවරුන්ගේ පඩිනඩි හෝ ඉන්ධන දීමනාවල නොව ප්‍රශ්නය ඇත්තේ ඔවුන් නොයෙක් ආකාරයෙන් ලබාගන්නා අල්ලස්වල හා නොමනා ලෙස රාජ්‍ය අරමුදල් යොදාගැනීම තුළය. කාටුන් අඳිනා මඩ ප්‍රහාර ගසනා බොහෝ මාධ්‍යවේදීනට මැති ඇමැතීනට වඩා පඩි වැඩිය.

ඇමැති ධුරයේ ඊළඟ නීරස අත්දැකීම වූයේ මාධ්‍ය විවේචනයන්ය. අපේ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ම ගොස් "බොල්ගොඩ" ප්‍රදේශයේ නීතිවිරෝධී ඉදිකිරීම් සඳහා නඩු පවරනු ලැබූ අතර, එක්තරා පුවත්පත් හිමියෙක්, රූපවාහිනී සේවා අයිතිකරුවෙක්, ගුවන් විදුලි සේවයක විධායක නිලධාරියෙක් ඒවායේ විත්ති කරුවන් වූහ. ඔවුන් මෙයින්, කුපිත වූ අතර, දිගටම රටපුරා ගස් කැපෙනා බවත්, අලි මැරෙනා බවත් අඟවන වාර්තා දිගට හරහට පළකළහ. 1997 දී අලි ඇතුන් (උතුර හා නැගෙනහිර හැර) 197 දෙනෙකු මියගිය අතර, 2007 දී (නැගෙනහිර ද ඇතුළුව) මියගියේ 189කි. නමුත් මාධ්‍ය වාර්තා පෙන්වූයේ හිටි හැටියේ අලි මියයන ආකාරයක්ය. එක්තරා පුවත්පතක් දිනපතාම අලි මියයන දර්ශන පළකළේ සිය දේශපාලනික වෛරය පිරිමසා ගැනීම සඳහාය.

අලි ඇතුන් බේරාගැනීම සඳහා අප දියත් කළ "ගජ මිතුරෝ" ව්‍යාපාරය මගින් 1982-2007 කාලයේ ඉදිකළ කි.මී. 620ක විදුලි වැට ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක්

2007-2009 කාලයේ (කි.මී. 680) ඉදිකළ බව මෙකී මාධ්‍ය කවදාවත් වාර්තා කළේ නැත. වංචා දූෂණ කර අත්හැර දමා තිබූ උඩවලව උද්‍යානය නවීකරණය කර ප්‍රතිෂ්ඨාපනය කළේත්, වතුර නැතිව අලි මැරෙනවා යැයි කියූ ලුණුගම්වෙහෙර අන්තිම මොහොතේ වෙහෙරගල ව්‍යාපාරය යටතේ නවීකරණය කළේත් අප යටතේය. කොටින්ම වසර 60ක් කුලියට සිට වසර 08ක් කාර්යාලයකට ඉඩමක් නැතිව වල්මත්වී සිටි වනජීවි දෙපාර්තමේන්තුවට නවීනතම කාර්යාලයක් ලබාදුන්නේ මාය. වෙනදා වන උද්‍යානවල, නිවාසවල සති ගණන් ලැගුම් ගෙන සැප ගන්නා ඇමැති නිලධාරී සම්ප්‍රදාය වෙනස් කිරීමට මට බොහෝ අරගල කරන්නට සිදුවිය. සුභදායී ප්‍රවෘත්ති එළ නොකිරීමේ පුදුම සම්ප්‍රදායක් අපට තිබේ. හිටපු ඇමැතිවරු මෙන් තමන්ට විශේෂ සැලකිල්ලක් නොදක්වායි යැයි උරණ වූ මාධ්‍යවේදියෙකු අමූලික අසත්‍යයන් ඉරිදා පුවත්පතක පිටුපුරා අතහරින්නට විය. කොළඹ ඉහළ ගණයේ ප්‍රභූන් තමනට රිසි ලෙස උද්‍යානවල නැවතීමට නොලැබීම ගැන මා සමග උරණ වූහ. ඔවුන ද කළේ පරිසර ප්‍රශ්න පිළිබඳව විද්‍යුත් තැපැල හා ඉංග්‍රීසි පුවත්පත් මගින් මා හට ප්‍රහාර එල්ල කිරීමය. කොටින්ම මැණික් ගැරීම ගැන චෝදනා ලත් අපේ සේවක මහතෙක් ද උද්‍යනවල මහත් පරිසර හානියක් වෙතැයි ප්‍රචාරයක් ගෙන ගියේය. වනජීවී දෙපාර්තමේන්තුවට පැළ සපයා ඒවාට මුදල් නොලැබීම නිසා ද, වැලි ගැනීමට ඉඩ නොදුන් නිසා ද කුපිත වූ දෙදෙනෙක් වරක් රිටිගල දී මට විරුද්ධව උද්ඝෝෂණයක් සංවිධානය කරනා ලදි. පසුව මාධ්‍යවේදීන් ඉදිරියේම ඔවුන් තමන්ගේ ඇත්ත විරෝධය පාපොච්චාරණය කරනා ලදි. නමුත් මාධ්‍ය පළකළේ විරෝධය පමණකි. එමෙන්ම වරක් "රිටිගල" කන්ද ගල්කොරියකට දී ඇති බවට ද වාර්තා පළවිය. සොයාබැලීමේ දී පෙනී ගියේ එයින් සැතපුම් 12ක් ඈත වසර 05ක් පැරණි ගල් වළක් ගැන ප්‍රවෘත්තියක් බවයි. ලංකාවේ බහුතරයක් මාධ්‍ය සාධාරණ නොවන විවේචන ගෙන එති. තමනට වාසි ඇති අයට යහමින් ප්‍රචාරය දෙති. නිතරම නරක උලුප්පා දක්වති. ඇතැම් විට අමූලික අසත්‍යය පතුරුවති. මෙය මාධ්‍ය පැසිස්ට්වාදයයි.

අමාත්‍යාංශය විධිමත් කිරීම සඳහා පියවර කීපයක් ගතිමි. පරිසර අමාත්‍යාංශය බොහෝදුරට සෙසු අමාත්‍යාංශ මෙන්ම නිලධාරීන්ගේ රජ දහනක් වී තිබිණි. එය වෙනස්කිරීම මගේ ප්‍රධාන කාර්යය විය. එයට බාධක කීපයක් තිබිණි. එකක් නම් පරිසරය සඳහා විවිධ විදේශ ආධාර, ව්‍යාපෘති හා ශිෂ්‍යත්ව ආදිය ලැබී තිබූ නිසා එය බොහෝදුරට මේ ආධාර ආයතනවල මිතුරු සමාජයක් වී තිබීමය. මුළු අමාත්‍යාංශයේම ව්‍යුහයන් සැකසී තිබුණේ ඒ අනුවය. පතල්










16-20 November 2008, Doha - Qatar
Under the Auspices of
EXECUTIVE SECRETARY
PRESIDENT VIENNA CONVENTION


PRESIDENT
VIENNA
CONVENTION









කැණීම් කාර්යාංශය වැනි ආයතන ව්‍යාපාරිකයන්ගේත්, දැව සංස්ථාව වැනි ආයතන දේශපාලන කොන්ත්‍රාත්කරුවන්ගේත්, වනජීවී දෙපාර්තමේන්තුව කොළඹ වන ලෝලීන්ගේත් ග්‍රහණයේ පැවැතිණි. දෙවැනි බාධකය වූයේ දේශපාලනයයි. යූ.එන්.පීයට හිතැති කොටස් කොයි මොහොතේ හෝ ආණ්ඩුව වැට්ටවීම සඳහා හේතු සකසමින් සිටියහ. ජ.වි.පෙ පිරිස් වැඩ වර්ජන කිරීමට හෝ ජාතික හෙළ උරුමයට හෝ මට පුද්ගලික ප්‍රහාරයක් එල්ල කිරීමට හෝ සැදී පැහැදී සිටියහ. ශ්‍රී.ල.නි.පයේ අය තමන්ගේ මිනිහෙක් ඇමැති නොවීම නිසා පෙත්සම් යැවීමට යුහුසුළු විය. කොහොමත්, වෘත්තීය සමිතිවල ප්‍රතිචාරය පවත්නා ක්‍රමයට රුහැනි එකක් විය. පහළ ශ්‍රේණිවල අයගේ සාධාරණ ඉල්ලීමක් පවා කල් දමමින් යට ගසනා නිලධාරීවාදී තත්ත්වයක් තිබිණි. පළාත් පාලන ඡන්දය ඉල්ලීම නිසා සේවයෙන් නෙරපන ලද ජ.වි.පෙ සාමාජිකයන් පිරිසකට රැකියා ලබාදීමට මට වසර එකහමාරක් නිලධාරීන් හා ගැටෙන්නට සිදුවිය. අපේ ව්‍යාපෘතියක වසර 05ක් සිටි සේවක පිරිසක් උකහාගන්නට වසරක් ක්‍රියා කළත්, නොහැකි විය. ඒ අතර, විද්‍යාත්මක සේවය, අමාත්‍යාංශ සේවය, විද්‍යා අධ්‍යාපනය ලැබූවන් හා නොලැබූවන් පිටින් පැමිණි අය ඇතුළින් පැමිණි අය ලෙස, භේදයක් පැවැතිණි.

මම පළමුව ජ්‍යෙෂ්ඨත්වය වෙනුවට කුසලතාවය හඳුන්වා දුනිමි. එය ජ්‍යෙෂ්ඨයින්ගේ විවේචනයට ලක්වුව ද කුසලතාවය ඇති තරුණ පිරිස්වලට වැඩි වගකීමක් ලබා දුනිමි. ඊළඟට කුසලතාවය ඇගයීමේ ක්‍රමවේදයක් ඇති කළෙමි. එය ඉහළ සිට පහළට ද, පහළ සිට ඉහළට ද ලෙස ක්‍රම දෙකකට සිදුකළෙමි. ආයතන අතර, මිත්‍ර තරගයක් බවට එය පත්කළෙමි. නිවාඩු ලබාදීම්, විදෙස් ගතවීම් සීමා කිරීම නිසා විශාල විරෝධතා ඇති වුව ද වැඩි වැඩියෙන් අලුත් අවස්ථා ලබාදීමෙන් විරෝධතා සමනය කෙරිණි. වරක් 300කට අධික වනජීවී දෙපාර්තමේන්තුවේ පිරිසක් විදේශ පුහුණුවට යැවීමට අධ්‍යක්ෂක ජනරාල් කළ ඉල්ලීමට කන්දුන්නේ ඔවුනට එය කිසිදා නොලැබෙන බව දැන සිටි නිසාය. විදේශ සංචාර, නිතරම ආයතන හා ආයතන ප්‍රධානීන් අතර බෙදාගැනීමේ සම්ප්‍රදාය බිඳ දැමුවෙමි.

මගේ දෙවැනි ඉලක්කය වූයේ අරමුදල්වලින් ස්වයං පෝෂිත වීමයි. 2007 වසරේ මට වැඩ කරන්නට වුණේ ඒ වනවිටත් අයවැයෙන් වෙන්වූ අරමුදල් යටතේය. අපේ ආයතනවල ආදායම් වැඩිකිරීමෙන් ද, සේවා කාර්යක්ෂම කිරීමෙන් ද, නව ආදායම් සොයා ගැනීමෙන් ද 2008 දී අපේ අමාත්‍යාංශයේ සියලු ආයතනවල සියලු වියදම් අපිම සොයා ගන්නත්, 2009 දී අමාත්‍යාංශය

ලාභදායී කරන්නටත් සමත් වුනෙමි. භූමිතෙල්වලින්, කිරිපිටිවලින්, පාන්පිටි පරිප්පුවලින් ලැබෙනා බදුවලින් යැපෙනා අමාත්‍යාංශයක් නොවන බව ආඩම්බරයෙන් කීවෙමි.

වැඩ වර්ජන සඳහා මම දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කළෙමි. අමාත්‍යාංශය තුළ ජවිපෙ වෘත්තීය සමිති ප්‍රබලව තිබුණ ද 2007 හා 2008 එකඳු වැඩ වර්ජනයක් වත් සාර්ථක නොවීය. 2008 සමස්ත මහා වැඩ වර්ජනය දා පැමිණීම වෙනදාටත් වඩා හොඳ වී 99% ඉක්මවා තිබිණි.

මහජන ප්‍රතිචාර සඳහා ද ඉක්මන් ක්‍රියාදාමයක් ඇරැඹීමි. "1991" හදිසි දුරකතනය හඳුන්වා දුන් අතර"ඇමැති ගමට" යටතේ සියලු දිස්ත්‍රික්කවලට ගියෙමි. අවසානයේ අපට දරාගත නොහැකි තරම් පැමිණිලි ගලා ආ අතර, අපේ අමාත්‍යාංශයට අයත් නැති පැමිණිලි පවා අපට යොමුව තිබිණි. මේ නිසා කෙලින්ම ජනතාව අතරට යා යුතුයැයි සිතා පාසල්, රජයේ ආයතන, පුද්ගලික ආයතන, රෝහල්, වැඩබිම්, ගම්මාන ආදිය වෙතට සෘජුව ගොස් විවිධ වැඩසටහන් දියත් කළෙමි. අපි නොදැන සිටි අලුත් ජනකායක් අපට හමුවිණි. අලුත් ප්‍රශ්න ද ඒ සමගම මතුවී ආවේය.

විශේෂ ව්‍යාපෘති ගණනාවක් ද දියත් කළෙමි. එයින් මූලිකම අංගය වූයේ "පිළිසරු" ජාතික කසළ කළමනාකරණ ව්‍යාපෘතියයි. කසළ කළමනාකරණය අපට අයත් විෂයක් නොවීය. අපේ වගකීම වූයේ පළාත් පාලන ආයතන එකී වගකීම ඉටුනොකරන විට නඩු පැවරීමය. මම එයට ඔබ්බෙන් ගොස් පළාත් පාලන අමාත්‍යාංශය හා පළාත් සභා සමග එක්වී "පිළිසරු" ගෙන ආවෙමි. බ්ලූමැණ්ඩල් ඇතුළු කුණු කඳු ගණනක් නිරීක්ෂණය කළ මට පෙනී ගියේ රෝහල් අපද්‍රව්‍ය, රසායනික අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය සාමාන්‍ය කසළ සමග කුණු කඳුවලට එන බවය. මම වහාම රෝහල් අපද්‍රව්‍ය සම්බන්ධයෙන් නව නීති ගෙන ආවෙමි. වහාම මට එරෙහිව ඔවුන් නැඟී සිටියහ. නමුත්, අවසානයේ ඔවුන් සියල්ලෝ අපේ තීන්දුවලට එකඟ වූහ. කොළඹ නගරයේ 2008 දෙසැම්බරයෙන් පසු රෝහල් අපද්‍රව්‍ය කුණු ගොඩට යන්නේ නැත. කුණු ගොඩින් වෙළෙඳපොළට පරිහරණය කළ සිරින්ජර ආදිය එන්නේ ද නැත. රසායනික අපද්‍රව්‍ය සඳහා ද සෘජුව ක්‍රියා කළෙමි. ව්‍යාපාර සඳහා පාරිසරික බලපත්‍රය අනිවාර්ය කළෙමි. ලැයිස්තු තුනකට ඒවා ගැසට් කර රසායනික හෝ වෙනත් අපද්‍රව්‍ය පරිසරයට එක්වීම වැළැක්වීමට පියවර ගතිමි. මෙය ඉතා අමාරුවෙන් ව්‍යාපාර කරගෙන ගිය අයට නරකට බලපෑවේය. එමෙන්ම ඇතැම්විට පුද්ගලික තරහ සඳහා ද යොදාගන්නා ලදි. ඒ අවස්ථාවල දී ප්‍රශ්නය

අවබෝධ කරගන්නා ලෙසත්, අධික දූෂණය සහ අධික ලාභ සහිත ආයතන සඳහා දැඩිව නීතිය ක්‍රියාත්මක කරනා ලෙසත්, නියෝග ලබාදුනිමි. මේ නිසා ඇතැම් ප්‍රකෝටිපතියන් මා සමග උරණ විය.

විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා නව පරිසර සංරක්ෂණ බදු ක්‍රමයක් හඳුන්වා දුනිමි. ලංකාවේ මුල්වරට විද්‍යුත් අපද්‍රව්‍ය එක් කිරීම සඳහ ක්‍රමවේදයක් සකස් කිරීමට ද අපට හැකිවිය. ඉවතලන ජංගම දුරකතන බැටරි, විදුලි ලාම්පු, පරිගණක, සී.ඩී. තැටි ආදී බොහෝ දේ සඳහා අලුත් ප්‍රතිපත්ති සකස් කළෙමි. ඇතැම් බලවතුන් අධිකරණයේ බලයෙන් ද අපේ නව රීති පාලනය කරන්නට ආවද අප නොසැලී සිටීම නිසා අධිකරණයට ද වෙනස් වන්නට සිදුවිය.

මුල දී මට හැඟී ගියේ ලංකාවේ කසළ ප්‍රශ්නය විසඳීමට නොහැකි, මුදල් හා තාක්ෂණය නොමැති නිසා බවය. අපි මුදල් හා තාක්ෂණය සොයාගත් විට පෙනී ගියේ ඉඩම් හා දේශපාලන අගතිය ප්‍රධාන හේතුන් බවය. නාගරික සංවර්ධනයේ දී කසළ සඳහා ඉඩම් හඳුනාගෙන වෙන් නොකිරීමත්, නාගරික සැලසුම් ක්‍රියාත්මක නොකිරීමත්, වගුරු බිම් කුණු දමා ගොඩ කිරීම රජයේ ද පුද්ගලික අංශයේ ද පොදු ප්‍රතිපත්තිය වීමත් මෙයට හේතු ලෙස හඳුනා ගතිමි. කැබිනට් මණ්ඩලයේ ගත් තීරණ පවා විවිධ ආයතනවල කඹ ඇදීම් නිසා මාස ගණන් කල් ගියේය. ජනාධිපති නියෝග පවා නොතකා හැරිණි. නමුත්, මම උත්සාහය අත් නොහැරියෙමි. දිගින් දිගටම පොර බැදීම නිසා බ්ලූමැණ්ඩල්, කරදියාන, පොහොරවත්ත, කොළොන්නාව වැනි දැවැන්ත කුණු කඳු සඳහා කළමනාකරණ වැඩසටහන් හඳුන්වාදීමට හැකිවිය. බොහෝ පළාත් පාලන ආයතනවලට ඉඩම් ලබාදීමට, ඒවා හඳුනාගැනීමට හැකිවිය. මට ඉවසිය නොහැකි වූයේ විධිමත් කසළ කළමනාකරණයක් හඳුන්වා දීමට යනවිට මතුකරනා පටු දේශපාලන විරෝධයයි. බ්ලූමැණ්ඩල් කුණු කන්ද ඇතිවූණේ 1991 සිටය. එහි යටි අරමුණ වූයේ තෙත්බිම ගොඩකර විකුණා ගැනීමයි. 1997 දී පාදුක්ක ප්‍රදේශයේ කසළ රඳවනයක් ගැන යෝජනාවක් විය. කැලණි ගඟ කසළවලින් රැකගැනීම සඳහා සියල්ලන් එක්වී එකී යෝජනාව පරාජය කරනා ලදි. ඉන්දික ගුණවර්ධන හා කරු ජයසූරිය මහත්වරු ඊළඟ ඡන්දය සඳහා කසළ අපහරණ යෝජනාව අත්හරිනු ලැබීය. ප්‍රතිඵලය වූයේ බ්ලූමැණ්ඩල් හි කසළ කන්දක් ඇති වී එහි අපජලය කැලණි ගඟ දිගේ කී.මී. 30-40ක් ද පාදුක්ක දක්වා ගමන් කිරීමය! මම නම් නිතරම කීවේ ඊළඟ ඡන්දය නොව ඊළඟ පරපුර වෙනුවෙන් මා ක්‍රියාකරනා බවයි.

වන අලින් සුරක්ෂිත කිරීම සඳහා ස්ථාපිත කළ "ගජ මිතුරෝ" විදේශ ශාඛ ඉවත් කර දේශීය ශාඛ ප්‍රචලිත කිරීමට ගෙන ආ "හෙළ තුරු වියන" ජලපෝෂක කඳුකර ප්‍රදේශ වනාන්තර කිරීම සඳහා ගෙන ආ "ගිරි තුරු වියන", දැව සංස්ථාවට හඳුන්වා දුන් නව "දැව ජවය" වාණිජ සැලැස්ම, පතල් කැණීම කාර්යාංශය පිබිදීම සඳහා ගෙන ආ "රන් දෙරණ" වැඩ සටහන, "හරිත ගම්මාන", "පියකරු පුරවර" ආදී ව්‍යාපෘති 10ක් දියත් කළෙමි. විශේෂයෙන් පතල් කැණීම් කාර්යාංශය ප්‍රථමවරට (1992 එහි පිහිටුවීමෙන් පසු) භාණ්ඩාගාරයට මුදල් යවනා ආයතනයක් කිරීමත් (2008 මිලියන 500) අමු ද්‍රව්‍ය ලෙස ඛනිජ පිටරට නොයවා මෙරට කර්මාන්ත ඇති කිරීමේ ප්‍රතිපත්තියත්, රුපියල් 15,000ට ගිය වැලි කියුබ් එක රුපියල් 6,000 ගෙන ආ මනම්පිටිය වැලි ව්‍යාපෘතියත් නව ප්‍රවේශයක් විය. ඛනිජ හා වැලි කළුගල් නිසා තානාපතිවරුන්ගේ සිට ගමේ ගොඩේ චන්ඩීන් හා දූෂිත දේශපාලකයින් පොලිස් නිලධාරීන් සමග නිරන්තරයෙන් ගැටෙන්නට මට සිදුවිය. පතල් හා ඛනිජ කාර්යාංශය මා භාරයට එනවිට එහි සේවකයෝ දෙකට බෙදී සිටියහ. දූෂණය හැම අතම විය. මම වෘත්තීය මට්ටමේ සභාපතිවරයෙක් හා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කළෙමි. ආයතනය විනයානුකූල කළෙමි. ආදායම් වැඩි කළෙමි. 2006 දී මා භාරගන්නට පෙර මිලියන 246ක් වූ එහි ආදායම 2008 දී මිලියන 491ක් දක්වා වැඩි කළෙමි. ආර්ථික අර්බුදය නිසා 2009 ඉලක්ක ලබාගත නොහැකි වුවත් අපි මිලියන 625ක් රජයට යැව්වෙමු. මනම්පිටියේ දුගී ජනයාට පමණක් මිලියන 250ක් පමණ ලබාදුන්නෙමු. කුලියට තිබූ මූලස්ථානය මිලදී ගැනීමට කටයුතු කළෙමි. විද්‍යාත්මක පර්යේෂණ සඳහා වෙනම ආයතනයක් යක්කල පිහිටුවූවෙමි. යාපනය හා මඩකළපුවේ සිට ප්‍රාදේශීය කාර්යාල ජාලයක් ඇති කළෙමි. දැව සංස්ථාව ද සම්පූර්ණයෙන් ප්‍රතිනිර්මාණය කළෙමු. දැව සංස්ථාවේ ආදායම 2006 මිලියන 2155ක්වූ අතර, එය 2008 දී 3141 කරන්නට අපි සමත්වීමු. විශේෂයෙන් දැව සංස්ථාවේ නිෂ්පාදන වූ විදුලි කණු ප්‍රමාණය බිංදුවේ සිට 50,000 දක්වා ද, සිල්පර ප්‍රමාණය බිංදුවේ සිට 100,000 දක්වා ද, අලිවැට කණු ප්‍රමාණය බිංදුවේ සිට 27,000 දක්වා ද ඉහළ දැමූවෙමි. දැව සංස්ථාවේ ගබඩා හා උපකරණ සහමුලින් නවීකරණය කරන්නට ද සමත්වීමි. අපි විදුලිබල මණ්ඩලයට විදුලි කණු සපයන විට ඔවුන් ඒවා ගෙන්වමින් සිටියේ නෝර්වේ රටිනි. සිල්පර ද, අප්‍රිකාවෙන් හා වෙනත් රටවලින් ආනයනය කෙරෙමින් තිබිණි. මේ නිසා මේ ව්‍යාපාරවලින් ලාභ ලබාගන්නවුන් හා නිතර ගැටීම් ඇතිකරගන්නටද සිදුවිය. අදාළ ඇමැතිවරු දෙපොළ කෙලින් නොසිටින්නට ඇතැම් නිලධාරීන් සියල්ල අවුල් කරන්නට ද ඉඩ තිබිණි.

අමාත්‍යාංශයක් දූෂණවලින් තොරව පවත්වා ගැනීම ගැන ද, රජයේ වාණිජ ආයතන බංකොලොත් වන යුගයක ඒවා ලාභ ලබන තරගකාරී ආයතන කිරීමට හැකිවීම ගැන ද නව ආර්ථිකයක් ගැන සිතනා මේ යුගයේ අපේ ආදර්ශය කාටත් ආදර්ශයකි.

පරිසර අමාත්‍යාංශයේ තිබූ වැදගත්ම අංගය එහි ජාත්‍යන්තර මානයයි. අපේ ඕසෝන් ඒකකයේ අධ්‍යක්ෂ සුමතිපාල මහතාගේ දක්ෂකම නිසා එකී මානයට ළඟාවූයේ ජාතික ඕසෝන් ඒකකය පමණි. ඕසෝන් වියන රැකීම සඳහා හොඳම ක්‍රියාකාරීකත්වය වෙනුවෙන් සම්මානය 2007 දී ලංකාවට ලැබුණු අතර, කැනඩා තානාපති කාර්යාලයේ සුදු වර්ගවාදීන් හා දෙමළ ජාතිවාදීන් එය ලබා ගැනීමේ උත්සවයට යෑමට මට අවස්ථාව දුන්නේ නැත. මම මාගේ විරෝධය කැනඩා අගමැතිට එක්සත් ජාතීන්ගේ සමුළුවක දී හමුවී දැක්වූවෙමි. පසුව මම ඒකච්ඡන්දයෙන් ඕසෝන් වියන රැකගැනීම සඳහා වූ "වියානා සම්මුතියේ" සභාපති බවට පත්වීමි. දේශගුණ විපර්යාසය ලොවේ ප්‍රධාන තේමාව වනබව දැනගෙන ඒ සඳහා ජාතික ලේකම් කාර්යාලයක් පිහිටුවීමි. කාබන් වෙළෙඳාම ප්‍රචලිත කිරීම සඳහා ජාතික කාබන් අරමුදල පිහිටුවීමි. මේවා සියල්ලම බොහෝ පමා වී සිදුකළ දේ වුවත්, අපගේ අනාගතය වෙනුවෙන් සිදුකළ දේ වෙයි. මා විසින්, ගෙනෙනා ලද පාරිසරික ණය බටහිර ජාතීන් ගෙවිය යුතුය යන දැක්මත්, තිරසර සංවර්ධනය මැණීමේ නව දර්ශකයත් විද්වතුන් අතර, හා දුගී රටවල විචාරයට හසුවිය. අපට හඬක් නැති බව හඳුනාගෙන සාර්ක් සමුළුවේ පොදු හඬක් ඇති කරන්නටත්, තෙත් වනාන්තර සන්ධානයට ඇතුළු වන්නටත්, කුඩා දිවයින් සන්ධානයේ නිරීක්ෂකයෙකු වන්නටත් ක්‍රියා කළෙමි. කනගාටුවට මෙන් අපේ විදේශ අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන් අපට තිසි සහාය දුන්නේ නැත. ඔවුනට පරිසර ප්‍රශ්නයේ ජාත්‍යන්තර මානය පෙනුණේ නැත. එහෙත්, එක්තරා ඉරිදා පුවත්පතකට කෝපන්හේගන් සමුළුව (2009) සඳහා නියෝජිතයන් පත්කර නැති බවට වූ ප්‍රවෘත්තිය නම් දුන්නේ විදේශ අමාත්‍යාංශයේ ලොකු නිලධාරියෙකි! බොහෝ දුගී රටවල් පෝසත් රටවල ආධාර පතාගෙන ඔවුන් විවේචනය නොකර ඩොලර් හිඟමනේ යත් දී මම සෑම විටම සත්‍යය වෙනුවෙන්, සාධාරණය වෙනුවෙන් පෙනී සිටියෙමි. මේ නිසාම බටහිර රටවල හිතවාදීන් ඔවුනගේ ඇතැම් සමුළුවලට මට ආරාධනා කිරීමෙන් වැළකී සිටීමට පරිස්සම් වූහ. ඒ අතර, තවත් රටවල් මා අදීන නායකයෙකු ලෙස පිළිගත්තෝය. එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුව අමතා මම 2008 පෙබරවාරි 18 කළ කතාව සමග අප දශක ගණනක් ලංකාවේ සිදුකළ සංවාදය

ජාත්‍යන්තර තලයට ගෙන ගියෙමු. ඒ සියල්ල අතරේ දියුණු රටවල දේශපාලන වංචාවෙන් මුළු ලෝකයම අනතුරේ වැටෙනා ආකාරයත්, අපි ජාත්‍යන්තර තලයට යෑමට දශකයකින් පමණ පමා වීමත්, ගැන ඇතිවන කනගාටුව හැමවිටම මා සිත වෙලා ගත්තේය. මාධ්‍ය ප්‍රචාරයෙන් පසුපසට ගියත් ඇත්ත දියුණුව පැත්තෙන් පරිසර අමාත්‍යාංශය ආදර්ශ අමාත්‍යාංශයක් කරන්නට හැකිවීම ජයග්‍රහණයකට වැඩි දෙයක් ලෙස සලකමි.

2009 වර්ෂය ඇරඹුණේම සුභ ආරංචි සමගය. ජනවාරි 01 දා සිට 09 වැනිදා දක්වා වූ කාලය තුළ මාන්කුලමේ සිට අලිමංකඩට කොටින්ගේ නිල අගනුවර වූ කිලිනොච්චිය, උපාය මාර්ගික වශයෙන් ඉතාම වැදගත් වූ පරන්තන් ද සමග වූ ප්‍රදේශ අත්කරගන්නට අපේ හමුදා සමත් විය. 2000දී අලිමංකඩ වැටීමත් සමග අප ඇතිකළ ජාතිකවාදී දේශපාලනයේ උච්ඡ ස්වරය 2009දී අලිමංකඩ යළි නොවැටෙන්නට අල්ලා ගැනීම විය. දෙපසින් පැමිණ ප්‍රසන්න හා ශවේන්ද්‍ර හමුදා නායකයන් අලිමංකඩදී එක්වන දර්ශනය විඳගත්තේ කඳුළු පිරී දෙනෙතිනි. අනුරාධපුරයේ රහසේ වළදමන ලද අලිමංකඩ බේදවාචකයෙන් මියගිය දරුවන්ට යුක්තිය ඉටුවුණේ එදාය.

2009 මාර්තු 08 දා රටේ ප්‍රචලිත ජ්‍යොතිෂඥයෙක් දාන ගෙදරකදී හමුවුනෙමි. ඔහු කීවේ අද තියුණු ග්‍රහ මාරුවක් ඇතිවන බවය. ඇතැම් අය ප්‍රභාකරන් අද මිය යන බව කීව ද එය පසුව සිදුවන බව හෙතෙම කීවේය. පසුදින යුද බිමේ සිටිනා අපේ මිතුරෙකුට කතා කර තත්ත්වය විමසුවෙමි. ජ්‍යොතිෂවේදියාගේ ග්‍රහමාරු කතාව ද කීවෙමි. ඔහු වේදනාවෙන් කීවේ ඊයේ හා පෙරේදා අපට දරුණු ප්‍රහාර එල්ල වූ බවය. අපි ආපස්සට ගිය බව ද කියවිණි. මම රත් වුණෙමි. කොටි යළිත් පරණ සෙල්ලම දමා අපව බිඳ දමයි ද යන සැකය ඇතිවිය. වහාම උඩ යට විවිධ අංශවලට කතා කළෙමි. තත්ත්වය පාලනය කර ඇති බව දැනගැනීමෙන් පසුවය එදින මට නින්ද ගියේ.

අප්‍රේල් 05 දා ආනන්දපුර සටනින් තීපන් මියගිය බවත්, සෙසු නායකයින් පුතුමාතලන් බලා පලාගිය බවත්, වාර්තා විය. තීපන් කොටින්ගේ යුද නායකයාය. දැන් ඉතින් කොටි අවසානය කරා පැමිණ ඇති බව මට හරියටම හදවතට වැටහිණි. නූතන විජිතර පුර සටන ලෙස ආනන්ද පුර සටන පෙන්වා පුවත්පතකට ලිපියක් ලීවෙමි.

මැයි 11 දා දිගටම මම සිටියේ යුද මුක්ත කලාපයේ සිදුවන දේ ගැන උනන්දුවෙනි. එක දිගට දුරකතන මගින් අපේ හිතවතුන්ගෙන් රණබිමේ තොරතුරු ගනිමිනි. ප්‍රසන්නගේ සේනාංක වඩ්ඩුවාල් දිය පැන්නුම පැන

උතුරට ගොස් ෂවේන්ද්‍රගේ සේනාංක සමග එක්වූවාය යන්න මිහිරිතම පුවතක් විය. අප දන්නා ඉතිහාසයේ ප්‍රථම වරට මුහුදු වෙරළේ හැම අඟලකම අයිතිය අපට ලැබිණි. එදාම (මැයි 14) ආචාර්ය පාලිත කොහාන හා ආචාර්ය විජයානන්ද එක්සත් ජාතීන්ට අපේ මුහුදු සීමාවේ නව අයිතිය පිළිබඳ දත්ත සටහන් භාර දුන්නේය. දශක ගණනක් පමා වූ මේ කාර්යයට අපේ භූ විද්‍යා කාර්යාංශයේ භූ විද්‍යාඥයින් සම්බන්ධ වීමත්, නිරන්තරයෙන් ඔවුන් සමග තොරතුරු හුවමාරු කිරීමත් සිදුකර ගත්තෙමි. අපේ දරුවන්ට තව කලකින් හෝ ලැබෙනා නව මුහුදු සම්පත් අයිතිය ගැන ප්‍රබෝධයට පත්වුනෙමි. TGS නෝර්පෙක් ආයතනය අපට මන්නාරම් ද්‍රෝණියේ දත්ත නොදී සිටීමට උත්සාහ කළ අවස්ථාවේ ඒවා ලබා ගැනීමට අප කළ අරගලය ද සිහිවිය. රටේ තෙල් සම්පත නෝර්වේ ජාතිකයන්ට පවරා දුන් රනිල්ගේ 2002 පෙබරවාරි 12 දරණ තෙල් සම්පත් ගිවිසුම හෙළිකර, එය නතර කිරීමට පුරෝගාමී වූයේද අපය. එය අපට පෙන්වා දුන් ක්‍රිස් ධර්මකීර්තිවද සිහිකරන්නේ කෘතඥපූර්වකවය. එමෙන්ම, අපේ රට මෙන් 23 ගුණයක් විශාල සාගර භූමි ප්‍රදේශයක අනේක සම්පත් මතු පරපුරට නොවේදැයි සිතා රණවිරු ජයග්‍රහණය දරුවන්ගේ විජයග්‍රහණයක් බව දැන සතුටු වුණෙමු.

මැයි 15 වැනිදා අපි බැසිල් රාජපක්ෂයන්ගේ කාර්යාලයේ හමු වී විජයග්‍රහණය සැමරීමේ ආකාරය ගැන සාකච්ඡාවක් පැවැත්වූයෙමු. පියවර කීපයකින් එය සිදුකිරීමට ඉටා ගත්තෙමු. පාර්ලිමේන්තුව අමතා කරන ප්‍රකාශය, ජනතා සමරුව, හමුදා සංදර්ශනය ආදී ලෙස එය මනාව සංවිධානය කෙරිණි. එදින සවස්වරුවේ දී මගේ ජංගම දුරකතනයට දෙමළ සන්ධාන මන්ත්‍රී කෙනෙක් පණිවුඩයක් එවා තිබිණි. ඒ කොටි නායකයින් යටත්වීමට සූදානම් බවය. මම එය බැසිල් රාජපක්ෂ මහතාට දැන්වූයෙමි. ඒ වනවිට ඔහුව තවත් කීප දෙනෙක් සම්බන්ධ කරගෙන තිබිණි. මෙය උපායක් විය හැකි බවට සැකයක් ද පැවතිණි. පසුව වාර්තා වුණේ නන්දිකඩාල් කලපුව හරහා පලායන්නට දරූ උත්සාහය ව්‍යර්ථ වූ බවය. එක්සත් ජනපද හමුදාවලට ජාත්‍යන්තර රතු කුරුසය හරහා භාර වීමට කොටි නායකයින් දැරූ උත්සාහය ද ව්‍යයර්ථ කෙරිණි.

ජනාධිපතිතුමා ජයග්‍රාහීව මව්බිමට සැපත් වූ මැයි 17 වැනිදා මම ද ගුවන්තොටුපළට ගියෙමි. මම සාමාන්‍යයෙන් මෙවැනි උත්සව පුළුවන් තරම් මග හරින්නෙමි. නමුත්, හදවත් ප්‍රීතියෙන් ඔද වැඩී තිබිණි. මව්බිම සිප ඉදිරියට එන එතුමාට ඉදිරියට ගොස් ආචාර කළෙමි. එතුමා වහාම මා වැළඳ ගෙන ඉතා උණුසුම් ලෙස 'අපි දිනුම්' යැයි කීවේය.



# පටිසෝතගාමීව
# තිස් වසක

## පාඨලී චම්පික රණවක

### ස්වයං ලිඛිත චරිතාපදානය

**පා**ඨලී චම්පික රණවක උපන්නේ කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල, බෝතලේගම ග්‍රාමයේ ය. අච්ච, වැස්ස, නිල්ල පිරුණු වටපිටාවක හෙතෙම වැඩුණේ ය. සමකාලීන සෙස්සන්ගෙන් ඔහු කැපී පෙනුනේ පාංශු දේහධාරීත්වය නිසාම නොවේ. නිර්භය නායකත්වයත්, පිරී ඉතිරීගිය බුද්ධියත්, බොහෝ දෑට එකවිට දක්ෂයෙකුත් වීම නිසා ය. තිරයෙන් පිටුපස සිට අප්‍රකටව වැඩකිරීම ඔහුගේ ස්වභාවය විය. නමුත්, ඉතිහාසය විසින් බලකෙරුණේ වී තෙමේම සිය භූමිකාව ප්‍රකටව පලකරන්නට විය.

වැඩි කාලයක් අධ්‍යාපනය සඳහා යොදවන්නට ඔහුට ඉඩක් නොතිබුණේ, ඔහු කුඩාකල සිටම ලොව වෙනස් කරන්නට අදිටන් කරගෙන, සමාජ ජීවිතයේ පැටලී පොරබදමින් සිටි නිසා ය. නමුත් පහේ ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ආදී විභාග ඔහු සමත් වූයේ කළුතර දිස්ත්‍රික්කයේ පළමුවැනියා ලෙස ය. සමකාලීනයන් ඔහුව හඳුන්වන්නේ, ගුරුන්ටත් අකුරු කියාදුන් ප්‍රාඥයෙකු ලෙසය. මොරටු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ දීප්තිමත් විදුලි ඉංජිනේරු සිසුවෙකු වූ ඔහු, පසුව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ගණිත අංශයේ උපදේශකවරයෙකු ද විය. ශිෂ්‍යයෙකු ලෙස මෙන්ම ගුරුවරයෙකු ලෙස ද හෙතෙම එක ලෙස කැපීපෙනෙන දක්ෂතා පෙන්වා ඇත්තේ ය.

බොහෝ දෙනෙකු පවතින දේශපාලනයේ විවිධ පක්ෂ, පාට තෝරාගෙන අනුන් තැනූ ආයතනවල ඉහළට යෑම තෝරා ගනිද් දී, හෙතෙම තමන්ගේ ම වූ ජාතික දේශපාලනයක ආරම්භකයා මෙන්ම නිර්මාතෘ ද විය. මවක් සේ සංයත, පියෙකු සේ පරිණත වී ජනප්‍රිය ප්‍රවාහයට රැහැනිව ඔහු ගිය දේශපාලන මග අන්තිමේ දී ඔහුව ජාතික දේශපාලන නායකයෙකු පමණක් නොව, ගෝලීය නායකයෙකු බවට ද පත්කළේය.

රළට එරෙහිව පටිසෝතගාමීව, නැඹුල් තරුණයෙකුගෙන් ඇරඹී, වැඩීගිය තරුණ නායකත්වයක් කරා ඔහු ගිය තිස් වසක නොනිමි මග මෙකී කෘතියෙන් කැටිකර දක්වා තිබේ.

මිල රු. 300/=

9 789559 884316